

දැක්මේ සිට ව්‍යාප්තිය දක්වා: ශ්‍රී ලංකාව තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධනයට අවකාශ සැලසීම.

වාර්ෂික වාර්තාව 2025



දැක්මේ සිට ව්‍යාප්තිය දක්වා:

ශ්‍රී ලංකාව තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධනයට අවකාශ සැලසීම.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අපි ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ වුවද , ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ වැඩිදියුණු වූ ස්ථාවරත්වයක් මෙම වසරේදී පෙන්වාඇති බව ප්‍රකාශ කරන අතර ගෝලීය වෙළඳ අර්බුද, භූ දේශපාලනික අවදානම් සහ මන්දගාමී ආර්ථික වර්ධනය සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට අබණ්ඩව බලපෑම් එල්ල කළද 2025 මූල්‍ය වර්ෂයේදී ශ්‍රී ලංකාව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වූ අතර වැඩිදියුණු වූ ද්‍රවශීලතාවය, ලාබ දායි තත්ත්වය සහ බැංකු අංශය කෙරෙහි ආයෝජක විශ්වාසය අලුත් වීම එයට හේතු වී තිබිනි.

2024 වර්ෂය හා සැසඳීමේදී, සැලකිය යුතු බදු පසු ලාභයක් ලබා ගනිමින් ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් බැංකුව වාර්තාකර තිබූ අතර 2025 වර්ෂයේ දී ආර්ථික අභියෝග යන්ට මුහුණ දෙමින් විශේෂයෙන්ම, අවදානමට ලක්විය හැකි ගනුදෙනුකරුවන් මෙන්ම පාර්ශවකරුවන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දෙමින් ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශම් සහගත ප්‍රවේශයක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අනුගමනයකර තිබිණි.

මෙම කාර්යසාධනය පිරිවැය කළමනාකරණය, ඉහළ ගොස් තිබූ ශුද්ධ පොලී ආදායම, ගාස්තු හා කොමිස් ආදායමේ වැඩිවීම සහ ඉතා සාර්ථක අති නවීන කේන්ද්‍රීය බැංකුකරණ පද්ධතියක් ආරම්භ කිරීම මගින් සිදුවී තිබිණි. ණය කළඹේ හා වත්කම්වල ස්ථාවර වර්ධනයක් ද බැංකුව වාර්තාකර තිබූ අතර නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළ අගයකින් ද්‍රවශීල හා ප්‍රාග්ධන අනුපාත පවත්වා ගැනීමටද සමත් වී තිබිණි.

SMIB
State Mortgage and Investment Bank

අන්තර්ගතය

ආයතනික පැතිකඩ 03

මූල්‍ය විශේෂතා 04

මූල්‍ය විශ්ලේෂණය 05

සභාපතිතුමාගේ පණිවුඩය 10

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවුඩය 16

අධ්‍යක්ෂ මණ්ඩලය 19

ආයතනික කළමනාකරණය 24

ජ්‍යෙෂ්ඨ කළමනාකරණය 26

ආයතනික පාලනය 27

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 66

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව 68

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 70

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 72

අවදානම් කළමනාකරණය 76

මානව සම්පත් කළමනාකරණය 81

නිෂ්පාදන සන්නාමකරණය 83

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 87

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය 92

බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 94

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 96

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 98

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 103

ආදායම් ප්‍රකාශනය 104

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 104

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 105

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 106

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 107

දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය 175

දැක්ම

පාරිභෝගික මූල්‍ය කටයුතුවල වෙළෙඳපොල පෙරගමන්කරුවෙකු වීම සමගින් සංවර්ධන බැංකුකරණයේ ජාතියේ අගනා කොටස්කරුවෙකු වීම.

මෙහෙවර

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ජාතියේ විශිෂ්ඨ නිවාස බැංකුව ලෙස ඉදිරියටත් පවත්වාගෙන යමින් සංවර්ධන බැංකුකරණයේ අගනා කොටස්කරුවෙකු වීම.

ආයතනික වටිනාකම්

අප පෙනී සිටින්නේ

- ගෞරවය පුදකරමින් විශ්වාසනීයව කටයුතු කරමු.
- අප ඉටුකරන සියළුම කාර්යයන්වලදී වෘත්තියවේදිත්වය හා විශිෂ්ඨත්වය ප්‍රදර්ශනය කරමු.
- අප කරන කාර්යයන් ඉතා කැපවීමෙන් ඉටුකරමින් වගකීම ආරක්ෂා කරමු.
- අපි විවෘතභාවය ප්‍රදර්ශනය කරමින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට උත්සාහ කරමු.
- අපි නව්‍යකරණ අදහස් සහ සක්‍රීය විසඳුම් බලාපොරොත්තු වෙමු.
- ඉගෙනුම සඳහා බලවත් කැමැත්ත සහ බැංකුව සමඟ වර්ධනයවීම සඳහා මහත් ලැදියාව අපි සතු වෙමු.

ආයතනික පැතිකඩ

ගනුදෙනුකරුෘ: විශිෂ්ඨ පාරිභෝගික සේවාව, නව්‍යකරණය, ගුණාත්මක බව හා අති නවීන තාක්ෂණය මඟින් අපගේ සියළුම ගනුදෙනුකරුවන්හට ඔවුන්ගේ නිවාස හා සංවර්ධන මූල්‍ය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ආකර්ෂණීය මූල්‍ය විසඳුම් ලබා දෙමින් සේවය කිරීමට අපි ඇපකැපවී සිටිමු.

ව්‍යාපාර හවුල්කරුවන්: ඉහළ ආරක්ෂාවකින් හා නම්‍යතාවයකින් යුතුව ආයෝජන සඳහා විශිෂ්ඨ ප්‍රතිලාභ ප්‍රදාන කරන්නෙමු.

සේවකයා: කණ්ඩායම් හැඟීමෙන් සේවය කල හැකි යහපත් පරිසරයක් නිර්මාණය කරමින් අපගේ සේවකයින්ගේ කුසලතා උපරිම අයුරින් වර්ධනය කරගැනීම වෙනුවෙන් හා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ද අපි අවස්ථා ලබා දෙන්නෙමු.

කොටස්හිමියන්: පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කරමින් ලාභදායිත්වයේ වර්ධනය මඟින් කොටස්කරුවන්ගේ තත්ත්වය ඉහළ නැංවීමට අපි කැපවී සිටින්නෙමු.

තාක්ෂණය: වේගවත්බව, ගුණාත්මක බව හා පහසුව ඇතිකරලීම සඳහා ස්වයංක්‍රියකරණ සහ තාක්ෂණික යෙදුම් මඟින් අපගේ බාහිර ගනුදෙනුකරුවන් සඳහා අගය එකතුකළ සේවාවන් ලබාදීමට අපි බැඳී සිටිමු. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂම බව හා සවලතාවය වැඩිකරලීම සඳහා අපගේ අභ්‍යන්තර ගනුදෙනුකරුවන්ට වේගවත් හා නිවැරදි තොරතුරු ලබා දෙන්නෙමු.

සමාජය: ජාතික සංවර්ධනයේ කොටස්කරුවෙකු ලෙස අපගේ ප්‍රජාවගේ ජීවන රටාව නගා සිටුවීම සඳහා සේවය කිරීමට අපි පොරොන්දු වෙමු.

මූල්‍ය විශ්ලේෂතා

	2025 රු. මිලි.	2024 රු. මිලි.	වෙනස %
පොලී ආදායම	7,121	7,591	-6.19%
පොලී වියදම	(3,888)	(5,392)	-27.90%
ශුද්ධ පොලී ආදායම	3,233	2,198	47.06%
බදු වලට පෙර ලාභය	737	158	366.42%
බදු කරණය	(375)	(126)	197.56%
බදු වලට පසු ලාභය	362	32	1031.32%
රාජ්‍ය සුරැකුම් ආයෝජන	7,529	6,030	24.85%
ණය සහ අත්තිකාරම් ශුද්ධ	44,806	41,730	7.37%
මුළු වත්කම්	57,360	55,668	3.04%
ගනුදෙනුකාර තැම්පතු	48,857	48,161	1.44%
ණය ගැනීම්	274	141	94.35%
පාර්ශවකරුවන්ගේ අරමුදල	5,816	5,420	7.30%
අනුපාත විශ්ලේෂණ			
ලාභදායිතා මට්ටම	%	%	%
ශුද්ධ පොලී ආන්තිකය	5.72%	3.83%	49.37%
ස්කන්ධය මත ඉපැයීම් (ROE)	6.44%	0.59%	992.24%
වත්කම් මත ඉපැයීම් (ROA)	1.30%	0.28%	365.71%
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය			
ස්කන්ධය / මුළු වත්කම්	10.14	9.74	4.09%
ස්කන්ධය / ණය හා අත්තිකාරම්	12.98	12.99	-0.08%
	බාසල් (III)	බාසල් (III)	
පළමු පෙළ	24.32%	19.28%	26.12%
පළමු සහ දෙවන පෙළ	22.42%	19.28%	16.28%
ද්‍රවශීලතාව			
ද්‍රවශීල වත්කම් අනුපාතය	102.48	104.79	-2.20%
ණය සහ අත්තිකාරම් / තැම්පතු	91.71%	86.65%	5.84%
ණය ගැනීම් / ණය සහ අත්තිකාරම්	0.61%	0.34%	79.62%
ශ්‍රේණිගත කිරීම්			
වත්කම් ගුණාත්මකභාවය			
අක්‍රීය ණය / ණය සහ අත්තිකාරම්	33.05%	29.13%	13.46%
සේවක අර්ථසාධක අරමුදල හැර / අක්‍රීය ණය	16.41%	17.07%	-3.87%
මුළු වත්කම්වලට ණය සහ අත්තිකාරම්	78.11%	74.96%	4.21%

මූල්‍ය විශ්ලේෂණය 2025

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2025 වර්ෂයේ දී ලඟාකරගත් ධනාත්මක ගමන්පථය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර එය ක්‍රමයෙන් වැඩි දියුණුවන සාර්ව ආර්ථික පරිසරයක් මධ්‍යයේ 2024 වර්ෂයේ දී ලඟාකරගත් ඉහළ ප්‍රකෘතිමත්භාවය මත පදනම්වී තිබිණි. රජයේ සුරැකුම්පත්වල ස්ථාවර ප්‍රවිලාභ, ප්‍රතිපත්ති පොලී අනුපාතයේ අඛණ්ඩ පහළයෑම, සාමාන්‍ය බරිත මූලික ණය පොලී අනුපාතය යහපත්වීම සහ ආයෝජකයින්ගේ සහ ව්‍යාපාර විශ්වාසයෙහි වර්ධනය, වසරේ ආර්ථික ස්ථාවරත්වයට හේතුවී තිබිනි. මෙම වර්ධනයන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබන ප්‍රතිසංස්කරණ වැඩ සටහන් කෙරෙහි රජයේ කැපවීම සමඟින් බැංකු අංශය සඳහා පුරෝකථනය කලහැකි හා වඩා යහපත්, මෙහෙයුම් පරිසරයක් නිර්මාණයකර තිබිනි.

දේශපාලන ස්ථාවරත්වය, බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරනයේ සාර්ථකත්වය, මූල්‍ය විනය සහ ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශකයන්ගේ ශක්තිමත්වීම මූල්‍ය අංශයේ ස්ථායී වර්ධනයට දායකවී තිබිනි. විවක්ෂණ වත්කම් හා බැරකම් කළමනාකරණය, ක්‍රමවත් අවදානම් කළමණාකරණ පරිචයන් සහ පැහැදිලි ලෙස දක්වා ඉලක්කගතකර තිබූ වර්ධන උපාය මාර්ගයන් වැනි හිතකර වාතාවරණයක් යටතේ ඒ සඳහා ඵලදායී ලෙස ප්‍රාග්ධනය ආයෝජනයකර තිබිනි.

2025 වර්ෂයේ දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ලාභදායීත්වයේ සැලකියයුතු දියුණුවක් වාර්තාකල අතර 2024 වර්ෂයේ රු. මිලියන 32.0 ක්වූ බදු පසු ලාභය රු. මිලියන 362 ක් ලෙස වාර්තා වී තිබිනි. මෙම ශක්තිමත් කාර්යසාධනය මඟින් බැංකුවේ අති නවීන බැංකු මෙහෙයුම් ශක්තිමත් කිරීම, වත්කම් ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ අරමුදල් හා මෙහෙයුම් පිරිවැය සාර්ථකව කළමනාකරණය කිරීමෙහිලා බැංකුවේ සාර්ථකත්වය විදහා දක්වයි. මෙම ජයග්‍රහනයේ ප්‍රධාන සාධකය වූයේ 2024 නොවැම්බර් මාසයේදී වැඩි දියුණු කරන ලද අති නවීන බැංකුකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කරවීමයි. එය පාරිභෝගික සේවා සැපයීම සැලකිය යුතු ලෙස ඉහළ නැංවූ අතර තීරණාත්මක ව්‍යාපාරික ක්‍රියාවලීන් විධිමත් කර ඇත. මෙම ආරම්භයන් සමඟ මෙහෙයුම් විශිෂ්ඨත්වය හා තිරසාර ලාභදායීත්වය සඳහා ඇති කැපවීම පිළිබිඹු කරමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශක්තිමත් ගමන්මඟක ස්ථානගතකර ඇත.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2025 වසරේ දී ශුද්ධ පොලී ආදායමේ 47% ක වර්ධනයක් වාර්තාකල අතර ඒ සඳහා පොලී ඉපයීම්වල තිරසාර ප්‍රසාරණය සහ අරමුදල් පිරිවැයෙන් උපරිම ඵල නෙලා ගැනීම හේතුවී තිබිනි. වර්ෂය තුලදී බැංකුව ලබාගත් ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයට මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් බලපා තිබිනි. පවතින අඩු පොලී අනුපාත තත්ත්වය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට වඩා යහපත් ආන්තිකයන් පවත්වා ගනිමින් තරඟකාරී ලෙස ණය මිලකරණය කිරීමට හැකිවී තිබූ අතර එමඟින් ඉපයීම් මට්ටම් සහ සමස්ථ මූල්‍යමය ඔරොත්තුදීමේ හැකියාව ද ශක්තිමත් කිරීමට හැකිවී තිබිනි. මීට අමතරව අඩු පොලී අනුපාතයන් යටතේ ප්‍රතිමූල්‍යකරණ මූල්‍ය ප්‍රතිපාදන නැවත සාකච්ඡා කිරීම තුලින් ලාභදායීත්වය තවදුරටත් ශක්තිමත් කල අතර එය තිරසාර වර්ධනයක් සඳහා බැංකුව ස්ථානගත ඇත.

වඩා යහපත්, ප්‍රාග්ධන හා ද්‍රවශීලතා කළමනාකරණය, වැඩි දියුණුවූ වත්කම් ගුණාත්මකභාවය සහ මනින ලද වර්ධනය මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය තත්ත්වය 2025 වසරේ දී තවදුරටත් ශක්තිමත්වී තිබිනි. වත්කම් ව්‍යාප්තිය මූලික වශයෙන් ණය හා අත්තිකාරම් මඟින් සිදුවී තිබූ අතර එය 2024 වසරේ තිබූ බිලියන 41.73 සිට රු. බිලියන 44.81 ක් දක්වා 7.37% කින් ඉහල ගොස් තිබිනි. එය පුද්ගලික අංශයේ ණය ඉල්ලුමේ ක්‍රමික වර්ධනයක් සනිටුහන් කර ඇත. දුරදර්ශී අවදානම් ඇගයීම් ප්‍රමිතීන් මඟින් අනුබලයක් ලබමින් ණය දීමේ වර්ධනය ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ සමගාමී විය. ශේෂපත්‍ර ස්ථාවරත්වය ආරක්ෂා කරමින් ව්‍යාපාර පරිමාවන් වර්ධනය කිරීමට බැංකුව සතු හැකියාව විදහා දක්වමින් තාක්ෂණය හා මෙහෙයුම් වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන සිදුකලත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පිරිවැය පිළිබඳ දැඩි ලෙස සැලකිලිමත්වී තිබිනි. එහි ප්‍රතිඵලයක් ලෙස වැටි බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදුවලට පෙර මෙහෙයුම් ලාභය 2024 වසරට සාපේක්ෂව 170% කින් ඉහල ගිය අතර වැඩි දියුණුකල මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ ක්‍රියාවලි ප්‍රශස්තිකරණයේ ප්‍රතිලාභ පෙන්වා තිබිනි.

2025 වර්ෂයේ දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රකෘතිමත්වීම තහවුරුවීම හා තිරසාර වර්ධනයක් කරා එළඹීම සනිටුහන්කර තිබිනි. හිතකර සාර්ව ආර්ථික පසුබිමක්, දේශපාලන ස්ථාවරත්වය සහ අඛණ්ඩ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මඟින් වැඩි දියුණුකල මූල්‍ය හා ශේෂ පත්‍ර කාර්යසාධනය සඳහා ශක්තිමත් පදනමක් සපයා තිබිනි. ශක්තිමත් ලාභදායීත්වය, වැඩි දියුණුකල වත්කම් ගුණාත්මකභාවය, ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් සහ නව්‍යකරණය, කාර්යක්ෂමතාවය හා වගකීම් සහිත ණය ලබාදීම් කෙරෙහි පැහැදිලි උපායමාර්ගික අවධානයක් යොමුකරමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි වර්ධන ගමන්මඟට පිවිසි එහි පාර්ශවකරුවන්ට දිගුකාලීන වටිනාකමක් ලබාදෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඵලදායී ලෙස දායකවීමට හොඳින් ස්ථානගතවී සිටියි.

ඉදිරි වැඩකටයුතු දෙස බලනවිට පාරිභෝගික අත්දැකීම්, මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල්කරණය සිදුකිරීම හා තාක්ෂණය මත පදනම්වූ වියදම් සඳහා ආයෝජන සිදුකිරීම ඉදිරියටත් කරගෙන යෑමට බැංකුව සැලසුම් කරයි. මෙම ආයෝජනයන් කෙටිකාලීන හා පිරිවැය පීඩනයන්ට දායකවූ අතර උත්ශ්‍රේණිගතකල පරිමානතාව, සේවා කාලය කෙටි කිරීම සහ වැඩි දියුණුකල තරඟකාරිත්වය මඟින් දිගුකාලීන ප්‍රතිලාභ ජනනය කරනු ඇතැයි අපේක්ෂා කරයි. මීට සමගාමීව සමස්ථ සමාජයම ඇතුලත් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම, ව්‍යවසායකත්වයට සහය ලබාදීම සහ දේශීය අගය නිර්මාණය ශක්තිමත් කිරීම අරමුණුකරගත් රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීමේදී කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර අංශය කෙරෙහි දැඩි අවධානයක් යොමුකරමින් ණය ලබාදීම වැඩි කිරීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සැලසුම් කරයි. ඩිජිටල් ක්‍රමවේදනයන්ට

අනුබල දෙමින් ණය ලබාදීමේ විධිමත් ක්‍රියාවලියක් සහ දත්ත මත පදනම්වූ තීරණ භාවිතා කරමින් ක්‍රියාවලි කාලය අඩු කිරීමට සහ පාරිභෝගික සහභාගිත්වය වැඩි දියුණු කිරීමට බැංකුව අපේක්ෂා කරයි. ඩිජිටල් ක්‍රමවේදයන්ට අනුගතවීම සහ කුඩා හා මධ්‍යපරිමාන ව්‍යවසාය කේන්ද්‍රකරගත් ණයදීම් අතර මෙම උපායමාර්ගික පෙළගැස්ම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව තිරසාර කලඹ වර්ධනයක් සහ කොටස් හිමියන්ට දිගුකාලීනව වටිනාකම් ලබා දෙන අතරම ජාතික සංවර්ධන අරමුණු සඳහා සහායවීමට ද ඉලක්ක කරයි.

ආදායම් ප්‍රකාශනය පිළිබඳ විශ්ලේෂණය

ආදායම් ප්‍රකාශනයේ සාරාංශය

දර්ශකය	2025 රු. මිලියන	2024 රු. මිලියන	වෙනස %
පොලී ආදායම	7,121	7,591	-6%
සමස්ථ මෙහෙයුම් ආදායම	3,807	2,780	37%
බදු පෙර ලාභය/(පාඩුව)	737	158	367%
බදු පසු ලාභය	362	32	1030%

පොලී ආදායම

වර්ෂයතුල මුළු පොලී ආදායම රු. මිලියන 7591 සිට රු. මිලියන 7121 දක්වා පහත වැටුනු අතර එය ප්‍රධාන වශයෙන් ආයෝජන කලඹ තුල අනුපාත සංවේදී වත්කම්වල ප්‍රතිලාභයන්හි සමස්ථ අඩුවීම පිළිබිඹු කරයි. රජයේ සුරැකුම්පත් ප්‍රතිලාභවල අඛණ්ඩ අඩුවීම මෙම පහත වැටීමේ ප්‍රවණතාවයට තවදුරටත් දායකවී තිබිනි. කෙසේ හෝ ණය හා අත්තිකාරම් මගින් ලැබෙන පොලී ආදායම ධනාත්මක ප්‍රවණතාවයක් වාර්තාකර තිබූ අතර එය 2024 වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 113 කින් නැතහොත් 2% ක් ලෙස වැඩිවී තිබිනි. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් ණය කළඹෙහි 8% ක වර්ධනය නිසා සිදුවූ අතර එය ආදායම් කාර්යසාධනයට ධනාත්මක ලෙස දායකවී තිබිනි. ආයෝජන මගින් ලැබෙන පොලී ආදායම රු. මිලියන 583 ක් ලෙස නැතහොත් 38% ක් ලෙස සැලකිය යුතු ලෙස පහල වැටී තිබිනි. ප්‍රධාන වශයෙන් ආයෝජන කළඹෙහි 11% ක හැකිලීමත් සහ අඩු වෙළඳපල පොලී අනුපාත සමග මෙම තියුණු අඩුවීම ආයෝජන ආශ්‍රිත ආදායමට කළඹේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම සහ අඩු හිතකර පොලී අනුපාත පරිසරයේ ඒකාබද්ධ බලපෑම අවධාරණය කරයි.

ශුද්ධ පොලී ආදායම

ශුද්ධ පොලී ආදායම ඉකුත් වසරට සාපේක්ෂව 47% ක අගයකින් ඉහල ගොස් තිබූ අතර, ප්‍රධාන වශයෙන් පොලී පිරිවැය සැලකියයුතු ලෙස අඩුවීම මෙයට හේතුවී ඇත. පොලී වියදම 2024 වර්ෂයේ දී රු. බිලියන 5.4 සිට රු. බිලියන 3.9 දක්වා අඩුවී තිබූ අතර එය 28% ක අඩුවීමක් ලෙස දැක්වෙයි. මෙම අඩුවීම වර්ෂය මුළුල්ලේ බැංකුවේ තැන්පතු පදනමේ වලදායී කළමනාකරණය හා ප්‍රශස්තිකරණය පෙන්වන අතර එමගින් අරමුදල්වල සමස්ථ පිරිවැය අඩුකර ගතහැකි විය. පොලී ගෙවියයුතු බැඳීම් සහ අරමුදල් සැකසීම්වල උපායමාර්ගික කළමනාකරණය මගින් බැංකුව සිය ශුද්ධ පොලී ආදායම සැලකියයුතු ලෙස වැඩි දියුණු කරගත් අතර, අභියෝගාත්මක ආර්ථික පරිසරයක් මධ්‍යයේ වැඩි දියුණුකල මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ පිරිවැය පාලනය පිළිබිඹුකර ඇත.

පොලී නොවන ආදායම


ගාස්තු හා කොමිස් ආදායම, මූල්‍ය ආයෝජනවලින් ලැබෙන ශුද්ධ ලාභ හෝ අලාභ සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් ඇතුලත් පොලී නොවන ආදායම වසරතුල සැලකියයුතු දියුණුවක් වාර්තාකල අතර ඒ සඳහා ප්‍රධාන සාධක කීපයක් හේතුවී තිබිනි. ගාස්තු හා කොමිස් ආදායම 120% ක් ලෙස ඉහල ගොස් තිබූ අතර එය මූලික වශයෙන් මධ්‍යගත බැංකු පද්ධතියක් (CBS) හඳුන්වාදීම හේතුවෙන් සිදුකල සංශෝධිත ගාස්තුවල ප්‍රථිඵලයක් විය. මෙයට අමතරව මූල්‍ය වත්කම්වල සාධාරණ අගය පෙර වසරට සාපේක්ෂව 61% ක් ලෙස පහල වැටුණි. ප්‍රධාන වශයෙන් ඒකක භාර ආයෝජනවල 73% ක අඩුවීම හේතුවෙන් මෙම පහත වැටීම ලාභාංශ ආදායම හා විවිධ ආදායම් යන ද්විත්වයෙහිම 55% ක වැඩිවීමකින් අර්ධ වශයෙන් පියවාගත් අතර එය බැංකුවේ පොලී නොවන ආදායම් කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් කලේය.

සමස්ථ මෙහෙයුම් ආදායම

ප්‍රධාන සාධක කීපයක් හේතුවෙන් සමස්ථ මෙහෙයුම් ආදායම 37% කින් කැපී පෙනෙන ලෙස ඉහල ගොස් තිබිනි. පොලී වියදම 28% ක් ලෙස අඩුවීම ප්‍රධාන ස්ථානයක් ගත් අතර එය වසර තුල ක්‍රියාත්මක කරන ලද පිරිවැය ප්‍රශස්තිකරණ උපාය මාර්ගවල සාර්ථකත්වය පිළිබිඹු කරයි. තැන්පතු පදනම ප්‍රවේශම් සහිතව කළමනාකරණය කිරීම සහ ශුද්ධ පොලී ආන්තිකයේ තිරසාර වැඩි දියුණු කිරීම් ලාබදායිත්වය තවදුරටත් ශක්තිමත් කර ඇත.

ගාස්තු හා කොමිස් ආදායමද සුවිශේෂී වර්ධනයක් ලබාදුන් අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 120% ක් ලෙස ඉහල ගොස් තිබිනි. මෙම තියුණු වැඩිවීමට හේතුවූයේ ගාස්තු ව්‍යුහයන්ට උපායමාර්ගික ගැලපීම් හා ඉහල ගනුදෙනු පරිමාවන් විය. මේ සඳහා අනෙකුත් ආදායම් 55% ක් ලෙස පුළුල්වී තිබූ අතර සමස්ථ කාර්යසාධනයට තවදුරටත් ශක්තියක් එක්කර තිබිනි. මෙම ප්‍රථිඵල වඩා යහපත් පිරිවැය කළමනාකරණය සහ ආදායම් විවිධාංගිකරණ මූලාරම්භයන්වල කාර්යක්ෂමතාවය පෙන්වන අතර එමගින් සාමූහිකව ලාභදායිත්වය සැලකියයුතු ලෙස ඉහල මට්ටමකට ගෙනයන ලදී.

ලාභදායිත්වය



2025 වසරේදී බැංකුව සුවිශේෂී ලාභදායිත්ව වර්ධනයක් පෙන්වා තිබූ අතර බදු පෙර ලාභය 367% ක් සහ බදු පසු ලාභය 1030% ක සීඝ්‍ර වැඩිවීමක් පෙන්නුම්කර ඇත. මෙම කැපී පෙනෙන කාර්යසාධනය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබුවේ ශුද්ධ පොලී ආදායමේ සැලකිය යුතු වැඩිවීමක් මගින් වන අතර එය බැංකුවේ පොලී බැඳීම් පිළිබඳ උපායමාර්ගික කළමනාකරණය පිළිබිඹු කරයි. අරමුදල් පිරිවැය ප්‍රශස්ථ කිරීම සහ වත්කම් මත ප්‍රතිලාභ වැඩි කිරීම සඳහා වූ ප්‍රවේශය සමස්ථ මූල්‍ය ප්‍රතිඵල සැලකියයුතු ලෙස ශක්තිමත් කල අතර එහි වර්ධන උපාය මාර්ගයේ සහ මෙහෙයුම් විශිෂ්ඨත්වයේ ඵලදායිතාවය පෙන්වා දෙමින් මෙම ක්‍රියාමාර්ග බැංකුවට අභියෝගාත්මක ආර්ථික පරිසරයකදී ප්‍රත්‍යස්ථ ප්‍රතිඵල ලබාදීමට හැකිවිය. එමගින් එහි වර්ධන උපාය මාර්ගයේ සහ මෙහෙයුම් විශිෂ්ඨත්වයේ සාර්ථකත්වය පිළිබිඹු කරයි.

අනෙකුත් ආදායම්වල වර්ධනය ද බදු පසු ලාභය ඉහළ යෑමට දායකවූ අතර එය සාම්ප්‍රදායික පොලී ආදායමෙන් ඔබ්බට ශක්තිමත් ආදායම් උත්පාදනයක් පෙන්නුම් කරන අතර බැංකුවේ විවිධාංගිකරණයට සහ ප්‍රත්‍යස්ථ ආදායම් මාර්ග ඉස්මතු කරයි.

ජාතියට දායකත්වය

ජාතියේ පැරණිතම බැංකුව ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දිවයිනේ ප්‍රගතියට සහය දැක්වීම සඳහා කැපවීමෙන් කටයුතු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකරන ලද ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාත නිරන්තරයෙන් පවත්වාගෙන යෑමට අමතරව, බැංකුව විවිධ ක්‍රමවේදයන් හරහා ජාතික සංවර්ධනයට ක්‍රියාකාරීව දායකත්වය සපයයි. ජාතික රක්ෂණ භාර අරමුදලට නිතිපතා දායක මුදල් ගෙවීම සහ බදු බැඳීම් ඉටුකිරීම මෙයට ඇතුලත්වන අතර එමගින් ජාතියේ මූල්‍ය හා සමාජ රාමුව ශක්තිමත් කිරීම සඳහා කැපවූ ආයතනික පුරවැසියෙකු ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි කාර්යභාරය ශක්තිමත් කරයි.

2025 වර්ෂයේ දී පමණක් බැංකුව රජයට සැලකියයුතු දායකත්වයක් ලබාදුන් අතර වැට් බදු සහ සමාජ ආරක්ෂණ බද්ද ඇතුලු සමස්ථ බදු ලෙස රු. මිලියන 454 ක් ගෙවා ඇත. ජාතියේ ආර්ථික සංවර්ධනයේ හා ස්ථායිතාවයේ කොටස්කරුවකුගේ ප්‍රධාන භූමිකාව ශක්තිමත් කරමින් පුළුල් ප්‍රජාව හා කොටස්කරුවන් යන දෙකොට්ඨාශයටම මෙම මූල්‍ය දායකත්වයන් මගින් බැංකුවේ කැපවීම පෙන්වා දෙයි.

2025 වර්ෂයේ දී පමණක් බැංකුව රජයට සැලකියයුතු දායකත්වයක් ලබාදුන් අතර වැට් බදු සහ සමාජ ආරක්ෂණ බද්ද ඇතුලු සමස්ථ බදු ලෙස රු. මිලියන 454 ක් ගෙවා ඇත. ජාතියේ ආර්ථික සංවර්ධනයේ හා ස්ථායිතාවයේ කොටස්කරුවකුගේ ප්‍රධාන භූමිකාව ශක්තිමත් කරමින් පුළුල් ප්‍රජාව හා කොටස්කරුවන් යන දෙකොට්ඨාශයටම මෙම මූල්‍ය දායකත්වයන් මගින් බැංකුවේ කැපවීම පෙන්වා දෙයි.

විස්තරය	2025 රු. මිලියන
එකතුකල අගය මත බදු (VAT)	400
සමාජ ආරක්ෂණ බද්ද (SSCL)	54

මූල්‍ය තත්ත්ව විශ්ලේෂණය

වත්කම්

2025 වර්ෂයේ දී බැංකුවේ සමස්ථ වත්කම් 3% ක් ලෙස රු. මිලියන 57,360 ක් දක්වා වර්ධනය වී තිබූ අතර එය සැලසුම් සහගත හා තිරසාර වර්ධනය මගින් පිළිබිඹු කරයි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුනේ ණය කළඹේ සැලකියයුතු ප්‍රසාරනයක්වන අතර එය රු. බිලියන 3.2 ක් ලෙස හෙවත් 8% ලෙස ඉහල ගොස් තිබූ අතර බැංකුව විසින් ණය ලබාදීමේ ඉලක්ක සපුරාගැනීම අරමුණුකරගත් ඉලක්කගත ණය උපාය මාර්ග යක් ක්‍රියාත්මක කරන ලදී. මෙම උපායමාර්ගික ක්‍රියාමාර්ගය ලාභදායිත්වය වැඩි දියුණු කිරීමට සෘජුවම දායකවූවා පමණක් නොව වත්කම් ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමෙන් ශේෂ පත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත්කර තිබිනි. ණය ආයෝජන සහ අනෙකුත් ප්‍රතිලාභ සහිත වත්කම් හරහා වත්කම් වෙන්කිරීම ප්‍රවේසම් සහගතව ප්‍රශස්ත කිරීම මගින් බැංකුව එහි ආදායම් උත්පාදන ධාරිතාවය වැඩි දියුණු කර ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පවත්වාගෙන ගොස් තිරසාර අනාගත වර්ධනය හා ස්ථාවරත්වය සඳහා ස්ථාන ගතවී ඇත.

ණය ලබාදීම පුළුල් කිරීම සඳහා වන යහපත් ප්‍රවේශය, විචක්ෂණ ණය සුදුසුකම් පරීක්ෂාව සහ ඵලදායි අවදානම් කළමනාකරණය සමග බද්ධව වත්කම් වර්ධනය දිගුකාලීන මූල්‍ය වර්ධනයකට සහය වන බව තහවුරු කරන අතර එමගින් බැංකුවට වත්කම් ගුණාත්මකභාවය සහ සමස්ථ ස්ථායිතාවය සමග ලාභදායිත්වය සමතුලිත කිරීමට ඉඩ සලසයි.

ණය සහ අත්තිකාරම්

ආසන්න වශයෙන් 8% ක වර්ධනයක් පෙන්වමින් බැංකුවේ සමස්ථ ණය කළඹ 2024 වර්ෂයේ රු. මිලියන 45,042 ක් ලෙස තිබූ අතර එය රු. මිලියන 48,635 ක් දක්වා ඉහල ගොස් තිබිනි. අර්ථසාධක අරමුදල මත ඇති ණය ඉල්ලුම සහ ඉලක්කගත ණය දීමේ උපාය මාර්ග පිළිබිඹු කරමින් අර්ථසාධක අරමුදල මත ඇති ණය අංශයේ සැලකියයුතු වර්ධනයක් මගින් මෙම ප්‍රසාරනය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබීය. උකස් ණය රු. බිලියන 10,909 ක් ලෙස බොහෝ දුරට ස්ථාවරව පැවති අතර එය ඉකුත් වසරට වඩා 0.3% ක සුළු වැඩිවීමක් පෙන්වයි. එමගින් නිවාස මූල්‍ය ණය සඳහා ස්ථාවර ඉල්ලුමක් පෙන්වයි. කෙසේ වෙතත් පුද්ගල ණය රු. මිලියන 154,430 කින් (9%) අඩුවූ අතර දැඩි ණය තක්සේරුකරණ ප්‍රමිතීන් ඉහල අවදානම්වල ප්‍රවේසම් සහගත නිරාවරණය සහ වඩාත් සුරක්ෂිත ප්‍රමුඛතා අංශ ණය දීම කෙරෙහි උපාය මාර්ගික අවධානයත් යොමු කරයි. 2025 වසරේ දී ණය ලබාදීමේ පුද්ගලික සහ අනාරක්ෂිත ණය අංශවල විනය පවත්වා ගනිමින් උසස් තත්ත්වයේ ණය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටී.

නිශ්පාදන අනුව	2025 රු. මිලියන	2024 රු. මිලියන
උකස්	10,909	10,881
අර්ථසාධකඅරමුදල්	18,587	13,939
කාර්ය මණ්ඩල ණය	156	150
පුද්ගල ණය	16,125	17,669
වෙනත්	2,858	2,404
එකතුව	48,635	45,043


වගකීම්

ආසන්න වශයෙන් 26% ක සැලකියයුතු වර්ධනයක් පෙන්වමින් බැංකුවේ සමස්ථ වගකීම් 2024 වර්ෂයේ තිබූ රු. මිලියන 50,248 සිට රු. මිලියන 51,544 ක් දක්වා 2025 වර්ෂයේ දී වැඩිවී තිබිනි. පසුගිය වසර හා සැසඳීමේදී පාරිභෝගික තැම්පතු 1% ක් ලෙස ඉහලයෑම මූලික වශයෙන් මෙම වැඩිවීමට හේතුවී තිබිනි. ණය ලබාදීමේ අවශ්‍යතා සඳහා රැකුලක් ලෙස ඉලක්කගත ණය ලබාදීම් පිළිබිඹු කරමින් 2024 වසර හා සැසඳීමේදී අනෙකුත් ණය ගැනුම්කරුවන් සඳහා වූ වගකීම් දෙගුනවී තිබිනි. වර්ෂය තුල ඉහල ගිය ලාභදායිත්වය විදහා දක්වමින් 2024 වර්ෂයේ බදු වෙන් නොකිරීම හා සැසඳීමේදී 2025 වර්ෂයේ දී රු. මිලියන 193.6 ක ආදායම් බදු වගකීම් බැංකුව හඳුනාගෙන තිබිනි. පාරිභෝගික තැම්පතු මගින් ප්‍රධාන අරමුදල් පදනම නිර්මාණය කරමින් සමස්ථයක් ලෙස බැංකුවේ වගකීම් ව්‍යුහය හොඳින් විවිධාංගීකරණයවී ස්ථාවරව පැවතිනි. ණය ගැනීම් ප්‍රතිපාදන හා මෙහෙයුම් වගකීම් ඉතා හොඳින් කළමනාකරණය කිරීම ශේෂපත්‍ර ස්ථාවරත්වය, ද්‍රවශීලතාවය හා ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පවත්වා ගනිමින් සංවර්ධන මූලාරම්භයන් සඳහා අරමුදල් සැපයීමට බැංකුවට ඇති හැකියාව පෙන්වයි.

තැන්පතු පදනම

ඉතුරුම් තැන්පතු හා ස්ථාවර තැන්පත් ඇතුළත් මුළු තැන්පතු ප්‍රමාණය රු. බිලියන 48,857 ක් ලෙස පැවති අතර එය ඉකුත් වසරට සාපේක්ෂව 1.45% සැලකියයුතු වැඩිවීමක් පෙන්වයි. තැන්පතු පදනම තවමත් බොහෝ දුරට ස්ථාවර තැන්පතු මගින් මෙහෙයවනු ලබන අතර එය ඉකුත් වසරට වඩා 1.5% ක ඉහල යෑමක් සනිටුහන් කරයි. මෙමගින් විදහා දැක්වෙන්නේ බැංකුවේ ස්ථාවරත්වය සහ දිගුකාලීන අරමුදල් හැකියාවන් පිළිබඳ තැම්පත්කරුවන්ගේ අඛණ්ඩ විශ්වාසයයි. ඉතුරුම් තැන්පතු රු. මිලියන 385,865 ක් ලෙස සාපේක්ෂව ස්ථාවරව පැවතුන අතර එය 2024 වසරේ දී රු. මිලියන 384,147 සිට මද වැඩිවීමක් පෙන්නුම් කරයි. එය ස්ථාවර සිල්ලර ගනුදෙනුකරුවන්ගේ සහභාගිත්වය සහ අඩු පිරිවැය පහසුවෙන් ලබාගත හැකි අරමුදල්වල ස්ථාවර ගලා ඒමත් පිළිබිඹු කරයි. ස්ථාවර හා ඉතුරුම් තැන්පත්වල ශක්තිමත් මිශ්‍රණය බැංකුවට ස්ථාවර සහ විවිධාංගීකරණයවූ අරමුදල් පදනමක් සපයන අතර ණය වර්ධනයට, ද්‍රවශීලතා කළමනාකරණයට සහ සමස්ථ ශේෂ පත්‍ර ස්ථාවරත්වයට රැකුලක් වෙයි.

ලාභදායිත්වය



ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපත්‍රලාභී විශේෂිත රාජ්‍ය බැංකුවක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකර ඇති අවම සීමාවන්ට වඩා නියාමන ද්‍රවශීලතා අනුපාත පවත්වාගෙන යෑම අවශ්‍යවේ. 1988 අංක 30 දරණ බැංකු පනතේ 86 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද 2024 අංක 1 දරණ මහ බැංකු විධිවිධානයට අනුකූලව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 100% ක අවම ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් පවත්වාගෙන යෑමට බැඳී සිටියි. තවද 2016 අංක 1 දරණ මහ බැංකු විධිවිධානයේ නියමකර ඇති පරිදි බැංකුව අවම සීමාව වන 12.5% ඉක්මවන සමස්ථ ප්‍රාග්ධන අනුපාතයක් පවත්වාගත යුතු වෙයි.

බාසල් III ප්‍රමිතීන්ට අනුකලව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දින දර්ශන දින 30 ක ආතති තත්ත්වයට ඔරොත්තු දීම සඳහා ප්‍රමාණවත් බරක් නොමැති උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් සහතික කරන ලද ද්‍රවශීල ආවරණ අනුපාතයක් පවත්වා ගැනීමෙන් ද්‍රවශීලතා ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කරයි. 2025 වසර අවසානය වනවිට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ද්‍රවශීලතා ආවරණ අනුපාතය ශක්තිමත්ව 102% ක් ලෙස පැවති අතර එය අවම නියාමන අවශ්‍යතාවය වන 100% වඩා ඉහල අගයක පැවතිනි.

2025 වසරෙන් අවසන්වූ වසර සඳහා පිළිවෙලින් 24.32% හා 22.42% ක් ලෙස අධියර I සහ අධියර II ප්‍රාග්ධන අනුපාත ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අවශ්‍යතා අනුව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් වාර්තා කර තිබිනි. මෙම අගයන් අවම නියාමන අවශ්‍යතාවය වන 12.5% සැලකියයුතු ලෙස ඉක්මවා යන අතර කර්මාන්තයේ සාමාන්‍ය අගයන් වන 15.2% හ 18.5% ට වඩා ඉහල අගයක් ගන්නා අතර එය බැංකුවේ ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වය හා ඔරොත්තු දීමේ හැකියාව පෙන්වයි. මීට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති පරිදි ස්ථාවර අරමුදල් සඳහා ශක්තිමත් ප්‍රවේශයක් බැංකුව පවත්වාගෙන ගිය අතර ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය 2025 (NSFR) දෙසැම්බර් 31 වන විට 110% දක්වා ලඟාවී තිබූ අතර එය අවම අවශ්‍යතාවය වන 100% සැලකියයුතු ලෙස ඉක්මවා ගොස් තිබිනි. මෙම මිනුම් මගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නියාමන අනුකූලතාවය සහ විචක්ෂණශීලි ද්‍රවශීලතා කළමනාකරණය සඳහා ඇති නොසැලෙන කැපවීම පෙන්වයි. ජාතියේ මූල්‍ය ක්ෂේත්‍රයට සහය දැක්වීමේදී එහි මෙහෙයුම්වල ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කරයි.

නව මුලික බැංකුකරණ
පද්ධතියක් සාර්ථකව
ආරම්භ කිරීම
කාර්යක්ෂමතාවය,
පාරිභෝගික සේවාව සහ
ආදායම් උත්පාදනය
සැලකිය යුතු ලෙස වැඩි
දියුණුකර ඇත.



සභාපතිතුමාගේ පණිවුඩය



බැංකුවේ සාරධර්ම හා සැමට අවස්ථාව සලසන නැවත නැඟී සිටියහැකි අනාගතයක් ගොඩනැඟීම සඳහා එහි ඇති කැපවීමේ ප්‍රධාන බලවේගයක් ලෙස තිරසාරභාවය පවතී. මෙම ප්‍රගතියේ ප්‍රධාන ගාමක බලවේගයක්වූයේ 2024 වරෂයේ දී වැඩි දියුණු කරන ලද මුලික බැංකුකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමයි. එමගින් පාරිභෝගික සේවා සැපයීම සැලකියයුතු ලෙස වැඩි දියුණුවූ අතර තීරණාත්මක ව්‍යාපාර කටයුතු විධිමත් කරන ලදී.

මේ සමග බැංකුවේ සේවා ගුණාත්මකභාවය සහ සමස්ථ පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානයක් යොමුකර තිබිනි. ප්‍රවේශ පහසුකම් උදෙසා ශාඛා පරිශ්‍රයන් වැඩිදියුණුකර නැවත ස්ථානගත කිරීම, ගනුදෙනුකරුවන්ට හා පුළුල් ප්‍රජාවට ගනුදෙනු කිරීමේ ගැටළු අවම කිරීම, පහසුකම් ඉහල නැංවීම වෙනුවෙන් උපයෝගිතා බිල්පත් ගෙවීමේ පහසුකම් හඳුන්වාදීම ප්‍රධාන මූලාරම්භයන් අතරට ඇතුලත්වේ.

2025 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සාපේක්ෂව අඩු අවිනිශ්චිතතාවයන් සහිත සාමාන්‍ය දේශපාලන හා ආර්ථික වාතාවරණයක් තුල මම ඔබ වෙත ඉදිරිපත් කරමි. සත්‍ය ලෙසම දේශීය සාර්ව ආර්ථික පරිසරයෙහි ධනාත්මක වර්ධනය හේතුවෙන් මූල්‍ය අංශය වඩා යහපත් ලෙස ඔරොත්තු දීමේ හැකියාවන් අඛණ්ඩව පෙන්වූ වසරකි.

ගෝලීය පරිසරයෙහි පැතිරයන බලපෑම් සහ වෙළෙඳ බාධකවල සැලකියයුතු ඉහල යෑම හේතුවෙන් ගෝලීය වශයෙන් ඇති වර්ධනය පැහැදිලි ලෙස මන්දගාමී වෙමින් තිබිනි. ලෝක බැංකුව 2025 වසරේ දී වර්ධනය 2.3% දක්වා දුර්වලවනු ඇතැයි අපේක්ෂාකරන බවත් බොහෝ ආර්ථිකයන්හි පෙර වසරට සාපේක්ෂව පහත වැටීමක් ඇති බවත් ප්‍රකාශ කර තිබිනි. ගෝලීය වර්ධනය අපේක්ෂාකල ප්‍රමාණයට වඩා වැඩි අගයක් ගත් නමුත් එය 3.2% ක් ලෙස වාර්තාවීම ශුභවාදී බවක් නොපෙන්වයි. ඇත්ත වශයෙන්ම ඉදිරි වසර තුල යථා තත්ත්වයට පත්වීම මන්දගාමී ලෙස සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහල ආදායම, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය ශක්තිමත්කල අතර එහි ප්‍රථිඵලයක් ලෙස සීමිත සමස්ථ ඌනතාවයක් සහ ප්‍රාථමික අතිරික්තයක් පැවති අතර එය මූල්‍ය ස්ථාවරත්වයට ධනාත්මක ලෙස දායකවිය. ආනයනය ඉහල ගිය ද ශ්‍රී ලාකාවේ බාහිර අංශය ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගනිමින් ජංගම ගිණුම් අතිරික්තයක් පවත්වා ගැනීමට සමත්වී තිබිනි. ආර්ථික ක්‍රියාකාරකම්වල සහනශීලි මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රසාරණය සහ ශක්තිමත් ව්‍යාපාරික කටයුතු හේතුවෙන් දේශීය වශයෙන් ණය වර්ධනය ඉහල ගොස් තිබිනි. ණය තැන්පතු අනුපාතය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියක පවතින බව පෙන්නුම් කළ අතර බැංකු ණය ලබාදීම සඳහා වඩාත් සුදුසු තත්ත්වයට පත්වෙමින් වෙළෙඳපල පොලී අනුපාත පහල මට්ටම්වල ස්ථාවරව තිබූ අතර එය නැවතත් වලදායි මුදල් ප්‍රතිපත්තියේ දර්ශනයක් විය. එමගින් ආයෝජක විශ්වාසය වැඩි දියුණු කරන බවට සංඥා කරයි.

බැංකුකරණ ශක්තිමත්භාවයේ දර්ශකය සමාලෝචිත කාලය තුල ක්ෂේත්‍රයේ වැඩි දියුණුවූ කාර්ය සාධනයක් පෙන්නුම්කර ඇත. පුද්ගලික අංශයට ණය ලබාදීම වැඩිවී තිබූ බැවින් ණය වර්ධනය වේගවත්වූ අතර එය ණය සඳහා ඇති ශක්තිමත් ඉල්ලුම සහ ක්ෂේත්‍රය තුල වැඩි දියුණුවූ මෙහෙයුම් කාර්යසාධනය යන ද්විත්වයම පිළිබිඹු කරයි. මේ අතර වියහැකි ණය පාඩු අවම කිරීම සඳහා ණය අවදානමට එරෙහි ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සඳහාවූ ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස වත්කම් ගුණාත්මකභාවය ක්‍රමයෙන් වැඩි දියුණුවීමේ ලක්ෂණ ද පෙන්නුම්කර තිබිනි. මෙයට අමතරව සමාලෝචනයට භාජනයවූ වර්ෂයතුල මූල්‍ය ආයතනයන්හි වෙළෙඳපල ද්‍රවශීලතාවය, ලාභදායිත්වය හා ප්‍රාග්ධන ප්‍රමාණවත්බව වැඩි දියුණුවූ අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක මහ බැංකුව විසින් ගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වලදායි ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරයි. මේ අතර මූල්‍ය වෙළෙඳ ක්ෂේත්‍රය පසුගිය වසරට වඩා වැඩි දියුණුවීම් පෙන්වා ඇති අතර ගෘහස්ථ හා ආයතනික අංශයේ ශේෂපත්‍ර මත පීඩනයද ලිහිල්වී තිබිනි.

කෙටියෙන් ප්‍රකාශකල විට පෙර වසරෙහි පිරිමැසුම්දායක, ප්‍රවේශම් සහගත සහ අධිෂ්ඨානශීලි මූල්‍ය වතාවරණයක් පැවතිනි නම් 2025 වසරේ දී වඩා තීරණාත්මක පියවර ගත යුතුව තිබිනි. සෑම විටම ප්‍රවේශම් සහගතව කටයුතුකල බැංකුව ණය චක්‍රයේ ප්‍රසාරණයත් සමගම ඉදිරි පියවරක් තැබීමට සමත්ව තිබිනි.

පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා සුපරික්ෂාකාරී වීම.

ආර්ථික අර්බුදයේ වඩාත්ම අයහපත් කාලය ගෙවීගොස් ඇති බව බැංකුව හොඳින් වටහාගෙන ඇති නමුත් කොටස්හිමියන් ගනුදෙනුකරුවන් සහ සේවකයින් ඇතුලු සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම සඳහා වියහැකි ගෝලීය සහ දේශීය අවදානම් පිළිබඳව සුපරික්ෂාකාරීවිය.

විඳදරාගත් දුෂ්කරතාවලින් හොඳින් ඉගෙනගත් පාඩම් සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව සහ ක්‍රියාශීලි පාලන ව්‍යුහයන්ට අනුකූලව, බැංකුව වර්ධනය හා ස්ථාවරත්වය පවත්වාගෙන යෑමට ඇති කැපවීම යලිත් තහවුරුකර තිබිනි. 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය සමයේ සහ ඉන්පසුව ඇතිවූ අවිනිශ්චිතතාවයන් සහ අස්ථාවරත්වය අවම කිරීමේ දී පෙන්වූ ඔරොත්තු දීමේ හැකියාව සමගින් විශේෂයෙන් නව මූලික බැංකුකරණ පද්ධතියකට සංක්‍රමණය වීමේදී තීරණාත්මක මෙහෙයුම් කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව 2024 වර්ෂයේදී මධ්‍යස්ථ කාර්යසාධනයක් පෙන්වා ඇත.

කාර්ය සාධනය ලුහුඬින්

2025 වසරේ ප්‍රගතිය සැබැවින්ම කැපී පෙනුනේ උපාය මාර්ගික අරමුණු සහ අදාල ප්‍රතිපත්ති ගැලපීම් සලකා බැලීමේදී එමගින් කළඹ විවිධාංගීකරණය ඇතුළු අනාගත සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සැපයීම හේතුවෙනි. බදු පසු ලාභයේ ධනාත්මක පරිවර්තනයන් සහ වැඩි දියුණුකල ආන්තිකයන්, මූල්‍යමය තත්ත්වය යහපත් අතට හැරවීම විදහා දැක්වුවද 2025 වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පරිදි අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහලින් පැවති ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අනුපාත මගින් පෙන්නුම් කරන පරිදි බැංකුව නියාමන ශක්තිය දිගටම පවත්වාගත් බව සඳහන් කල යුතුවේ.

2024 වර්ෂයේ දී රු. මිලියන 32.0 ක්වූ බදු පසු ලාභය රු. මිලියන 362.0 ක් ලෙස වාර්තා කරමින් 2025 වසරේ දී බැංකුව කැපී පෙනෙන වර්ධනයක් ලබා තිබිනි. මෙම ශක්තිමත් කාර්යසාධනය මගින් බැංකුවේ මූලික බැංකු පද්ධති මෙහෙයුම් ශක්තිමත් කිරීම, වත්කම් ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, විනය ගරුක ලෙස ප්‍රාග්ධන කළමනාකරණය ද්‍රවශීලතාවය සහ මෙහෙයුම් පිරිවැය කළමනාකරණය සහ විචක්ෂණශීලි අරමුදල් උපාය මාර්ග අනුගමනය කිරීමෙහිලා බැංකුවේ සාර්ථකත්වය අවධාරණය කරයි.

පොලී පිරිවැයෙහි සැලකිය යුතු පහල බැසීම හේතුවෙන් ශුද්ධ පොලී ආදායම 47% ක් ලෙස වැඩිවී තිබිනි. 2024 වර්ෂයේදී රු.බිලියන 5.4 ක සිට 2025 වසරේදී රු. බිලියන 03 දක්වා පොලී වියදම් 28% ක් ලෙස අඩුවී තිබූ අතර එය වලදායී කළමනාකරණයක් සහ වසර පුරා බැංකුවේ තැන්පතු පදනමේ ප්‍රශස්ථකරණය විදහා දක්වයි. ප්‍රධාන සාධක කීපයක් හේතුවෙන් වසරතුල පොලී නොවන ආදායම ද සැලකියයුතු දියුණුවක් වාර්තාකර තිබිනි. ප්‍රධාන වශයෙන් නව මූලික බැංකුකරණ පද්ධතියක් හඳුන්වාදීමෙන් පසුව ක්‍රියාත්මක කරන ලද සංශෝධිත ගාස්තු හේතුවෙන් මනා පිරිවැය කළමනාකරණය සහ ආදායම් විවිධාංගීකරණයේ එළදායිතාවයට අමතරව, ගාස්තු හා කොමිස් ආදායම 120% ක් ලෙස වැඩිවී ඇත. මෙයට අමතරව මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම පෙර වසරට සාපේක්ෂව 61% ක් ලෙස පහත වැටී ඇත. ප්‍රධාන වශයෙන් ඒකක භාර ආයෝජනවල 73% ක අඩුවීමක් හේතුවෙන් ලාභාංශ ආදායම සහ විවිධ ආදායම යන ද්විත්වයෙහිම 55% ක වැඩිවීමක් මගින් මෙම පහත වැටීම අර්ධ වශයෙන් හිලවිකර ඇති අතර එය බැංකුවේ පොලී නොවන ආදායම් කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් කලේය.

ඉහත කරුණු සැලකිමේදී 2025 වර්ෂයේ දී බැංකුවේ මුළු මෙහෙයුම් ආදායම 37% ක් ලෙස රු. බිලියන 3.8 දක්වා වර්ධනය විය. තාක්ෂණය සහ මෙහෙයුම් වැඩි දියුණු කිරීම සඳහා බැංකුව ආයෝජන සිදුකිරීම ආරම්භකල විට පවා දැඩි පිරිවැය විනයක් පවත්වා ගෙන තිබිනි. එහි ප්‍රථිඵලයක් ලෙස

2025 වසරේ වැටි සහ සමාජ ආරක්ෂණ බදු වලට පෙර මෙහෙයුම් ලාභය 170% ක් ලෙස ඉහල ගොස් බිලියන 1.2 දක්වා වැඩිවිය. (2024 රු. මිලියන 436) එමගින් බැංකුව 2025 වසර සඳහා රු. මිලියන 362.0 ක බදු පසු ලාභයක් වාර්තා කර ඇත.

ශේෂපත්‍ර ස්ථාවරත්වය ආරක්ෂා කරමින් ව්‍යාපාර පරිමාවන් වර්ධනය කිරීමට බැංකුව සතු හැකියාව ණය වර්ධනය, ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමග සමපාතව පැවතීම හා දැඩි වගකීම් සහතික කිරීමේ ප්‍රතිඵල මගින් අනුබලයක් ලබාදීම මගින් පෙන්වා තිබිනි. 2025 වර්ෂයේදී බැංකුවේ මුළු වත්කම් 3% ක් ලෙස රු. බිලියන 57.4 ක් දක්වා වැඩිවී තිබිනි. ප්‍රධාන වශයෙන් ණය කළඹේ සැලකිය යුතු ප්‍රසාරණය හේතුවෙන් එය රු. බිලියන 3.6 ක් ලෙස ඉහල ගොස් තිබිනි. මෙය බැංකුව විසින් ණය දීමේ ඉලක්ක වෙත ලඟාවීම සඳහා සිදුකල ඉලක්කගත ණය දීමේ උපාය මාර්ග හරහා සිදුවී තිබිනි. දළ ණය කළඹ 2024 වර්ෂයේ දී රු. බිලියන 44.7 සිට රු. බිලියන 48.3 දක්වා වැඩිවූ අතර එය ආසන්න වශයෙන් 8% ක වර්ධනයක් නියෝජනය කරයි. ප්‍රධාන වශයෙන් අරථසාධක අරමුදල් ණය අංශයේ සැලකියයුතු වර්ධනය හේතුවෙන් එය 33% ක් ලෙස ඉහල ගොස් තිබිනි. උකස් ණය රු. මිලියන 10.017 ක් ලෙස ස්ථාවරව පැවති අතර එය පෙර වසරට වඩා 0.48ක සුළු වැඩිවීමක් පෙන්වා තිබිනි. පුද්ගල ණය රු. මිලියන 16,124.8 දක්වා අඩුවිය. (රු. මිලියන 1,544.3 හෝ 8.74%) මෙමගින් දැඩි ඇපකර ප්‍රමිතීන්, ඉහල අවදානම් සහිත අංශ සඳහා ප්‍රවේශම්සහගත ණය ලබාදීම සහ වඩාත් සුරක්ෂිත හා ප්‍රමුඛතා අංශයේ ණය ලබාදීම කෙරෙහි උපාය මාර්ගික අවධානයක් පිළිබිඹු වේ. මේ අනුව ණය ප්‍රදානය කිරීමේ උපාය මාර්ගය ඇත්ත වශයෙන්ම සමතුලිත හා ඉලක්කගතවූ අතර පුද්ගලික සහ අනාරක්ෂිත ණය අංශවල දැඩි විනයක් පවත්වා ගනිමින් උසස් තත්ත්වයේ ණය පිළිබඳ දැඩි අවධානයක් යොමුකර ඇත. 2025 වර්ෂය අවසානයේ බැංකු සමස්ථ හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 3,493.4 ක් ලෙස පවත්වාගෙන ගොස් තිබූ අතර එය 2024 වර්ෂය අවසානයේ රු. මිලියන 2,936.8 ක්වී තිබිනි.

ඉතුරුම් තැන්පතු සහ ස්ථාවර තැන්පතු ඇතුළුව මුළු තැන්පතු ප්‍රමාණය රු. බිලියන 48,856.8 ලෙස පැවති අතර එය ඉකුත් වසර හා සැසඳීමේදී 1.45 මධ්‍යස්ථ වැඩිවීමකි. තැන්පතු පදනම ස්ථාවර තැන්පතු මගින් අඛණ්ඩව මෙහෙයවනු ලබන අතර එය පෙර වසර හා සැසඳීමේදී 1.5% ක වර්ධනයක් පෙන්වයි. මෙමගින් පිළිබිඹු වන්නේ බැංකුවේ ස්ථාවරත්වය සහ දිගුකාලීන අරමුදල් සැපයීමේ හැකියාවන් කෙරෙහි තැන්පත්කරුවන්ගේ අඛණ්ඩ විශ්වාසයයි. ඉතුරුම් තැන්පතු (තැන්පතු යෝජනා ක්‍රම ඇතුළුව) රු. මිලියන 3,858.7 ක් ලෙස සාපේක්ෂව ස්ථාවරව පැවතුනු අතර එය ස්ථාවර සිල්ලර ගනුදෙනුකරුවන්ගේ සහභාගිත්වය සහ පහසුවෙන් ලබාගත හැකි අඩුවියදම් අරමුදල්වල ස්ථාවර ගලා ඒම පිළිබිඹු කරයි.

2025 වර්ෂය අවසන් වනවිට බැංකුවේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 102% ක් වැනි ශක්තිමත් මට්ටමක පැවති අතර එය ව්‍යවස්ථාපිත අවම අවශ්‍යතාවය වන 100% ඉක්මවා ගොස් තිබිනි. ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය අනුව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2025 වසරෙන් අවසන්වූ වර්ෂය සඳහා පිළිවෙලින් 24.3% සහ 22.4% ක ස්ථර I සහ 22.4% ක ස්ථර II ප්‍රාග්ධන අනුපාත වාර්තාකර තිබිනි. මෙම ප්‍රමාණයන් නියාමන අගය වන 12.5% සැලකියයුතු ලෙස ඉක්මවා ගොස් තිබූ අතර 15.2% සහ 18.5% ක කර්මාන්තයේ සාමාන්‍යයට වඩා ඉහල අගයක් ගන්නා අතර එය බැංකුවේ ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වය හා ඔරොත්තු දීමේ හැකියාව පෙන්වයි.

දිවයිනේ ප්‍රගමනයට සහය දැක්වීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දැඩි ලෙස කැපවී සිටියි. ශ්‍රී ලංකා මහ බැංකුව නියමකර ඇති පරිදි ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පවත්වා ගැනීමට අමතරව බැංකුව ජාතික රක්ෂණ භාර අරමුදලට අඛණ්ඩව දායකත්වය සපයමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස සහය දක්වමින් ජාතියේ මූල්‍ය හා සමාජීය කටයුතු ශක්තිමත් කිරීම සඳහා කැපවූ වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කරයි. 2025 වර්ෂයේ දී පමණක් බැංකුව රජයට සැලකියයුතු දායකත්වයක් සපයා තිබූ අතර බදු ලෙස එනම් වැටි සහ සමාජ ආරක්ෂණ බදු ලෙස රු. බිලියන 454 ක් ගෙවා තිබිනි.

පාලනය හා අවදානම් කළමනාකරණය තහවුරු කිරීම

අපගේ කොටස්කරුවන් අතර විශ්වාසය සහ අඛණ්ඩ බව ගොඩනැගීමේ දී වගවීම සහ විනිවිදභාවය යන ද්විත්වයම තහවුරු කරමින් ආයතනික පාලනයේ ඉහලම ප්‍රමිතීන් පවත්වාගෙන යෑමට බැංකුව කැපවී සිටියි. ව්‍යවස්ථාපිත අවශ්‍යතා ඇතුළුව ක්ෂේත්‍රයට විශේෂිතවූ ආයතනික පාලන ප්‍රමිතීන්ට බැංකුව පූර්ණ වශයෙන් අනුකූලවූ බව වාර්තා කිරීමට ලැබීම මා හට සතුටට කරුණකි.

ගෝලීය හොඳම භාවිතයන් සමග පූර්ණ අනුකූලතාවයක් ලබා ගැනීම සඳහා බැංකුව මෙම වසරේදීත් එහි පාලන රාමුව පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් සිදුකර තිබිනි. පෙර වසරේ මෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය අතර ශක්තිමත් සහ සමීප කටිකාවක් ගොඩනැගීමට අපි උත්සාහ කලෙමු.

ගෝලීය ආර්ථිකයේ සිදුවන අනපේක්ෂිත වර්ධනයන් සහ ඒවා නිතර සිදුවන අවස්ථාවලදී බැංකුව එහි අවදානම් කළමනාකරන ක්‍රියාමාර්ග හා ක්‍රියාවලි විධිමත්කර තිබිනි. තොරතුරු තාක්ෂණය හා සයිබර් ආරක්ෂාව යන අංශ දෙක සඳහාම අපි දැඩි සැලකිල්ලක් දක්වන අතර මූල්‍ය ආයතන හා නියාමකයින් සඳහා මෙම ද්විත්වයම බොහෝ සෙයින් අදාලවී පවතී.

තිරසාරත්වය සහ සේවා විශිෂ්ටත්වය සඳහා කැපවීම

යහපාලනය, වලදායි අවදානම් කළමනාකරණය සහ තිරසාර වටිනාකම් සඳහා යොමුවීමට ඇති කැපවීමට අමතරව බැංකුව පරිසර සමාජීය හා පාලන (ESG) සාධක ඒකාබද්ධ කිරීමට වැදගත්වන මෙහෙයුම් සලකා බැලීම හා දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සඳහා පදනමක් ලෙස සලකන අතර එවැනි සලකා බැලීම් සැලසුම් හා ක්‍රියාත්මක කිරීම් සඳහා ඇතුලත් කර ඇත. තිරසාරත්වය යනු බැංකුවේ මූලික වටිනාකම්වල ප්‍රධාන අංගයක් වන අතර සියල්ල ඇතුලත් සහ ඔරොත්තු දෙන අනාගතයක් ගොඩනැගීම සඳහා එහි කැපවීමේ ප්‍රථිඵලයක් ලෙස පාරිසරික සමාජීය සහ පාලන (ESG) සාධකවල අන්තර් සම්බන්ධතාවය බැංකුවේ මෙහෙයුම් වල අනිවාර්ය අංගයන් බව අපි අවධාරණයකර ඇත්තෙමු. තවද සියල්ලන්ටම බැංකුසේවා ලබාගත හැකි අවස්ථාවන් හා ඔරොත්තු දීමේ හැකියාව අපගේ

පාරිසරික සමාජීය මූලික පදනම ලෙස පවතී. අපගේ බලපෑම තවදුරටත් දිගුකාලීන හා වැඩි දියුණුකල තිරසාරභාවයට පහසුකම් සපයන ව්‍යුහයන් ශක්තිමත් කිරීමට අපි ඉක්මන් පියවර ගෙන ඇත්තෙමු.

සමාලෝචිත වර්ෂය තුලදී බැංකුව තිරසාර ප්‍රකෘතිමත්භාවය වෙනුවෙන් වලදායී ලෙස ගනුදෙනුකරුවන් හා පාර්ශවකරුවන් සමග සම්බන්ධතා ගොඩනගාගෙන තිබූ අතර දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂඥතාවය හා සම්පත් උපයෝගී කර ගනිමින් බැංකුවේ පාරිසරික හා සමාජීය අරමුණු සමග සමගාමී වර්ධනයක් ඇති කිරීම සඳහා අවධානය යොමුකල උපාය මාර්ගයන් අනුගමනය කරමින් තිරසාර අරමුදල්කරණය සඳහා ඇති කැපවීම තහවුරු කර තිබිනි.

බැංකුව පාර්ශවකරුවන්ගේ බලපෑමට අමතරව සේවා ගුණාත්මකභාවය ඉහල නැංවීම කෙරෙහිද අවධානය යොමුකර ඇත. ඒ අනුව සන්නාම පරිශ්‍රු වැඩි දියුණු කිරීම සහ නැවත ස්ථානගත කිරීම තුලින් පිවිසුම් හා පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කිරීමට පියවර ගන්නා ලදී. ගනුදෙනුකරුවන් හා අනෙකුත් අය සඳහා ගනුදෙනු කිරීමෙදී ඇතිවන තදබදය අඩු කිරීමෙන් පහසුකම් වැඩි දියුණු කිරීමට බැංකුව උපයෝගිතා බිල්පත් ගෙවීමද හඳුන්වාදී ඇත. එහි වෙබ් අඩවිය අවශ්‍ය ප්‍රමිතීන් සපුරාලීම හේතුවෙන් බැංකුවට Top Web.lk සම්මානය (2025 මැයි මාසයේ) ලැබීමෙන් මෙම උත්සාහයන් ඇගයීමට ලක්විය. බැංකුව කාර්යමණ්ඩල ඇගයීම සඳහා සහ 2025 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු සම්මාන උළෙල සඳහා ද කටයුතු ආරම්භකර ඇත.

ඉදිරි දැක්ම

මෙහෙයුම් සිදුකරගෙන යෑම සඳහා වඩාත් කාර්යක්ෂම සහ තිරසාර ක්‍රමවේදයන් හා නව්‍යකරණය සඳහා බැංකුව නිතරම හමුවන අභියෝගයන් අවස්ථාවන් ලෙස සලකයි. උගත් පාඩම් මගින් ශක්තිමත්වූ මූලික වටිනාකම් මත ස්ථිරව පදනම්වූ බැංකුව අවශ්‍ය වන්නේ නම් මාර්ගය නිවැරදි කිරීමට සුදානම්වනු ඇත. අරමුණක් හා අධිෂ්ඨානයක් සමග ඉදිරියට යන අතර අවිනිශ්චිතතාවයන්ගෙන් සලකුණුවූ ගතික පාරිසරික පවා තරග කිරීම හා ජයග්‍රහන ලබාගැනීමට උපාය මාර්ග අඛණ්ඩව නැවත සලකා බලමින් නව්‍ය ශක්තිය යොමු කරයි.

සාර්ව ආර්ථික අභියෝගයන් හා ක්ෂේත්‍රයේ ඉදිරි ගමන සඳහා පාර්ශවකරුවන්ගේ වටිනාකම් ඉහල නැංවීම පුළුල් ඩිජිටල්කරණය හා කලඹ විවිධාංගිකරණය මගින් අනාගත දියුණුව සඳහා වන වේදිකාව ශක්තිමත් කිරීමට බැංකුව අරමුණු කරයි. සේවා සැපයීම සහ මෙහෙයුම් කාරයක්ෂමතාව හා පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කිරීම සහ තාක්ෂණය මුසුවූ ඩිජිටල් පරිවර්තන විසඳුම් සඳහා බැංකුව අඛණ්ඩව ආයෝජන සිදුකරමින් යයි. මෙම මූලාරම්භයන් සත්‍ය වශයෙන්ම කෙටිකාලීන පිරිවැය ගැටළුවලට මග පාදන අතර මෙමගින් වැඩිදියුණුකල තරගකාරිත්වය හා කාර්යන් නිම කිරීමට ගතවන කාලය වැඩි දියුණු කල වර්ධන හැකියාවන් මගින් දිගුකාලීන ප්‍රතිලාභ ජනනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එලඹෙන වසරේදී බැංකුව සේවාවන් ඒකාබද්ධ කිරීම හා හවුල්කාරිත්වය තවදුරටත් දියුණු කිරීමට කටයුතු කරනු ඇති අතර නිදසුනක් වශයෙන් මහජන උපයෝගිතා ගෙවීම් පහසුකම් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග හඳුන්වාදීම දැක්විය හැකිවේ. ඔරොත්තුදීමේ හැකියාව ගොඩ නැගීම සඳහා මග පෙන්වන පාඩමක් ලෙස බැංකුව පාරිසරික සමාජීය හා පාලන (ESG) රාමුව ඒකාබද්ධ කිරීම සිදුකරනු ඇත.

දේශීයව අගය නිර්මාණය ශක්තිමත් කිරීම සඳහා මෙන්ම ව්‍යවසායකයින්ට සහය ලබාදෙමින් පුළුල් වූ ආර්ථික වර්ධනයක් ඇති කිරීමේ අරමුණින් රාජ්‍ය ප්‍රතිපත්ති හා බැංකුවේ නිත්‍යානුකූල බලය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ඉලක්කකරණය ලබාදීම් වැඩි කිරීම සිදුකිරීම, ණය ක්‍රියාවලි විධිමත් කිරීම සහ දත්ත මත පදනම්වූ තීරණ ගැනීම් මගින් පාරිභෝගික සහභාගිත්වය වැඩි කිරීමට හා ක්‍රියාවලි සැකසුම් කාලසීමාවන් අඩු කිරීමට බැංකුව ඉලක්ක කරයි. ශක්තිමත්වූ ලාභදායිත්වය, වැඩි දියුණුකල වත්කම් ගුණාත්මකභාවය, ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් හා නව්‍යකරණය, කාර්යක්ෂමතාවය, වඟකිවයුතු ණය ලබාදීම් කෙරෙහි පැහැදිලි උපාය මාර්ගික අවධානයක් යොමු කරමින් බැංකුව එහි වර්ධනය සඳහා යන ගමන්මග පවත්වා ගැනීමට සහ එහි පාර්ශවකරුවන්ට දිගුකාලීන වටිනාකමක් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට අර්ථවත් ලෙස දායකවීමට ස්ථානගතවී සිටියි.

අපගේ ව්‍යවස්ථාපිත නියෝග කෙරෙහි ඇති විශ්වාසය ස්ථිරවම පවතිනු ඇත. අපි කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර, ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර (MSME) සහ සමුපකාර ගනුදෙනුකරුවන්ට පමණක් නොව, වැඩි දියුණුකල වෙළඳපල ආවරණය සහ සුක්ෂම පිරිවැය කාර්යක්ෂමතාවයක් මගින් අපගේ බලපෑම වැඩිකර අපගේ ප්‍රවේශය පුළුල් කරන්නෙමු. එමගින් අපගේ සේවාදායකයින්ගේ වටිනාකම් එකතු කිරීම වැඩි දියුණු කිරීමට අපි නිරන්තර උත්සාහයක යෙදෙන්නෙමු.


අපි ඉදිරි වසර දෙස ශුභවාදීව බලා සිටිමු. නව තාක්ෂණය වැළඳ ගැනීම සහ නව ක්‍රමවේදයන් සොයා යෑමේදී පවා අපි සථාපිතකර ඇති ක්‍රියාවලීන්ට අඛණ්ඩ අනුගත වෙමු. අනාගත අභියෝග දුරු කිරීම සඳහා අපි වඩාත් ලිහිල් උපාය මාර්ග අනුගමනය කරන අතර අවස්ථාව මත පදනම්වූ අවදානම් තක්සේරු කිරීම් සිදුකරන්නෙමු. අපගේ ගමන්මග තවදුරටත් පුළුල් කිරීම සඳහා ආසන්න වෙළඳපලවල අවස්ථා ගවේෂණය කරන අතර ආයතනික හවුල්කාරිත්වයන් ඒකාබද්ධ කරන්නෙමු. බැංකුව අනාගතය දෙසට ගමන් කිරීමේ දී තිරසාර වර්ධනයන් සහ නව්‍යකරණය ස්ථාපිත කිරීමට හැකිවන පරිදි නවීන ක්‍රමවත් වර්ධනය වෙත (smart growth) අවධානය යොමු කරන්නෙමු. අවසාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හා මුදල් අමාත්‍යාංශයේ මග පෙන්වීම් යටතේ බැංකුව මෙම ප්‍රමුඛ රාජ්‍ය මූල්‍ය ආයතන දෙකට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වන හවුල්කාරිත්වයන් ගවේෂණය කිරීම සඳහා මහජන බැංකුව සමග සාකච්ඡා ඉදිරියටත් සිදුකරනු ඇත.

අපගේ කෘතඥතාවය පුද කිරීම

අප විසින් වැඩි දියුණුකර ඇති බොහෝ පිරිවැය වලදායී මූල්‍ය උපකරණ පිළිබඳ ඇගයීම් සිදුකල අපගේ ගනුදෙනුකරුවන් වෙත රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙනුවෙන් මම මාගේ ස්තුතිය පුදකරන අතර ඔවුන්ගේ දිගුකාලීන විශ්වාසය අපහට බොහෝ සෙයින් වැදගත්වේ. 2025 වර්ෂය තුලදී ලබාදුන් මග පෙන්වීම් මෙන්ම නොමසුරු සහයෝගය ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩලයට මම මාගේ කෘතඥතාවය පුදකරමි. අපහට ඉතා

වැදගත් මග පෙන්වීම් හා උපදෙස් ලබාදුන් මුදල් අමාත්‍යතුමා වෙත ද මාගේ ස්තුතිය ප්‍රකාශකර සිටිමි. මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය, මුදල් අමාත්‍යංශ ලේකම්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සහ උක්ත ආයතනවල නිලධාරීන්, නීතිපතිතුමා හා විගණකාධිපතිතුමා ඔවුන් ලබාදුන් උපරිම සහයෝගය, උපදෙස් හා සහාය ලබාදීම වෙනුවෙන් මම ඔවුන් වෙත මාගේ ස්තුතිය ප්‍රකාශ කරමින් අගය කරමි.

අපගේ සේවක මණ්ඩලය වර්ෂය පුරා අපේක්ෂිත ප්‍රතිඵල ලගාකර ගැනීමට වෙහෙස නොබලා කටයුතු කර ඇත. සෑම අවස්ථාවකම බැංකුව සියලුම සේවකයන්ට ඔවුන්ගේ කුසලතා වර්ධනය කරමින් උසස් වීමට, සමානාත්මක හා ප්‍රේරණාත්මක පරිසරයක් සැලසීමට කිසිවක් අඩු නොකරයි ඔවුන් සේවය කරන ආයතනයට ඔවුන් අයත් බව යන හැඟීම ඔවුන් තුල ජනිත කරවීමට අපට අවශ්‍යවී ඇත. මේ සඳහා විශිෂ්ඨත්වය කරා යන ගමනේදී අවශ්‍ය හොඳම දක්ෂතා ආකර්ෂණයකර ගැනීමට, පෝෂණය කිරීමට සහ රඳවා ගැනීමට බැංකුව ප්‍රයත්න දරා ඇත. කළමනාකරණ කණ්ඩායම සහ සත්‍ය ලෙස සෑම සේවකයෙකුටම ඔවුන්ගේ ශක්තිය මෙම පරිච්ඡේදවල ඔබ කියවන සංඛ්‍යා බවට පරිවර්තනය කිරීම වෙනුවෙන් මාගේ ඉමහත් කෘතඥතාවය පුදකිරීමට කැමැත්තෙමි.



විශ්වාසී
මහීල් පී කුරගම මහතා
සභාපති

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය



අපගේ උපාය මාර්ගය තිරසාර වර්ධනය, මෙහෙයුම් විශිෂ්ඨත්වය සහ නව්‍යකරණය දෙස අවධානය යොමු කිරීම නොකඩවා සිදුකරනු ඇත. පහසු ළඟාවීම සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ වැඩිවන අවශ්‍යතා සපුරාලීමට, අපගේ ඩිජිටල් හැකියාවන් ශක්තිමත් කිරීම ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇත. එසේම අපගේ ප්‍රවේශය පුළුල් කරමින් ජාතික සංවර්ධනය සඳහා අපගේ දායකත්වය වැඩිකිරීමට අපි අපේක්ෂා කරමු.

මූල්‍ය පද්ධතිය අබණ්ඩව ශක්තිමත් වෙමින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ වැදගත් ඉදිරි පියවරක් 2025 වර්ෂයේදී සනිටුහන් කර තිබිණි. පෙර නොවූ විරූ ආර්ථික පසුගාමීත්වයකින් පසු යහපත් ප්‍රතිපත්ති පියවර සහ සාමූහික උත්සාහයන් තුළින් තිරසාරත්වය නැවත ගොඩනැඟීමට ජාතික වශයෙන් ආරම්භයක් ලබාදී ඇත. මෙම පරිසරය තුළ ආර්ථික පුනර්ජීවනයට සහාය දැක්වීම, විශ්වාසය තහවුරු කිරීම සහ තිරසර වර්ධනයක් ඇති කිරීම සඳහා මූල්‍ය ආයතනයන්ට වැදගත් කාර්යභාරයක් පැවරී ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ඒකාබද්ධතාවයේ, ඔරොත්තු දීමේ හැකියාවේ සහ නව ගම්‍යතාවයක කාලපරිච්ඡේදයක් උදාකර තිබිණි. පැහැදිලි උපාය මාර්ගික යොමුවීමක් සහ අපගේ ජනතාවගේ කැපවීමෙන් ලබාදී තිබූ සහයෝගය පෙරදැරි කරගෙන බැංකුව එහි මෙහෙයුම් පදනම් ශක්තිමත් කර ගනිමින්, යථා තත්ත්වයට පත්වන ආර්ථිකයක නැඟී එන අවස්ථා ග්‍රහණය කර ගැනීම සඳහා ස්ථානගත වී තිබිණි. එම නිසා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මා ඉදිරිපත් කරන්නේ, විශ්වාසයෙන් මෙන්ම සුබවාදී හැඟීමෙන් යුතුවය.

සමාලෝචිත වර්ෂය තුළදී පවතින ගෝලීය අවිනිශ්චිතතාවයන් හමුවේ වුවද, දේශීය ආර්ථිකය ස්ථාවර වීම ආරම්භ වී තිබිණි. වැඩිදියුණු වූ ව්‍යාපාරික මානසිකත්වය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ සහයෝගාත්මක මූල්‍ය තත්ත්වයන් මූල්‍ය ආයතන සඳහා වඩාත් හිතකර මෙහෙයුම් පරිසරයකට දායක වී තිබිණි.

අඩු සහ වඩාත් ස්ථාවර පොළී අනුපාත ගෘහස්ථව සහ ව්‍යාපාර මත පීඩනය ලිහිල් කර තිබූ අතර, මූල්‍ය වැඩිදියුණු කිරීම් සහ ජාතික ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රගතිය සමස්ත මූල්‍ය පද්ධති ස්ථායීතාවය ශක්තිමත් කර තිබිණි.

මෙම ප්‍රවණතාවයන් යටතේ ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය ඔරොත්තු දීමේ හැකියාව ප්‍රකට කර ඇත. තවමත් අභියෝග පවතින අතර, සුපරීක්ෂාකාරීත්වය අවශ්‍ය වුවද, සමස්ත දිසාවම දිරිමත් කිරීම සහ මූල්‍ය ආයතනවල ගම්‍යතාවය විශ්වාසය නැවත ඇති කිරීම සඳහා ශක්තිමත් වේදිකාවක් සපයා ඇත. මෙම තත්ත්වය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සිය මෙහෙයුම් පදනම සහ උපාය මාර්ගික අවධානය ශක්තිමත් කිරීම අබණ්ඩව සිදුකර තිබිණි. වර්ෂය තුළ අපගේ ප්‍රමුඛතා කේන්ද්‍රගත වූයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම, මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ ඉදිරි වසරවල තිරසාර වර්ධනයක් සඳහා බැංකුව ස්ථානගත කිරීම කෙරෙහිය.

වර්ෂය තුළ අපගේ අරමුදල්ව්‍යුහය සහ තැන්පතු පදනම අබණ්ඩව උපරිම තත්ත්වයට ගෙන ඒම සිදුකළ ප්‍රධාන ක්‍රියාමාර්ගයන්ගෙන් එකක් විය. ක්‍රමයෙන් වඩාත් විවිධාංගීකරණය වූ සිල්ලර තැන්පතු කලඹක් වෙත මාරු වීමෙන් බැංකුව එහි ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කිරීම සිදුකරන අතර, ඉහළ පිරිවැයක් සහිත අරමුදල් ප්‍රභවයන් මත සැපයීම අවම කිරීමට හැකිවී තිබිණි. ඒ සමගම මූල්‍ය අන්තර්ග්‍රහණය සඳහා අපගේ කැපවීම ශක්තිමත් කරමින් කාන්තාවන්, ළමුන් සහ සමාජ ආධාර වැඩසටහන්වල ප්‍රතිලාභීන් ඇතුළුව ප්‍රජාවේ අඩු පහසුකම් සහිත කොටස් වෙත අපි අපගේ ප්‍රවේශය පුළුල් කළෙමු.

මෑත වසරවලදී ක්‍රියාත්මක කරන ලද මෙහෙයුම් වැඩිදියුණු කිරීමද සතුටුදායක ප්‍රතිඵල ලබා ගෙන ඇත. වැඩිදියුණු කරන ලද කේන්ද්‍රීය බැංකුකරණ පද්ධතිය 2024 වර්ෂයේ අග භාගයේ හඳුන්වාදී තිබූ අතර, එමඟින් කාර්යක්ෂමතාවය, අභ්‍යන්තර ක්‍රියාවලි ශක්තිමත් කිරීම සහ සමස්ත පාරිභෝගික අත්දැකීම් සැලකිය යුතු ලෙස වර්ධනය කර තිබිණි. තාක්ෂණය සඳහා ආයෝජනය අපගේ දිගුකාලීන උපාය මාර්ගයේ කේන්ද්‍රය ලෙස පවතින අතර, වැඩිවන පාරිභෝගික අපේක්ෂාවන්ට සහ වේගයෙන් වෙනස් වන මූල්‍ය වටපිටාවට වඩාත් ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට බැංකුවට හැකියාව ලබා දෙයි.

විශේෂිත සංවර්ධන කේන්ද්‍රීය මූල්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි ණය ලබාදීමේ කටයුතු ජාතික ප්‍රමුඛතා සමඟ පෙළගස්වා ඇත. නිවාස මූල්‍ය සැපයීම අපගේ ප්‍රධාන පරමාර්ථය වන අතර, වර්ෂය තුළ එහි ණය ලබාදීමේ විවිධාංගීකරණය කිරීමට තවදුරටත් වගබලාගෙන ඇත. එය පුළුල් ආර්ථික කටයුතු සඳහා පිටුවහලක් වී ඇත. අපි කුඩා හා මධ්‍ය පරිමාණ අංශයට සහාය වීම පුළුල් කළ අතර, පොල් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු පුනර්ජනනීය බලශක්ති භාවිතය, ධීවර කර්මාන්තය සහ අගය එකතු කළ කෘෂිකාර්මික අංශ වැනි කේෂ්ත්‍රවල නව මූල්‍යකරණ ආරම්භයන් අපගේ බලපෑම පුළුල් කිරීම පමණක් නොව, අපගේ ණය කළඹ තුළ සංකේන්ද්‍ර අවදානම අඩු කිරීමට දායක වෙයි.

වර්ෂය තුළ බැංකුවේ මෙහෙයුම් කාර්ය සාධනයේ ස්ථීර වර්ධනය අපගේ උපාය මාර්ගික දිසාවේ සවලතාවය සහ අප කණ්ඩායමේ කැපවීම විදහා දක්වයි. ශක්තිමත් කරන ලද ලාභදායීත්වය, වැඩිදියුණු කළ වත්කම් ගුණාත්මකභාවය සහ ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වය හේතුවෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට යහපත් මූල්‍ය විනයක් පවත්වා ගනිමින් විශ්වාසදායක සහ වගකිව යුතු මූල්‍ය ආයතනයක් ලෙස එහි කාර්යභාරය ශක්තිමත් කිරීමට හැකිවී ඇත.

ඉදිරිය බැලීමේදී අපගේ උපාය මාර්ගික තිරසර වර්ධනය, මෙහෙයුම් විශිෂ්ඨත්වය සහ නව්‍යකරණය දෙස අවධානය යොමු කරනු ඇත. ප්‍රවේශය වැඩිදියුණු කිරීම, සේවා සැපයීම ඉහළ නැංවීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ වැඩිවන අවශ්‍යතා සපුරාලීමට අප උත්සාහවන්ත වන විට, අපගේ ඩිජිටල් හැකියාවන් ශක්තිමත් කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇත.


ඒ සමඟම ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ ප්‍රවේශමි සහගත සම්පත් කළමනාකරණය මඟින් වැඩිදියුණු කිරීම් සහ පිරිවැය ප්‍රශස්තකරණය අපි නොකඩවා සිදුකරමින් යන්නෙමු. මෙම උත්සාහයන් ඵලදායීතාවය තවදුරටත් ශක්තිමත් කිරීමට උපකාරී වන අතර, තරඟකාරී පරිසරයක් තුළ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව පවතින බව සහතික කරයි.

තිරසාරත්වය අපගේ දිගුකාලීන දැක්මේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස ද පවතී. වගකිව යුතු ණය ලබාදීමේ පිළිවෙත්, පාරිසරික වශයෙන් වගකිව යුතු ව්‍යාපෘති සඳහා සහයෝගය දැක්වීම මෙන්ම, තිරසාර මූල්‍ය කටයුතු ආරම්භ කිරීම මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මූල්‍ය කාර්ය සාධනය සමාජයීය හා පාරිසරික වගකීම් සමඟ සමතුලිත කිරීම තවදුරටත් සිදුකරනු ඇත.

වෙළෙඳ පොළ ප්‍රවේශය පුළුල් කිරීම සහ විවිධාංගීකරණය අපගේ අනාගත වර්ධන උපාය මාර්ගයේ වැදගත් කොටසක් ලෙස පවතිනු ඇත. හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම, නව අවස්ථා හඳුනා ගැනීම සහ අපගේ ආයතනික ශක්තීන් උපයෝගී කර ගැනීම මඟින් අපගේ ප්‍රවේශය පුළුල් කිරීම සහ ජාතික සංවර්ධනයට අපගේ දායකත්වය වැඩි කිරීම අපගේ අරමුණයි. අනාගතය දෙස බලන විට ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික ප්‍රගමනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන විශේෂිත මූල්‍ය ආයතනයක් ලෙස එහි කාර්යභාරය ශක්තිමත් කිරීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දැඩි කැපවීමකින් කටයුතු කරයි. යහපත් පාලනයක් පවත්වා ගැනීමෙන්, නව්‍යකරණය සිදුකිරීම සහ අපගේ පාරිභෝගික සම්බන්ධතා වැඩි කිරීමෙන් සියලුම කොටස්කරුවන්ට දිගුකාලීන වටිනාකමක් ලබාදිය හැකි ශක්තිමත් ආයතනයක් අපි ගොඩනඟන්නෙමු.

බොහෝ පුද්ගලයන් හා ආයතනවල සහයෝගය හා කැපවීම නොලැබිණි නම්, වර්ෂය තුළ ලබාගත් කිසිඳු ප්‍රගතියක් වෙත ළඟාවිය නොහැකිව තිබිණි. අපගේ සභාපතිතුමා වන මහීල් කුරගම මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන් ලබාදුන් නායකත්වය හා මඟපෙන්වීම් වෙනුවෙන් මම මාගේ කෘතඥතාවය පුදකර සිටිමි. එසේම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කෙරෙහි අඛණ්ඩ විශ්වාසය දැක්වූ අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට හා හවුල්කරුවන්ට ද මාගේ ස්තුතිය පුදකර සිටිමි.

අපගේ නියාමන ආයතනවල මඟපෙන්වීම් සහ අධීක්ෂණය වෙනුවෙන් සහ අපගේ කොටස්කරු ලෙස ශ්‍රී ලංකා රජයට අප වෙත දක්වන ලද සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පළකර සිටිමි. මෙම සියලුම කාර්යයන්ටත් වඩා බැංකුවේ ඉදිරි ගමන සඳහා අඛණ්ඩව කටයුතු කරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු කණ්ඩායමේ කැපවීම හා වෘත්තීයභාවය මම අගය කරමි. ඒ සමඟම ශ්‍රී ලංකාවේ තිරසර වර්ධනයට සහ සියල්ල ඇතුළත්ව වර්ධනය ළඟා කර ගැනීමට දායක වීම විශ්වාසදායක මූල්‍ය හවුල්කරුවෙකු ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි තත්ත්වය ශක්තිමත් කිරීමට අපි කටයුතු කරන්නෙමු.



තුෂාර අසුරමාන්න
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට අසුන් ගෙන:

අතුල සී. ගමගේ මහතා, මහීල් පී. කුරගම මහතා, ජේ. නිශාන්ත වීරකෝන් මහතා, රෝහණ එල්. වික්‍රමසිංහ මහතා

වමේ සිට නැගී සිටිමින්:

එම්. එම්. ජබීර් කාදර් මහතා, කේ. එම්. ජානක ආර්. අබේසිංහ මහතා, ආචාර්ය බී. සන්පික එස්. පෙරේරා, ටිරෝන් ඒ. ජේ. එල්. ගෝමිස් මහතා, එච්. එම්. ආනන්ද සෙනෙවිරත්න මහතා, අරුණ පී කුරුඹලාපිටිය මහතා, අරුණ පී. රණසිංහ මහතා



මහීල් පී. කුරගම මහතා



ජේ. නිශාන්ත වීරකෝන් මහතා



අරුණ පී. රණසිංහ මහතා



අතුල සී. ගමගේ මහතා



ටිරෝන් ඒ. ජේ. එල්. ගෝමිස් මහතා



රෝහණ එල්. වික්‍රමසිංහ මහතා



කේ. එම්. ජානක ආර්. අබේසිංහ මහතා



එච්. එම්. ආනන්ද සෙනෙවිරත්න මහතා



එම්. එම්. ජබීර් කාදර් මහතා



අරුණ පී කුරුඹලාපිටිය මහතා



ආචාර්ය බී. සන්පික එස්. පෙරේරා

අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ

මහීල් පී. කුරගම මහතා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂක

2025 ඔක්තෝබර් මස 04 දින මහීල් පී කුරගම මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සභාපතිවරයා ලෙස පත්කර තිබිනි. බැංකු අංශයේ ආදර්ශමත් සේවාවක් සහ මූල්‍ය හා බැංකුකරණ කටයුතු පිළිබඳ වසර 32 ක පුළුල් පලපුරුද්දක් ලබා ඇති කුරගම මහතා කීර්තිමත් මූල්‍ය ප්‍රවීණයෙකි. සභාපතිවරයා ලෙස ඔහුගේ පත්වීමත් සමඟ නායකත්වය, උපායමාර්ගික සැලසුම් සහ මූල්‍ය කළමනාකරණය වැනි කරුණු පිළිබඳ පුළුල් දැනුම සිය තනතුරෙහි වැඩ කටයුතු කරගෙන යෑම සඳහා උපකාරවෙයි.

කුරගම මහතා ඔහුගේ සේවා කාලය තුළ ශාඛා මෙහෙයුම්, පරිපාලනය සහ අභ්‍යන්තර විගණන යන අංශවල විවිධ තනතුරු උසුලා ඔහුගේ බහුශ්‍රැතභාවය හා විශේෂඥතාවය පෙන්වා ඇත. ප්‍රථමයෙන්ම ඔහු සම්පත් බැංකුවේ සේවය කළ අතර එහිදී ආයතනික කළමනාකරන කණ්ඩායමේ හා බැංකුවේ තාක්ෂණ උපදේශන කණ්ඩායමේ සාමාජිකත්වය දරා ඇත. උපාය මාර්ගික තීරණ ගැනීම, නවෝත්පාදන සඳහා අදහස් සහ මෙහෙයුම් විශිෂ්ඨතාවය තහවුරු කිරීම, පිළිබඳව ඔහුගේ දායකත්වය ඉතා වැදගත් විය. ඔහුගේ සේවා කාලය තුළ විශිෂ්ඨ නායකත්ව ලක්ෂණ හා කළමනාකරණ කුසලතා පෙන්වා තිබූ අතර එමඟින් ඔහු සේවය කල ආයතනයේ නව්‍යකරණය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට හේතු වී තිබිණි. බැංකු ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වය හා ගැඹුරු අත්දැකීම් සඳහා ඔහු සතුවූ කැපවීම හා ආයතනික ඉලක්ක වෙත ළඟාවීමට සහ වර්ධනය ඇති කිරීමට කැපවූ ඉහළ පෙලේ වෘතිකයෙක් ලෙස ප්‍රසිද්ධියක් ලබාගෙන තිබිණි.

ඔහුගේ වෘතියමය දියුණුවට සිංගප්පූරුවේ ජාතික සරසවියේ (NUS) ව්‍යාපාරික පාසලේ සාමාන්‍ය කළමනාකරණය සඳහා වන විධායක සංවර්ධන වැඩ සටහන් (Executive Development Programs) සහ හාවඩ් ව්‍යාපාරික පාසලේ Leading Change and Organizational Renewal වැනි අඟනා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමෙන් ඔහු ඔහුගේ වෘතිය දියුණුව ලඟාකර ගෙන ඇත.

මීට අමතරව කුරගම මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයකු වන අතර වෘතිය සංවර්ධනය හා කර්මාන්ත ප්‍රමිති වැනි අංශ කෙරෙහි ඔහුගේ සහභාගිත්වය තවදුරටත් ප්‍රකටව පෙනෙයි.

ජේ. නිශාන්ත වීරකෝන් මහතා ජ්‍යේෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂක

නිශාන්ත වීරකෝන් මහතා දේශීය හා අන්තර්ජාතික වශයෙන් ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය සහ ආයතනික නායකත්වය පිළිබඳ දශක තුනකට අධික පළපුරුද්දක් ලබා ඇති ජ්‍යේෂ්ඨ මූල්‍ය වෘතිකයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ (එක්සත් රාජධානිය) සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි.

වීරකෝන් මහතා දැනට මහවැලි රිසර්ච් හොටෙල් පී එල් සී හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.

ඔහු මීට පෙර ඒ සී එල් කේබල් පී එල් සී හි සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී, ආර්.සී වන මනුබායි සමූහ සමාගමේ (ෆිපි දුපත්) සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී, සී අයි සී හෝල්ඩින්ස් පී එල් සී හි සමූහ මූල්‍ය අධ්‍යක්ෂ සහ මොබිටෙල් (පුද්ගලික) සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ඇතුළු ප්‍රධාන විධායක නායකත්ව තනතුරු කීපයක් දරා ඇත. ඔහුගේ වෘතිය ජීවිතයේ මුල් කාල වකවානුව තුළ ඔහු ඊ.ටී.ඒ. ලංකා (පුද්ගලික) සමාගම, සුප්‍රීම් ෆුඩ්ස් සමාගම (KSA)Nutrena (පුද්ගලික) සමාගම (CIC Feeds), ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක් පී එල් සී ජ්‍යේෂ්ඨ භූමිකාවන් හරහා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ලබාගෙන තිබූ අතර KPMG ශ්‍රී ලංකා හි විගණන අභ්‍යාසලාභියෙකු ලෙස කටයුතුකර ඇත.

අරුණ පී. රණසිංහ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක

අරුණ පී රණසිංහ මහතා 2025 ජනවාරි 22 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස පත්කර ඇත. වසර 20 ට අධික කාලයක් ඉක්මවා ඇති ඔහුගේ වෘතිය ජීවිතය මෙහෙයුම් අවදානම්, කළමනාකරණය, විගණනය හා මූල්‍ය සේවා පිළිබඳ ඔහුගේ ගැඹුරු ප්‍රවීනත්වය පිළිබිඹු කරමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට අගනා වත්කමක් බවට පත්වී ඇත.

අමෙරිකා එක්සත් ජනපදයේ ඇමරිකන් සිටි සරසවියෙන් සාමාන්‍ය ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන උපාධියක් රණසිංහ මහතා ලබාගෙන ඇත. මීට අමතරව ඔහු පහත සඳහන් සුදුසුකම් ලබා ඇත. ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාවක්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයෙන් භාණ්ඩාගාර හා විදේශ විණිමය මෙහෙයුම් පිළිබඳ සහතික පත්‍රයක් ද ලබාගෙන ඇත. එක්සත් රාජධානියේ අවදානම් කළමනාකරණය පිළිබඳ විශේෂතාවයක් උසුලන සුරැකුම්පත් හා ආයෝජන පිළිබඳ වරලත් ආයතනයෙන් මූල්‍ය ආයතනයන්හි මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ සහතිකයක්ද ඔහුගේ වෘතිය සුදුසුකම් අතර වෙයි.

රණසිංහ මහතා ඔහු දැනට දරණ තනතුරට පෙර ප්‍රසිද්ධ මූල්‍ය ආයතන ගණනාවකම ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු උසුලා ඇත. ඒ අතරට සවුදි අරාබියේ රියාද් නුවර සවුදි බ්‍රිටිෂ් බැංකුවේ ජේෂ්ඨ කලමනාකරු මෙහෙයුම් අවදානම් (අධීක්ෂණ), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර), සේලාන් බැංකුව, සවුදි අරාබියේ

රියාද් නුවර සවුදි හොලන්ඩි (Hollandi) බැංකුවේ වෙළෙඳ නිෂ්පාදන සංවර්ධන ප්‍රධානී, මහජන බැංකුවේ වෙළෙඳ සේවා හා ආයතනික ශාඛාවේ ප්‍රධානී ලෙස සේවය කර ඇත. මීට අමතරව සවුදි අරාබියේ රියාද් නුවර ප්‍රොටිවිටි (Protiviti) කළමනාකරණ උපදේශන සේවයේ සවුදි බ්‍රිටිශ් බැංකුවේ විගණන කණ්ඩායමේ ආරාධිත විගණකවරයකු ලෙස සේවය කරන අතරතුර විශේෂ පැවරුම් හා උපදේශනය පිළිබඳ කටයුතු බාරවද ක්‍රියාකර තිබිනි. සවුදි ෆ්‍රැන්සි බැංකුවේ (Fransi Bank) මෙහෙයුම් කළමනාකරණය සඳහා උපදේශනය හා තාක්ෂණ දැනුම ද ලබා දී ඇත.

රණසිංහ මහතා දැනට වෘතිය හා ජාත්‍යන්තර අධ්‍යයන කටයුතු පිළිබඳ විද්‍යායතනයේ (The Academy for Professional and International Studies (Pvt) Ltd) අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරන අතර 2019 පෙබරවාරි 08 දින ඒ සඳහා පත්වීම ලබා තිබිනි. පරිපාලනය, දේශන පැවැත්වීම හා අධ්‍යාපන නායකත්වය ඔහුගේ කාර්යභාරයට ඇතුලත් වෙයි.

අරුණ පී රණසිංහ මහතා ශ්‍රී ලංකාවේ හා සවුදි අරාබියේ ප්‍රධාන නායකත්ව තනතුරු උසුලා මූල්‍ය, අවදානම් කළමනාකරණ සහ බැංකු මෙහෙයුම් කටයුතු පිළිබඳ විශාල පලපුරුද්දක් සහිත දක්ෂ වෘතීය වේදියෙකි. ඔහුගේ පුළුල් විශේෂඥතාවය අවදානම් කළමනාකරණය, මෙහෙයුම් අධීක්ෂණය සහ උපායමාර්ගික බැංකුකරණ කටයුතු වන අතර එහි ප්‍රවීපලයක් ලෙස ඔහු සතුව මෙහෙයුම් අවදානම් සහ මූල්‍ය පද්ධති පිළිබඳ ගැඹුරු අත්දැකීමක් ඔහු දැනට උසුලන තනතුර වන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ තනතුරේ කාර්යභාරයට එකතු කරයි.

අතුල සී. ගමගේ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක

2025 ජනවාරි 22 දින සිට බලපැවැත්වෙන පරිදි අතුල සී ගමගේ මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර ඇත.

බැංකු මෙහෙයුම් කටයුතු ණය කළමනාකරණය සහ සිල්ලර ණය යන ක්ෂේත්‍ර වල බැංකු අංශයේ වසර 25 ට අධික අඟනා පලපුරුද්දක් ඔහු ලබා ඇත. කැලණිය සරසවියෙන් භෞතික විද්‍යාව සඳහා විද්‍යාවේදී උපාධියත් ව්‍යාපාර පරිපාලනය සහ කළමනාකරණය සඳහා ව්‍යාපාර පරිපාලනවේදී උපාධියත් එම විශ්ව විද්‍යාලයෙන්ම ලබාගෙන ඇත. මීට අමතරව ඔහු ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයෙන් ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කටයුතු පිළිබඳව විභාගයේ මධ්‍ය පරීක්ෂණය සමත්වී ඇත.

ගමගේ මහතාගේ බැංකු කටයුතු ආශ්‍රිත පුළුල් වෘතිය ජීවිතය ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ජේෂ්ඨ තනතුරු ගණනාවක් පුරා පැතිර තිබූ අතර එහිදී ඔහු විවිධ ණය කළමනාකරණ කටයුතු හා බැංකු කාර්යයන් හරහා බැංකුවේ වර්ධනයට හා සාර්ථකත්වයට දායකත්වයක් ලබා දී තිබිනි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ණය, සහකාර සාමාන්‍යාධිකාරී ණය සහ අයකර ගැනීම් අංශ, සහකාර සාමාන්‍යාධිකාරී ශාඛා ණය සහ සහකාර සාමාන්‍යාධිකාරී ශාඛා කළමනාකරණ අංශය ඔහු පෙර ඉසිලූ තනතුරු අතර වෙයි.

සිල්ලර බැංකුකරණයේ, ණය කළමනාකරණයේ සහ උපායමාර්ගික අධීක්ෂණයන්ගේ ශක්තිමත් අඩිතාලමක් සහිත ගමගේ මහතාගේ ගැඹුරු විශේෂඥතාවය අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇත. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඔහුගේ නායකත්ව පලපුරුද්ද විශේෂයෙන්ම ණය කටයුතු අධීක්ෂණය මගින් ඔහු රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වටිනා වත්කමක් ලෙස ස්ථානගත වී ඇත.

ටිරෝන් ඒ. ජේ. එල්. ගෝමිස් මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක

2025 ජනවාරි 22 දින ටිරෝන් ගෝමිස් මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර තිබිණි.

බැංකු ක්ෂේත්‍රයේ වසර 32 ට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇති ගෝමිස් මහතා බැංකු මෙහෙයුම් ශාඛා කළමනාකරණය සහ කළමනාකරණය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබාගෙන ඇත. මෙහෙයුම් සහ කළමනාකාරීත්වය යන දෙඅංශයේම ඔහුගේ පුළුල් වෘතිය ජීවිතය බැංකුවේ උපායමාර්ගික තීරණ සඳහා වලදායී ලෙස දායක වීමට අවශ්‍ය විශේෂඥ දැනුමෙන් ඔහුව සන්නද්ධකර ඇත.

එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය සහ වාණිජ්‍ය පිළිබඳ වාණිජවේදී උපාධිය ද ගොමිස් මහතා ලබාගෙන ඇත. තවද ඔහු ණය කළමනාකරණ ආයතනයෙන් ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද කළමනාකරණය පිළිබඳ සෙලින්කෝ ආයතනයෙන් කළමනාකරණ ඩිප්ලෝමාවක් ද ලබාගෙන ඇත.

ගෝමිස් මහතා ඔහුගේ වෘතිය ජීවිතය පුරා ජේෂ්ඨ තනතුරු කීපයක්ම දරා ඇති අතර 2023 ජනවාරි මාසයේ සිට මැක්ස් පී.බී.සී හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ (Max PBC Holdings (Pvt) Ltd) සාමාන්‍යාධිකාරීවරයා ලෙස ඔහුගේ මෑත කාලීන භූමිකාව දරයි. බැංකුකරුවෙකු ලෙස ගෝමිස් මහතා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවයකර වසර 32 ට අධික පලපුරුද්දක් ලබා ඇති අතර එහිදී ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම්, සහකාර සාමාන්‍යාධිකාරී මෙහෙයුම් සහ ප්‍රාදේශීය කළමනාකරු මෙහෙයුම් යන තනතුරුවල සේවය කර ඇත.

ගෝමිස් මහතාගේ ශාඛා කළමනාකරණය, මෙහෙයුම් සහ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් පලපුරුද්ද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අඟනා වත්කමක් වනු ඇත. ඔහුගේ නායකත්වය සහ කළමනාකරණ විශේෂඥතාව විශේෂයෙන්ම විශාල බැංකු ජාලයන්හි ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම බැංකුවේ අඛණ්ඩ සාර්ථකත්වය සහ උපාය මාර්ගික වර්ධනය සඳහා ඉවහල්වනු ඇත.

රෝහණ එල්. වික්‍රමසිංහ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක

2025 ජනවාරි මස 31 දින දොන් රෝහණ ලාල් වික්‍රමසිංහ මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර ඇත. මූල්‍ය විගණනය, බදුකරණය සහ ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ වසර 32 ට අධික පුළුල් පලපුරුද්දක් සමග ඔහු බැංකුව සමග එක්වී ඇත. බැංකු

අධීක්ෂණය සහ උපායාමාර්ගික ප්‍රතිපත්ති සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මූල්‍ය නියාමනය, අභ්‍යන්තර විගණනය සහ කළමනාකරණය තුළ ඔහුගේ කීර්තිමත් වෘතිය ජීවිතයේ ප්‍රධාන භූමිකාවන් විහිදී යයි.

වික්‍රමසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මූලික හා බලපත්‍රලාභී පරීක්ෂණ ඔහු සම්පූර්ණකර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ සහතිකලත් මූල්‍ය සේවා විගණකවරයකු ද වෙයි. තවද ඇමෙරිකා එක්සත් ජනපදයේ තොරතුරු පද්ධති විගණන හා පාලන සංගමයේ සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරයකු ද වෙයි.

මූල්‍ය පාලනය හා නියාමන කටයුතු සඳහා දායක වෙමින් ශ්‍රී ලංකාවේ හා ඕමානයේ ප්‍රසිද්ධ ආයතන ගණනාවකම වික්‍රමසිංහ මහතා වැදගත් තනතුරු උසුලා තිබිණි. ඔහු ඕමානයේ මහ බැංකුවේ බැංකු විශේෂඥ තනතුරක් හොබවා ඇති අතර එහිදී බලපත්‍රලාභී මූල්‍ය ආයතන පරීක්ෂාව, කාර්යමණ්ඩල පුහුණු කිරීම සහ ඕමානයේ බැංකු හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා සහය දැක්වීමේ වගකීම ද දරා තිබිණි.

වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර බැංකු පරීක්ෂක, බැංකු පරීක්ෂක සහ ප්‍රතිපත්ති අංශයේ ප්‍රධානී ලෙස තනතුරු ද හොබවා ඇත. වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයකල දීර්ඝ කාලය තුල බලපත්‍රලාභී මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ ප්‍රධාන භූමිකාවක් ද උසුලා තිබිනි.

බැංකු නියාමනය, අභ්‍යන්තර විගණනය, බදුකරණය සහ ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ඔහුගේ පුළුල් විශේෂඥතාව හේතුවෙන් වික්‍රමසිංහ මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට අගනා සම්පතක් වෙයි.

මූල්‍ය සේවා විගණනය අභ්‍යන්තර විගණනය සහ තොරතුරු තාක්ෂණික පද්ධති විගණනය පිළිබඳ ඔහුගේ පෘථුල දැනුම සමග සම්බන්ධ වූ කැපී පෙනෙන නායකත්ව පලපුරුද්ද බැංකුවේ උපාය මාර්ගික තීරණ හා පාලනයට දායක වීමට ඔහුව ස්ථානගත කර ඇත.

කේ. එම්. ජානක ආර්. අබේසිංහ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක

ජානක අබේසිංහ මහතා විදුලි සංදේශ, තාක්ෂණ සහ ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍රවල දශක තුනකට අධික පළපුරුද්දක් ලබා ඇති දක්ෂ ඉංජිනේරුවරයෙකු සහ ආයතනික නායකයෙකි. ඔහු මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ ගෞරව උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ කැන්සාස් විශ්ව විද්‍යාලයෙන් විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබාගෙන ඇත. ඔහු Fulbright ශිෂ්‍යත්වලාභියෙකි. වරලත් ඉංජිනේරුවරයෙකි. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. ශ්‍රී ලංකා පරිගණක සංගමයේ සාමාජිකයෙකි.

අබේසිංහ මහතා ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී හි (SLT) සමූහ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කළ අතර උපායමාර්ගික පරිවර්තනයක් සහ ඩිජිටල් ව්‍යාප්තිය හරහා සංවිධානය මෙහෙයවීය. ශ්‍රී ලංකා ටෙලිකොම් හි ඔහුගේ පුළුල් වෘත්තිය ජීවිතය තුළ ප්‍රධාන ව්‍යවසාය සහ තොග නිලධාරී, සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් කිහිපයක්ද දරා ඇත.

ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) නාගරික ආයෝජන හා හෝටල් සංවර්ධන (පුද්ගලික) සමාගම (Urban Investment and Hotel Development (Pvt) Ltd) සහ ලංකා නම්බර් පෝටබිලිටි සර්විස් (ගරන්ටි) ලිමිටඩ් (Lanka Number Portability Services (Guarantee) Ltd.) ඇතුළු ප්‍රමුඛ ආයතන කීපයක අධ්‍යක්ෂ මණ්ඩලයන්හි සේවයකර ඇත. ඔහු ශ්‍රී ලංකා ටෙලිකොම් (සර්විසස්) සමාගම සහ සින්ටැක් සිංගප්පුරු සමාගම (Xynatc Singapore Pte Ltd.) යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයන්හි ද සේවයකර ඇත.

අබේසිංහ මහතා ඉංජිනේරු විද්‍යාව, ඩිජිටල් පරිවර්තන ආයතනික පාලනය සහ උපායමාර්ගික කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි අත්දැකීම් සම්භාරයක් අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙන එයි.

එච්. එම්. ආනන්ද සෙනෙවිරත්න මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක

ආනන්ද සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයකු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගෙන ඇත. උපායමාර්ගික මෙහෙයුම් සහ පාලන ක්ෂේත්‍ර හරහා නායකත්ව භූමිකාවන් දරමින් මූල්‍ය හා කල්බදු අංශයන්හි වසර පහළොවකට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

ඔහු දැනට ෆිනෑන්ස් හවුස් ඇසෝසියේෂන් (20222024) හි සභාපති හා කවුන්සිල සාමාජිකයකු ලෙස සේවය කරන අතර මීට පෙර ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී, ඇසට්ලයින් ලීසිං සමාගමේ මෙහෙයුම් අධ්‍යක්ෂ සහ ලෝඩ් ස්ටාර් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ඇතුළු ප්‍රධාන තනතුරු කීපයක් දරා ඇත.

ශ්‍රී ලංකා ලීසිං සංගමයේ සභාපති සහ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ හා මහ බැංකුව විසින් පත්කරන ලද කමිටු කීපයක සාමාජිකයකු ලෙස තම පාලන භූමිකාවන් මගින් සෙනෙවිරත්න මහතා පුළුල් මූල්‍ය සේවා කර්මාන්තයට දායක වී ඇත. විශේෂයෙන් ඔහු නේෂන්ස් ලංකා ෆිනෑන්ස්හි කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධානියා ලෙස සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පත්කරන ලද ද ෆිනෑන්ස් කම්පැනි පී එල්. සී. හි කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද සේවය කර ඇත.
දැනට ඔහු නිල බලයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාර්ශ්ව කරුවන්ගේ සම්බන්ධතා කමිටුවේ සාමාජිකයකු ලෙස සේවය කරන අතර මීට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයේ පීඨ උපදේශන කමිටුවේ බාහිර කමිටු සාමාජිකයෙකු ලෙස සේවය කර තිබිණි.

එම්. එම්. ජබීර් කාදර් මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කේ. එම්. එම්. ජබීර් කාදර් මහතා පත්කිරීම සතුටින් නිවේදනය කරයි.

උපායමාර්ගික නායකත්වය, ණය මෙහෙයුම් සහ මූල්‍ය ව්‍යාපාර කටයුතු ඇතුළත් මූල්‍ය සේවා අංශයේ දශක තුනකට අධික පළපුරුද්දක් ලබා ඇති ජබීර් කාදර් මහතා ඉතා සාර්ථක හා දක්ෂ මූල්‍ය වෘතිකයෙකි. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයකු වන අතර කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (එක්සත් රාජධානිය) අවසන් විභාගයට පෙනී සිට ඇත.

ආයතනික පරිවර්තන සහ මූල්‍ය කාර්යසාධනය මෙහෙයවීම පිළිබඳව ජබීර් මහතා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකර ඇත. කොවිඩ්19 වසංගතයේ අනපේක්ෂිත බලපෑම් මධ්‍යයේ වුවද ජනශක්ති ෆිනෑන්ස් පී එල් සී (පෙර ඔරියන්ට් ෆිනෑන්ස් පී එල්.සී.) හි විධායක අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ඔහුගේ පළමු වසරේ සේවා කාලය තුළ සමාගම ඉතා සාර්ථකව ලාභදායී තත්ත්වයට පත්කර තිබිනි. මීට පෙර ඔහු රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් හි ආරම්භක ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක අධ්‍යක්ෂ ලෙස සේවය කළ අතර පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී මර්කන්ටයිල් ලීසිං ලිමිටඩ් සහ සෙලාන් මර්චන්ට් බැංකුව වැනි ප්‍රමුඛ ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හොබවා ඇත.

මූල්‍ය මෙහෙයුම්, ණය කළමනාකරණය, අවදානම් හා අනුකූලතා සහ උපායමාර්ගික නායකත්වය පිළිබඳ පුළුල් විශේෂඥතාවයක් ලබා ඇති ජබීර් මහතා වටිනා අවබෝධයක්, පාලන ශක්තියක් හා කර්මාන්තය පිළිබඳ විශේෂඥතාවයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ගෙන එයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ජබීර් කාදර් මහතාව අපි සාදරයෙන් පිළිගනිමු. ඔහුගේ පුළුල් පළපුරුද්ද, මූල්‍ය අංශය පිළිබඳ ඇති ගැඹුරු දැනීම සහ ආයතනික පරිවර්තන පිළිබඳ පෙන්වා තිබූ හැකියාව බැංකුවට සැලකිය යුතු උපායමාර්ගික වටිනාකමක් එකතු කරයි. නව්‍යකරණය දැඩි පාලනය හා තිරසාර වර්ධනය දෙස අඛණ්ඩව ගමන් කිරීමේදී ඔහුගේ දායකත්වය අපි අපේක්ෂා කරමු.

අරුණ පී කුරුඹලාපිටිය මහතා විධායක නොවන අධ්‍යක්ෂක

රාජ්‍ය අංශයේ දශක තුනකට වඩා වැඩි පළපුරුද්දක් ලබා ඇති අරුණ කුරුඹලාපිටිය මහතා රාජ්‍ය මූල්‍ය විගණනය සහ පරිපාලන ක්ෂේත්‍රයන්හි දක්ෂ වෘතිකයෙකි. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් හා ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයෙන් ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ලබාගෙන ඇත.

කුරුඹලාපිටිය මහතා දැනට මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සේවය කරන අතර ඔහු 2023 පෙබරවාරි මාසයේ සිට එම තනතුර හෙබවීය. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, ජාතික විද්‍යා පදනම, ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල කීපයකම ඔහු නිල බලයෙන් සේවය කරන අතර මීට පෙර නාරා ආයතනය, ජයවර්ධනපුර රෝහල සහ 1990 සුව සැරිය පදනමේ අධ්‍යක්ෂ තනතුරු දරා ඇත.

ඔහුගේ වතමන් තනතුරුවලට ප්‍රථම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවා තිබූ අතර ඒවාට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ යන තනතුරු ඇතුලත් වේ.

ආචාර්ය බී. සන්පික එස්. පෙරේරා විධායක නොවන අධ්‍යක්ෂක

පශු සම්පත් සංවර්ධන, සත්ව සෞඛ්‍ය සහ කෘෂි කළමනාකරණ අංශයන්හි වසර 25 ට අධික පළපුරුද්දක් ඇති ආචාර්ය සන්පික පෙරේරා පශු වෛද්‍ය වෘතිකයකු මෙන්ම රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ පරිපාලකවරයෙකි. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් (BVSC) සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් ආයතනික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

ආචාර්ය පෙරේරා මහතා දැනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සේවය කරන අතර එහිදී ඔහු පශු සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ ජාතික සම්බන්ධීකරණය සඳහා වගකිව යුතු වෙයි. ඔහු මීට පෙර සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විෂය කරුණු විශේෂඥයෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙසටත්, බස්නාහිර සහ වයඹ පළාත්වල රජයේ පශු වෛද්‍යවරයෙකු ලෙසත් සේවයකර ඇති අතර සත්ව සෞඛ්‍යය, අභිජනනය සහ ව්‍යාප්ති සේවා සඳහා පුළුල් දායකත්වයක් ලබා දී ඇත.

ඔහු නෙදර්ලන්තය, ජපානය සහ චීනය යන රටවල සත්ව විද්‍යාව, ආහාර කළමනාකරණය, ආහාර සුරක්ෂිතතාවය සහ පශු සම්පත් ඵලදායිතාවය පිළිබඳ අන්තර්ජාතික පුහුණු වැඩසටහන් කිහිපයකටද සහභාගීවීමෙන් තිරසාර පශු සම්පත් කළමනාකරණය සහ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ඔහුගේ විශේෂඥතාවය වැඩි දියුණු කරගෙන ඇත.

ආයතනික කළමනාකරණය



ඇයි.ටී. අසුරමාන්න මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.
MBA, BSc. Eng.,FCMA – UK, CGMA – UK, BMS, AM (IESL), MIEE- UK



කේ. එල්. එන්. ඒ පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික සැලසුම් හා ශාඛා මෙහෙයුම්
MBA (Fin), FCA, B.Com.(Sp), HNDA, Dip. in Risk Management



කේ.කේ. කපිල කීරවැල්ල මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(අයකරගැනීම්, පුණර්ජීවන සහ ණය සහාය
B.Com (Sp) Hons (USJ), PG.EX.Dip. In Bank Mgt (IBSL), APB



ඩබ්ලිව්.කේ. තන්ත්‍රිගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)
MBA-PM, MDT,Bsc MIS, CLSSGB, CISE



පී.ආර්.ඒ. ලසන්ත යු. කුමාර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා සැපයුම්)
MBA, BSc. HRM, ACIPM

ආයතනික කළමනාකරණය



එච්.ඒ.පී.එම්. සමන්තිලක මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී(නීති)
LLM,AAL



එන්. රාජපක්ෂ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ණය)
MBA(Aus), B.Sc(UOR), Dip (Banking & finance) IBSL to "CBF-IBSL)



ඒ්.එම්.සී.එස් අලහකෝන් මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
LLB, ACCS, Dip. ICSA (UK)



පී කුරුවිට මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ACA, ACMA, CGMA, AAT, DIP IT, IIA Member



ආර්.කේ.ඒ.එන්. රත්නායක මහත්මිය
ප්‍රධාන කළමනාකාරිණී (අවදානම් කළමනාකරණ)
EMBA (PIM-USJP), ACMA(UK), CGMA(UK), DBIRM(IBSL), Dip in Business Management



ජේ.ටී.ආර්. රණවීර මහත්මිය
(අනුකූලතා) නිළධාරිනි)
MBA (UK), FCMA/CGMA,AIB (Sri Lanka), Dip. in Compliance

ජ්‍යෙෂ්ඨ කළමනාකරණය



ආර්.එම්.යු.ඩී. බණ්ඩාර මහතා
ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා සැපයුම්)
MHRM,BSc BA (Sp), NDHRM., AMCIPM



අයි. එදිරිසූරිය මහතා
ප්‍රධාන කළමනාකරු (තක්සේරු)
MEM, B.Sc (EMV) (Sp) Hons. MRICS(UK), FIV(IVST)



ටී. තිලකරත්න මහත්මිය
ප්‍රධාන කළමනාකරු (නීති)
LLB,AAL



ඊ.ඒ.ඩී.වී. සේපාලිකා මහත්මිය
ප්‍රධාන කළමනාකරු (මූල්‍ය)
B.Sc (Accounting) Special (UOSJ), ACA



ජේ. එමිල්රාජන් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ශාඛා මෙහෙයුම් ප්‍රධානී
BBA(Hons) in Finance, MBA in Finance(UOC)



ඩී.ජී.කේ. විජේසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු, දෙපාර්තමේන්තු ප්‍රධානී (කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සහ ව්‍යාපාර බැංකුකරණය)
MBA (ARU), B.Sc BA (UOSJ), CMA (SL), Dip. Banking & Finance (IBSL), APB



ඩබ්ලිව්.එම්.කේ.ටී. රන්දිර් ප්‍රනාන්දු
ප්‍රධාන කළමනාකරු දෙපාර්තමේන්තු ප්‍රධානී (ණය පරිපාලන)
B.Sc (Public) Special (UOSJ), APB



ටී.එම්. අෂිල ඉන්දික තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ කළමනාකරු දෙපාර්තමේන්තු ප්‍රධානී (මධ්‍යම ණය අංශය)
BCom (UOK)

ආයතනික පාලනය

දිගුකාලීන වටිනාකම් නිර්මාණය සහ ඵලදායී කළමනාකරණය අධීක්ෂණයට, ආචාරධර්මානුකූල හැසිරීම සාධාරණත්වය, විනිවිදභාවය හා වගවීමේ මූලධර්ම මඟින් පදනමක් සපයන අතර එමඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ආයතනික පාලනය මූර්තිමත් කරයි. බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස තිරසාර වර්ධනය, මූල්‍යමය ශක්තිය සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම තහවුරු කිරීම සඳහා ඉහලම පාලන ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ක්‍රියා කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තීරණ ගැනීමේ ඉහළම බලධාරීන්වන එහි අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුවේ උපායමාර්ගික මග පෙන්වීම්, ප්‍රතිපත්ති සම්පාදනය සහ ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය සඳහා සමස්ථ වගකීම පැවරෙන අතර තැන්පත්කරුවන්, ණය හිමියන්, සේවකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සැමවිටම සපුරාලීම සහතික කිරීම සඳහා වගකිව යුතු වෙයි. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුකරණය, මූල්‍ය ආර්ථික විද්‍යාව, නීතිය, කළමනාකරණය සහ අනෙකුත් අදාළ විෂයන්ගෙන් විශේෂඥතාවයක් ලබා ඇති වෘතිකයින් පිරිසක් ඇතුලත් වේ. එම නිසා උපාය මාර්ගික කරුණු පිළිබඳ තීරණ ගැනීම, කාර්යසාධනය හා සම්පත් වෙන්කර දීම පිළිබඳ ස්වාධීන තීරණ ගැනීමට හැකිවෙයි.

බැංකුවේ පාලන ව්‍යුහය ඵලදායී තීරණ ගැනීම ශක්තිමත් කරන අතර ඉන් යහපත් විනිවිදභාවය දිරිගන්වමින් ව්‍යාපාරයේ සෑම අංශයක් තුළම වගවීම සිදුකරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති උපදෙස් මෙන්ම අභ්‍යන්තර ප්‍රතිපත්ති හා හොඳම ප්‍රමිතීන් ඇතුළුව අදාළ නීති සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව මෙහෙයුම් විචක්ෂණ ලෙස සිදුකරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

මෙම වාර්ෂික වාර්තාවේ අඩංගු සභාපතිතුමාගේ සමාලෝචනය සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ගේ සමාලෝචනය තුළ බැංකුවේ කාර්යසාධනය, තත්ත්වය සහ අනාගත දැක්ම පුළුල් ලෙස සාකච්ඡා කර ඇත.

පාලන මූලධර්ම

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පාලන දර්ශණය පදනම්වී ඇත්තේ වගවීම, විශ්වාසනීයත්වය, සාධාරණත්වය, නියාමන අනුකූලතාවය සහ පූර්ණ හෙළිදරව් කිරීම් මතවේ. මෙම මූලධර්ම බැංකුවට ව්‍යාපාරය සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව සිදුකරගෙන යෑමට මග පෙන්වන අතර එය පාර්ශවකරුවන්ගේ විශ්වාසය ඉහළ නංවයි.

වගවීම

වගවීම යහ පාලනයේ මූලික අංගයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ වාර්ෂික සහ අතුරු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයකර අනුමත කරයි. මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලබන අතර විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය සහතික කරමින් කාලෝචිත අයුරින් ප්‍රකාශයට පත්කරනු ලැබේ. කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන බාසල් III මග පෙන්වීම් හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිති (SLFRS) අනුව පිළියෙල කරනු ලබන අතර එමඟින් මහජන විශ්වාසය ඉහළ නංවයි. බැංකුවට අදාළ වන සියලුම නියාමන අවශ්‍යතාවයන්ට සමාලෝචිත වසර තුළදී බැංකුව සම්පූර්ණයෙන්ම අනුගත වී ඇත.

සාධාරණත්වය

ජාතියේ නිවාස බැංකුව ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි සියලුම පාර්ශවකරුවන්ට සාධාරණව සැලකීමට කැපවී සිටියි. ණය ලබාදීමේ තීරණ ගැනීමේ දී ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාවන් සැලකිලිමත් ලෙස ඇගයීමෙන් අනතුරුව හා දැරිය හැකි මිලකට සහ වගකිවයුතු ණයදීමේ පිළිවෙත් සහතික කිරීමෙන් සිදුකරයි. නෛතික ක්‍රියාමාර්ග ගනු ලබන්නේ අවසන් විසඳුමක් ලෙස පමණක් වන අතර බැංකුව එහි සංවර්ධන වගකීමට අනුකූලව අනපේක්ෂිත දුෂ්කරතාවයන්ට මුහුණ දෙන ගනුදෙනුකරුවන්ට සහය ලබා දෙයි.

විනිවිදභාවය සහ හෙළිදරව් කිරීම්

විනිවිදභාවය හා හෙළිදරව් කිරීම් බැංකුවේ පාලන රාමුවේ අත්‍යවශ්‍ය අංගයකි. නිවැරදි ගිණුම්කරණ පිළිවෙත්, කාලෝචිතව ප්‍රමාණාත්මක තොරතුරු බෙදා හැරීම, ඕනෑම බැඳියා පිළිගැටුමක් සුදුසු ලෙස එළිදරව් කිරීම බැංකුව තහවුරු කරයි. ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාත, ප්‍රධාන කාර්යසාධන දර්ශක, අවදානම් නිරාවරණය සහ පාලන පිළිවෙත් නිතිපතා මූල්‍ය වර්තාකරණය මඟින් අනාවරණය කරයි. අවශ්‍ය රහස්‍යභාවයට හානියක් නොවන පරිදි සියලුම ප්‍රමාණාත්මක වර්ධනයන් අදාළ නියාමන බලධාරීන්ට සහ පාර්ශවකරුවන් වෙත ක්ෂණිකව දැනුම් දෙයි. සමාලෝචිත වර්ෂය තුළ කිසිදු සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක් වාර්තාවී නොතිබිණි.

අධ්‍යක්ෂ මණ්ඩලය

1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට (සංශෝධිත පරිදි) අනුව මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය සමබර හා අපක්ෂපාති සාකච්ඡා තහවුරු කරමින් විවිධ විශේෂඥතාවයන්ගෙන් සමන්විත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

2025 වර්ෂයතුළ දී අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය වෙනස්වීම

සමාලෝචිත වර්ෂය තුළ දී පහත සඳහන් පත් කිරීම් හා ඉල්ලා අස්වීම් සිදුවී තිබිණි.

- 2024.10.04 දින එම්. පී. කුරගම මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට තෝරා පත්කරගෙන තිබූ අතර 2024.10.30 දින සිට බලපැවැත්වෙන පරිදි සභාපති ධුරයේ වැඩ භාරගෙන තිබිණි.
- එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා 2023.03.07 දින පත්වීම් ලබා තිබූ අතර 2025.01.31. දින ඉල්ලා අස්වී ඇත.

- මහාචාර්යය ඩී. ඒ. එම්. පෙරේරා 2025.01.21 දින පත් කර තිබූ අතර 2025.01.22 දින ඉල්ලා අස්වී ඇත.
- බී. ආර්. මඩිහහේවා මහතා 2023.05.02 දින පත්කර තිබූ අතර 2025.01.22 දින ඉල්ලා අස්වී ඇත.
- ආචාර්ය ආර්. ඒ. ටී. කේ රණසිංහ මහතා 2024.01.09 දින පත්කර තිබූ අතර 2025.01.22 දින ඉල්ලා අස්වී ඇත.
- එච්. සී. ඩී. එල්. සිල්වා මහතා 2023.01.01 දින සිට සේවයකර තිබූ අතර 2025.06.13 දින විශ්‍රාම ගොස් ඇත.

2025 වර්ෂයතුළ ලබාදුන් නව පත්වීම් පහත පරිදි වේ.

- ඒ්. පී. රණසිංහ මහතා 2025.01.22 දින පත්කර ඇත.
- ඒ්. සී ගමගේ මහතා 2025.01.22 දින පත්කර ඇත.
- එම්. ටී. ඒ්. ජේ. එෆ්. ගෝමිස් මහතා 2025.01.22 පත්කර ඇත.
- ඩී. ආර්. එල් වික්‍රමසිංහ මහතා 2025.01.31 දින පත්කර ඇත.
- ඒ්. පී. කුරුඹලාපිටිය මහතා 2025.06.13 දින පත් කර ඇත.
- ආචාර්ය බී. එස්. එස්. පෙරේරා 2025.06.13 දින පත්කර ඇත.
- ජේ. එන්. විරකෝන් මහතා 2025.09.26 දින පත්කර ඇත.
- එච්. එම්. ඒ් සෙනෙවිරත්න මහතා 2025.10.21 දින පත් කර ඇත.
- කේ. එම්. එම්. ජබීර් මහතා 2025.10.21 දින පත් කර ඇත.
- කේ. එම්. ජේ. ආර් අබේසිංහ මහතා 2015.10.24 දින පත් කර ඇත.

උපාය මාර්ග, කාර්යසාධනය, අවදානම් සහ පාලනයට අදාළ කරුණු සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වසර පුරා නිතිපතා රැස්වී ඇත. සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිවන අතර ඔහුට ඡන්ද අයිතිය හිමිවන්නේ නැත. නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සභාපති සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී යන අයගේ කාර්යභාරයන් වෙන්කර ඇත.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කාර්යභාරය

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන අතර බැංකුවේ එදිනෙදා කළමනාකරණය සඳහා වගකිවයුතු වෙයි. ප්‍රධාන විධායක නිලධාරිවරයා උපාය මාර්ගික නායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර ඇති උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, අනුමත අවදානම් රුචිය හා ප්‍රතිපත්ති රාමුව තුළ මෙහෙයුම් සිදුකරන බව සහතික කරයි.

ප්‍ර.වි.නි සෘජු ලෙසම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළයුතු අතර බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය සඳහා වගකිව යුතු වෙයි. උපාය මාර්ගික අරමුණු ඵලදායි ලෙස ඉටු කිරීම තහවුරු කිරීම සඳහා සියලුම කළමනාකරණ කමිටු ඔහුගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පුළුල් කිරීම හා මෙහෙයවීම මගින් සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩලය එහි පාලන රාමුව ශක්තිමත් කර තිබිණි. දැනට ක්‍රියාත්මක කමිටුවලට අමතරව ප්‍රධාන ක්ෂේත්‍රයන් තුළ අධීක්ෂණය ඉහළ නැංවීම සඳහා නව කමිටු දෙකක් ද පිහිටුවා තිබිණි.

2025 වසර තුළ ක්‍රියාත්මක වූ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

1. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)
2. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)
3. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා හා පාලන කමිටුව (BNGC)
4. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරන කමිටුව (BIRMC)
5. අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව (BCC) 2025 වසරේදී පිහිටුවා ඇත.
6. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC) 2025 වසරේදී පිහිටුවා ඇත.

සියලුම කමිටු පැහැදිලි ලෙස නිර්වචනය කර ඇති නියමයන්ට අනුව ක්‍රියාත්මකවන අතර සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අනුකූලතාවය සහ විගණන ක්‍රියාවලිය අධීක්ෂණය කරයි. මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය තහවුරු කිරීම හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම කමිටුව සිදුකරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරන කමිටුව (BIRMC) ණය, වෙළඳපළ, ද්‍රවශීලතා මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් අධීක්ෂණය කරයි. කමිටුව අවදානම් නිරාවරණයන් අනුමත සීමාවන් තුළ පවතින බව සහතික කරන අතර අවශ්‍ය අවස්ථාවන්වලදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC)

අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා මානව සම්පත් උපායමාර්ග කාර්යසාධන ඇගයීම් හා පාරිශ්‍රමික ප්‍රතිපත්ති අධීක්ෂණය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා හා පාලන කමිටුව (BNGC)

අනුප්‍රාප්තික සැලසුම් සිදුකිරීම හා සුදුසු අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය, පවත්වා ගැනීම සහතික කරමින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත්කිරීම නිර්දේශ කිරීම සඳහා වගකිව යුතුවෙයි.

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව (BCC)

2025 වර්ෂයේ දී පිහිටුවන ලද අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව බැංකුවේ ණය කලඹ, විශාල නිරාවරණයන් සහ ණය ප්‍රතිපත්ති රාමුව අධීක්ෂණය ශක්තිමත් කරයි. බැංකුවේ අවදානම් රුචිය සහ නියාමන අවශ්‍යතා සමඟ පෙළ ගැස්වීම තහවුරු කිරීම සඳහා ලබා දී ඇති බලතල අනුව ණය යෝජනා සමාලෝචනයකර අනුමත කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC)

2025 වර්ෂයේ දී පිහිටුවන ලද අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව ඩිජිටල් පරිවර්තනය තොරතුරු තාක්ෂණ පාලනය, සයිබර් ආරක්ෂාව, දත්ත ආරක්ෂාව සහ තාක්ෂණික අවදානම් කළමනාකරය පිළිබඳව උපායමාර්ගික අධීක්ෂණයන් සිදුකරයි. තොරතුරු වත්කම් ආරක්ෂා කරමින් තොරතුරු තාක්ෂණ ආයෝජන බැංකුවේ උපායමාර්ගික අරමුණු සඳහා සහය දක්වන බව කමිටුව තරවුරු කරයි.

කළමනාකරණ කමිටු

බාසල් මාර්ගෝපදේශයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. විසින් සභාපතිත්වය දරණ කළමනාකරණ කමිටු වෙත මෙහෙයුම් වගකීම් පවරා ඇත. ඒවාට ඇතුලත් වන්නේ:

1. විධායක ණය කමිටුව (ECC)
2. වත්කම් හා බැරකම් කළමනාකරන කමිටුව (ALCO)
3. අලෙවිකරන කමිටුව (MC)
4. නිෂ්පාදන සංවර්ධන කමිටුව (PDC)
5. නෛතික සහ අයකර ගැනීමේ කමිටුව (LRC)
6. ප්‍රතිසාධන හා පුනර්ජීවන කමිටුව (RRC)
7. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරන කමිටුව (EIRMC)

මෙම කමිටු ණය ද්‍රවශීලතා අවදානම්, අලෙවිකරන සහ නිෂ්පාදන නව්‍යකරණය ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට සහාය දක්වයි. අධීක්ෂණය පහසුකිරීම, උපායමාර්ගික අරමුණු සහ අවදානම් පරාමිතීන් සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි. ලබා දී තිබූ ඉක්කවල ප්‍රගතිය සහ මෙහෙයුම් අභියෝගයන්ට මුහුණ දීම සඳහා ශාඛා කළමනාකරුවන් ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකරණය කාර්යසාධන ඇගයීම් රැස්වීම්වලට සහභාගි වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය හා මග පෙන්වීම් යටතේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් බැංකුවේ ක්‍රියාකාරකම්, ව්‍යාපාර උපායමාර්ග, අවදානම් රුචිය, පාරිශ්‍රමික සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර ඇති අනෙකුත් ප්‍රතිපත්තිවලට අනුකූලවන ආකාරයෙන් සිදුකර කළමනාකරණය කරනු ලබන අතර ඒ අනුව ඉහත සඳහන් කළමනාකරන කමිටු සාමාජිකයින්ට ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ඇති ව්‍යාපාර හා පුද්ගලයින් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අත්දැකීම්, නිපුණතා හා විශ්වාසනීයත්වය ඇති අතර, ඔවුන්ගේ නිපුණතා පවත්වා ගැනීමට සහ සංවර්ධනය කිරීමට ඔවුන්ගේ වගකීම් ක්ෂේත්‍රවලට අදාළ සංවර්ධනයන් පිළිබඳව යාවත්කාලීන වීමට නිතිපතා පුහුණුවීම් සිදුකරයි. ශාඛා කළමනාකරුවන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ මසකට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වෙයි.

විනිවිදභාවය, වගවීම සහ විචකක්ෂණශීලි අවදානම් ප්‍රවර්ධනය කරන ශක්තිමත් ආයතනික පාලන රාමුවක් පවත්වා ගැනීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටියි. 2025 වර්ෂයතුළ සිදුකරන ලද වැඩි දියුණු කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව පිහිටුවීම සහ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය ශක්තිමත් කිරීම ඇතුළු පාලනය සහ දිගුකාලීන ආයතනික ඔරොත්තුදීමේ හැකියාව සඳහා බැංකුවේ ක්‍රියාකාර ප්‍රවේශය පිළිබිඹු කරයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/F/SMIB/CG/2025/17 මගේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 අප්‍රේල් 21

සභාපති,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සපුරාලීම සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සිද්ධි වාචක සෙවීම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව - 2025 දෙසැම්බර් 31

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙලකර ඉදිරිපත්කර ඇති පාලන වාර්තාව සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඇමුණුමට සම්බන්ධකර ඇති ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැංවීම මා විසින් සිදුකරනු ලැබ ඇත. එකඟ වූ ක්‍රියාමාර්ග සඳහා අදාලවන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 4400 (SLSPS 4400) හි දක්වා ඇති මූලධර්මවලට අනුකූලව මෙම කටයුතු සිදුකර ඇත. ආයතනික පාලන විධිවිධානයන්ට අනුකූලවීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඔබට සහයවීම පිණිස පමණක් මෙම ක්‍රියාපටිපාටි ඉටුකර ඇත.

මාගේ සොයා ගැනීම් මෙම වාර්තාවේ ඇමුණුමෙහි මා විසින් දක්වා ඇත.

ඉහත ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන බැඳීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව සිදුකළ විගණනයක් හෝ සමාලෝචනයක් අර්ථවත් නොවන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීම සම්බන්ධයෙන් යම් සහතික කිරීමක් මම ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හෝ සමාලෝචන කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිතිඅනුව පාලන වාර්තාවේ විගණනයක් හෝ සමාලෝචනයක් හෝ අතිරේක ක්‍රියාමාර්ග ඉටුකර තිබිනි නම් ඔබට වාර්තාකළ යුතුව තිබූ අනෙකුත් කරුණු මාගේ අවධානයට ලක්විය යුතුව තිබිනි.

මාගේ වාර්තාව මෙම වාර්තාවේ පලමුවන පරිච්ඡේදයේ විස්තරකර ඇති කාර්යයන් සඳහා සහ ඔබගේ දැනගැනීම පිණිස පමණක් වන අතර, එයවෙනත් අරමුණු සඳහා හෝ වෙනත් කිසිම පාර්ශවයක් සඳහා ලබාදීම පිණිස නොවේ.

මෙම වාර්තාව ඉහත දක්වා ඇති අයිතමයන් සම්බන්ධයෙන් පමණක් වන අතර, සමස්ථයක් ලෙස ගත්විට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කිසියම් මූල්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් විස්තර දැක්වීමක් නොවේ.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ආයතනික පාලන වාර්තාව

සිද්ධිවාචක සෙවීම් වාර්තාවට ඇමුණුමක්

පරිච්ඡේද අංකය	විස්තරය	අනුකූලතාවය	යොමුව
1	**අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසාන වගකීම් හා වගවීම්**		
1.1	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**		
අ)	බැංකුවේ දිගුකාලීන ඉලක්ක අනුව එහි උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරීක්ෂා කිරීම. බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් බැංකුව තුළ සන්නිවේදනය කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2024. 12. 23 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 24/SP 06/BD(APP)/02 සහ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 24.SP 06. 05. 22 මගින් ආයතනික සැලැස්ම අනුමත කර ඇත. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම්වලදී දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කර තිබිණි. 2024. 12. 31 දින විද්‍යුත් තැපැල් මගින් ශාඛා ඉලක්ක සන්නිවේදනය කර තිබිණි.
ආ)	බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරීක්ෂා කිරීම. සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිය හා යාන්ත්‍රණය ඇතුළත් සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග සහ එය ලේඛනගත කිරීම පරීක්ෂා කිරීම. සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග තුළ අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක අඩංගු බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග (ආයතනික දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ) ආයතනික සැලැස්මේ ඇතුළත් වේ. මෙය 2024. 12. 23 පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 24/SP06/05.02 සහ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 24/SP06/BD(APP)/02 මගින් අනුමත කර ඇත. සමස්ත අවදානම් ප්‍රතිපත්තිය අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණය ඇතුළත් සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග බැංකුව ලේඛනගත කර තිබිණි. 2025. 11. 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය මෙය අනුමත කර ඇත. 2025-2029 ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හරහා ක්‍රියාත්මක කරන ලද අතර, ඉලක්ක හා දැරිය හැකි ඉලක්ක 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර ඇත.
ඇ)	i. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගත් අවදානම් කළමනාකරණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන්හි විචක්ෂණශීලී බව මෙන්ම එවා නිසි පරිදි ක්‍රියාවට නංවා ඇත්දැයි පරීක්ෂා කිරීම. ii. ආරක්ෂක මට්ටම් තුන දක්වමින් නිර්වචනය කර ඇති සංවිධාන සටහනක් ඇති බව පරීක්ෂා කිරීම. iii. අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවයට පළමු හා තෙවන පෙළ ආරක්ෂක මට්ටම්වලට අයත් වගකීම් තිබේදැයි පරීක්ෂා කිරීම.		ප්‍රධාන අවදානම් නිරාවරණ, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම හා පද්ධති හා පාලනයන් විචක්ෂණශීලීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුගමනය කරන ලද සමුද්දේශය විෂය යටතේ ක්‍රියාත්මක වන අධ්‍යක්ෂක මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා බැංකුව ශක්තිමත් අවදානම් පාලනයක් ස්ථාපිත කර ඇත.

	iv. අභ්‍යන්තර විගණන කාර්යයට පළමුවන හා දෙවන ආරක්ෂක මට්ටම් සඳහා කිසියම් වගකීමක් තිබේදැයි පරීක්ෂා කිරීම. v. උපාය මාර්ග සමඟ ගැළපෙන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අවදානම් භාරගැනීම පරීක්ෂා කිරීම. vi. සීමාවන් කඩකිරීම පිළිබඳව අවදානම් භාරගැනීමේ ප්‍රකාශයේ ක්‍රියාමාර්ග නිසි ලෙස හඳුනාගෙන තිබේද යන්න පරීක්ෂා කර, අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමේ ක්‍රියාපටිපාටියක් තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	සංවිධාන ව්‍යුහය පැහැදිලිවම ආරක්ෂක මට්ටම් තුන පිළිබිඹු කරන අතර, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය මෙහෙයුම් හෝ විගණන වගකීම් නොමැතිව දෙවන මට්ටම ලෙස ක්‍රියාත්මක වන අතර, අභ්‍යන්තර විගණනය පළමු හෝ දෙවන මට්ටමේ රාජකාරි සඳහා සම්බන්ධ නොවී තුන්වන මට්ටම ලෙස ස්වාධීනව ක්‍රියාත්මක වෙයි. නිර්වචනය කර ඇති සීමාවන්, පූර්ව අනතුරු හැඟවීමේ දර්ශක සීමාවන් ඉක්ම යෑම සඳහා ක්‍රියාමාර්ග ඇතුළත්ව බැංකුවේ උපාය මාර්ගික අරමුණුවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂිකව අවදානම් භාරගැනීමේ ප්‍රකාශයක් සමාලෝචනය කර අනුමත කරයි. සැලකිය යුතු කඩවීම් ඒකාබද්ධ අවදානම් කළමනාකරන කමිටුව වෙත සහ අවශ්‍ය වූ විට අධ්‍යක්ෂ මණ්ඩලයට ක්ෂණිකව වාර්තා කිරීම සහතික කිරීම සඳහා අවදානම් භාරගැනීමේ ප්‍රකාශනයෙහි ඉහල නැංවීමේ ක්‍රියාපටිපාටිද ඇතුලත් වේ. BIRMC විසින් ප්‍රධාන අවදානම් දර්ශක, තහවුරු පරීක්ෂණ ප්‍රතිඵල සහ අවදානම් තක්සේරුකරුවන්ගේ වාර්තා ඉදිරිපත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ උපායමාර්ගික තීරණ ගැනීම සඳහා සහය දැක්වීම හා අවදානම් සහ බැංකුවේ උපායමාර්ගික දිශාව අතර අබණ්ඩ පෙළ ගැස්ම සහතික කිරීම සඳහා වේ.
ඈ)	තැන්පත්කරුවන්ගේ ණය හිමියන්ගේ සහ සමස්ත බැංකුවේ අවශ්‍යතාවයන්ට අහිතකර හෝ අගතියක් වන අයුරින් අධ්‍යක්ෂවරයෙකු හෝ කණ්ඩායමක් විසින් ආධිපත්‍යය දැරීම හෝ සැලකිය යුතු ලෙස බලපෑම් නොකිරීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්තියක් තිබේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම පිළිබඳව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ හත්වන වගන්තියේ අර්ථ දක්වා ඇති අතර, බැංකුවේ සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. මොවුන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාවය පිළිබඳව සහතිකය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත යුතු වෙයි. ඒ අනුව මෙම ප්‍රතිපාදන ඉහත පනතින් හා මහ බැංකු විධිවිධානයන් මගින් පාලනය වෙයි.
ඉ)	තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස්කරුවන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ක්‍රියාත්මක කරන්නේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	නියාමකයින්, තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස්කරුවන් සහ ණය ගැනුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී සන්නිවේදනයක් සඳහා සන්නිවේදන ප්‍රතිපත්තිය භාවිතා කරයි. සංශෝධිත සන්නිවේදන ප්‍රතිපත්තිය 2024. 10. 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී (වාර්තා අංක 24. 10. 140. 03 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 24/10/BD/(APP)/04)
ඊ)	බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත් බව හා විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති, කළමනාකරණ කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් මගින් අනුමත කරන ලද සමුද්දේශ්‍ය විෂය සහිත පුළුල් රාමුවක් මගින් පාලනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විටින්විට නියම කරන ලද කාල රාමුවකදී ඉහත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාලෝචනය කර ඇත.

ඇ)	සම්බන්ධිත පාර්ශ්ව නිරාවරණයන් කළමනාකරණය කිරීම සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලින් පැනනැගිය හැකි බැදියා ගැටුම් වළක්වා ගැනීම සඳහා පාලන පද්ධති පරීක්ෂා කිරීම.	අනුකූල විය	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තිය ණය මැනුවලයෙහි කොටසක් වන අතර, නිරාවරණය කළමනාකරණය කිරීම සඳහා විධායක ණය කමිටුව (ECC) ගනුදෙනු නිරීක්ෂණය කරයි. වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් යටතේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු එළිදැක්වීමට කටයුතු කර ඇත.
ඈ)	මූල්‍ය වර්ෂය තුළ ව්‍යාපාර අඛණ්ඩතා සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් අනුමත කර, ඒවා නිසි ලෙස පවතීදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025 ඔක්තෝබර් මාසයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 25/11/BD/(APP)/05)
ඉ)	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	සේවකයන්ගේ පාරිශ්‍රමික අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සාමූහික ගිවිසුම අනුව සිදු කරයි. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අනුව සිදුකරයි.
ඊ)	2010 අංක 03 දරණ බැංකු පනතේ නිර්වචනය කර ඇති පරිදි හා 2015 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 02/17/550/0002/003 හා පසුව සංශෝධනය කරන ලද 2024 අංක 07 දරණ බැංකු පනතේ (2024 ජූනි 28 නිකුත් කරන ලද) තීරණය කර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක මට්ටමේ රාජකාරි සිදුකරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනා ගැනීම හා පත් කිරීම සිදුකර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	සාමාන්‍යාධිකාරිවරයාද ඇතුළත්ව විධායක කටයුතු සිදුකරන නිලධාරීන් හා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස නිර්වචනය කරන අතර නාමයෝජනා කමිටුව (BNC) විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.
උ)	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා බලතල සහ ප්‍රධාන වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂවරුන් සතු බලතල සහ අධිකාරිත්වය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 07 වන පරිච්ඡේදයේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සඳහා අධ්‍යක්ෂවරු, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන අතර, ප්‍රඥප්තිය/සමුද්දේශ්‍ය විෂය මගින් බලතල නිර්වචනය කර ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි දක්වා ඇත. අධ්‍යක්ෂවරු හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අධිකාරිත්වයේ හා වගකීමේ ප්‍රමාණය BHRRC හි විස්තර කර ඇත.
ඌ)	අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ග හා ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තිය සමඟ ප්‍ර.වි.නි.ගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කටයුතු සමපාත වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය නිසි ලෙස අධීක්ෂණය කර තිබේදැයි පරීක්ෂා කිරීම.		උපාය මාර්ගික ව්‍යාපාරික සැලැස්මට අනුව බැංකුවේ කාර්ය සාධනය සමාලෝචනය සිදුකරන අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ එම කමිටුවලට පවරා ඇති අනෙකුත් අදාළ කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලින් වාර්තා ලබා ගනී. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සමුද්දේශ්‍ය විෂය මගින් පාලනය වෙයි. තවද, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම්වලදී ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඔවුන්ගේ විෂය පථයට අයත් කරුණු පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදුකරයි. ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය (කාර්තුමය ලෙස) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කරයි.

එ)	අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් පාලන පිළිවෙත්වල ඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින්වර තක්සේරු කර තිබේදැයි පරීක්ෂා කිරීම. ඒ සඳහා ඇතුළත් වන්නේ, i. අධ්‍යක්ෂවරුන් ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම, නම් කිරීම හා පත් කිරීම ii. බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ iii. දුර්වලතා හඳුනා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලය තේරීම, නම් කිරීම හා පත් කිරීම 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි. අමාත්‍යවරයාගෙන් ලැබෙන නාමයෝජනා මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ලයට පත් කිරීමට නියමිත අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතා ඇගයීම්වලට ලක් කර පත් කිරීම සඳහා නිර්දේශ කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය එහි පාලන පරිචයන් පිළිබඳ වාර්ෂික ඇගයීමක් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු ඔවුන්ගේ ස්වයං ඇගයීමේ පත්‍රිකාවල තහවුරු කර තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම විගණනය කිරීමට අධ්‍යක්ෂ මණඩලය තීරණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීත්වය ප්‍රශ්නාවලියක් මඟින් තක්සේරු කරයි. බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් බදවා ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති මානව සම්පත් ප්‍රතිපත්තියක් අනුව හා මහ බැංකුවේ පූර්ව අනුමැතියෙන් බදවා ගැනීමේ යෝජනා ක්‍රමයක් මඟින් සිදු කරයි.
ඒ)	සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං තක්සේරු ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර තිබේදැයි පරීක්ෂා කර එවැනි තක්සේරු වාර්තා පවත්වා ගැනීම.	අනුකූල විය	2025. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ස්වයං තක්සේරුවක් සිදුකර තිබිණි.
ඓ)	අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ හා ප්‍රා.වි.නි සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	අනුමත අනුප්‍රාප්තික ප්‍රතිපත්තියට අනුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් 2024 දෙසැම්බර් 13 දින අනුමත කර තිබිණි.
ඔ)	ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ඇති කිරීම සහ ආයතනික අරමුණු සඳහා ඇති ප්‍රගතිය නිරීක්ෂනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග නිතිපතා රැස්වීම් සැලසුම් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකටම සාමාන්‍යාධිකාරිවරයාගේ පැමිණීම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය සන්නිවේදන මාර්ග ඇති කිරීමත් ආයතනික අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමත් සිදු කරයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති කරුණු නිතර ඉදිරිපත් කිරීමත් සිදුකරයි.
ඕ)	නියාමන පරිසරයේ සිදුවන ප්‍රමාණාත්මක වෙනස්කම් පිළිබඳව යාවත්කාලීන වීමට සහ බැංකුව නියාමකයින් සමඟ ඵලදායී සම්බන්ධයක් පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාමාර්ග හා ක්‍රියාවලින් සිදුර ඇති බව පරීක්ෂා කිරීම	අනුකූල විය	අනුකූලතා නිලධාරියා නියාමකයින් සමග ඵලදායී සම්බන්ධතාවයක් සඳහා රාජකාරී ලැයිස්තුව සමග පෙළගැස්වීම සිදුකරනු අතර, ඔහු ආයතනික පාලන උපදෙස්හි දක්වා ඇති උපදෙස් අනුව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යටතේ ස්වාධීනව ක්‍රියාකරයි. නියාමන පරිසරයේ සිදුවන සියලුම වෙනස්කම් අදාළ නියාමන ආයතනය විසින් දැනුම් දුන් විගස දැනුම් දීම සිදුකරයි. තවද, අනුකූලතා නිලධාරියා සහ අවදානම් කළමනාකරණ ප්‍රධානී විසින් අනුකූලතා අවශ්‍යතාවල තත්ත්වය පිළිබඳව වරින්වර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලබයි.

ඔ)	බාහිර විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමට මෙන්ම ඔවුන් අධීක්ෂණ තත්ත්වයේ තබා ගැනීම සඳහා ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බව පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ සඳහන් ප්‍රතිපාදන අනුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයා පත් කර ඇත.
අං)	බැංකුවේ සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන දිරිදීමනා, තෑගි හෝ අරමුදල් ඇතුළු ඕනෑම අනිසි මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව ක්‍රියාවලියක් සකස් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	සේවකයින්ගේ මැනුවලය සහ මානව සම්පත් ප්‍රතිපත්තිවල සේවකයින්ට අනවශ්‍ය මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ ලැබීම වළක්වන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ අඩංගු වේ. එසේම එවැනි සිදුවීම් පිළිබඳ තොරතුරු ලබාදීම සඳහා බැංකුවට පැමිණිලි කිරීමට විසිල්බ්ලෝවර් ප්‍රතිපත්තියක් සහ විශේෂ දුරකථන මාර්ගයක් ඇත.
අඃ)	ඉතා යහපත් අයුරින් හැසිරීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පවතිදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මානව සම්පත් ප්‍රතිපත්ති හා විනය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන අතර, සේවකයින්ගේ හැසිරීම, රෙගුලාසි නීති සහ කර්මාන්තයේ හොඳම පිළිවෙත්වලට අනුකූලව සදාචාර සම්පන්න හා වෘත්තීයවේදීත්වය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පවතී.
ක)	ශ්‍රී ලංකා මහ බැංකු පරීක්ෂණ වාර්තාව සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ නීති යාවත්කාලීන කිරීම් පරීක්ෂා කිරීම	අනුකූල විය	දැන ගැනීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කාර්තුමය යාවත්කාලීන කිරීම් කාර්තුමය BIRMC / රැස්වීම්වල සභාගත කරනු ලැබේ.
බ)	අනුමත කර ඇති විසිල්බ්ලොවර් ප්‍රතිපත්තිය හා එහි අන්තර්ගතය පරීක්ෂා කිරීම	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති ප්‍රතිපත්තියක් පවතී. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 25.10. 102.01
ග)	සමස්ත සමාජයම ඇතුළත් හා දේශගුණික හිතකාමී හරිත ව්‍යාපාර කටයුතුවලට සහාය වීම සඳහා ඇති ප්‍රතිපත්ති තහවුරු කිරීම හා තිරසාරත්වය වර්ධනය කිරීම සඳහා බැංකුවේ ව්‍යාපාරික උපාය මාර්ග පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ විෂය පථය සීමා කිරීම නිසා එම පනතේ සංශෝධන ක්‍රියාවලිය අවසන්වූ පසු සඳහන් කර තිබූ ක්ෂේත්‍ර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට බැංකුව බලාපොරොත්තු වෙයි.
1.2	**සභාපතිවරයා හා ප්‍ර.වි.නි පත් කිරීම**		
	1. අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා (ප්‍ර.වි.නි) පත් කර ඇති බව පරීක්ෂා කිරීම. 2. සභාපතිවරයා හා ප්‍ර.වි.නි.ගේ කාර්යභාරය හා වගකීම් පරීක්ෂා කිරීම.	අනුකූල විය	1. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිච්ඡේද අංක 14.1 අනුව සභාපතිවරයා අදාළ රේඛීය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබ ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රා.වි.නි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබයි. 2. 2024 අංක 05 දරණ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පාලන විධිවිධානවල ප්‍රතිපාදන හා ඉහත පනත අනුව සමපාත වන සභාපතිවරයාගේ හා ප්‍රාවිනිගේ කාර්යභාරයන් හා වගකීම්
1.3	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**		
	ආසන්න වශයෙන් මසකට එක් වරක් බැගින් අවම වශයෙන් දොළොස් වතාවක් මූල්‍ය වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වී ඇති බව තහවුරු කිරීම. (අවම වශයෙන් අර්ධ වාර්ෂික පදනමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා භෞතිකව සහභාගී වීම)	අනුකූල විය	2025 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය 15 වතාවක් රැස්වී ඇත. ආසන්න වශයෙන් මසකට එක් වතාවක් බැගින් රැස්වීම් වාර 12ක් පවත්වා ඇති අතර, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 2ක් පවත්වා ඇත. බැංකුවේ මෙහෙයුම් පිළිබඳ අධ්‍යක්ෂවරු යාවත්කාලීන කිරීම සඳහා ඉදිරිපත් කිරීම් සිදුකිරීමට එක් රැස්වීමක් සංවිධානය කර තිබිණි. අධක්ෂ මණ්ඩල තීරණ ලේඛනය සහ අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ ලේඛනය ඇත.

1.4	**අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටිය**		
අ)	වීධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයට කරුණු හා යෝජනා ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකිවන පරිදි සැකසූ වැඩපිළිවෙළක් අධ්‍යක්ෂ මණ්ඩල සතුව ඇති බව පරීක්ෂා කිරීම, මෙහිදී එම කරුණු හා යෝජනා බැංකු ව්‍යාපාරයේ ප්‍රවර්ධනය, අවදානම් කළමනාකරණය හා බැංකු සේවකයින්ගේ හැසිරීමට අදාළ වීම.	අනුකූල විය	අධ්‍යයනය කිරීමට හා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි රැස්වීම් පැවැත්වීමේ නිවේදනය හා න්‍යාය පත්‍රය සියලුම අධ්‍යක්ෂවරු වෙත රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් දින 07ට පෙර ලැබීමට සලස්වයි. ඒ අනුව, බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනයට හා අවදානම් කළමනාකරණය කිරීමට සම්බන්ධ කරුණු හා යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරනු ලබයි.
ආ)	සියලුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම්වලට සහභාගි වීම සඳහා අවස්ථාව ලබාදීම පිණිස අවම වශයෙන් දින 07කට පෙර දැනුම් දීම සිදුකරන බව පරීක්ෂා කර ඇත. සියලු අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහාත් දැනුම් දීම සිදුකර ඇත.	අනුකූල විය	විද්‍යුත් සන්නිවේදනයක් මගින් රැස්වීම් පැවැත්වීමට දින 07 ට පෙර සියලුම අධ්‍යක්ෂවරු වෙත දැනුම් දීමක් සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අත්සන් තබා අනුමත කර පිළියෙළ කරන ලද න්‍යාය පත්‍රය සභාපතිවරයාගේ ද අනුමැතිය සහිතව රැස්වීම් පැවැත්වීමට දින 07කට ප්‍රථම සෑම අධ්‍යක්ෂවරයකු වෙතම භාරදීම සිදුකරයි.
ඇ)	මාස 12 ක් ඇතුළත පැවැත්වූ රැස්වීම් වාර වලින් 2හෝ3 කට සහභාගී නොවූ හා නොකඩවා රැස්වීම් වාර 03 ක් සඳහා සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගෙන ඇති බව පරීක්ෂා කරන ලදී. අධ්‍යක්ෂවරයෙකු වෙනුවට නම් කරන ලද විකල්ප අධ්‍යක්ෂවරයෙකු රැස්වීම් වලට සහභාගි කරවීම රැස්වීම් වලට සහභාගී වුවාසේ පිළිගනු ඇත.	අනුකූල විය	අවශ්‍ය පරිදි අධ්‍යක්ෂවරු රැස්වීම් වලට සහභාගී වී ඇති නිසා එවැනි පියවර ගැනීමක් අවශ්‍ය නොවිය.
1.5	**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත් කිරීම**		
අ)	බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම් ලේකම් කෙනෙකු පත්කර ඇති බව පරීක්ෂා කරන ලද අතර, එම අයගේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩල හා කොටස් කරුවන්ගේ රැස්වීම්වල ලේකම්ගේ කාර්යභාරය ඉටු කිරීමත් අඥාපනතේ හා අනෙකුත් නීතිරීතිවලට අනුව ඇති කටයුතු ඉටු කිරීමත්ය.	අනුකූල විය	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයකු පත්කර ඇත.
ආ)	සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීමට ඇති ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලය වෙනමම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්යාලයක් පිහිටුවා ඇති අතර, සුදුසුකම් ලත් අයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබා ගැනීමට සෑම අධ්‍යක්ෂවරයෙකුටම ඉඩ සලසා ඇත.
ඇ)	නාමයෝජනා සහ පාලන කමිටු වාර්තා පරීක්ෂා කර අධ්‍යක්ෂවරුන්ට පුහුණු පාඨමාලා වෙන් කර තිබේද යන්න හා සාක්ෂි ඉල්ලා සිටීම.	අනුකූල නොවේ	සමාලෝචිත කාලය තුළදී පුහුණුවීම් සිදුකර තිබූ අතර, ඒවා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම්වලදී ඉදිරිපත් කර නොමැත.
ඈ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තබා ගැනීම සමාගම් ලේකම් විසින් සිදු කරන අතර, සියලුම අධ්‍යක්ෂවරුන්ට හෝ නියාමකයින්ට එවැනි වාර්තා පිරික්සීමට ක්‍රියාවලියක් තිබේද යන්න පරීක්ෂා කරන ලදී.	අනුකූල විය	සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිළිවෙලින් ගොනුකර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ භාරයේ තබා ගනී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ ඕනෑම තොරතුරක් ඕනෑම අවස්ථාවක ලබා ගැනීමට ඕනෑම අධ්‍යක්ෂවරයකුට අවස්ථාව ඇත.

1.6	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වා ගැනීම**		
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල පහත සඳහන් කරුණු අඩංගු වී තිබේද යන්න පරීක්ෂා කිරීම. අ. අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා වලදී අධ්‍යක්ෂ මණ්ඩලය භාවිතා කල දත්ත හා තොරතුරු සාරංශයක් ආ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කල කරුණු ඇ. හෙලිදරව් කර ගැනීමේ සාකච්ඡා සහ මතබේදයට තුඩු දුන් කරුණු, අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි සැලකිල්ලකින් හා විචක්ෂණශීලීව ඔවුන්ගේ රාජකාරී ඉටු කරමින් සිටියේද යන වග නිරූපණය කරයි. ඈ. අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ග සහ ප්‍රතිපත්ති හා අදාළ නීති හා රෙගුලාසි පිලිපැදීම පිළිබඳ අනුකූලතාවය දක්වන කරුණු ඉ. බැංකුව මුහුණදෙන අවදානම් අවබෝධ කර ගැනීම හා යොදාගත් අවදානම් කලමනාකරණ ක්‍රියාමාර්ගවල දළ විශ්ලේෂණයක් සහ තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	අනුකූල විය	අ. දත්ත සාරාංශයක් අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවල දක්වා ඇත. ආ. සලකා බලන ලද කරුණු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවල විස්තරකර ඇති අතර, වාර්තාවලද සඳහන් වෙයි. ඇ. කරුණු එළිදරව් කිරීමේ වාර්තාවලින් පැහැනැඟුණු කරුණු වාර්තාවල සටහන් කර ඇත. ඈ. ගනු ලබන තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපාය මාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර, අදාළ නීති හා රෙගුලාසිවලටද අනුකූල වේ. ඉ. බැංකුව විසින් අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ පියවර සැලකිල්ලට ගනිමින් තීරණ ගනු ලැබේ.
1.7	**ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම**		
	සාධාරණ ඉල්ලීමකින් පසුව සුදුසු අවස්ථාවන්හි දී ස්වාධීන වෘත්තීය උපදෙස් බැංකුවේ වියදමින් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන්ට හැකිවීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟවූ ක්‍රියා පිලිවෙත් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	තීරණ ගැනීමේ දී හා රාජකාරී කටයුතු කරගෙන යාමේ දී අවශ්‍ය වූ විටක ස්වාධීන වෘත්තීය උපදෙස් බැංකුවේ වියදමින් අධ්‍යක්ෂවරුන්ට ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. බැංකුව මේ සඳහා රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරයි.
1.8	**බැඳියා පිළිගැටුම් කළමනාකරණය**		
අ)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ බැඳියා පිලිගැටුම් නොමැතිවීම හෝ පැවතීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාපාටි පාටි පැවතීම, ඒ පිළිබඳ වාර්තා කිරීම හා ඒවා නිරවුල් කිරීම සහ එවැනි තත්ත්වයන් වලක්වාලීමට සුදුසු ක්‍රියාමාර්ග පැවතීම පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	වෙනම ප්‍රතිපත්තියක් නොමැත.
ආ)	අධ්‍යක්ෂවරයෙකු ඔහු/ඇය හෝ ඔහුගේ/ ඇයගේ ඥාති සම්බන්ධතාවයක් ඇති අයෙකු හෝ අධ්‍යක්ෂවරයාගේ සැලකිය යුතු උනන්දුවක් ඇති කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීම හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ වන කරුණක් සඳහා ගණපූරණය සම්බන්ධයෙන් ඔහු/ඇය ගණන් ගෙන ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	එවැනි කරුණක් සමාලෝචිත වර්ෂයේ පැහැනැඟී නොමැති බැවින් මෙම කොටස අදාළ නොවේ.

ඇ)	බැදියා ගැටුම් සඳහා අනුමත ප්‍රතිපත්ති ලේඛනයක් ඇති බව පරීක්ෂා කිරීම හා එහි පහත දෑ අඩංගු විය යුතු වෙයි. 1. බැදියා ගැටුමකට හේතු විය හැකි හෝ දැනටමත් හේතුවී ඇති ඕනෑම කරුණක් වහාම හෙළිදරව් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුගේ යුතුකමකි. 2. දේශපාලන සම්බන්ධතා ඇතුළුව බැදියා ගැටුම් හෝ විය හැකි බැදියා ගැටුම් ඇති කළ හැකි ක්‍රියාකාරකම්වලින් හැකිතාක් දුරට වැළකී සිටීම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුගේ යුතුකමකි. 3. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස සේවය කරන විට ගැටුම් ඇති විය හැකි අවස්ථා 4. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හෝ ඔහුගේ /ඇයගේ සමීප ඥාතීන් හෝ ඔහු /ඇය සැලකිය යුතු උනන්දුවක් දක්වන කරුණක් සම්බන්ධයෙන් ඇති ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිළිබඳ සාකච්ඡාවලට සහභාගීවීමෙන් වැලකී සිටීමේ වගකීම: සහ 5. ප්‍රතිපත්තියට අනුකූල නොවන අවස්ථාවකදී ගතයුතු ක්‍රියාමාර්ග.	අනුකූල විය	i. හෙළිදරව්කිරීමට අවශ්‍ය වැනි සිදුවීමක් නිරීක්ෂණයවී නොමැත. ii. හෙළිදරව්කිරීමට අවශ්‍ය වැනි සිදුවීමක් නිරීක්ෂණයවී නොමැත. iii. හෙළිදරව්කිරීමට අවශ්‍ය වැනි සිදුවීමක් නිරීක්ෂණයවී නොමැත. iv. හෙළිදරව්කිරීමට අවශ්‍ය වැනි සිදුවීමක් නිරීක්ෂණයවී නොමැත. v. හෙළිදරව්කිරීමට අවශ්‍ය වැනි සිදුවීමක් නිරීක්ෂණයවී නොමැත.
1.9	**වගකීම් ඉටු කිරීමට නොහැකි වීම පිළිබඳ දැනුම් දීමේ අවශ්‍යතාවය**		
	බැංකුවට සිය වගකීම් ඉටුකල නොහැකි හෝ නොහැකිවීමේ තත්ත්වයට පත්විය හැකි බව හෝ බුන්වත් තත්ත්වයට පත්වීමට ආසන්න බව හෝ තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ ගෙවීම් අත්හිටුවීමට ආසන්න බව අධ්‍යක්ෂ මණ්ඩලයට හැඟි යන්නේ නම් බැංකුවේ තත්ත්වය පිළිබඳව යම්කිසි තීරණයක් හෝ පියවරක් ගැනීමට ප්‍රථම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වහාම දැනුම් දීම සිදුකල යුතු බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	එවැනි අවස්ථාවක් පැනනැඟී නොමැත.
1.10	**විවක්ෂර අවශ්‍යතාවයන් සමග අනුකූලතාවය**		
	ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද අනෙකුත් විවක්ෂර අවශ්‍යතා අනුව අවශ්‍ය ප්‍රමාණයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව ප්‍රාග්ධනික කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	2025 වර්ෂය සඳහා කෙටුම්පත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව බැංකුවේ අවම නියාමන ප්‍රාග්ධන හිඟය පියවා ගැනීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මහජන බැංකුවට පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධිත ආයතනයක් ලෙස පවරා ගැනීමට කැබිනට් අනුමැතිය ලබාදී ඇත.
1.11	**වාර්ෂික ආයතනික පාලන වාර්තාව**		
	මෙම විධිවිධානයන්ට අනුකූල වීම දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් බැංකුවේ වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ අවශ්‍ය කේෂ්ත්‍ර ඇතුළත්ව බැංකුවේ වාර්ෂික වාර්තාව සමඟ අනුකූල විය. ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධානයන්ට අනුකූල බව දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාව වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළ කරනු ලබයි.

2	**අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය**		
2.1	**අධ්‍යක්ෂවරු පත් කිරීමේ ක්‍රියාපටිපාටිය**		
අ)	i. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා විධිමත් හා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටිය පරීක්ෂා කිරීම. ii. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුප්‍රාප්තික සැලැසුම පරීක්ෂා කිරීම	අනුකූල විය අදාළ නොවේ	i. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය, 2024 අංක 05 දරණ ආයතනික පාලන විධිවිධාන හා රාජ්‍ය බැංකු සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අනුව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත් කිරීම සිදුකරයි. ii. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ විධිවිධානවලට අනුව අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික නොවේ.
ආ)	නව අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම පිළිබඳව ඇති ක්‍රියාපටිපාටිය පරීක්ෂා කිරීම.	අනුකූල විය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා රාජ්‍ය බැංකු සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අනුව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබයි.
2.2	**අධ්‍යක්ෂවරු සංඛ්‍යාව**		
අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව 7ට නොඅඩු සහ 13 ට නොවැඩි විය යුතු බව පරීක්ෂා කිරීම.	අර්ධ වශයෙන් අනුකූල වේ	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු 08 දෙනෙකු හා විධායක නොවන අධ්‍යක්ෂවරු 03 දෙනෙකුගෙන් සමන්විත වේ.
ආ)	2025 වසර තුළ කාන්තා නියෝජනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	2025. 12. 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයට කාන්තා නියෝජනයක් සිදුවී නොමැත.
2.3	**විධායක අධ්‍යක්ෂවරු**		
	ප්‍රධාන විධායක නිලධාරියා ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකක් නොයික්මවන බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරු නොමැත.
2.4	**විධායක නොවන අධ්‍යක්ෂකවරු**		
	ස්වාධීන අධ්‍යක්ෂකවරු පත් කිරීම සඳහා බැංකුවට ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	වෙන්වූ ක්‍රියාවලියක් නොමැත. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා රාජ්‍ය බැංකු සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අනුව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත් කිරීම සිදුකරයි.
2.5	**ස්වාධීන අධ්‍යක්ෂවරු**		
අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් අවම වශයෙන් අඩක් ස්වාධීන විධායක නොවන, අධ්‍යක්ෂවරුන් බව පරීක්ෂා කිරීම, බලපත්‍රලාභී බැංකු 2027. 01. 01 දින වන විට මෙම විධානයට අනුකූල විය යුතු වෙයි.	අනුකූල විය	සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු වන අතර, මුළු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් අඩකට වඩා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.
ආ)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ස්වාධීන යයි සැලකිය හැකි නම් ඔහු/ඇය අ. බැංකුවේ සියයට 1කට වඩා සෘජු හා වක්‍ර කොටස් හිමිකමක් දැරීම. ආ. අධ්‍යක්ෂවරයකු ලෙස පත් වීමට පෙර වසර දෙකක් ඇතුළත ඔහු/ඇය මෙහි විධිවිධාන අංක 7.2 යටතේ විස්තර වන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවා යන ප්‍රමාණයක බැංකුව සමග කිසියම් ව්‍යාපාරික ගනුදෙනුවක් සිදුකර ඇති විට,	අනුකූල විය අනුකූල විය	බැංකුවේ කිසිම අධ්‍යක්ෂවරයකු බැංකුවේ කොටස් හිමිකමක් නොදරයි. පසුගිය වසර දෙක ඇතුළත බැංකුව සමග කිසිම ව්‍යාපාරික ගනුදෙනුවක් සිදු කර නොමැත.

	ඇ. අධ්‍යක්ෂවරයකු ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක් තුළදී බැංකුව විසින් එහි සේවයේ යොදවා ඇති විට	අනුකූල විය	අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමෙන් පසු අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත කිසිම අධ්‍යක්ෂවරයකු පත් කර නොමැත.
	ඈ. බැංකුවේ හෝ වෙනත් බැංකුවක ප්‍රධාන විධායක නිලධාරි ඉහළ කළමනාකරණයේ නිලධාරියකු සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු සමග සමීප සම්බන්ධතාවයක් පවත්වා තිබීම, සමීප සම්බන්ධතාවය යනු කාලත්‍රයා හෝ යැපෙන දරුවෙකු අදහස් කෙරේ.	අනුකූල විය	එවැනි සම්බන්ධතාවයක් වාර්තා වී නොමැත.
	ඉ. බැංකුවේ විශේෂිත පාර්ශ්වකරුවකු නියෝජනය කරන විට	අනුකූල විය	විශේෂිත පාර්ශ්වකරුවකු නියෝජනය නොකරයි.
	ඊ. සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක අධ්‍යක්ෂවරයකු සේවකයකු හෝ සැලකිය යුතු කොටස්කරුවකු වන විට,	අනුකූල විය	කිසිම අධ්‍යක්ෂවරයකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ.
	i. මෙම නියෝගවල 7.2 නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10ක ප්‍රමාණයක් ඉක්මවා යන කිසියම් ගනුදෙනුවක් බැංකුව සමග පැවතීම හෝ	අනුකූල විය	i. කිසිම අධ්‍යක්ෂවරයෙකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ
	ii. මේ සම්බන්ධයෙන් බැංකුවේ අනිකුත් අධ්‍යක්ෂවරුන් සේවයේ යොදවා හෝ අධ්‍යක්ෂවරු හෝ සැලකිය යුතු කොටස්කරුවන් හෝ	අනුකූල විය	ii. කිසිම අධ්‍යක්ෂවරයෙකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ
	iii. මූල්‍ය අංශයේ බලධාරීන් නිර්දේශ කර ඇති පත්වීම් හැර හෝ,	අනුකූල විය	iii. කිසිම අධ්‍යක්ෂවරයෙකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ
	iv. මෙම නියෝගවල 7.2 නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10ක පමාණයක් ඉක්මවා යන ගනුදෙනුවක් බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරු බැංකුව සමග ඇති බව,	අනුකූල විය	iv. කිසිම අධ්‍යක්ෂවරයෙකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ
	v. අදාළ පුද්ගලයා ඔහු/ඇය අධ්‍යක්ෂවරයකු ලෙස පත්වීමට පෙර වසරක කාලයක් ඇතුළත උපදේශකයකු හෝ බැංකුවට උපදේශන සපයන සමාගමක ප්‍රධාන උපදේශකයකු ලෙස සේවය කරන්නේද යන්න පරීක්ෂා කිරීම සහ	අනුකූල විය	v. කිසිම අධ්‍යක්ෂවරයෙකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ
	vi. වර්තමානයේ අධ්‍යක්ෂවරයකු ලෙස පත්වීමට පෙර වසරක කාලයක් තුළ බැංකුවට උපදේශන සේවා සපයන සමාගමක උපදේශකයකු හෝ ප්‍රධාන උපදේශකයකු ලෙස සේවය කරමින් සිටීම සහ	අනුකූල විය	vi. කිසිම අධ්‍යක්ෂවරයෙකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ
	vii. වර්තමානයේ හෝ අධ්‍යක්ෂවරයකු ලෙස පත්වීමට පෙර වසරක කාලයක් තුළ බැංකුවට විගණන සේවා සපයන ආයතනයක හවුල්කරුවකු ලෙස සිටීම.	අනුකූල විය	vii. කිසිම අධ්‍යක්ෂවරයෙකු උපුටා දක්වන ලද නියෝග යටතට නොගැනේ
2.6	**විකල්ප අධ්‍යක්ෂවරයකු මගින් නියෝජනය**		
අ)	සමාගම විකල්ප අධ්‍යක්ෂවරු පත් කර තිබේදැයි පරීක්ෂා කිරීම සහ එය එසේ නම් මෙම විධානයෙහි එවැනි නියෝජනයකට අවසර තිබේද යන්න තහවුරු කිරීම.	අනුකූල විය	විකල්ප අධ්‍යක්ෂවරු පත් කර නොමැත.

ආ)	ස්වාධීන අධ්‍යක්ෂවරයකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබුවහොත් පත් කළ අය ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ වන නිර්ණායක සපුරන්නේදැයි පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	
ඇ)	බැංකුවේ දැනට සිටින අධ්‍යක්ෂවරුන් වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස පත් කර තිබේදැයි නිරීක්ෂණය කිරීම.	අදාළ නොවේ	
ඈ)	එක් අධ්‍යක්ෂවරයකුගේ විකල්ප අධයක්ෂවරයෙකු ලෙස පත් කරන ලද අයෙක් එම අධ්‍යක්ෂ මණ්ඩලයේම තවත් අධ්‍යක්ෂවරයෙකුගේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	
2.7	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ගණපූරණය**		
	බැංකුව නියම කරන ලද ගණපූරණයට අධ්‍යක්ෂවරුන්ගෙන් සියයට 50ට වඩා ඇතුළත් වන අතර, මෙම ගණපූරණයෙන් සියයට 50ට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතු බව පරීක්ෂා කිරීම. එවැනි රැස්වීමකදී ගණපූරණය සෑදීමට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පැමිණ සිටියද එවැනි රැස්වීමකදී සිටින අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නොවන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමත් නිසි ලෙස පැවැත්වීම නොකළ යුතු අතර, 2026. 01. 01 දින වන විට බැංකුව මෙම විධානයට අනුකූලතාවය දැක්විය යුතු වෙයි.	අනුකූල විය	අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3ට වඩා ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති.
3	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය**		
3.1	**යෝග්‍යතාවය හා සුදුසු බව තක්සේරු කරන නිර්ණායක**		
	යෝග්‍යතාවය හා සුදුසු බව සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	සියලුම අධ්‍යක්ෂවරුන්ගේ පත් වීම් සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන ඇත.
3.2	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සඳහා අතිරේක සුදුසුකම්**		
	i. අධක්ෂවරයකු ලෙස සේවය කරන පුද්ගලයාගේ වයස අවුරුදු 70 නොයික්ම වන බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	ප්‍රකාශනය මගින් තහවුරු කර පරීක්ෂා කර ඇත. සියලුම අධ්‍යක්ෂවරුන්ගේ වයස වසර 70ට අඩුවේ.
	ii. ප්‍රධාන විධායක නිලධාරියාගේ තනතුර හොබවන අධ්‍යක්ෂවරයාගේ ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන නිලධාරීන් හැර අනෙකුත් අධ්‍යක්ෂවරයකුගේ මුළු සේවා කාලය වසර 9 නොයික්ම වන බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	අවුරුදු 09ක මුළු සේවා කාලය ඉක්මවූ අධ්‍යක්ෂවරු නොමැත. සමාගම්/ආයතන 20ට අධික සංඛ්‍යාවක අධ්‍යක්ෂධුර හෙබවූ අධ්‍යක්ෂවරු නොමැත.
	iii. බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ඇතුළු සමාගම්/ආයතන 20ට අධික ප්‍රමාණයක යම් අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂ ධුර හොබවන්නේද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම.	අනුකූල විය	බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස වගකීම් ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක්
	iv. බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස සිය වගකීම් ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් තිබේදැයි පරීක්ෂා කිරීම.		

3.3	**විවේක කාලය**		
	මීට පෙර වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධාරී ධුරය දැරූ අයෙක් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී හෝ අධ්‍යක්ෂ ධුරයට පත් කිරීමට ප්‍රථම මාස හයක විවේක කාලයක් ගත කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025 වසර තුළදී උපුටා දක්වන ලද නියෝග උල්ලංඝනය කරමින් කිසිඳු පත් වීමක් සිදුකර නොමැත.
4	**කාර්යයන් පැවරීම**		
4.1	**වගකීම් බෙදා ගැනීම**		
	අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ ජීවන වියදම් දීමනා සීමාවන් පරීක්ෂා කිරීම.	අනුකූල විය	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට හා අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ කාර්යයන් පැවරීමේ බලතල සීමාවන් ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 25. 01. 08. 04
4.2	**අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා නිශ්චිත කරුණු**		
	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමුද්දේශ්‍ය විෂය මගින් බැංකුවේ අධීක්ෂණය හා පාලනය කෙසේ සිදු කරන්නේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල නොවිය	මහ බැංකු නියෝග සහ 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත අනුව බැංකුව ක්‍රියාකරයි.
4.3	**බලය පැවරීම සඳහා සීමාවන්**		
	සමස්ථයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් ඉටු කිරීමේ හැකියාවට සැලකිය යුතු ලෙස බාධා සිදුවන හෝ අඩු කරන කිසිදු කරුණක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවකට ප්‍ර.වි.නි. ට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට හෝ විධායක අධ්‍යක්ෂවරුන්ට පවරන්නේ නැති බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය සිය බලතල පවරන ලද අතර, එවැනි පැවරීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු කළමනාකරණ කමිටු සමුද්දේශ්‍ය විෂයෙහි අර්ථ දක්වා ඇති DA ප්‍රමාණය සහ අදාළ පතිපත්ති ක්‍රියාපටිපාටි මැනුවල සහ අභ්‍යන්තර චක්‍රලේඛවල අර්ථ දක්වා ඇති DA ප්‍රමාණය මත ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හරහා සිදුකර ඇත.
4.4	**බලය පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම**		
	පවතින බලය පැවරීමේ ක්‍රියාවලිය බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන පරිදි පවතින බව තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය කලින් කලට සමාලෝචනය කරන බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	එවැනි ප්‍රතිපත්ති සහ සමුද්දේශ්‍ය විෂයෙහි තීරණය කර ඇති කාලසීමාවට අනුව බලය පැවරීමේ සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත් ක්‍රියාපටිපාටියක් ඇත.
5	**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී**		
5.1	1. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික අරමුණු ආයතනික වටිනාකම් සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටිවලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරියා විසින් බැංකු ව්‍යාපාරයේ එදිනෙදා කළමනාකරණය සිදුකරන බව පරීක්ෂා කිරීම. 2. සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් වෙන් වශයෙන් ඇති අතර ඒවා එකම පුද්ගලයකු විසින් ඉටු නොකරයි.	අනුකූල විය අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත උපායමාර්ගික අරමුණු, ආයතනික වටිනාකම්, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාපිළිවෙත්වලට සමගාමීව ප්‍රධාන විධායක නිලධාරිවරයා බැංකුවේ එදිනෙදා කටයුතු කළමනාකරණය කරයි. බැංකුවේ සභාපතිවරයා හා ප්‍රධාන විධායක නිලධාරී පුද්ගලයන් දෙදෙනකු වන අතර ඔවුන්ගේ කාර්යභාරයන් වෙන වෙනම පවතී.
5.2	**සභාපතිවරයාගේ යෝග්‍යතාවය**		
	1. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකුදැයි පරීක්ෂා කිරීම සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු නොවන අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු ලේඛනගත සමුද්දේශ්‍ය විෂය සමග මාස හයකට නොයික්මවන කාලයක් සඳහා ස්වාධීන අධ්‍යක්ෂවරයකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස නම්කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	1. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. නිශාන්ත වීරකෝන් මහතා ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කර තිබිණි.

	2. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ එළිදරව් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ එළිදරව් කරනු ඇත.
	3. ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු දැනට සභාපතිවරයා ලෙස සේවය කරන්නේ නම් විධිවිධාන අංක 03 ඇතුළු අදාළ නීති හා රෙගුලාසිවලට යටත්ව එවැනි අධ්‍යක්ෂවරයෙකුට 2027 12 31 දිනෙන් ඉදිරියට නොයන තවත් කාලයක් සඳහා සේවය කළ හැකි බව පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	3. අනාගත අනුකූලතාවය සඳහා සටහන් කර ඇත.
	4. මෙම විධානය ක්‍රියාත්මක වන දිනට පසුව පත් කළ සභාපතිවරයෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු බව පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	4. අනාගත අනුකූලතාවය සඳහා සටහන් කර ඇත.
5.3	**සභාපතිවරයාගේ වගකීම්**		
අ)	අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම එහිදී සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියා කරන බවත් එහි වගකීම් නිසි ලෙස ඉටු කරන බවත් සහතික කිරීම.	අනුකූල විය	බැංකු පනතේ 42 වන පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරු සිදු කල ස්වයං ප්‍රකාශනය එළිදරව් කර තිබිණි. ස්වයං ඇගයීම් ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි.
ආ)	අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියා කරන බවත් එහි වගකීම් ඉටු කරන බවත් සහතික කරන අතර සියලුම ප්‍රධාන සහ අදාළ ගැටලු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලෝචිත අයුරින් සාකච්ඡා කරන බවත් සහතික කරයි.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සාකච්ඡා කළ සියලු කරුණු හා අනුමත වූ තීරණ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවල සඳහන් වේ.
ඇ)	සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබූ විධිමත් න්‍යාය පත්‍රයක් සමාගම් ලේකම්වරයා විසින් බෙදාහැර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	සභාපතිවරයාගේ අනුමැතිය යටතේ සියලුම අධ්‍යක්ෂවරුන් වෙත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් න්‍යාය පත්‍රය බෙදාහැර තිබිණි.
ඈ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පැනනගින ගැටලු පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරුන්ට කාලෝචිත ලෙස දැනුම් දීම පිළිබඳ සභාපතිවරයාගේ තහවුරු කිරීම, පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පැනනගින ගැටලු පිළිබඳව අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සූදානම් වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කල්ඇතිව අධ්‍යක්ෂවරු වෙත ලබා දෙයි.
ඉ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීමට හා බැංකුවේ යහපත වෙනුවෙන් ක්‍රියාකිරීමට පෙරමුණ ගන්නා සභාපතිවරයා දිරිමත් කරන ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025 වර්ෂයේදී විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය ඇගයීමට ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර තිබිණි.
ඊ)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය තක්සේරු කරන ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025 වර්ෂයේදී ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර තිබූ අතර එමගින් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය තක්සේරු කරයි.
උ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සියලුම අධ්‍යක්ෂවරුන් තීරණාත්මක හා ඵලදායී සාකච්ඡා පවත්වන බවත්, තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ විරුද්ධ අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමට සහ සාකච්ඡා කිරීමට හැකි බව තහවුරු කිරීම පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂවරු රැස්වීම්වලදී සාකච්ඡා කරණ කරුණුවලට දායක වන අතර, ඔවුන්ගේ අදහස් නිදහස්ව පකාශ කරති.
ඌ)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ හෝ විධායක තත්ත්වයේ කුමන හෝ රාජකාරියක සෘජු අධීක්ෂණය හා සම්බන්ධ කටයුතුවලට සභාපතිවරයාගේ මැදිහත් වීමක් වන බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	සභාපතිවරයා ප්‍රධාන කළමනාකරන නිලධාරීන්ගේ හෝ වෙනත් විධායක රාජකාරි කටයුතු සඳහා සෘජු අධීක්ෂණ කටයුතුවල නියැළීමත් සිදු නොකරයි.

සෘ)	කොටස්කරුවන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යෑම සඳහා සහ කොටස්කරුවන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාගැනීම සඳහා ක්‍රියාවලියක් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	බැංකුවේ හිමිකාරිත්වය සියයට 100%ක් රජය සතු වන අතර, සියලුම අධ්‍යක්ෂවරු පත් කිරීම අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබයි භාණ්ඩාගාරයේ නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්ථිර සාමාජිකයකු වෙයි.
5.4	**ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කටයුතු**		
	ඒ. බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතුවල එදිනෙදා කළමනාකරණය භාරව ඇති ඉහළ විධායක නිලධාරියකු ලෙස ප්‍ර.වි.නි. ක්‍රියාකරන බවත්, වෙනත් කිසියම් විධායක රාජකාරියක නොයෙදෙන බවත් පරීක්ෂා කිරීම.	අනුකූල විය	ඒ. බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතුවලට එදිනෙදා කළමනාකරණය භාරව ඇති ඉහළ විධායක නිලධාරියකු ලෙස ප්‍ර.වි.නි. ක්‍රියා කරයි ඔහු වෙනත් කිසියම් විධායක රාජකාරියක නොයෙදෙයි.
	ආ. බලපත්‍රලාභී බැංකුවක අනුබද්ධිත ආයතනයක හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස හැර වෙනත් බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් සමාගමක/ආයතනයක සේවකයකු හෝ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම හෝ නම් කිරීම සිදු නොකිරීම පරීක්ෂා කිරීම.	අනුකූල විය	ආ. ප්‍රධාන විධායක නිලධාරිවරයා වෙනත් බලපත්‍රලාභී බැංකුවක හෝ යම්කිසි සමාගමක/ආයතනයක සේවකයකු හෝ අධ්‍යක්ෂවරයකු නොවේ.
5.5	**ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ යෝග්‍යතාවය**		
	බැංකු පනතේ 44A සහ 76H වගන්ති ප්‍රකාරව පධාන විධායක නිලධාරියා ලෙස පත් කරන පුද්ගලයා, එවැනි තනතුරක් දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයෙක්ද යන්න සහ අතීනවින බැංකු කටයුතු පිළිබඳව ප්‍රමාණවත් දැනුමක්, දක්ෂතාවයක් හා නිපුණතාවයක් සහ විශේෂඥතාවයක් තිබිය යුතු බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීමට සුදුසු බව හා යෝග්‍යතාවය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු අනුමැතිය ලබාගෙන ඇත.
6	**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු**		
6.1	**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සඳහා වන අවශ්‍යතාවයන්**		
	මෙම විධිවිධානයන්හි 6.2 6.6 විධිවිධානවල දක්වා ඇති පරිදි සෑම බලපත්‍රලාභී බැංකුවක් සඳහාම අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පහක් තිබිය යුතු වෙයි.	අනුකූල විය	බැංකුව පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත. i. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) ii. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) iii. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC) iv. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) v. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC) vi. අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව
	ඒ. සෑම කමිටුවක්ම සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු වෙයි.	අනුකූල විය	
	ආ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම කමිටුවකටම බලතල පැවරීම විශේෂයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියාකිරීමට කමිටුවට බලය තිබේද නැතහොත් නිශ්චිත ගැටලුවක් පරීක්ෂා කර නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමට බලය තිබේද යන්න දැක්විය යුතු වෙයි.	අනුකූල විය	
	ඇ. සෑම කමිටුවකටම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති සමුද්දේශ්‍ය විෂයක් ඇත.	අනුකූල විය	ඒ. සෑම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තාවක්ම සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ යුතු වෙයි.
	ඈ. අනෙකුත් කරුණු අතර කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් කැඳවීමට සහ ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා පවත්වා ගැනීමට ලේකම්වරයකු පත් කළ යුතු වේ. සියලුම කමිටුවල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.	අනුකූල විය	ආ. ශ්‍රී ලංකා මහ බැංකු උපදෙස්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සමුද්දේශ්‍ය විෂයෙහි (TOR) සෑම කමිටුවකටම ඇති බලතල දක්වා ඇත.
	ඉ. සෑම කමිටුවකම ගණපූරණය අවම වශයෙන් කමිටු සාමාජිකයන් සංඛ්‍යාවෙන් හරි අඩක් විය යුතු වේ.	අනුකූල විය	ඇ. සෑම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවකටම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත කර ඇති සමුද්දේශ්‍ය විෂයක් (TOR) ඇත.

	ඌ. වාර්ෂික මහා සභා රැස්වීමේදී සෑම කමිටුවකම රාජකාරි හා කාර්යභාරයේ කාර්යසාධන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ යුතු වෙයි.	අනුකූල විය	ඈ. නියමිත අරමුණු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම කමිටුවකටම ලේකම්වරයෙකු පත් කර ඇත. ඉ. සෑම කමිටුවකටම ගණපූරණය සඳහා කමිටු සාමාජිකයන්ගෙන් හරි අඩක් අඩංගු වේ. ඊ. වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සංයුතිය රාජකාරි කාර්යභාරය හා කාර්යසාධනය ඇතුළුව සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විස්තර එළිදරව් කර ඇත.
6.2	**විගණන කමිටුව**		
අ)	කමිටුවේ සභාපතිවරයා, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු බවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක සභාපතිවරයා නොවන බවත් මූල්‍ය ගිණුම්කරණය සහ හෝ විගණනය පිළිබඳව සුදුසුකම් හා පළපුරුද්ද ඇති බවත්, පිළිගත් වෘත්තීය ගණකාධිකරණ ආයතනයක සාමාජිකත්වයක් ඇති බවත් පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු වූ අතර, ඔහුට අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ඇත. වසරේ පළමු රැස්වීම් පහ සඳහා රෝහණ වික්‍රමසිංහ මහතා සභාපතිත්වය ඉසිලූ අතර, ආනන්ද සෙනෙවිරත්න මහතා 17. 12. 2025 දින පැවති රැස්වීමේ සිට බල පැවැත්වෙන පරිදි සභාපතිවරයා ලෙස පත් කර තිබිණි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයා පහත සඳහන් සුදුසුකම් දරයි. ■ රාජ්‍ය පරිපාලන විද්‍යාවේදී උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ■ කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ■ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයකි. ■ මූල්‍ය අංශයේ වසර 15කට වඩා ලබා ඇති පළපුරුද්ද
ආ)	ස්වාධීන අධ්‍යක්ෂවරු වැඩි පිරිසක් සමග කමිටුවේ සියලුම සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. බැංකුවේ මෙහෙයුම් සංකීර්ණතාවය සහ ප්‍රමාණයේ විවිධත්වය සමග අනුරූප වන විගණනය, ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ කුසලතා හා විශේෂඥ දැනුමේ සාමූහික තුලනයක් සාමාජිකයන් සතු විය යුතු වෙයි.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙයින් දෙදෙනෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, එක් අයෙකු ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වෙයි. සාමාජිකයන් සතුව මූල්‍ය ගිණුම්කරණය බැංකුකරණය සහ විගණනය පිළිබඳ විශේෂඥ දැනුමක් හා කුසලතා තුලනයක් ඇත.
ඇ)	කමිටුවේ සාමාජිකයන්ගෙන් බහුතරය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගෙන් ගණන් නොගත යුතු වන අතර, මෙය ප්‍රතිලෝම වශයෙන් ද එසේ සිදුවිය යුතුය.	අනුකූල විය	අධ්‍යක්ෂවරුන්ගෙන් කිසිවෙකු අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් නොවෙති.
ඈ)	ඉහත සඳහන් කරුණු වෙනුවෙන් කමිටුව නිර්දේශ ඉදිරිපත් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	බාහිර විගණකවරයා විගණකාධිපතිවරයා වන අතර, ඔහු ශ්‍රීලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මුදල් පනත/විගණන පනත සහ 1975 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 65 පරිච්ඡේදය අනුව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පරිච්ඡේද අංක 12 අනුව පත් කරනු ලබයි.
	i. අදාළ ප්‍රඥප්තිවලට අනුකූලව විගණන සේවා සැපයීම සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම.	අනුකූල විය	අදාළ වන විට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් නිර්දේශ කරනු ලබයි.

	ii. වරින්වර විගණකවරුන්ට නිකුත් කරන ලද මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම. iii. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිතය සහ සේවා කාලය විගණන ගාස්තුව යන බාහිර විගණකගේ ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහ කිරීමත්, බාහිර විගණක සහකරු සේවයේ යෙදවීම වසර හයක් නොයික්මවිය යුතු බවත්, වසර තුනක් ඉකුත් වීමට පෙර නිශ්චිත විගණක සහකරු විගණනය සඳහා නැවත සම්බන්ධ කර නොගත යුතු බව.	අදාළ නොවේ	ගෙවිය යුතු විගණන ගාස්තු පිළිබඳව විගණන කමිටුව නිර්දේශ සිදුකර ඇත. අදාළ නොවේ. 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව බාහිර විගණකවරයා විගණකාධිපතිවරයා වෙයි.
ඉ)	තම ස්වාධීනත්වය පිළිබඳව බාහිර විගණකවරුන්ගේ කරුණු ඉදිරිපත් කිරීම කමිටුව ලබා ගෙන තිබීම හා විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	ස්වාධීන ප්‍රකාශයක් ලබා ගෙන ඇති අතර, එය වාර්ෂික වාර්තාවේ එළිදරව් කර ඇත.
ඊ)	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බාහිර විගණකවරුන්ට නිකුත් කරන ලද මාර්ගෝපදේශ විගණන නොවන සේවාවන් සැපයීම සඳහා බාහිර විගණකවරයෙකු සම්බන්ධ කර ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ අඩංගු විධිවිධාන අනුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තියේ විධිවිධානවලට අනුව විගණකාධිපතිවරයා පත් කර ඇත.
උ)	වීගණනය ආරම්භ කිරීමට ප්‍රථම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව විගණනයේ විෂය පථය හා ස්වභාවය කුමක්දැයි බාහිර විගණකවරුන් සමග කමිටුව සාකච්ඡා කර තීරණය කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ අඩංගු විධිවිධාන අනුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තියේ විධිවිධානවලට අනුව විගණකාධිපතිවරයා පත් කර ඇත.
ඌ)	ගිණුම්කරණ ප්‍රතිපත්ති/ක්‍රම සහ අභ්‍යන්තර පාලන රාමුව කමිටුව විසින් සමාලෝචනය කර තිබේදැයි තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තා පරීක්ෂා කිරීම.	අනුකූල විය	පහත සඳහන් විගණන කමිටු රැස්වීම්වලදී බැංකුවේ මූල්‍ය තොරතුරු කමිටුව සමාලෝචනය කර තිබිණි. 28/02/2025, 07/09/2025, 05/04/2025, 18/09/2025, 30/10/2025
ඍ)	එළිදැක්වීම සඳහා පිළියෙළ කර ඇති බැංකුවේ කාර්තුමය වාර්තා, ගිණුම්, වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයන්හි විශ්වාසනීයත්වය අධීක්ෂණය කිරීම සඳහා මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමට කමිටුව ක්‍රියාවලියක් සහ පහත සඳහන් ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගෙන් ලබා ගැනීමට ද ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම. i. ප්‍රධාන තීන්දු ගත යුතු කේෂ්ත්‍ර ii. ගිණුම් ප්‍රතිපත්ති හා ව්‍යාපාරවල වෙනස්වීම් iii. වීගණනයේදී පැනනගින ප්‍රධාන ගැළපීම් iv. ව්‍යාපාර අඛණ්ඩතාවය පිළිබඳ උපක්ලපන සහ v. අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා වෙනත් නෛතික අවශ්‍යතා සමග අනුකූලතාවය	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් විගණන කමිටු රැස්වීම් තුළින් මූල්‍ය තොරතුරු සමාලෝචනය කර ඇත. 28/02/2025, 07/09/2025, 05/04/2025, 18/09/2025, 30/10/2025

සෘ)	වීගණනයට සම්බන්ධ ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහභාගි නොවන යම්කිසි කරුණකට අදාළව බාහිර විගණකවරුන් කමිටුව හමුවීම පරීක්ෂා කිරීම.	අනුකූල විය	විධායක කළමනාකරණය නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව 07. 07. 2025 සහ 17. 12. 2025 පැවති රැස්වීම්වලදී බාහිර විගණකවරයා හමුවී තිබිණි.
ඌ)	බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය හා ඒ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව සමාලෝචනය කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	2024 මූල්‍ය වර්ෂය සඳහා බාහිර විගණකවරයාගේ කළමනාකරණ ලිපිය විගණන කමිටුව සමාලෝචනය කර තිබූ අතර, 17. 12. 2025 දින පැවති රැස්වීමේදී කළමනාකරණයේ ප්‍රතිචාර එයට දක්වා තිබිණි.
ඍ)	බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළව කමිටුව පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලබන බව පරීක්ෂා කිරීම: අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සම්පත් කාර්යයන් සහ විෂය පථයේ ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කරන අතර දෙපාර්තමේන්තුවට එහි වැඩ කටයුතු සිදුකරගෙන යෑම සඳහා අවශ්‍ය බලතල ඇති බවට සෑහීමකට පත් වෙයි.	අනුකූල විය	2024. 12. 11 දින පැවති රැස්වීමේදී විගණන කමිටු පත්‍රිකා අංක බීඒසී/24/06/03 මගින් 2025 අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර තිබිණි.
	i. අභ්‍යන්තර විගණන වැඩ සටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සඳහා අවශ්‍යතාවය පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත සුදුසු පියවර ගැනීම සහතික කිරීම;	අනුකූල විය	i. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මගින් අභ්‍යන්තර විගණන අංශයට ඔවුන්ගේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය බලය පවරා ඇත. විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම කාර්තුමය වශයෙන් සමාලෝචනය කර ඇති අතර, අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කර අවශ්‍ය වූ සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.
	ii. අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කිසියම් ඇගයීමක් හෝ තක්සේරුව පිළිබඳ සමාලෝචනය කිරීම.	අනුකූල විය	ii. කාර්යසාධක කරුණු සම්බන්ධයෙන් විගණන කමිටුව ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය ඇගයීමට ලක් කරයි. අභ්‍යන්තර විගණන අංශයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්යසාධන තක්සේරුව ප්‍රධාන විගණක විසින් තක්සේරු කරනු ලැබේ.
	iii. අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රධානි හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ බාහිර සේවා සපයන්නන්ගේ පත්කිරීම හෝ සේවය අවසන් කිරීම නිර්දේශ කිරීම.	අදාළ නොවේ	iii. සමාලෝචිත වර්ෂය තුළදී එවැනි සිදුවීමක් සිදුවී නොමැත.
	iv. ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිර සේවා සපයන්නන් ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් කමිටුව ඇගයීමට ලක් කරන අතර ඉල්ලා අස්වීම සඳහා හේතු ඉදිරිපත් කිරීමට ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිර සේවා සපයන්නන් වෙත අවස්ථාව ලබා දෙන බව පරීක්ෂා කිරීම;	අදාළ නොවේ	iv. සමාලෝචිත කාලය තුළදී ඉල්ලා අස්වීම් සිදුවී නොමැත.
	v. අභ්‍යන්තර විගණන කාර්ය එහි විගණන ක්‍රියාකාරකම් වලින් ස්වාධීනව සිදුකරන බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	v. අභ්‍යන්තර විගණන අංශය එමගින් සිදුකරන මෙහෙයුම් කටයුතු විගණනය සඳහා සහභාගි නොවේ.
එ)	අභ්‍යන්තර පරීක්ෂණවලින් සොයාගත් කරුණු හා ඒ සඳහා කළමනාකරණය දැක්වූ ප්‍රතිචාර කමිටුව විසින් සැලකිල්ලට ගෙන තිබේදැයි තහවුරු කර ගැනීම.	අනුකූල විය	අභ්‍යන්තර විගණනය මගින් නිකුත් කරන ලද විමර්ශන වාර්තාවල ඉස්මතු කර ඇති ප්‍රධාන සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇත.
ඒ)	විධායක අධ්‍යක්ෂවරුන් හා කළමනාකරණය නොමැතිව බාහිර විගණකවරුන් සමග අවම වශයෙන් කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	විධායක කළමනාකරණය නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වර්ෂය තුළදී 07. 07. 2022 සහ 17. 12. 2025 දිනයන්හිදී බාහිර විගණක හමුවී ඇත.

වෙ)	i. කමිටුවේ සමුද්දේශ්‍ය විෂය පරීක්ෂාකර පහත දෑ තහවුරු කිරීම. ii. එහි සමුද්දේශ්‍ය විෂය තුල ඇති ඕනෑම කරුණක් විමර්ශනය කිරීමට ඇති පැහැදිලි බලතල iii. එසේ කිරීමට අවශ්‍ය සම්පත් iv. තොරතුරු ලබාගැනීමේ පූර්ව ප්‍රවේශය v. අවශ්‍යනම්, බාහිර වෘත්තීය උපදෙස් ලබාගැනීමට සහ අදාල අත්දැකීම් සහිත බාහිර පුද්ගලයින්ට සහභාගීවීමට ආරාධනා කිරීමට ඇති බලතල	අනුකූල විය	අභ්‍යන්තර විගණන සැලැස්ම 2025 2024. 12. 11 දින පැවති විගණන කමිටු රැස්වීමේදී පත්‍රිකා අංක BAC/24/06/03 මඟින් අනුමත වී තිබිණි.
ඔ)	කමිටුව අවම වශයෙන් සිව් වතාවක්වත් රැස්වී ඇති බව හා වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල විය	සමාලෝචිත කාලය තුළදී කමිටුව පස් වතාවක් රැස්වී ඇත.
ඕ)	කමිටුවේ ලේකම්වරයා සමාගම් ලේකම්වරයා ද නැතහොත් අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රධානියා ද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය	කමිටුවේ ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වේ.
ඖ)	අනුමත අයථා ක්‍රියා දැනුම් දීමේ ප්‍රතිපත්තිය පරීක්ෂා කර අයථා ක්‍රියා දැනුම් දීමේ කරුණු ස්වාධීන විමර්ශනයක් සමග විගණන කමිටුවට වාර්තා කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025 වර්ෂය සඳහා අයථා ක්‍රියා දැනුම් දීමේ පතිපත්තිය විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කර තිබිණි. අභ්‍යන්තර විගණන අංශය ස්වාධීන පරීක්ෂණයක් සිදුකර විගණන කමිටුවට වාර්තා කර තිබිණි.
6.3	**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව**		
අ)	සභාපතිවරයාගේ පැතිකඩ පරීක්ෂා කර ස්වාධීනත්වය තහවුරු කිරීම.	අනුකූල විය	කමිටු සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වෙයි
ආ)	කමිටු සාමාජිකයන්ගේ විස්තර සහ කමිටුවේ සමුද්දේශ විෂය පරීක්ෂා කිරීම ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් සමන්විත වීම වඩාත් යෝග්‍ය වේ.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සමුද්දේශ්‍ය විෂයක් ඇත. කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වෙයි.
ඇ)	වාර්තා සමාලෝචනය කරමින් ප්‍රධාන විධායක නිලධාරියාට අදාල කරුණු සාකච්ඡා කරන කමිටු රැස්වීම් වලට ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී නොවන්නේ දැයි සමුද්දේශ්‍ය විෂයෙහි සඳහන් වීම පරීක්ෂා කිරීම.	අනුකූල විය	ප්‍ර.වි.නි පිළිබඳ කරුණු සාකච්ඡා කරන රැස්වීමකට ඔහු සහභාගි නොවිය යුතු යැයි සමුද්දේශ විෂයෙහි දැක්වේ.
ඈ)	අධ්‍යක්ෂවරුන් ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික (වැටුප් දීමනා සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම යෑමේදී ලබාදෙන විශේෂ ගෙවීම්) ප්‍රතිලාභ සහ මූල්‍ය නොවන සහ අනෙකුත් මූල්‍යමය ගෙවීම් තීරණය කිරීම සඳහා කමිටුව පතිපත්තියක් කියාත්මක කර තිබේදැයි පරීක්ෂා කිරීම	අනුකූල විය	අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 3/2015 සහ චකලේඛ අංක PED 01/2020 මත පදනම් වේ. රජයේ ප්‍රධාන බැංකු 3ක වැටුප් වර්ධක සලකා බලා සාමුහික ගිවිසුමට අනුකූලව ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ගේ පාරිශ්‍රමික තීරණය කරනු ලබන අතර මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි.
ඉ)	අධ්‍යක්ෂවරුන් ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් සඳහා ඉලක්ක හා පරමාර්ථ ලිඛිතව සකසා ඇත්දැයි පරීක්ෂා කිරීම	අනුකූල විය	අධ්‍යක්ෂවරු, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාර නිලධාරීන් සඳහා ඉලක්ක හා අරමුණු 2025-2029 සංශෝධිත ආයතනික සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇත. කලින් කලට සපයා ඇති ඉලක්ක හා අරමුණු සඳහා ප්‍රධාන කළමණාකරණයේ නිලධාරීන් හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යසාධන මට්ටම් තවදුරටත් ක්‍රියාවලි ගත කරමින් පවතී.

ඊ)	ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්හට ලබා දී ඇති ඉලක්ක හා අරමුණු පිළිබඳව කාලීනව කාර්යසාධන ඇගැයීම් සිදු කිරීමට කමිටුව අවධානය යොමුකර ඇත්දැයි හා ඔවුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිලාභ හා කාර්යසාධනය පදනම් කරගත් දිරි දීමනා වැනි වෙනත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම පිළිබඳ පරීක්ෂා කිරීම.	අනුකූල විය	ප්‍රධාන කළමණාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක්කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව විසින් නියමකරන ලද ප්‍රධාන කාර්යසාධක දර්ශක වලට අනුව ඔවුන්ගේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීමෙනි. තවදුරටත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍ර.වි.නි.ගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක්කරයි. අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි, සහකාර සාමාන්‍යාධිකාරිඅනුකූලතාගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවදානම් කළමනාකරණ ප්‍රධානීගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමික සාමූහික ගිවිසුම පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි.
උ)	අධ්‍යක්ෂවරුන්ට ප්‍ර. වි. නි. ට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට රැකියාව අවසන් කිරීමේදී හෝ විශ්‍රාම යෑමේදී ලබාදුන් විශේෂ ගෙවීම්/මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහා ලියාපදිංචි කොටස් හිමියන්ගේ අනුමැතියක් ලබාගෙන තිබේදැයි පරීක්ෂා කිරීම. (බලපත්‍රලාභී බැංකු සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රාග්ධනයෙන් සියයට 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය සතු නම් බැංකුවේ ඡන්ද අයිතිය ඇති අතර, එවැනි පූර්ණ අනුමැතිය භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් ලබාගත යුතු වෙයි.	අදාළ නොවේ	එවැනි අවශ්‍යතාවයක් පැනනැඟී නොතිබිණි.
ඌ)	අධ්‍යක්ෂවරුන්ට ප්‍රධාන විධායක නිලධාරියාට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ලබාදෙන වන්දි මුදල බැංකුවේ අවදානම් රුචිකත්ව සීමාවන් තුළ තිබේද යන්න පිළිබඳව අවදානම් කමිටුවෙන් සන්නිවේදන එකඟතා තිබේදැයි පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	එවැනි අවශ්‍යතාවයක් පැනනැඟී නොතිබිණි.
ෘ)	බලපත්‍රලාභී බැංකුවක ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට සිදුකරන ලද කාර්ය සාධනය මත පදනම් වූ ගෙවීම් සඳහා වූ වෙනත් අවශ්‍යතාවයන් අතර වංචා සහ අරමුදල් අවභාවිතය යන තත්ත්වයන් යටතේ බලපත්‍රලාභී බැංකුවට සිදුවන මූල්‍ය අලාභයේ ප්‍රමාණය සඳහා ප්‍රතිපත්තියක් ඇත්දැයි පරීක්ෂා කිරීම. ලේඛනයට ක්ලෝ බැක් විධිවිධාන ඇතුළත් කර තිබේදැයි තහවුරු කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ රැකියා කොන්ත්‍රාත්තු පරීක්ෂා කිරීම.	අනුකූල විය	මෙය අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු සමුද්දේශ විෂයෙහි අඩංගු වේ. අනාගතයේ පත්වන සියලුම ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පත්වීම් ලිපිවල මෙම වගන්තිය ඇතුළත් කරනු ඇත. කෙසේ වෙතත් මෙම වගන්තිය දැනට සිටින ප්‍ර.වි.නි.ගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පත්වීම් ලිපිවල අඩංගු නොවේ.

6.4	**නාමයෝජනා හා පාලන කමිටුව**		
අ)	ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් සමන්විත කමිටුවේ සභාපතිත්වය ස්වාධීන අධ්‍යක්ෂවරයකු විසින් දරන බව පරීක්ෂා කිරීම. ප්‍ර.වි.නි. ඔහු පිළිබඳ සාකච්ඡා නොකරන රැස්වීම් සඳහා ආරාධනයෙන් සහභාගි වෙයි.	අනුකූල විය	කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ. දෙදෙනකු විධායක නොවන අධ්‍යක්ෂවරු වන අතර, කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු වෙයි. ප්‍ර.වි.නි. පිළිබඳ කරුණු සාකච්ඡා කරන රැස්වීම්වලට හැර ඔහු රැස්වීම් සඳහා සහභාගි වෙයි.
ආ)	නව අධ්‍යක්ෂවරු ප්‍ර.වි.නි හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තේරීම/පත් කිරීම සඳහා කමිටුව විධිමත් හා විනිවිදභාවයෙන් යුත් ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ ප්‍රතිපාදන අනුව අමාත්‍යාංශය විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබයි. බැංකුවේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගන්නා අතර, තෝරාගත් අයැදුම්කරුවන් විගණන කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය සහ අනුමැතිය යටතේ බඳවා ගනු ලබයි. බැංකුවේ අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් හා යෝග්‍යතාවය සඳහා මහ බැංකු අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සියලු අධ්‍යක්ෂවරු සහ කළමනාකරණ නිලධාරීන් පත් කරනු ලැබේ.
ඇ)	අංක 03 හා 8.2 විධිවිධානවල දක්වා ඇති පරිදි සහ අදාළ නීති හා රෙගුලාසිවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් තනතුරු දැරීමට සුදුසු බවට අත්සන් කරන ලද ප්‍රකාශ කමිටුව විසින් ලබාගෙන තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂවරුන්ගේ ප්‍ර.වි.නි.ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සම්පූර්ණ කරන ලද ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ලබාගෙන මහ බැංකුව වෙත යොමු කර ඇත.
ඈ)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලදී අවදානම් නිලධාරී සහ ප්‍රධාන අනුකූලතා නිලධාරී තෝරා ගැනීම සහ විගණන කමිටු රැස්වීම්වලදී සහතිකලත් අභ්‍යන්තර විගණක තෝරා ගැනීම පිළිබඳව අදහස් සාකච්ඡා කර තිබේදැයි තහවුරු කර ගැනීමට වාර්තා පරීක්ෂා කිරීම.	අනුකූල විය	සහතික කළ අභ්‍යන්තර විගණන ප්‍රධාන අවදානම් නිලධාරී සහ අනුකූලතා නිලධාරියා තෝරා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට BIRMC/BAC නියෝජනය කරන අධ්‍යක්ෂවරු සහභාගි වූහ.
ඉ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සමස්තයක් ලෙස ඉටු කිරීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන ලද කාර්යසාධනය සහ දායකත්වය වරින්වර ඇගයීම මඟින් වත්මන් අධ්‍යක්ෂවරුන් නැවත තෝරා පත් කර ගැනීම කමිටුව සලකා බලා නිර්දේශ කර තිබේද? (නැතහොත් නිර්දේශ කර නොතිබේද) යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය	අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව දැනට සිටින අධ්‍යක්ෂවරුන් (දැනට සේවය කරන) නැවත පත් කිරීමට නිර්දේශ කර ඇත.
ඊ)	2. 5. ආ විධිවිධානය ප්‍රකාරව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයේ තත්ත්වය කාර්තුමය ලෙස පරීක්ෂා කර එවැනි අධ්‍යක්ෂවරුන්ට ස්වාධීනව රාජකාරි සිදු කිරීමේ හැකියාවට බාධාවක් විය හැකි කිසියම් බැදියා ගැටුමක් තිබේද යන්න සහ ස්වාධීන තත්ත්වයට ඇති වෙනස්කම් (තිබේ නම්) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීම.	අනුකූල විය	සමාලෝචිත කාලය තුළදී අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනව රාජකාරි ඉටු කිරීමේ හැකියාවට බාධාවක් විය හැකි හෝ නිරීක්ෂණය වී ඇති ස්වාධීනත්වයට බලපාන කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

ඇ)	රැකියා විස්තර සමාලෝචනය මඟින් ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරී තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා යෝග්‍යතාවය සලකා බැලීමට අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද සහ අනෙකුත් ප්‍රධාන අවශ්‍යතා වැනි නිර්ණායක කමිටුව සකසා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇතුළත් වේ.
ඈ)	විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලසුමක් පිළිබඳව කමිටුව අවධානය යොමුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය මඟින් අධ්‍යක්ෂවරු පත් කිරීම පාලනය වන අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට කලින් කලට අධ්‍යක්ෂවරු පත්කිරීම/නම් කිරීම අමාත්‍යවරයා විසින් සිදු කරයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වන අනුප්‍රාප්තික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව කමිටුව විසින් නිර්දේශ කර ඇත.
ඉ)	පහත සඳහන් කරුණු සලකා බලමින් ප්‍ර.වි.නි.ට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ශක්තිමත් අනුප්‍රාප්තික සැලැස්මක් තිබේදැයි පරීක්ෂා කිරීම. i. බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණතාවය සැලකිල්ලට ගෙන කෙටි, මධ්‍ය හා දිගුකාලීනව අනුප්‍රාප්තික සඳහා ප්‍ර.වි.නි. සහ කළමනාකරණ නිලධාරීන්ගේ තනතුරු සඳහා සුදුසුකම්ලත් සහ දක්ෂ පුද්ගලයන් (අභ්‍යන්තරව/බාහිරව) හඳුනා ගැනීම. ii. අදාළ කේෂ්ත්‍රය සඳහා කුසලතා/දැනුම හඳුනාගෙන පරතරය අවම කිරීමෙන් අදාළ තනතුරු සඳහා තෝරාගත් අනුප්‍රාප්තිකයන් වෙන් කිරීම සහ iii. අවම වශයෙන් වාර්ෂික පදනමින් අනුප්‍රාප්තික සැලැස්ම සැකසීම.	අනුකූල විය	දෙවන මට්ටමේ අනුප්‍රාප්තිකයන් ලෙස තෝරා ගැනීම සඳහා අදාළ කේෂ්ත්‍රවල අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහිත සුදුසු අය බැංකුව හඳුනාගෙන ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික ප්‍රතිපත්තියේ වාර්ෂික සමාලෝචනය 2024 දෙසැම්බර් 13 දින සිදුකර ඇත.
ඌ)	බැංකු කේෂ්ත්‍රයට අදාළ නීති රෙගුලාසි, සාර්වආර්ථික ප්‍රතිපත්ති තාක්ෂණික වර්ධනයන් සහ දියුණු වන මූල්‍ය අංශය සහ වෙළෙඳ පළ සංවර්ධනයන් පිළිබඳව අධ්‍යක්ෂවරු අඛණ්ඩව දැනුවත් කර ඇති බව තහවුරු කිරීම සඳහා පුහුණුවීම් හෝ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීම.	අනුකූල විය	බැංකු කේෂ්ත්‍රයට අදාළ නීති රෙගුලාසි, සාර්වආර්ථික ප්‍රතිපත්ති තාක්ෂණික වර්ධනයන් සහ දියුණුවන මූල්‍ය අංශය සහ වෙළෙඳ පළ සංවර්ධනයන් පිළිබඳව අඛණ්ඩ දැනුවත් කිරීම් සහතික කිරීම සඳහා අධ්‍යක්ෂවරු දැනුවත් කිරීම වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මහ බැංකු විධිවිධාන ප්‍රවෘත්ති පත්‍ර සහ ඕනෑම යාවත්කාලීන කිරීමක් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම පිණිස බෙදාගනු ලැබේ.
ඍ)	පහත දක්වා ඇති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් සියලුම සාමාජිකයන්ගේ පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා අධ්‍යක්ෂ මණ්ඩලය නිතර නිතර සමාලෝචනය කර එකඟ වී ඇති බව පරීක්ෂා කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම නිරීක්ෂණය කිරීම වසර තුළ පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකළ බව සටහන් කර ගැනීමට අදාළ ලේඛන පරිශීලනය කරන්න.	අනුකූල නොවේ.	අනුකූලතා අංශයෙන් සම්බන්ධීකරණය කරන ලද සිදුකළ පුහුණු වැඩසටහන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර තිබිණි. කෙසේ නමුත් සමාලෝචිත කාලය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පුහුණු අවශ්‍යතාවයන් පිළිබඳව නිත්‍ය සමාලෝචනයක් සිදුකර නොතිබිණි.

ඌ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනු කමිටුවල අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනයේ සාක්ෂි පරීක්ෂා කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනු කමිටුවල ව්‍යුහය, ප්‍රමාණය සුදුසුකම් හා සංයුතිය ස්ථාපිත කිරීම.	අනුකූල විය	කමිටු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තෝරාගෙන ඇත්තේ ඔවුන්ගේ අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද මෙන්ම ඔවුන්ගේ විශේෂඥතාවයන් සැලකිල්ලට ගනිමිනි.
එ)	බැංකුවේ ආයතනික පාලන රාමුව සහ ප්‍රතිපත්ති කලින් කලට සමාලෝචනය කර ඵලදායී ලෙස යාවත්කාලීන කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	බැංකුවේ ආයතනික පාලන රාමුව එහි නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා හා මෙහෙයුම් අවශ්‍යතාවල වෙනස්කම්වලට අනුකූල වන බව තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්ති, සමුද්දේශ්‍ය විෂය සහ ක්‍රියාපටිපාටි වරින්වර යාවත්කාලීන කරයි.
6.5	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව**		
අ)	සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක සභාපතිවරයා නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක්ද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය	කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර, වෙනත් කිසිඳු අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක සභාපතීත්වය නොඋසුලයි.
ආ)	කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනකු, ප්‍රධාන විධායක නිලධාරි සහ ණය, වෙළෙඳ පොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත ද යන්න පරීක්ෂා කිරීම හා කමිටුවට පවරා ඇති බලතල හා සාධාරණත්වයේ රාමුව තුළ කටයුතු කිරීම.	අනුකූල විය	කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වෙයි. ප්‍ර.වි.නි. අවදානම් ප්‍රධානී, අනුකූලතා නිලධාරි, ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරි ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි වෙති. අනෙකුත් කළමනාකරණ නිලධාරීන් අවශ්‍ය වූ විට කැඳවයි.
ඇ)	කමිටුවේ සාමාජිකයන්ගෙන් බහුතරය විගණන කමිටුවේ සාමාජිකයන් නියෝජනය නොකරන බව පරීක්ෂා කිරීම (අනෙක් පසටද මෙය එසේ විය යුතුය)	අනුකූල විය	කිසිම සාමාජිකයකු විගණන කමිටුවේ සාමාජිකයන් නොවේ.
ඈ)	CEO, CRO, CCP සහ KMPS රැස්වීම්වලට අවශ්‍යතාවයන් මත පදනම්ව සහභාගි වන බව තහවුරු කිරීමට BIRMC වාර්තා පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025. 10. 24 දින දරණ වාර්තාව අනුව මෙය අනුකූල වී ඇත.
ඉ)	බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සඳහා ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්ය වගකිව යුතුදැයි පරීක්ෂා කිරීම	අනුකූල විය	අවදානම් කළමනාකරණ කාර්යය යනු අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කරන ස්වාධීන කාර්යයකි. බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව කළමනාකරණය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම වගකිව යුතු අතර, සියලුම අවදානම් කේෂ්ත්‍රවල ස්ථාවර අධීක්ෂණය සහතික කරයි. රැස්වීම් වාර්තා සමාලෝචනය කිරීමෙන් තහවුරු වන්නේ උපයෝගිතා මට්ටම්, කඩකිරීම් සහ KRI ප්‍රවණතා ඇතුළුව අවදානම් භාරගැනීම පිළිබඳ වරින්වර යාවත්කාලීන කිරීම්, අවදානම් කළමනාකරණ කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා කරන බවත්, අනුමත අවදානම් සීමාවන් සමග අබණ්ඩව පෙළගැස්වීමට සහාය වන බවත්ය.
ඊ)	කළමනාකරණ තොරතුරු සහ සුදුසු අවදානම් දර්ශක හරහා මාසිකව බැංකුවේ මෙහෙයුම් හා උපාය මාර්ගික අවදානම්, ද්‍රවශීලතාවය, වෙළඳපල හා ණය වැනි සියලුම අවදානම් කත්සේරු කිරීමේ කියාවලියක් කමිටුවට තිබේදැයි පරීක්ෂා කිරීම. අනුබද්ධිත සමාගම් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණය බැංකු පදනමින් හා සමූහ පදනමින් සිදුකළ යුතු වෙයි.	අනුකූල විය	අවදානම් කළමනාකරණ අංශය මඟින් ණය අවදානම, වෙළඳපළ අවදානම, මෙහෙයුම් අවදානම, උපායමාර්ගික අවදානම සහ ද්‍රවශීලතා අවදානම ප්‍රමාණවත් පරිදි මාසිකව තක්සේරු කරන අතර, එය කාර්තුමය පදනමකින් අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි.

උ)	අවදානම් රුචියට සම්බන්ධ කාලීන යාවත්කාලීන කිරීම් සඳහා වාර්තා පරීක්ෂා කිරීම	අනුකූල විය	රැස්වීම් වාර්තා සමාලෝචනය, ප්‍රයෝජනයට ගන්නා ප්‍රමාණ සහ ප්‍රධාන අවදානම් දර්ශක අවදානම් රුචියේ කාලීන යාවත්කාලීන කිරීම් තහවුරු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට හා අවදානම් කළමනාකරණ කමිටුවට නිතිපතා වාර්තා කිරීම මඟින් අනුමත අවදානම් සීමා සමඟ සමපාත වීමට අනුබලයක් ලබා දෙයි.
ඌ)	ප්‍රධාන අවදානම් නිලධාරී CRO අධීක්ෂණය සහ නිතිපතා අවදානම් පිළිබඳ වාර්තාවල අදාළ සාකච්ඡා ස්ථාපිත කිරීම සඳහා වාර්තා පරීක්ෂා කිරීම	අනුකූල විය	සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳව විස්තරාත්මක වාර්තා සහ CRO විසින් සභාගත කරන ලද සියලුම අවදානම් සම්බන්ධ කරුනු පිළිබඳ වාර්තා පවතී.
ඍ)	ප්‍රකාශිත අවදානම් රුචිය සමඟ අනුකූලතාවය සහතික කිරීම සඳහා ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා කළමනාකරණය සහ ණය වෙළෙඳ පළ මෙහෙයුම් තොරතුරු ආරක්ෂාව සහ උපාය මාර්ගික අවදානම් වැනි බැංකුවේ සියලුම අදාළ අවදානම් කළමනාකරණ සඳහා ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ග පිළිබඳව ප්‍ර.වි.නි. විසින් සපයන ලද යාවත්කාලීන කිරීම් පරීක්ෂා කිරීම.	අනුකූල විය	ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය පිළිබඳව අවදානම් කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළ කරුණු රැස්වීම් වාර්තාවල ඇතුළත් වේ.
ඎ)	ණය කමිටුව සහ වත්කම් හා බැරකම් කමිටු වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටු සඳහා කමිටුව නිශ්චිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් සමාලෝචනය කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	කළමනාකරණ මට්ටමේ කමිටුවලදී සමාලෝචනය කරන ලද ණය අවදානම, වෙළෙඳ පළ අවදානම ද්‍රවශීලතා අවදානම සහ අවදානම් සීමාවන් උල්ලංඝනය කිරීම් සම්බන්ධ කරුණු අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේදී සමාලෝචනය කර ඇත.
ඏ)	විශේෂිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සම්බන්ධයෙන් ඔබ්බට ගිය සියලුම අවදානම් දර්ශක කමිටුව සමාලෝචනය කර සලකා බලා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා සමඟ සියලුම අවදානම් දර්ශක කමිටුව විසින් සමාලෝචනය කර සලකා බලා ඇත. විවක්ෂණ සීමාවන් ඉක්මවා ගොස් ඇති අවදානම් දර්ශක කෙරෙහි කමිටුව විශේෂ අවධානයක් යොමු කර ඇති අතර, ඒවාට අනුකූල වීම සඳහා නිසි උපදෙස් ලබාදී ඇත.
ඐ)	යාවත්කාලීන කර ඇති ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ඇතුළු සියලුම අංශවල අවදානම් කළමනාකරණය තක්සේරු කිරීමට කමිටුව අවම වශයෙන් කාර්තුමය පදනමකින් කැඳවා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	2025 වසර සඳහා අධයක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක් පවත්වා ඇත.
ඒ)	නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම පිළිබඳව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කමිටුව විසින් විධිමත් ලේඛනගත විනය ක්‍රියාමාර්ග ක්‍රියාපටිපාටියක් සමාලෝචනය කර අනුගමනය කර තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	සියලුම විනය ක්‍රියාමාර්ග රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ ඇති විනය සංග්‍රහය මඟින් පාලනය වෙයි. විනය ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු අවස්ථා පිළිබඳ දැනුම් දෙන අතර, කමිටුව කාර්තුමය පදනමකින් රැස්වන හෙයින් මුලින්ම ඒවා සාමාන්‍යාධිකාරි (විනය අධිකාරි) වෙත විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරයි.
ඓ)	කමිටුව විසින් සෑම රැස්වීමකින්ම සතියක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතා සහ/හෝ නිශ්චිත උපදෙස් සඳහා අවදානම් කත්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන්නේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	අනුකූලතා කාර්ය සඳහා අනුකූලතා නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් පත් කර ඇත. අනුකූලතා නිලධාරියා අනුකූලතා කාර්ය නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයටද කාර්තුමය වශයෙන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ද (BIRMC) වාර්තා කරයි.

වෙ)	බැංකුව නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන හා සියලු ව්‍යාපාරික මෙහෙයුම් ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර තිබේද යන්න සහ කමිටුව වෙත කාලීනව වාර්තා කිරීම සඳහා අනුකූලතා කාර්යය කරගෙන යාමට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතරින් තෝරාගත් සුදුසු අනුකූලතා නිලධාරියෙක් සිටි ද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය	අනුකූලතා කාර්යයන් සඳහා අනුකූලතා නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇත. අනුකූලතා නිලධාරියා අනුකූලතා කායර්යන් නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර, කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරයි.
ඔ)	අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ රාමුවට අවශ්‍ය ගැළපීම් සිදු කිරීම සඳහා නැඟී එන අවදානම් ඇතුළු සියලුම අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා විගණන කමිටුව යාවත්කාලීන කිරීමේදී ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය.	ක්‍රියාත්මක වන ක්‍රියාවලි මඟින් ඵලදායී අධීක්ෂණය සහ කාලෝචිත තීරණ ගැනීම පහසු කිරීම සඳහා ප්‍රධාන අවදානම් කරුණු පිළිබඳව විගණන කමිටුව නිතිපතා යාවත්කාලීන කිරීම සහතික කරයි. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස සියලුම ප්‍රධාන අවදානම් සොයා ගැනීම් ක්ෂණිකව විගණන අංශය වෙත දැනුම් දෙනු ලැබේ. මෙය ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් සඳහා මඟපාදයි. අවදානම් කළමනාකරණය හා විගණන කාර්යයන් අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කරයි.
ඕ)	බැංකුවේ අවදානම් මට්ටම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ ඉපයීම් සැලකිල්ලට ගනිමින් සේවකයන්ට ලබාදුන් දිරිදීමනා ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.	අනුකූල විය	බැංකුවේ සේවකයන්ගේ දිරිදීමනා ක්‍රියාවලිය බැංකුවේ අවදානම් මට්ටම්, ප්‍රාග්ධන තත්ත්වය, ද්‍රවශීලතා ශක්තිය සහ ඉපයීම් කාර්ය සාධනය සැලකිල්ලට ගනිමින් සමස්ත අවදානම් පැතිකඩ සලකා බලයි. දිරිගැන්වීම් සැලසුම් කර ඇත්තේ විචක්ෂණශීලී අවදානම් ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන අතර, එය බැංකුවේ මූල්‍ය ස්ථාවරය සමඟ සමපාත වෙයි.

6.6	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව**		
අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතීත්වය දරන බව පරීක්ෂා කිරීම	අනුකූල විය	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය ණය සංග්‍රහයේ ඇතුළත් වන අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවක් පත් කර නොමැත. විධායක ණය කමිටුව අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව අබණ්ඩ පදනමක් මත අදාළ පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා වගකිව යුතු වෙයි. අදාළ පාර්ශ්ව ගනුදෙනු වාර්ෂික වාර්තාවේ එළිදරව් කර ඇත. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 28 වන වගන්තියට අනුකූලව, බැංකුවේ කිසිදු අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ සේවකයකුගේ කලත්‍රයෙකුට හෝ යැපෙන දරුවෙකුට අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයකුට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති ඕනෑම සමාගමකට බැංකුව කිසිදු ණය මුදලක් ලබා නොදේ. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් (RPTR) පිහිටුවා කාර්තුමය රැස්වීම් පැවැත්වීමට අප හට ප්‍රායෝගිකව කළ නොහැකි වන්නේ රැස්වීම් කාලයේ අනුමත කිරීමේ පහසුකම් නොමැති බැවිනි. RPTR කමිටුවක් පත් කර නොමැති වුවද, ලබාදී ඇති පහසුකම් ඔවුන්ගේ ණය ඇගයීමේ කොටසක් ලෙස මහ බැංකුව විසින් නියම කර ඇති RPTR අවශ්‍යතාවලට අනුකූලද යන්න ECC විසින් පරීක්ෂා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු RPTR ප්‍රතිපත්ති සහ ක්‍රියාපිළිවෙත් ණය සංග්‍රහයෙහි කොටසකි.
අ)	ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයක් සහිතව අවම වශයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතදැයි පරීක්ෂා කිරීම. ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට රැස්වීම්වලට සහභාගි විය හැක්කේ අවශ්‍යතා පදනම්ව අදාළ න්‍යායපත්‍ර අයිතම සඳහා පමණි.	අනුකූල නොවේ.	
අ)	අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව අබණ්ඩ පදනමක් මත අදාළ පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීම, අධීක්ෂණය හා වාර්තා කිරීම සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාපටිපාටි හා ක්‍රියාවලීන් තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය.	අදාළ පාර්ශ්වකාර ගනුදෙනු සමබන්ධ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ණය සංග්‍රහයෙහි ඇතුළත් වේ.
ඈ)	විධිවිධාන අංක 7.1හි නිර්වචනය කර ඇති විශේෂයෙන්ම සම්බන්ධිත පාර්ශ්ව ලෙස සලකනු ලබන පුද්ගලයන් සමඟ 7.2 විධිවිධානයේ නිර්වචනය කර ඇති ගනුදෙනු ඇතුළු බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම. එමඟින් එවැනි ගනුදෙනුවලින් පැනනඟින බැදියා ගැටුම් වළක්වා ගැනීම.	අනුකූල විය.	ණය මැනුවලයෙහි අඩංගු වේ.

ඉ)	සම්බන්ධිත පාර්ශ්වයන්ගේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ආර්ථික ප්‍රතිවිපාක අධ්‍යක්ෂ මණ්ඩලයට කාර්තුමය වශයෙන් වාර්තා කිරීමේ ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය.	සමාලෝචිත කාලය තුළදී කිසිවක් වාර්තා වී නොතිබිණි.
ඊ)	අධ්‍යක්ෂවරයාට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයාට සැලකිය යුතු උනන්දුවක් ඇති කරුණකට අදාළ ගනුදෙනු පිළිබඳ ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පිළිබඳ සාකච්ඡාවලට සහභාගි වීමෙන් අධ්‍යක්ෂවරයා වැළකී සිටින්නේ ද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය.	සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි සිදුවීමක් සිදුවී නොතිබිණි.
උ)	(i) ඉහත 7.1 නියෝගයේ දක්වා ඇති පරිදි සම්බන්ධිත පාර්ශ්ව සමඟ බැංකුව ගනුදෙනුවල නිරත නොවන බව සහතික කිරීමත් සහ එවැනි පාර්ශ්ව සඳහා එකම ව්‍යාපාරයේ නිරත බැංකුවේ අනෙකුත් ගනුදෙනුකරුවන්ට වඩා වැඩි සැලකිල්ලක් ලබාදෙන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ක්‍රියාවලියක් තිබේද යන්න පරීක්ෂා කිරීම. අ)මෙම උප නියෝගයේ කාර්ය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විවක්ෂණ මට්ටම ඉක්මවා යන මුළු ශුද්ධ ණය පහසුකම් සම්බන්ධිත පාර්ශ්ව සඳහා අනුමත කිරීම. i)ණය පහසුකම යනු බැංකු පනත් නියෝගවල සඳහන් ණය පහසුකම් අදහස් වේ. මුළු ශුද්ධ ණය පහසුකම් ගණනය කරනු ලබන්නේ මුළු ණය පහසුකම් ප්‍රමාණයෙන් එවැනි සම්බන්ධිත පාර්ශ්ව විසින් බැංකුවේ හුවමාරු ප්‍රාග්ධනයේ හා ණය උපකරණවල වසර 5ක් හෝ ඊට වැඩි කල්පිරීම් කාලයක් සහිත මුදල් ඇප සුරැකුම් හා ආයෝජන අඩු කිරීමෙනි.	අනුකූල විය.	සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි සිදුවීමක් සිදුවී නොතිබිණි.
	ii)සම්බන්ධිත සෑම පාර්ශ්වයක් සමඟ සෑම ගනුදෙනුවක් සඳහා බැංකුවේ ඉහළ ණය අනුපාතිකයට වඩා අවම පොළී අනුපාතයක් අය කිරීම හෝ බැංකුවේ තැම්පත් අනුපාතයට වඩා වැඩියෙන් ගෙවීම පරීක්ෂා කිරීම.	අනුකූල විය.	සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි සිදුවීමක් සිදුවී නොතිබිණි.
	(iii)සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු කිරීමේ සාමාන්‍ය ක්‍රමයට ලබා දෙන කොන්දේසි, වෙළෙඳ අඩුපාඩු පියවීම හා/හෝ ගාස්තු/කොමිස් කපාහැරීම වැනි විශේෂිත සැලකිම් දැක්වීම පරීක්ෂා කිරීම.	අනුකූල විය.	සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි සිදුවීමක් සිදුවී නොතිබිණි.
	(iv)ඇඟයුම් ක්‍රමවේදයකින් තොරව සම්බන්ධිත පාර්ශ්වයකින් සේවා ලබා ගැනීම සහ ඔවුන් වෙත සේවා සැපයීම.	අනුකූල විය.	සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි සිදුවීමක් සිදුවී නොතිබිණි.
	(v)කාර්යසාධනය සඳහා අවශ්‍ය වන සුදුසු රාජකාරි හා කාර්යයන් හැර, සම්බන්ධිත පාර්ශ්ව සමඟ යෝග්‍ය විය හැකි රහසිගත හෝ වැදගත් තොරතුරු හුවමාරුවීම සඳහා හේතු වන තොරතුරු ගලායෑමක් සහ වාර්තාකරන ක්‍රම පවත්වා ගෙන යෑම පරීක්ෂා කිරීම.	අනුකූල විය.	තොරතුරු හුවමාරු කරගනු ලබන්නේ දැන ගැනීම සඳහා පමණක් වන අතර, අදාළ පාර්ශ්වයන් සමඟ හිමිකාර, රහස්‍ය හෝ වෙනත් ආකාරයකින් සංවේදී තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් ගැටලු මතු කරන කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

7	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**		
7.1	**සම්බන්ධිත පාර්ශ්ව**		
	බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සඳහා පහත අවශ්‍යතාවයන් යොදාගත හැකිදැයි පරීක්ෂා කිරීම. මෙම විධානයේ අරමුණු සඳහා සම්බන්ධිත පාර්ශ්වයන් ලෙස සලකනු ලබන පුද්ගලයන් කාණ්ඩ පහත පරිදි වේ. අ. බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු, ආ. එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ සමීප සම්බන්ධතාවයක් ඇති අයෙකු, ඇ. බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු උනන්දුවක් ඇති, එම උනන්දුව එවැනි බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පෙර හෝ පසුව ඇති වූ එකක් වීමේ අවස්ථාවක, ඈ. සැලකිය යුතු උනන්දුවක් ඇති බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකු වූ අවස්ථාවක, ඉ. බලපත්‍රලාභී බැංකුවක සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ එම නිලධාරියාට ලබාදී ඇති ණය පහසුකම් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවක ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරියෙකු ඊ. සැලකිය යුතු උනන්දුවක් ඇති බලපත්‍රලාභී බැංකුවක කොටස් හිමියෙකු, පුද්ගලයකු හෝ උනන්දුවක් දක්වන අයෙකු උ. බලපත්‍රලාභී බැංකුවක අනුබද්ධ සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් ඌ. බලපත්‍රලාභී බැංකුවක හිමිකාර සමාගමක් එහි අනුබද්ධිත සමාගම් ඇතුළුව (මව් බැංකුව සහ ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත බැංකුවේ අනුබද්ධිත සමාගම් හැර) ඍ. බලපත්‍රලාභී බැංකුවක ආශ්‍රිත සමාගමක හෝ අනුබද්ධිත සමාගමක අධ්‍යක්ෂවරයෙකු ඎ. බලපත්‍රලාභී බැංකුවක සහ එහි අනුබද්ධිත සමාගම්වල හිමිකාර සමාගමක අධ්‍යක්ෂවරයෙකු ඏ. ඉහත විධිවිධාන 7.1 (ඉ) සහ (ඊ) හි අර්ථ දක්වා ඇති පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකු ඐ. සමාගමක අධ්‍යක්ෂවරයෙකු හෝ හවුල්කරුවෙකු එවැනි බැංකුවක අධ්‍යක්ෂවරයෙකු වූ විට ඒ. බලපත්‍රලාභී බැංකුවක සැලකිය යුතු කොටස් හිමියෙකුට සැලකිය යුතු උනන්දුවක් ඇති සමාගමක් සහ ඓ. සැලකිය යුතු උනන්දුවක් ඇති සමාගමක සැලකිය යුතු කොටස් කරුවෙකුගේ සමීප ඥාතියෙකුට	අනුකූල විය.	බැඳියා ගැටුම් පිටුදැකීම සඳහා ගනුදෙනු සිදු කිරීමට ප්‍රථම සම්බන්ධිත පාර්ශ්ව හඳුනා ගැනීමේ ස්ථාපිත කරන ලද ක්‍රියාවලියක් ඇත. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය ණය මැනුවලයේ අඩංගු වෙයි. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වාර්ෂික වාර්තාවේ වාර්තා කර ඇත.

7.2	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වර්ග**		
	අදාළ පර්ශ්වයන් සමඟ ගනුදෙනු ලෙස හඳුනාගෙන ඇති පහත සඳහන් ගනුදෙනු වර්ග, විධිවිධානය මඟින් ආවරණය වන බවට හඳුනාගෙන වාර්තා කිරීමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම. අ) උපරිම ණය ප්‍රමාණය LARO නිරාවරණය පිළිබඳ බැංකු පනතේ උපදෙස්වල අර්ථ දක්වා ඇති පරිදි ඕනෑම ආකාරයක ණය පහසුකම් ප්‍රදානය කිරීම. ආ)තැන්පතු ණය ගැනීම් සහ ආයෝජන ලෙසින් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. ඇ)බැංකුවට සපයන ලද හෝ බැංකුවෙන් ලැබුණු මූල්‍යමය හෝ මූල්‍යමය නොවන ස්වභාවයේ ඕනෑම සේවාවක් සැපයීම. ඈ)බැංකුව හා ආදළ කිසියම් හෝ පර්ශ්වයන් අතර තොරතුරු හුවමාරු හා දැනුම් දීමේ ක්‍රම ඇති කිරීම හෝ පවත්වාගෙන යෑම මඟින් එවැනි අදාළ පාර්ශ්වයන්ට වාසිවිය හැකි තීරණාත්මක තොරතුරු එසේ නැතහොත් හිමිකාරිත්වයන් බෙදී යෑම.	අදාළ නොවේ	1975 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 28 වන වගන්තියට අනුව කිසිදු අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයෙකුට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම සමාගමකට හෝ ආයතනයකට බැංකුව කිසිම ණය මුදලක් ලබා නොදිය යුතුය.
7.3	බැංකුවේ සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍ර.වි.නි.ට හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සාමාජිකයකුට ලබාදී ඇති ඕනෑම ණය පහසුකමක් හැර අදාළ වන 7.1 වන වගන්තියේ අර්ථ දක්වා ඇති එහි අදාළ පාර්ශ්වයන්ට ලබාදී ඇති ණය පහසුකම් සම්බන්ධයෙන් බැංකු පනතේ 4.1 වන වගන්තිය සහ 76 කේ වගන්තියේ විධිවිධානවලට අනුකූලද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය	සිදු වී නොමැත.
7.4	**අධ්‍යක්ෂවරුන්ට හා සම්බන්ධිත පාර්ශ්ව සඳහා ණය පහසුකම් ප්‍රදානය**		
	බලපත්‍රලාභී බැංකුවක් විසින් පුද්ගලයකුට හෝ එම පුද්ගලයාගේ සමීප ඥාතියෙකුට හෝ එම පුද්ගලයාට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම සමාගමකට යම් ණය පහසුකමක් ලබාදී ඇති බවත්, එම පුද්ගලයා පසුව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර ඇති බවත් පරීක්ෂා කිරීම. අ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද අවශ්‍ය ආරක්ෂාව එවැනි පුද්ගලයකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ දින සිට වසරක් ඇතුළත ලබාදීම සිදු නොකරයි. ආ. ණය පහසුකම් හේතුවෙන් ගෙවිය යුතු ඕනෑම මුදලක් පොළිය සමඟ ණය පහසුකම් ලබා දෙන අවස්ථාවේදී හෝ එදින සිට මාස 18ක කාලයක් ඉකුත් වන විට නිශ්චිත කාලසීමාව තුළ පියවා නොමැති නම් ඉහත (අ) හි දක්වා ඇති 30 වන කාලසීමාව තුළ එවැනි ආරක්ෂාවක් ලබාදී නොමැති අවස්ථාවක, එවැනි අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වී ඇති බව සලකනු ලැබේ. කෙසේ හෝ ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේ බැංකුවේ සේවකයෙකු වූ සහ එවැනි බැංකුවක සියලුම සේවකයින්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ණය පහසුකම් ලබාදී ඇති අධ්‍යක්ෂවරයෙකුට මෙම විධානය අදාළ නොවේ.	අනුකූල විය	1975 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 28 වන වගන්තියට අනුව අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයෙකුට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම සමාගමට හෝ ආයතනයකට බැංකුව විසින් කිසිදු ණය මුදලක් ලබා නොදිය යුතු වෙයි.

7.5	**සේවකයන්ට ලබා දෙන ණය පහසුකම්**		
	එවැනි බැංකුවක සේවකයන්ට අදාළ වන හෝ උක්ත 47 (3) සහ (5) බැංකු පනත් නියෝගයට අනුව ණය පහසුකම් හෝ සහන සැලසීමට අදාළව මූල්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබිය හැකි ඇපය මඟින් සහන අත්විම එවන් අවස්ථාවකදී හැර, කිසියම් සේවකයකුට හෝ එවැනි සේවකයකුගේ සමීප ඥාතියකුට හෝ සේවකයාට හෝ ඥාතියාට සම්බන්ධිත වෙනත් කිසියම් අයෙකු සඳහා හෝ ගාස්තු හා/හෝ/කොමිස් කපාහැරීම බැංකුව කිසියම් ණය පහසුකමක් මුදලක් හෝ වඩාත් හිතකර සැලකීමක් ලබාදීම හදුනා ගැනීමේ ක්‍රමවේදයක් තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූල විය	සිදුවී නොමැත. අදාළ පරීශ්වයන්ට ලබාදුන් ණය පහසුකම් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තියට RPTR සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලව සිදුකරන ලදී.
7.6	**සම්බන්ධිත පාර්ශ්ව ණය පසුකම් ලියාහැරීම**		
	71වන විධිවිධානයේ දක්වා ඇති අදාළ පාර්ශ්වයන්ට බැංකුව විසින් ලබාදී ඇති කිසිදු ණය පහසුකමක් හෝ එවැනි ණය පහසුකම්වල කිසිදු කොටසක් හෝ ඒ සඳහා ගෙවිය යුතු කිසිඳු පොළියක් ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියකින් තොරව කපාහැරීමක් සිදු නොවන බව පරීක්ෂා කිරීම මෙන්ම, 02 වගන්තියේ සඳහන් පරිදි එවැනි අනුමැතියකින් තොරව කරන ලද ඕනෑම කපාහැරීමක් අවලංගු වන අතර, එහි කිසිදු බලපෑමක් නොමැත.	අදාළ නොවේ	සමාලෝචිත කාලය තුළදී එවැනි සිදුවීමක් වාර්තා වී නොමැත.
8	**ජ්‍යෙෂ්ඨ කළමනාකරණය**		
8.1	**ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය**		
	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපාය මාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූලව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයන් එදිනෙදා කටයුතු ආරක්ෂිතව සහ යහපත් ආකාරයකින් සිදු කරන්නේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කර සහතිකකර ගන්නේද යන්න පරීක්ෂා කිරීම. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අ)ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ බලතල හා වගකීම් ක්ෂේත්‍ර නිර්වචනය කිරීම. ආ)ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර උපායමාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූල වන බව සහතික කිරීම. ඇ)ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා වන ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා අවශ්‍යතා මත පදනම්ව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ නිතිපතා හමුවීම. ඈ)ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සපයන ලද පැහැදිලි කිරීම් සහ තොරතුරු ප්‍රශ්න කිරීම සහ විවේචනාත්මකව සමාලෝචනය කිරීම. ඉ)බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණතාවය සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමූහික දැනුම සහ විශේෂඥතාව සුදුසුදැයි තක්සේරු කිරීම සහ ඊ)ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයින් ක්‍රියාවන් සඳහා වගකිව යුතු බවට පත් කිරීම.	අනුකූල විය	බැංකුවේ එදිනෙදා කටයුතු සිදුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණ කමිටු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට බලතල පවරා ඇත. කළමනාකරණ ක්‍රියාමාර්ග ව්‍යාපාර උපාය මාර්ගයට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති නිර්දේශ නියමයන් සහ පවරන ලද බලතල සීමාවන් ක්‍රියාත්මක වෙයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම් සහ අනෙකුත් කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබන්නේ නව උපාය මාර්ග පිළිබඳ ප්‍රගතිය සහ තීරණ සමාලෝචනය කිරීම සඳහා වේ. කළමනාකරණ කමිටු විසින් ගනු ලබන තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයට හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත ඔවුන්ගේ දැන ගැනීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ඉදිරිපත් කරයි. අවශ්‍ය පරිදි ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය, වැඩිදුර පැහැදිලි කිරීම් සහ/හෝ තොරතුරු සපයනු ලැබේ. ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සාමූහික දැනුම සහ විශේෂඥතාවය බැංකුවේ අවශ්‍යතා සඳහා සුදුසු වෙයි. වර්තමාන ව්‍යාපාරික අවශ්‍යතා සමඟ යාවත්කාලීන වීමට සහ ඔවුන්ගේ ක්‍රියාවන් සඳහා වගකිව යුතු බවට පත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අවශ්‍ය පුහුණුවීම් ලබා දෙනු ලැබේ.

8.2	**ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සුදුසු බව හා යෝග්‍යතාවය තක්සේරු කිරීමේ නිර්ණායක**		
	බැංකු පනතේ 44. ඒ සහ 76වැනි වගන්ති ප්‍රකාරව බලපත්‍රලාභී බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණය එවැනි අඳාළ තනතුරු දැරීමට සුදුසු සහ යෝග්‍ය පුද්ගලයන් විය යුතු අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාමාජිකයන් සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින්ද යන්න තීරණය කිරීමේදී බැංකු පනතේ 42 (2) වගන්තිවල විධිවිධාන අදාළවේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූල විය	දිවුරුම් ප්‍රකාශ සහ ප්‍රකාශන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් ලබා ගන්නා අතර, පත්වීම් සඳහා සුදුසුකම් හා යෝග්‍යතාවය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පූර්ව අනුමැතිය ලබා ගනී.
8.3	**ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීම්**		
	ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සාමාජිකයින්		
	අ. පුද්ගලික හැසිරීම තුළින් බලපත්‍රලාභී බැංකුවක ශක්තිමත් ආයතනික පාලන රාමුවට සැලකිය යුතු ලෙස දායක වීම.	අනුකූල විය	අ. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපාය මාර්ගික, ව්‍යාපාර සැලැස්මට අනුකූලව තම ක්‍රියාවන් පෙළගස්වා, අභ්‍යන්තර පාලනයන් ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහ නියාමන අවශ්‍යතා සකස් කිරීමෙන් යහපත් ආයතනික පාලන රාමුවකට දායකත්වය සපයයි.
	ආ. බලපත්‍රලාභී බැංකුවේ ඔහුගේ/ඇයගේ රාජකාරී ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් වෘත්තීයකාලයක් කැප කිරීම හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයකු බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත ආයතනයක හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබුවහොත්	අනුකූල විය	ආ. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයන් කිසිවෙකු වෙනත් සංවිධානයක විධායක අධ්‍යක්ෂවරුන් ලෙස පත්කර නොමැති අතර ඔවුන් රාජකාරී ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් වෘත්තීය කාලයක් කැප කරයි.
	ඇ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදී ඇති උපදෙස් යටතේ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කළමණාකරනය කිරීම සඳහා ව්‍යාපාර උපායමාර්ග අවදානම් කළමනාකරන පද්ධති අවදානම් හා අනුකූලතා සංස්කෘතිය, ක්‍රියාවලි හා පාලනයන් ක්‍රියාත්මක කිරීම.	අනුකූල විය	ඇ. කළමනාකාරිත්වය ඔවුන්ගේ අදාල රැකියා විස්තර සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත උපායමාර්ගික සැලැස්මට අනුව ඔවුන්ගේ රාජකාරී ඉටුකරන අතර ප්‍රධාන කාර්යසාධක දර්ශක සකස් කරයි. ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදී ඇති උපදෙස් යටතේ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කළමනාකරනය කිරීම සඳහා ව්‍යාපාර උපායමාර්ග, අවදානම් කළමනාකරන පද්ධති, අවදානම් හා අනුකූලතා සංස්කෘතිය, ක්‍රියාවලියක් හා පාලනයන් ක්‍රියාත්මක කිරීම සහතික කරයි.
	ඈ. අවදානම් කළමණාකරනය අනුකූලතාවය සහ අභ්‍යන්තර විගණන කාර්යයන්හි ස්වාධීන රාජකාරී හඳුනාගෙන ඒවාට ගරු කලයුතු අතර එවැනි රාජකාරී ක්‍රියාත්මක කිරීමට මැදිහත් නොවිය යුතුය.	අනුකූල විය	ඈ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සඳහා ස්වාධීන කාර්යන් 3 ක් ස්ථාපිත කර ඇති අතර එක් එක් කමිටුවේ ප්‍රඥප්තිය /TOR මගින් වගකීම් නිර්වචනය කරයි.
	ඉ. නිපුණතා පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට සහ අදාළ වගකීම් ක්ෂේත්‍රවලට අදාළ වර්ධනයන් පිළිබඳව යාවත්කාලීනව සිටීමට නිතිපතා පුහුණුව සඳහා ප්‍රවේශය ලබාගැනීම.	අනුකූල විය	ඉ. අවශ්‍ය තාක්ෂණික හා නියාමන සංවර්ධනය සමඟ යාවත්කාලීන වීමට කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව මානව සම්පත් අංශය මගින් සපයයි.
	ඊ. කාර්ය මණ්ඩලයට රාජකාරී පැවරීම හා එවැනි පැවරූ රාජකාරී අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු වීම.	අනුකූල විය	ඊ. කාර්ය මණ්ඩලයට පවරා ඇති රාජකාරී ඉටු කිරීම සඳහා අවශ්‍ය පවරන ලද බලය අනුමත කර ඇත. බලතල හා වගකීම් ඔවුන්ගේ රැකියා විස්තරයෙහි ලැයිස්තුගත කර ඇත.
	උ. බැංකුව තුළ විනිවිදභාවය හා වගවීම ප්‍රවර්ධනය කරන කළමනාකරණ ව්‍යුහයක් පිහිටුවීම.	අනුකූල විය	උ. පැහැදිලි වාර්තාකරණ ව්‍යුහයක් සහ වගවීම හා විනිවිදභාවය සහතික කිරීම සඳහා සංවිධාන ව්‍යුහය වර්ධනය වී ඇත. CIA, HORM යන අනුකූලතා නිලධාරියා පිළිවෙළින් විගණන කමිටුව සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කරයි.
	ඌ. කඩවීම් හඳුනාගත හොත් විනයානුකූල පියවර හෝ සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම.	අනුකූල විය	ඌ. උල්ලංඝණයන් හඳුනාගත් සෑම අවස්ථාවකම අනුමත විනය ප්‍රතිපත්තියේ විධිවිධානවලට අනුව සුදුසු ප්‍රතිකර්ම හෝ විනය ක්‍රියාමාර්ග ගෙන ඇත.

	ඍ. ව්‍යාපාර උපාය මාර්ගයේ වෙනස්කම් (i) අවදානම් උපාය මාර්ගය/අවදානම් භාර ගැනීම (ii) බැංකුවේ කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය (iii) අවදානම් සීමාවන් හෝ අනුකූලතා නීති උල්ලංඝණය කිරීම (iv)අභ්‍යන්තර පාලන අසාර්ථකත්වයන් (v) නීතිමය හා නියාමන ගැටලු ඇතුළුව එහෙත්, ඒවාට පමණක් සීමා නොවන ප්‍රමාණාත්මක කරුණු පිළිබඳව තොරතුරු නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට ලබාදීම. ඎ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුගේ හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයකුගේ සුදුසුකම් හා යෝග්‍යතාවයට අහිතකර ලෙස බලපාන ඕනෑම වැදගත් තොරතුරක් පිළිබඳ දැනුවත් වූ පසු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීම.	අනුකූල විය අනුකූල විය	ඍ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට ඔවුන්ගේ අදාළ කේෂ්ත්‍රය පිළිබඳ යාවත්කාලීන කිරීම සහ නිතිපතා ඉදිරිපත් කිරීම් සිදුකිරීම සඳහා තොරතුරු සපයයි. CIA, HORM සහ අනුකූලතා නිලධාරී අභ්‍යන්තර පාලනය අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කරුණු යාවත්කාලීන කරයි. ඎ. සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුගේ හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයකුගේ සුදුසුකම් හා යෝග්‍යතාවයට අහිතකර ලෙස බලපාන කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.
9	**හෙළිදරව් කිරීම්**		
9.1	**හෙළිදරව් කිරීම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්**		
	බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය විවිධත්වය සහ සංකීර්ණත්වයට අනුකූලව වැඩිදියුණු කළ වෙළෙඳපළ විනය සහ විනිවිදභාවය පහසු කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්ය සාධන දර්ශක, ප්‍රාග්ධන ප්‍රමාණවත්බව, ද්‍රවශීලතාවය, ව්‍යාපාර ඒකාග්‍රතාවයන්, අදාළ පාර්ශ්ව ගනුදෙනු ආයතනික පාලනය මූල්‍ය ප්‍රකාශන ආදිය ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී අදාළ තොරතුරු ප්‍රමාණවත් සහ කාලෝචිත ලෙස ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතු බව පරීක්ෂා කිරීම. වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, අධීක්ෂණ සහ නියාමන බලධාරීන් විසින් නියම කරන ලද ආකෘති හෝ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කර ප්‍රකාශයට පත් කරනු ලැබේ.	අනුකූල විය	අනුකූල විය
9.2	**වාර්ෂික වාර්තාවේ කළ යුතු අවම හෙළිදරව් කිරීම්**		
	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම් සිදුකර තිබෙදැයි පරීක්ෂා කිරීම.		
අ)	විශේෂිත හෙළිදරව් කිරීම් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවට වූ ප්‍රකාශනය	අනුකූල විය	අනුකූල විය
ආ)	මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මූල්‍ය වාර්තාකරණ විශ්වාසදායිත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සකස්කර තිබීම සහ බාහිර අවශ්‍යතා සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුකර තිබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	අනුකූල විය	

ඇ)	ඉහත (ආ) හි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ බාහිර විගණකගේ සහතිකය අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ සම්බන්ධව බැංකු සඳහා ශ්‍රී ලංකා සහතික කිරීමේ බැඳීම් පිළිබඳ ප්‍රමිතිය SLSAE 3050 සහතික කිරීමේ වාර්තා විගණනවරුන් විසින් නිකුත් කරන ලද සහතික කිරීමේ වාර්තාව මේ සම්බන්ධයෙන් ආදේශක හෙළිදරව් කිරීමක් ලෙස භාවිත කළ හැකි වෙයි.	අනුකූල විය	
ඈ)	අධ්‍යක්ෂවරුන්ගේ විස්තර, නම්, බැංකුව සමග කල ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුලත්ව	අනුකූල විය	
ඉ)	අදාළ පාර්ශවවල එක් එක් වර්ගය සඳහා ලබාදී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කර ඇත.	අනුකූල විය	
ඊ)	බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකවල මුළු වටිනාකම හා බැංකුව එහි ප්‍ර.වි.නි හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග ඇති ගනුදෙනුවල මුළු වටිනාකම ගෙවූ පාරිශ්‍රමික ලබාදුන් ණය පහසුකම් හා බැංකුවේ කළ තැන්පත් හෝ ආයෝජන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රභේද දක්වා ඇත.	අනුකූල විය	
උ)	හෙළිදරව් කිරීම් පරීක්ෂා කිරීම සහ නිවැරදි විස්තර සඳහන් කර තිබේදැයි පරීක්ෂා කිරීම i. වර්ෂය තුළ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ii. වර්ෂය තුළ පවත්වන ලද එක් එක් කමිටුවේ රැස්වීම් ගණන සහ iii. එවැනි රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම	අනුකූල විය	
ඌ)	වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ පහත සඳහන් දෑ හෙළිදරව් කර තිබේදැයි පරීක්ෂා කිරීම i. මෙම විධානයන් සමග අනුකූල වීම පිළිබඳ බාහිර විගණකගේ සහතික කිරීම බලපත්‍රලාභී බැංකුවක එක් එක් අනුවිධානයන් සමග අනුකූලතා තත්ත්වය පැහැදිලි ලෙස නිරූපණය කරයි. ii. සභාපතිවරයා, විධායක අධ්‍යක්ෂවරු, විධායක නොවන අධ්‍යක්ෂවරු සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ, iii. සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවය හා සභාපතිවරයා, ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් ප්‍රමාණාත්මක අදාළ සම්බන්ධතා තිබේනම් ඒවායේ ස්වභාවය	අනුකූල විය	
ඍ)	වීවක්ෂණශීලී අවශ්‍යතා නීති රෙගුලාසි හා අභ්‍යන්තර පාලනයට අනුකූල වීම සහ කිසියම් ප්‍රමාණාත්මක අනුකූල නොවීමක් නිවැරදි කිරීමට ගෙන ඇති පියවර පිළිබඳ විස්තර සහිත වාර්තාවක් ඇත්දැයි පරීක්ෂා කිරීම.		

ඍෘ)	බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දී ඇති මෙම නියෝග හා අනුකූල නොවීමට හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාවට හෙළිදරව් කිරීම සඳහා පනවන ලද පරිපාලන දඩ සහ එවැනි ගැටලු විසඳීමට බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ නියාමන සහ අධීක්ෂණ ගැටලු පිළිබඳ ප්‍රකාශයක් පරීක්ෂා කිරීම		
ඎ)	අදාළ මූල්‍ය වර්ෂය තුළ සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම ගැන්වීමේදී අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්ට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ලබාදුන් මුළු ව්‍යවස්ථාපිත නොවන විශේෂ ගෙවීම්/මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභවල සමස්ත වටිනාකම පරීක්ෂා කිරීම	අනුකූල විය	රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 3/2015 අධ්‍යක්ෂවරු සහ සභාපති, රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2020 ප්‍රකාරව අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු හා ප්‍රවාහන දීමනා පමණක් ගෙවා ඇත. ප්‍ර.වි.නි ට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සාමූහික ගිවිසුමේ ප්‍රතිපාදන අනුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව ගෙවා ඇත.
9.3	**අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ සේවය හැරයෑමේදී කළ යුතු හෙළිදරව් කිරීම**		
	නියාමන අනුකූලතා නොගැලපීම සහ/හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වන්නේද ඉවත් කරන්නේද නැතහොත් අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වී ඇති බව පරීක්ෂා කිරීම. අධ්‍යෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සහ එයට හේතු බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කළ යුතු අතර, අදාළ අධ්‍යක්ෂවරයාගේ බැංකුව සමග ඇති වූ කිසියම් මතබේදයකට සීමා නොවී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෙළිදරව් කළ යුතු වේ.	අදාළ නොවේ	සමාලෝචනයට යටත් වන කාලපරිච්ඡේදය තුළ නියාමන අනුකූල නොවීම් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය සමග ඇති වූ මතබේද හේතුවෙන් අධ්‍යක්ෂවරු ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සිදුවී නොමැත.
10	**ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බැංකු**		
	ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති බැංකු පහත අවශ්‍යතාවලට අනුකූල වන බව පරීක්ෂා කිරීම.	අදාළ නොවේ	
10.1	**උපදෙස් සඳහා අදාලයි.**		
	මෙම විධානයන් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බැංකුවලට අදාළ වන්නේ, එම බැංකුව පිහිටුවා ඇති රටේ අදාළ වන නීති හා රෙගුලාසිවලට අනුකූල නොවනතාක් දුරටය. ඒ අනුව ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බැංකු ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාල විසින් නියම කර ඇති පවතින පාලන රාමු/ව්‍යුහයන් මත පදනම්ව, අදාළ වන පරිදි මෙම විධිවිධානවලට අනුකූල විය යුතුය.		

10.2	**තොරතුරු යොමු කිරීම**		
	සඳහන් කළ තොරතුරු නියමිත වේලාවට ඉදිරිපත් කර තිබේදැයි පරීක්ෂා කිරීම. අ. විධිවිධාන 9.2 ඈ/උ/ සහ උ෯ හැර විධිවිධාන 9.2 මගින් අවශ්‍ය තොරතුරු වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග විධිවිධාන 9.2 ආ සහ ඍ හි සඳහන් වාර්තා ප්‍රධාන කාර්යාලය හෝ ශ්‍රී ලංකා මෙහෙයුම් අධීක්ෂණය කරන ප්‍රාදේශීය කාර්යාලය විසින් සකස් කළ යුතුය. ආ. මූල්‍ය වර්ෂය අවසන් වී මසක් ඇතුළත පහත විස්තර, i. මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල රැයිස්තුවක් රැස්වීම් දිනයන් සහ එක් එක් රැස්වීමේදී සාකච්ඡා කරන ලද ප්‍රධාන විෂය කරුණු සමග ii. අදාළ අධිකාරිය විසින් අනුමත කරන ලද සියලුම කළමනාකරණ කමිටු සඳහා සමුද්දේශ්‍ය විෂයේ පිටපත් iii. එක් එක් කමිටුවේ සංයුතිය සාමාජිකයන්ගේ නම් තනතුරු සහ iv. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ප්‍රධාන කාර්යාලයට සහ/හෝ ප්‍රාදේශීය කාර්යාලයට ශාඛාවේ ක්‍රියාකාරී වාර්තාකරණ මාර්ග පිළිබඳ විස්තර ඇ. මූල්‍ය වර්ෂය අවසන් වී මාස පහක් ඇතුළත මව් බැංකුවේ වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ පිටපතක්	අදාළ නොවේ	අදාළ නොවේ
11	**සාංගමික ව්‍යවස්ථාවලිය සමග ගැටීම්**		
	ඕනෑම බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය සහ මෙම විධිවිධානයන්ගේ ඕනෑම ප්‍රතිපාදනයක් අතර කිසියම් ගැටුමක් තිබේදැයි පරීක්ෂා කරීම. එක් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය මගින් මෙම විධිවිධානයට නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතියට වඩා දැඩි ප්‍රමිතියක් නියම කලහොත් සාංගමික ව්‍යවස්ථාවලියේ එවැනි විධිවිධාන අනුගමනය කල හැකිවේ.	අදාළ නොවේ	


2025 මූල්‍ය වර්ෂයේදී,
රාජ්‍ය උකස් හා ආයෝජන
බැංකුව, තිරසාරත්වය
ඩිජිටල් බැංකුකරණය,
වැඩි දියුණුකල පාරිභෝගික
සේවාව සහ ප්‍රජා කේන්ද්‍රීය
බැංකු කටයුතු පිළිබඳ
අවධානය යොමුකර ඇත.
2025

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

විගණන කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටු සමුද්දේශ්‍ය විෂය පාලනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කර අනුමත කරනු ලබන විගණන කමිටු ප්‍රඥප්තිය මඟිනි. කමිටුවේ ක්‍රියාකාරිත්වයට අදාළ නව වර්ධනයන් සහතික කිරීම සඳහා 2025 නොවැම්බර් 30 දින විගණන කමිටු ප්‍රඥප්තිය අවසන් වරට සමාලෝචනය කර අනුමත කරන ලදී.

තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය, කළමනාකාරිත්වයේ සහයෝගය සහ එහි රැස්වීම් සඳහා සහභාගීවීමට ඕනෑම විධායක නිලධාරියෙකුට ආරාධනා කිරීමේ නිදහස කමිටුව සතු වේ.

"ආයතනික පාලනය සඳහා ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු" පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද එහි සංශෝධන මඟින් කමිටුවේ සංයුතිය, කාර්යභාරය සහ ක්‍රියාවලිය තවදුරටත් නියාමනය කරනු ලබයි.

මූලික පරමාර්ථ

විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර/ බාහිර විගණන පිළිබඳ වගකීම් දැරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය සපයයි.

කමිටුවේ සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

	සාමාජිකයා	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ දරන තනතුර	පත්වීම් ලද දිනය	ඉල්ලා අස්වූ දිනය	පැමිණීම්
1.	එච්. එම්. ඒ. සෙනෙවිරත්න මහතා	සභාපති (ස්වාධීන අධ්‍යක්ෂ)	16.12.2025	-	1
2	ඩී. ආර්. එල්. වික්‍රමසිංහ මහතා	සභාපති (ස්වාධීන අධ්‍යක්ෂ) (27.02.2025 සිට 16.12.2025 දක්වා) සාමාජික (ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ) (16.12.2025) දින සිට	27.02.2025	-	5
3	එම්. පී. කුරගම මහතා	සාමාජික (ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ)	27.02.2025	-	5
4	අතුල ගමගේ මහතා	සාමාජික (ස්වාධීන අධ්‍යක්ෂ)	27.02.2025	16.12.2025	4
5	මහාචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා මහතා	සභාපති (ස්වාධීන අධ්‍යක්ෂ)	26.06.2023	22.01.2025	-
6	එච්.සී. දිලිප් ලාල් සිල්වා මහතා	සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ)	26.06.2023	30.01.2025	-
7	එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා	සාමාජික (ස්වාධීන අධ්‍යක්ෂ)	26.06.2023	30.01.2025	-

විගණන කමිටුවේ ගණපූරණය, සමාජිකයින් අඩකගේ බහුතරය යන්නෙන් වැඩි අඟය විය යුතුය. 2025 දෙසැම්බර් 31 දිනට සාමාජිකයින් පිළිබඳ විස්තරය පිටු අංක 19 හි දක්වා ඇත.

විගණන කමිටු ප්‍රඥප්තියෙන් ලබා දී ඇති බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා කටයුතු කරයි.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී, බාහිර විගණකවරයෙකු ලෙස රජයේ විගණන නියෝජිත, මුදල් අමාත්‍යාංශයේ නියෝජිත, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ආයතනික සැලසුම් සහ ශාඛා මෙහෙයුම් සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇරයුම් ලැබීමෙන් විගණන කමිටුව සඳහා සහභාගී වන නිත්‍ය සාමාජිකයින්ය.

2025 වර්ෂයේ පවත්වන ලද රැස්වීම්

2025 වර්ෂයේදී කමිටුව අවස්ථා පහකදී (05) රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභා රැස්වීම් කටයුතු සභාගත කර අනුමත කරන ලදී. එහිදී ප්‍රධාන ගැටලු, සැලකිය යුතු කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගනු ලැබිණි.

2025 වර්ෂයේදී අවධානය යොමු කළ ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ වාර්තාකරණය විගණන කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශවල සාධාරණත්වය තක්සේරු කිරීමේදී ඖණුම්කරණ මූලධර්ම, ඇස්තමේන්තුවල සාධාරණභාවය සහ ඒ පිළිබඳ විනිශ්චයන් යොදා ගැනීම පිළිබඳ සාකච්ඡා කොට ඇඟයීමට ලක් කරන ලදී.

කමිටුව සිය අධීක්ෂණ වගකීම් ඉටුකිරීමේදී කාර්තුමය සහ වාර්ෂිකව විගණනය නොකල / විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, අදාල ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අධීක්ෂණ හා නියාමන අධිකාරීන් නියම කර ඇති අවශ්‍යතා වලට අනුකූලව සකස් කර ප්‍රකාශයට පත්කර ඇති බව සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබිනි.

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණත්වය තක්සේරු කිරීමේදී කමිටුව ගිණුම්කරණ මූලධර්ම භාවිතා කිරීම, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ ඒ පිළිබඳ විනිශ්චයන් සාකච්ඡාකර ඇගයීමට ලක්කර ඇත.

SLFRS 9 (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 9) සමග පෙලගැස්වීම සහතික කිරීම සඳහා කමිටුව විසින් වරලත් ජාත්‍යන්තර සමාගමකට හානිකරණ තක්සේරු ආකෘතිය වලංගු කිරීම පවරා ඇත.

කමිටුව විසින් 2016 අංක 1 දරන බැංකු පනත් විධිවිධානයේ "අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය පිළිබඳ නියාමන රාමුව" හි විශේෂිත කොට දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව, 2024 වර්ෂය සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධනය ප්‍රමාණවත්ව තක්සේරු කිරීමේ (ICAAP) නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා පවතින අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය සහ සවලතාවය ඇගයීමට ලක් කරන ලදී.

නියාමන අනුකූලතාව

අවශ්‍ය සියලු බැංකුකරණ සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවලට බැංකුව අනුකූලවන බව කමිටුව මඟින් සහතික කරන ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් වැඩිදුර අධීක්ෂණ පියවරක් ලෙස සියලුම නියාමන අනුකූලතා අවශ්‍යතා ආවරණය වන පරිදි ස්වාධීන පරීක්ෂණයේ හරිවැරදි බැලීමක් සිදු කරන ලදී.

අභ්‍යන්තර පාලනයන්

සියලුම සැලකිය යුතු අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණවත් බව සහ සවලතාවය තක්සේරු කිරීම සඳහා අවදානම් පදනම් කරගත් විගණන ක්‍රියාවලියක් බැංකුව විසින් සිදු කරන ලද අතර, අභ්‍යන්තර විගණනයේ විෂය පථයෙහි ආවරණය වර්ධනය කරලීම සහ පුළුල් කරලීම සඳහා කමිටුව විසින් නියමිත ක්‍රියාවලිය සහ නිර්දේශ සමාලෝචනය කරන ලදී.

කමිටුව විසින් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල සවලතාවය පවත්වා ගැනීම සඳහා හඳුනාගත් අවදානම් සම්බන්ධයෙන් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග පිළිබඳ අවශ්‍ය සහතික කිරීම් ව්‍යාපාර ඒකකවලින් බලාපොරොත්තු වන අතර, එය ලබා ගනු ලබයි.

නිත්‍ය පදනමක් යටතේ සහ යම් අවස්ථාවක් ඇති වුවහොත්, කමිටුව විසින් පාලන ඌනතාවයේ මූලික හේතුව විශ්ලේෂණය කොට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලබයි.

තොරතුරු තාක්ෂණ පාලනය තහවුරු කිරීම සඳහා මූලික බැංකු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් පසු ජාත්‍යන්තර විගණන සමාගමක් නිශ්චිත තොරතුරු පද්ධති විගණනයක් සිදුකර ඇත. නව පද්ධතියට අදාල දත්ත හුවමාරු ක්‍රියාවලීන් තොරතරු තාක්ෂණ පාලන සහ තාක්ෂණ යෙදුම් පාලනය කෙරෙහි ඇතුලු ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි විගණනය මඟින් අවධානය යොමුකර තිබිනි. කමිටුව විගණන සොයාගැනීම්, කළමනාකරණය විසින් කරන නිර්දේශ සහ විගණන සොයාගැනීම් නිවැරදි කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර තිබිනි.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය සහ විෂයමූලිකත්වය සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සහ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළ අත්පොත අධ්‍යයනය කරන ලදී.

විගණන කමිටුව විසින් වාර්ෂික විගණන සැලැස්ම අනුමත කරන ලද අතර, වර්ෂය පුරා එය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සමාලෝචනය කරන ලදී.

වසර තුළදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් බැංකුවේ විවිධ අංශවල සිදු කරන ලද විගණනයක් ඔස්සේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සහ පද්ධති පාලනය කිරීම සඳහා සිදු කළ මූලපිරීම්වල ප්‍රගතිය කමිටුව විසින් අධ්‍යනය කරන ලදී.

විගණන කමිටුව විසින් ශාඛා ණය සහ තැන්පතු කළඹ ඇගයීමට ලක් කරන ලද අතර කාර්යසාධනය වර්ධනය කරලීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන
ලදී.

තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තියට අනුව ගනුදෙනුකරුවන් සහ සේවකයින් විසින් සිදු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය මඟින් සිදු කරන ලද විමර්ශනය විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර, බැංකුවේ හැසිරීම් සහ කටයුතුවල විනිවිදභාවය වැඩි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන්වලට නව වර්ධනයන් එක් කරමින් යාවත්කාලීන කිරීම සඳහා තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලදී.

බාහිර විගණනය

ව්‍යවස්ථාව අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වේ. වාර්ෂික විගණනයේ අරමුණ සඳහා බාහිර විගණකට අවශ්‍යවන සියලුම තොරතුරු සහ ලියවිලි ලබාදීම කමිටුව විසින් සිදු කරනු ලබයි. කමිටුව විසින් අවසන් විගණන වාර්තාවේ වලිදරව් කර ඇති බාහිර විගණනයේ දී සැලකිල්ලට බඳුන් වූ කරුණු සමාලෝචනය කර ඇති අතර, කළමනාකරණ ලිපියේ සහ කාලාන්තර විගණන විමසුම්වල ඉස්මතු කර ඇති ගැටලු විසඳීම සඳහා කළමනාකාරිත්වය විසින් ගෙන ඇති නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රමාණවත් බව සමාලෝචනය කර ඇත.



එච්. එම්. ඒ. සෙනෙවිරත්න
සභාපති අධ්‍යක්ෂ මණ්ඩල විගණක කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව

හැඳින්වීම

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNGC) බැංකුවේ ආයතනික පාලන රාමුව හා අනුමතකර ඇති සමුද්දේශ්‍ය විෂයට (TOR) අනුකූලව පිහිටුවා ඇත.

සුදුසුකම් සහිත, පළපුරුදු, සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පත්කිරීම මගින් බැංකුව ශක්තිමත් පාලන ව්‍යුහයක් පවත්වාගෙන යන බව තහවුරු කිරීම සඳහා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දක්වයි.

2025 වසරතුල සංයුතිය සහ ගණපූරණය

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන අතර එය අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතවේ. එයින් බහුතරය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය සඳහා කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

- ඒ. සී. ගමගේ මහතා සභාපති (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- එම්. පී. කුරගම මහතා සාමාජික (ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ)
- ඩී. ආර්. එල්. වික්‍රමසිංහ මහතා සාමාජික (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා සභාපති (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
  (2025. 01. 30 දින සිට ඉල්ලා අස්වී ඇත)
- එච්. සී. ඩී. එල් සිල්වා මහතා සාමාජික (ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ)
  (2025. 01. 30 දින සිට ඉල්ලා අස්වී ඇත)

ගණපූර්ණය සඳහා සාමාජිකයින් දෙදෙනෙකු අවශ්‍යවන අතර ඔවුන් දෙදෙනාම රැස්වීම් කාලය මුළුල්ලේම එයට සහභාගිවන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු විය යුතු වෙයි.

ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ ලේකම්වරයා, ලෙස කටයුතු කරන අතර රැස්වීම් කැඳවීම, රැස්වීම් න්‍යාය පත්‍රය බෙදාහැරීම, රැස්වීම් වාර්තා සකස්කර තබා ගැනීම සහ කමිටුවේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත් ලෙස වාර්තා කිරීම සඳහා වගකිව යුතු වෙයි.

විෂය පථය

සමුද්දේශ්‍ය විෂයට අනුකූලව කමිටුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකරයි.

1. ප්‍රධාන විධායක නිලධාරී (CEO) සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (KMP) තෝරා පත්කර ගැනීම සඳහා විධිමත් හා විනිවිදභාවයෙන් යුත් ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කරයි.
2. ප්‍රධාන විධායක නිලධාරී ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම හෝ උසස් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද, නිපුණතා හා ප්‍රධාන ගුණාංග තීරණය කරයි.
3. අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය සාධනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදෙන දායකත්වය සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂවරු නැවත තෝරා පත් කිරීම (හෝ වෙනත් ආකාරයකින්) ඇගයීමට ලක්කර නිර්දේශ කරයි.
4. නායකත්වයේ අඛණ්ඩභාවය සහතික කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලසුම් සමාලෝචනයකර නිර්දේශ කරයි.
5. බැංකු පනතේ 42 වගන්තිය ප්‍රකාරව නියාමන අවශ්‍යතාවල දක්වා ඇති "සුදුසු සහ යෝග්‍ය" නිර්ණායකයන්ට අනුව අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඇගයීමට ලක්කරයි.
6. කලින් කලට සිදුකරන පාලන ස්වයං ඇගයීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රතිචාර සමාලෝචනය කරයි.
7. අධ්‍යක්ෂ මණ්ඩල හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් අතිරේක හෝ නව විශේෂඥතාවයන් සඳහා අවශ්‍යතා කලින් කලට තක්සේරුකර නිර්දේශ කරයි.
8. කමිටුවේ සමුද්දේශ්‍ය විෂය වාර්ෂිකව සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය සංශෝධන නිර්දේශ කරයි.

වගකීම් සහ බලතල

එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී කමිටුව

1. ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා පත්කිරීම් හා උසස් කිරීම් කුසලතා, නිපුණතා, අවංකත්වය සහ නියාමන අනුකූලතාවය මත පදනම්වන බව තහවුරු කරයි.
2. නායකත්ව පෙළගැස්ම සහ උපාය මාර්ගික පෙළගැස්ම පවත්වා ගැනීම සඳහා අනුප්‍රාප්තික සැලසුම් සමාලෝචනය කරයි.
3. අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යෝග්‍යතාවය සහ යෝග්‍යතාවලට අදාල නියාමන අවශ්‍යතාවලට අනුකූලවීම තහවුරු කරයි.
4. අනුමැතිය හා දැනගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට තහවුරු කරන ලද රැස්වීම් වාර්තා සහ නිශ්චිත නිර්දේශ ඉදිරිපත් කරයි.
5. තම වගකීම් ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා කළමනාකාරිත්වයෙන් අවශ්‍ය ඕනෑම තොරතුරක් ලබා ගැනීමට බලය ඇත.

කමිටු රැස්වීම්

කමිටුව අවම වශයෙන් වසරකට එක්වරක් හෝ රැස්විය යුතු වන අතර අවශ්‍ය පරිදි අමතර රැස්වීම් කැඳවිය හැකිවේ.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් වාර හතක් (07) පවත්වා ඇත. ඵලදායී ලෙස සාකච්ඡා පැවැත්වීම හා තීරණ ගැනීම පහසු කරවීම සඳහා සියලුම රැස්වීම් ප්‍රමාණවත් කාලයක දැනුම්දීමක් සහ අදාල ලියකියවිලි යොමු කිරීම මගින් සිදුකර ඇත.

සියලුම රැස්වීම්වලදී ගණපූරණ අවශ්‍යතාවය නිසි ලෙස සපුරා තිබූ අතර සාමාන්‍යාධිකාරී, ප්‍රධාන විධායක නිලධාරී අවශ්‍ය අවස්ථාවන්හිදී ආරාධිතයකු ලෙස රැස්වීම්වලට සහභාගීවී ඇත.

රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම	පැවැත්වූ රැස්වීම් ගණන	සහභාගිවූ රැස්වීම් ගණන
ඒ. සී. ගමගේ මහතා	07	05
එම්. පී. කුරගම මහතා	07	05
ඩී. ආර්. එල්. වික්‍රමසිංහ මහතා	07	04
එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා (2025. 01. 30 දින සිට ඉල්ලා අස්වී ඇත)	07	01
ඒච්.සී.ඩී.එල්.සිල්වා මහතා (2025. 01. 30 දින සිට ඉල්ලා අස්වී ඇත)	07	01

සමාප්තිය

සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව අදාල නියාමන අවශ්‍යතාවයන් සහ එහි සමුද්දේශ්‍ය විෂයට අනුකූලව වගකීම් ඵලදායී ලෙස ඉටුකර ඇති බවට සෑහීමකට පත්වෙයි.

ඒ. සී. ගමගේ මහතා
සභාපති අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව
2026 පෙබරවාරි 26

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

හැඳින්වීම

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) යනු ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරණ බැංකු පනතේ උපදෙස්වල 3(6) වගන්තියට අනුව පිහිටුවන ලද අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවකි.

කමිටුව 2024 අංක 05 දරණ ශ්‍රී ලංකා මහ බැංකු විධිවිදාන, අදාළ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිපත්ති, අනෙකුත් අදාල නීති හා රෙගුලාසි සහ කමිටුවේ අනුමත සමුද්දේශ විෂයට (TOR) අනුකූලව ක්‍රියාත්මක වෙයි.

2025 වසරතුල සංයුතිය හා ගණපූරණය

කමිටු සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන අතර, විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙයින් බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති. කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වෙයි.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

- එම්. ටී. ඒ. ජේ. එෆ්. ගෝමිස් මහතා සභාපති (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- ඒ. පී. රණසිංහ මහතා සාමාජික (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- ඒ. සී. ගමගේ මහතා සාමාජික (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)

ගණපූරණය සඳහා සාමාජිකයින් දෙදෙනෙකු අවශ්‍යවන අතර ඔවුන් දෙදෙනාම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු විය යුතුවේ.

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ඔහු /ඇය පිළිබඳ කරුණු එනම් ඔවුන්ගේ කාර්යසාධනය, පාරිශ්‍රමික හෝ ඉවත් කිරීම පිළිබඳ සලකා බලන රැස්වීම්වලට හැර අනෙකුත් රැස්වීම් සඳහා සුදුසු පරිදි ආරාධනා ලබයි.

ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

විෂය පථය

සමුද්දේශ විෂයට අනුව (TOR) කමිටුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකරයි.

1. ප්‍රතිපත්ති, උපායමාර්ග සහ පාරිශ්‍රමික සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වීම් හා උපදෙස් ලබාදීම.

2. බැංකුවේ උපාය මාර්ගික සැලැස්ම, අවදානම් රුචිය, ආයතනික වටිනාකම් සහ නියාමන බැඳීම්වලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා මැනිය හැකි ඉලක්ක, ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ කාර්යසාධන ඉලක්ක ස්ථාපිත කරයි.

3. එකඟවූ ඉලක්ක වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධන ඇගයීම් හා දිරිගැන්වීම් ලබාදීම.

4. ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය හා ආයතනික ව්‍යුහය ඇතුළත් තිරණාත්මක තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලසුම් සමාලෝචනයකර නිර්දේශ කරයි.

5. අනුකූලතා හා මානව සම්පත් අවදානම් අධීක්ෂණය

6. අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමික කාර්යසාධන උපමාන, කාර්යසාධනය හා ගෙවීම් සම්බන්ධතාවයන් ඇතුළු එලිදරව් කිරීම් 2024 අංක 5 දරණ ශ්‍රී ලංකා මහ බැංකු විධිවිදානයට අනුව වාර්ෂික වාර්තාවේ සුදුසු පරිදි එලිදරව් කිරීම තහවුරු කිරීම.

වගකීම් සහ බලතල

එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී කමිටුව:

1. නිසි ක්‍රියාවලියට හා "සුදුසු හා යෝග්‍ය" උපමානයට අනුකූල බව තහවුරු කරමින් ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත්කිරීම නැවත පත්කිරීම හා ඉවත් කිරීම අනුමත කිරීම.

2. කිසිම අධ්‍යක්ෂවරයකු ඔහුගේ /ඇයගේ පාරිශ්‍රමික තීරණය කිරීමට මැදිහත්වී නොමැති බව තහවුරු කිරීම.

3. අධික අවදානම් ගැනීමකින් තොරව තරගකාරිත්වය තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍රයේ අනෙකුත් සමාන ආයතනවල වැටුප් මට්ටම් හා සැසඳීමෙන් සම්මත වේතනය තීරණය කිරීම.

4. අවදානම් දැරීමේ මට්ටම සහ දිගුකාලීන තිරසාරත්වය සමඟ සමගාමී බව තහවුරු කරමින් දිගුකාලීන වශයෙන් දිරි දීමනා වැඩසටහන්, ප්‍රසාද දීමනා සහ ලාභ බෙදීම පිළිබඳ කටයුතු අනුමත කිරීම හා සමාලෝචනය කිරීම.

5. බැංකුවේ වියදම් දැරීමෙන් (වන්දි උපදේශකයින්, නීති උපදේශකයින් සහ මානව සම්පත් විශේෂඥයින්) යන අයගේ ස්වාධීන වෘතිය උපදෙස් ලබා ගැනීමට අයිතියක් සතුවීම.

6. එහි රාජකාරී වලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය කළමනාකරණ සහ අදාළ තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ඇති පූර්ණ හැකියාව.

කමිටු රැස්වීම්

කමිටුව අවම වශයෙන් වසරකට දෙවරක් හෝ අවශ්‍ය පරිදි නිතර නිතර රැස්විය හැකිවේ.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයතුළ කමිටුව රැස්වීම් හතරක් (04) පවත්වා ඇත. දැනුවත් තීරණ ගැනීම පහසුවීම සඳහා ප්‍රමාණවත් දැනුම්දීමක් සහිතව න්‍යාය පත්‍රය හා අදාළ ලියකියවිලි රැස්වීම් කැඳවීම සඳහා යොමුකරනු ලබයි.

රැස්වීම සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම	පැවැත්වූ රැස්වීම් ගණන	සහභාගි වූ රැස්වීම් ගණන
එම්. ටී. ඒ. ජේ. එෆ්. ගෝමස් මහතා	04	04
ඒ. පී. රණසිංහ මහතා	04	04
ඒ. සී. ගමගේ මහතා	04	04

සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ මානව සම්පත් උපායමාර්ග සහ පාරිශ්‍රමික ප්‍රතිපත්ති 2024 අංක 05 දරණ ශ්‍රී ලංකා මහ බැංකු විධිවිදානයන්ට අනුකූලව සහ බැංකුවේ උපායමාර්ගික අරමුණු, අවදානම් රුචිය සහ ශක්තිමත් ආයතනික පාලන මූලධර්ම සමග අනුකූලව ක්‍රියාත්මක කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සෑහීමකට පත්වෙයි.

ටී. ඒ. ජේ. එෆ්. ගොමිස් මහතා
සභාපති අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පරිශ්‍රමික කමිටුව
2026 පෙබරවාරි 26

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය 2025

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු සිව්දෙනෙක්, බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි., අවදානම් කළමනාකරණ අංශ ප්‍රධානී සහ කමිටුවේ ලේකම්ගෙන් සමන්විතවේ. 2025 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක් පවත්වා ඇත.

පළමුවන, දෙවන, තුන්වන සහ සිව්වන කමිටු රැස්වීම් සඳහා කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

- ඒ. පී. රණසිංහ මහතා විධායක නොවන අධ්‍යක්ෂ කමිටුවේ සභාපති
- ඒ. සී. ගමගේ මහතා විධායක නොවන අධ්‍යක්ෂ
- එම්. ටී. ඒ. ජේ. එෆ්. ගෝමස් මහතා විධායක නොවන අධ්‍යක්ෂ
- අයි. ටී. අසුරමාන්න මහතා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
- ආර්.කේ.ඒ.එන් රත්නායක මහත්මිය අවදානම් කළමනාකරණ අංශ ප්‍රධානී
- ජේ. ටී. ආර්. රණවීර මහත්මිය අනුකූලතා නිලධාරී
- ඩී. අලහකෝන් මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කළ 2007 අංක 12 දරන බැංකු පනත් නියෝග යේ 3:6) (v) වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය 2025.11.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එය කලින් කලට සමාලෝචනය කරයි. අනුමත කරගත් ප්‍රඥප්තිය තුළින් එහි බලතල, ව්‍යුහය සහ වගකීම් පිළිබඳ අර්ථ දක්වයි.

ප්‍රඥප්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ.

1. බැංකුවේ අවදානම් රුචිය සමාලෝචනය කිරීම.
2. බැංකුවේ ප්‍රධාන අවදානම් ප්‍රතිපත්ති සමාලෝචනය සහ අනුමත කිරීම හා විශේෂිත සීමාවන් සඳහා බැංකුවේ අනුගතවීම පිළිබඳ වාර්තා ලබා ගැනීම.
3. බැංකුව මුහුණ දෙන ණය, වෙළඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් ඇතුළුව විවිධ අවදානම් සහ එක් එක් වර්ගවලට නිරාවරණයවීම, මෙම අවදානම් වර්ග තුළ සැලකියයුතු සංකේන්ද්‍රණ, අවදානම් නිරාවරණය මැනීම සඳහා යොදාගත් ක්‍රම සහ මෙම අවදානම් නිරාවරණයේ පිලිගතහැකි හා සුදුසු මට්ටම් පිළිබඳ කළමනාකරණයේ අදහස් පිළිබඳ වාර්තා ලබාගැනීමත් ඒවා සමාලෝචනය කිරීමත් සමගින් කළමනාකරණයට යම් පිටුවහලක් ලබාදීම.
4. කළමනාකරණය විසින් අවදානම් නිරාවරණ පාලනය කිරීමට භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව සහ අවදානම් මැනීමේ ක්‍රමවේද සහ පීඩන පරීක්ෂා ප්‍රවේශය සමාලෝචනය කිරීම
5. මෙයටම සීමා නොවූවද, බැංකුව වෙත ඇති ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් සහ ක්‍රමෝපායික/ කීර්තිනාම අවදානම් ඇතුළු සියලුම අවදානම් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් සමාලෝචනය කිරීම.
6. බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධික්ෂණ අවශ්‍යතා මත පදනම් වී, ස්ථාපිතව පවරනලද බලතලවලට අනුකූලව අවදානම් තීරණ ගන්නා බව සහ කමිටුව විසින් නියමකළ අවදානම් ඉවසුම් සීමාව ඉක්මවන, අවදානම් අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීම.
7. අවදානම් කළමනාකරණ කාර්යයේ ප්‍රමාණාත්මතාව සහ තෝරාගත් අවදානම් නිලධාරීන්ගේ සුදුසුකම් සහ පසුබිම ඇගයීමට ලක් කිරීම.
8. අවදානම් කළමනාකරණ කාර්යයේ ස්වාධීනත්වය සහ බලතල සමාලෝචනය කිරීම.
9. බැංකුවේ අවදානම් ප්‍රාග්ධන රාමුව (ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම්) වැදගත් නිමැවුම් හා උපකල්පන ඇතුළුව සමාලෝචනය කිරීම
10. අවදානම් නිරාවරණය කළමනාකරණ සඳහා කළමනාකරණය භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ශේෂ පත්‍රය. ශේෂ පත්‍ර ව්‍යුහය, ප්‍රාග්ධනය, අරමුදල්, පොළි අනුපාත සහ ද්‍රවශීලතා කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම.
11. බැංකුවේ ද්‍රවශීලතාව, තැන්පතු රැස්කිරීම සහ අරමුදල් කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.
12. බැංකුවේ නියාමන ප්‍රාග්ධන මට්ටම සහ ප්‍රාග්ධන ව්‍යුහය සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.

13. බැංකුවේ ප්‍රාග්ධන අරමුණු ඇතුළුව එහි ප්‍රාග්ධනය තක්සේරු කිරීමේ රාමුව සමාලෝචනය කිරීම.

14. අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ කාර්යයට අදාළ කරුණු සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ප්‍රධානී, අනුකූලතා නිලධාරී, අභ්‍යන්තර විගණක, මූල්‍ය ප්‍රධානී, භාණ්ඩාගාරික, කළමනාකරණයේ අනෙකුත් පිරිස, ස්වාධීන විගණකවරුන්, නියාමකයින් සහ සුදුසු පරිදි බාහිර ප්‍රවීනයින්ගෙන් තොරතුරු ලබාගැනීම.

15. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අයකරගැනීමේ කමිටුව, විධායක ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි විශේෂිත අවදානම් හෝ අවදානමේ සමහර අංශ සමඟ කටයුතු කරන සියලුම කළමනාකරණ කමිටුවල විෂය ක්ෂේත්‍රය සමාලෝචනය කිරීම.

16. ඉහත සඳහන් අදාළ කමිටු විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවල ඵලදායිත්වය පරීක්ෂා කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් ආරම්භ කළ ක්‍රියාමාර්ග නියාමනය.

17. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියමකළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පරාමිති තුළ අවදානම් හඳුනාගැනීම, මැනීම, වැලැක්වීම, අවම කිරීම, මාරු කිරීම හෝ පාලනය කිරීම සඳහා එහි විධි නියෝගය සහ ප්‍රමාණවත් යාන්ත්‍රණය පිළිබඳ මනා අවබෝධයක් ඇති බව සහතික කිරීමට ඉහත කමිටුවල වාර්ෂික වැඩ සැලැස්ම, අදාළ ක්‍රමෝපායන්, ප්‍රතිපත්ති සහ වැඩරාමු සමාලෝචනය කිරීම.

18. විශේෂිත අවදානම් සමඟ සෘජුව හෝ වක්‍රව කටයුතු කරන කළමනාකරණ කමිටු සමඟ අඛණ්ඩ සාකච්ඡා පවත්වා ගැනීම සහ ඒ තුළින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව එහි කාර්යය ඉටු කිරීමේදී හෝ එහි තීරණ ක්‍රියාත්මක කිරීම තුළ යම් අවහිරතා, බාධා, අධෛර්යමත් කිරීම හෝ වැලැක්වීම පිළිබඳ ඒකාබද්ධ කළමනාකරණ කමිටුව (BIRMC) දැනුවත් කෙරේ.

19. අපේක්ෂිත අවදානම් කළමනාකරණ පරමාර්ථවලට සේවය කිරීමේදී අවදානම් දර්ශකවල ප්‍රමාණාත්මතාව තීරණය කිරීම පිළිබඳ දැක්මක් සහිතව යම් දෙන ලද කාලයක් තුළ විශේෂිත අවදානම්වල මට්ටම නියාමනය කිරීමට එවැනි දර්ශක සමාලෝචනය කිරීම.

20. එක් එක් අවදානම් දර්ශක අනුව මාසිකව ගණනය කරන ලද සැබෑ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ යම් අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සීමාවන් ඉක්මවන අවස්ථාවක එම විශේෂිත අවදානම්වල බලපෑම අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වහාම ගතයුතුය.

21. විවිධ වර්ගයේ අවදානම් අනුව කළමනාකරණය විසින් නියමකළ පරාමිති සහ සීමා සමාලෝචනය කර අනුමත කිරීම සහ ඒවා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ අපේක්ෂිත ප්‍රතිපත්ති මට්ටම්වල පවතින්නේද යන්න සහතික කිරීම.

22. විශේෂ අවදානම් හඳුනාගැනීමට/ අභ්‍යන්තර පාලන උපදෙස්වලට අනුකූලවීමට අපොහොසත් වීම සඳහා වගකීමට බැඳි සිටින නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම සහ කමිටුව විසින් නිර්දේශ කරන පරිදි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාපටිපාටි ගැනීම.

23. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළ නීති සහ රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුකූලතා කාර්යයේ ඵලදායිත්වය සමාලෝචනය කිරීම.

24. වාර්ෂිකව ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා පිලියම් සැලැස්ම සමාලෝචනය කිරීම.

25. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කිරීම

26. බැංකුවේ ප්‍රධාන වියදම් වැඩසටහනට අනුව සිදුකරන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දීමට අවශ්‍ය ප්‍රාග්ධන දායකත්වයන් සමාලෝචනය කිරීම.

27. වැදගත් පීඩන අවස්ථාවක් සම්බන්ධයෙන් ව්‍යාපාරය පිළිබඳ අර්බුදයක් වියහැකි බලපෑම සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම සහ කළමනාකරණය විසින් සිදුකළයුතු අයකරගැනීමේ විකල්ප සමාලෝචනය කිරීම

28. විගණන කමිටුවේ උපදේශකත්වයෙන්, අවම වශයෙන් වාර්ෂිකව කළමනාකරණය සමඟ සමාලෝචනය කර සාකච්ඡා කිරීම

29. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා ඇති පරිදි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියට අදාළ වෙනත් කටයුතු ඉටු කිරීම

ප්‍රඥප්තියට අනුව, මෙම කමිටුවේ අනෙකුත් වගකීම් පහත පරිදි වේ.

1. කමිටුව විසින් විගණන කමිටුවට එහි ව්‍යවස්ථාපිත, නියාමන සහ අනෙකුත් වගකීම් සුදුසු පරිදි ඉටු කිරීමට ඉඩ ලබාදීම සඳහා අවශ්‍ය පරිදි තොරතුරු හුවමාරුව සහ සන්නිවේදනය පවත්වාගෙන යෑම.

2. කමිටුව විසින් කමිටුවේ විෂයපථය තුළ ඇති කරුණු සම්බන්ධයෙන් නියාමන පරීක්ෂණ වාර්තා පිටපත් සහ ඒ සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරයද ලබාගනී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වන අතර, කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.


1, 2, 3 සහ 4 වන කාර්තු සඳහා

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගිවූ රැස්වීම් ගණන / සහභාගී වියයුතු රැස්වීම් ගණන
ඒ. පී. රණසිංහ මහතා (කමිටුවේ සභාපති)	4/4
ඒ. සී. ගමගේ මහතා	4/4
එම්. ටී. ඒ. ජේ. එෆ්. ගෝමිස් මහතා	2/4


වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීමේදී ව්‍යාපාර මෙහෙයුම් සිදුකරමින් හා අවදානම් කළමනාකරණය කරමින් ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සමීපව කටයුතු කර ඇත.

වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වලදී යෝජනා කල හා සාකච්ඡාවට ලක්කල කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ලබා ගැනීම එකඟතා හා විශේෂිත මඟ පෙන්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ සමගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකල නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සඳහා සහ අවශ්‍යවූවිට විස්තරාත්මකව සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.



ඒ. පී. රණසිංහ මහතා
සභාපති අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව



රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ ඉලක්කය වන්නේ, එහි ඩිජිටල් හැකියාවන් තව තවත් වැඩිදියුණු කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය ලබාදීම ශක්තිමත් කිරීම, කළඹ විවිධාංගීකරණය සහ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය පවත්වාගෙන යමින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය නගා සිටුවීමයි.

අවදානම් කළමනාකරණය

මෑත වර්ෂවල මුහුණදුන් මූල්‍ය අර්බුදවලින් පසුව 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාව ක්‍රමික ආර්ථික වර්ධනයක් පෙන්වා ඇත. සංචාරක කර්මාන්තයේ වර්ධනය, විදේශ මුදල් ලැබීම් ඉහළයෑම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ හේතුවෙන් ආර්ථිකය ස්ථාවරවීම ආරම්භවී තිබිනි. වර්ෂය සඳහා දළ දේශීය නිශ්පාදිතයේ වර්ධන අනුපාතය 4.8% ක් ලෙස පැවති අතර එය තුන්වන කාර්තුව වන විට 5.4% ක් ලෙස ක්‍රමයෙන් ඉහල ගොස් තිබූ අතර උද්ධමනය 2.1 ක් ලෙස වැඩි දියුණුවූ මූල්‍ය තත්ත්වයන් විදහා දක්වමින් 2025 දෙසැම්බර් මාසයේ දී තනි අංක පරාසයක පැවතිනි. විදේශ විණිමය සංචිතයේ ක්‍රමික ඉහල යෑමක් දක්නට තිබුනද ශ්‍රී ලංකාව තවමත් ඉහල ණය මට්ටම්, ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන් සහ බාහිර මූල්‍ය මත ඇතිවී තිබූ පීඩනයට තවමත් මුහුණ දෙමින් සිටින අතර එමගින් වලදායී අවදානම් කළමනාකරණයක අත්‍යවශ්‍යතාවය පැන නගී.

2025 වර්ෂය තුල ශ්‍රී ලංකාවේ බැංකු අංශය වඩා වැඩි දියුණුවූ පරිසරයක ක්‍රියාත්මක වෙමින් පැවතිනි. ප්‍රාග්ධන තත්ත්වයන් ශක්තිමත් කිරීම, ණය අවදානම කළමනාකරණය කිරීම සහ වත්කම් ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මගින් බැංකු මූල්‍ය ස්ථාවරත්වයක් පවත්වාගෙන යෑමට ඉලක්ක කර තිබිනි. දැඩි නියාමන අධීක්ෂණ සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර තිබූ අවදානම් වර්තාකරණ මාර්ගෝපදේශ, තහවුරු පරීක්ෂා සහ විචක්ෂණශීලි අවශ්‍යතා සමග අනුගතවීම අවශ්‍යතාවයක් ලෙස පැවතිනි. ණය වර්ධනය මන්දගාමී වුවත් බැංකු ආර්ථික පුනර්ජීවනය සඳහා අබණ්ඩ සහයක් දැක්වූ අතර ද්‍රවශීලතාවය පොලී අනුපාත සහ මෙහෙයුම් අවදානම් ඉතා සමීපව අධීක්ෂණය කිරීමට සහය දක්වමින් සිටියේය.

මෙම තත්ත්වය යටතේ වලදායී අවදානම් කළමනාකරණ පරිචයන් පිළිබඳව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දැඩි අවදානයක් යොමුකර ඇත. ස්ථාවරත්වය හා තිරසරභාවය තහවුරු කිරීම සඳහා බැංකුව එහි සියලුම මෙහෙයුම් කටයුතු හරහා අවදානම් පාලනය කිරීම, වාර්තාකරණය, අධීක්ෂණය, මැනීම සහ හඳුනාගැනීම පිළිබඳව අවදානය යොමුකර තිබිනි. අධ්‍යක්ෂ මණ්ඩලය හා විධායක අධීක්ෂණය මගින් බැංකුව පැහැදිලි අවදානම් පාලන ව්‍යුහයක් පවත්වාගෙන ගොස් තිබිනි. අබණ්ඩ අධීක්ෂණය සහ අභ්‍යන්තර පාලනයන් මගින් යථා තත්ත්වයට පත්වෙමින් ඇති ආර්ථික පරිසරයක කටයුතු කරමින් වියහැකි බාධා අවම කිරීම හා එහි උපායමාර්ගික අරමුණු සඳහා සහයවීම බැංකුවේ අරමුණ වී තිබිනි.

අවදානම් කළමනාකරණය සඳහා බැංකුව පහත සඳහන් පරිදි ආරක්ෂක පියවර තුනක ආකෘතියක් භාවිතා කරයි.

පළමු ආරක්ෂක මට්ටම

ව්‍යාපාරික ඒකක සහ සංස්ථාපිත කාර්යයන්

පළමු ආරක්ෂක මට්ටම මූලික අවදානම් ගන්නන් නියෝජනය වන අතර ඔවුන් ඔවුන්ගේ එදිනෙදා මෙහෙයුම්වල වූ අවදානම් ගැනීම සහ කළමනාකරණය සිදුකරයි.

- අවදානම් හඳුනාගැනීම තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා දැනුවත් විනිශ්චයන් යොදාගැනීම.
- සියලුම අවදානම් බැංකුවේ අනුමත කරන ලද අවදානම් රුචිය ආවරණය වන පරිදි හා පිහිටුවා ඇති අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමග අනුගත බව තහවුරු කිරීම.

දෙවන ආරක්ෂක මට්ටම

අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ අංශයේ පාලනය

දෙවන ආරක්ෂක මට්ටම ස්වාධීන අධීක්ෂණයක් සපයන අතර බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවේ වලදායී ක්‍රියාකාරිත්වය තහවුරු කරයි. ප්‍රධාන වගකීම්:

- ව්‍යාපාරික ඒකක හරහා අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම.
- බැංකුව මුලුල්ලේම දැඩි අවදානම් දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම.
- බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ඒකාබද්ධ අවදානම් රාමුව පවත්වාගෙන යෑම සහ වැඩි දියුණු කිරීම.
- අවදානම් නිරාවරණ මැනීම, අධීක්ෂණය හා වාර්තාකරණය.
- සමස්ථ අවදානම් පාලනය ශක්තිමත් කිරීම සඳහා පළමු සහ තුන්වන ආරක්ෂක මට්ටම් සමග කටයුතු කිරීම.

තුන්වන ආරක්ෂක මට්ටම

සහතික කිරීම සහ විගණන

තුන්වන ආරක්ෂක මට්ටම අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලනයන්හි ඵලදායිතාවය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට ස්වාධීන සහතිකයක් ලබා දෙයි. එහි පහත දෑ ඇතුලත්වේ

- අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය සහ නියාමන සමාලෝචන පළමු සහ දෙවන ආරක්ෂක මට්ටම්වල ප්‍රමාණවත් බව ස්වාධීනව ඇගයීමට ලක්කරයි.
- ශක්තිමත් පාලන ප්‍රමිති සහ උසස් පාලන පරිසරයක් සඳහා සහාය දැක්වීම.
- කළමනාකරණය වෙත සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සිදුකල සොයාගැනීම් නිසි කලට දන්වා සිටීම.

අවදානම් සංස්කෘතිය

බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවේ ඵලදායිතාවය ආයතනයේ සියලු මට්ටම් හරහා අවදානම් දැනුවත්භාවය හා වගවීම මගින් අනුබලයක් ලබන ශක්තිමත් අවදානම් සංස්කෘතියක් මගින් තහවුරුකර ඇත. ආරක්ෂක මට්ටම් ආකෘති තුනට සමගාමීව අවදානම් හඳුනාගැනීම, කළමනාකරණය සහ ඉහල යෑම සඳහා බැංකුව එහි සියලු අංශ සඳහා වගකීම බෙදාදෙයි.

අවදානම් කළමනාකරණ කාර්ය මගින් සපයනු ලබන අධීක්ෂණය සමගින් බැංකුවේ පාලන රාමුව, ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි හරහා අවදානම් සංස්කෘතිය ශක්තිමත් කරනු ලබයි. අවදානම් කළමනාකරණ වගකීම් සහ එදිනෙදා මෙහෙයුම්වලදී ප්‍රතිපත්ති පිළිබඳ සේවකයින්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා අබණ්ඩ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වනු ලබයි.

අභ්‍යන්තර විගණන සමාලෝචන සහ පශ්චාත් සිදුවීම් තක්සේරු කිරීම් ඇතුලු ස්වාධීන සහතික කිරීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කලයුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමෙන් සහ ආයතනය මුළුල්ලේ යහපත් අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීමෙන් බැංකුවේ අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීමට තවදුරටත් සහාය දක්වයි.

අවදානම් වාර්ථාකරණය

ද්‍රව්‍යාත්මක අවදානම කාලෝචිත ලෙස හඳුනාගැනීම, මැනීම, අධීක්ෂණය සහ ඉහලයෑම තහවුරු කිරීම සඳහා බැංකුව ශක්තිමත් අවදානම් වාර්තාකරණ රාමුවක් අබණ්ඩ ලෙස පවත්වාගෙන ගොස් ඇත. සියලුම ද්‍රව්‍යාත්මක අවදානම් කාණ්ඩ හරහා බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳව හොඳ දැක්මක් ලබාදීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද අවදානම් වාර්තාකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇත.

අවදානම් නිරාවරණය ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයට අදාල අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවලට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තාකරනු ලබන අතර එමගින් ඵලදායි අධීක්ෂණයක් සහ දැනුවත් තීරණ ගැනීමක් සිදුකරයි. අවදානම් වාර්ථාකරණ ක්‍රියාවලියට අනුමත සීමාවන් සහ එම සීමාවන්ට එරෙහිව අවදානම් මට්ටම් නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන අවදානම් දර්ශක සහ ස්ථාවර අවදානම් ඇතුලත්වන අතර මතුවන අවදානම් සහ වියහැකි විචලනයන් කල්තබා හඳුනාගැනීමට පහසුකම් සපයයි.

අවදානම් රුචිය

බැංකුව ක්‍රියාත්මක වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් රුචිය පිළිබඳ ප්‍රකාශයක් (RAS) මත වන අතර එහි බැංකුව තම උපායමාර්ගික හා මූල්‍යමය අරමුණු ඉටුකර ගැනීමේ දී භාර ගැනීමට කැමති අවදානම් මට්ටම් හා වර්ග නිර්වචනය කර ඇත. ව්‍යාපාර කටයුතු, ප්‍රාග්ධන වෙන්කිරීම් තීරණ සඳහා මග පෙන්වන පිළිගත හැකි අවදානම් සීමාවන්, දැරීමට කැමති අවදානම් සීමා මට්ටම් හා උත්සන්න කිරීමේ ප්‍රේරක ස්ථාපිත කිරීමෙන් අවදානම් ගැනීම සඳහා ව්‍යුහගත රාමුවක් අවදානම් රුචි ප්‍රකාශය මගින් සපයයි.

බැංකුවේ අවදානම් රුචි රාමුවට ප්‍රමාණාත්මක පරාමිතීන් දෙකම ඇතුලත්වේ. ප්‍රමාණාත්මක ක්‍රියාමාර්ග ණය අවදානම ප්‍රාග්ධන ප්‍රමාණවත්බව, ද්‍රවශීල ආවරණ සහ වෙළෙඳපල අවදානම යන ක්ෂේත්‍ර ආවරණය කරයි. ගුණාත්මක පරාමිතීන් මෙහෙයුම් හා නියාමන අවදානම් සඳහා බැංකුවේ ප්‍රවේශය පිළිඹිමු කරයි. අදාලත්වය හා ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා සාර්ව ආර්ථික වර්ධනය සහ තහවුරු පරීක්ෂණ ප්‍රථිඵල සැලකිල්ලට ගනිමින් ඉදිරි දැක්මක් සහිතව කටයුතු නිරීමාණයකර ඇත.

අවදානම් කළමනාකරණ කාර්ය අනුමත කර ඇති අවදානම් රුචියට අදාලව බැංකුවේ අවදානම් පැතිකඩ අබණ්ඩව නිරීක්ෂණය කරන අතර කළමනාකරණයට අදාල අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වෙත හා අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා කරයි. අනුමත සීමාවන්ට යම් අතපසුවීමක් සිදුවී ඇත්නම් ක්ෂණිකව ඉක්මන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා යොමුකරනු ලබයි. අදාල නියාමන අවශ්‍යතාවයන්ට හා අභ්‍යන්තර හා බාහිර මෙහෙයුම් පරිසරයේ සිදුවන වෙනස්කම් සමග අනුගත වීම තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට අවදානම් රුචි වාර්තාව සමාලෝචනය කරයි.

ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ කීර්තිය ආරක්ෂා කිරීමටත් බංකොලොත්භාවයෙන් බැංකුව මුදා ගැනීමටත් ඵලදායි ප්‍රාග්ධන කළමනාකරණය ඉතා වැදගත් වෙයි. බාසල් අවශ්‍යතාවලට ඇතුලුවන අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්බව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය මගින් බැංකුවේ අවදානම්වලට අදාල සමස්ථ ප්‍රාග්ධනයේ ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියට මග පෙන්වයි. රාජ්‍ය බැංකුවක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ප්‍රාග්ධනය රැස්කර ගැනීම සඳහා කොටස් වෙළඳපලට ප්‍රවේශවීම

පිළිබඳව සීමිත හැකියාවක් පවතින අතර ප්‍රාග්ධනය වර්ධනය කරලීමට අභ්‍යන්තර ලාභ උත්පාදනය හා රාජ්‍ය අනුග්‍රහය මත බලාපොරොත්තු තැබීමට සිදුවේ.

	අවම අවශ්‍යතා	2025 %	2024 %	2023 %
පොදු ස්කන්ධය 1 ස්ථරය	7%	24.32	19.28	23.46
1 ස්ථරයේ අනුපාතය	8.5%	22.42	19.28	23.46
සමස්ථ ප්‍රාග්ධන	12.5%	22.42	19.28	23.46

ප්‍රතිපත්ති රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකර ඇති පරිපූර්ණ ප්‍රතිපත්ති සමුදායක් අවදානම් හඳුනාගැනීමට, මැනීමට හා අවම කිරීමට සහ ආයතනය තුල පවතින සියලුම මට්ටම් වෙත සුදුසු ලෙස හා ක්‍රමානුකූලව වාර්තා කිරීම තහවුරු කරයි. කර්මාන්තයේ පවතින හොඳම පරිචයන් හා සමගාමීව හා නැගී එන අවදානම් සඳහා මුහුණදීම තහවුරු කිරීමට ප්‍රතිපත්ති නිතරම සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම සිදුකරයි. වසර තුලදී බැංකුව වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේ වත්කම් ආරක්ෂා කිරීමට, සදාචාරාත්මක හැසිරීම් ප්‍රවර්ධනය කිරීමට සහ වඩාත් සංකීර්ණ වංචාවලට ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා වන එහි කැපවීම ශක්තිමත් කරමිනි.

අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු එකඟවූ ණය ගනුදෙනු නියමයන්ට අනුකූලව ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට ප්‍රතිපාර්ශවය අපොහොසත්වීමෙන් ඇති වන පාඩුවයි. ණය අවදානම ණය ගැනුම්කරුවන්ගේ පැහැර හැරීම් මෙන්ම ප්‍රති පක්ෂ සම්බන්ධව ඇතිවන සංකේන්ද්‍රනය, භූගෝලීය ප්‍රදේශ හෝ කර්මාන්ත අංශ මගින් පැන නැගිය හැකිවේ. බැංකුව නියාමනයක් සහිත පරිසරයක ක්‍රියාත්මක වන හෙයින් ණය අවදානම් කළමනාකරණය, අනුකූලතා අවදානම් සලකා බැලීම හා විචක්ෂණ මට්ටම් වලට යටත්ව ක්‍රියාත්මක වෙයි. පවතින වෙළෙඳපල තත්ත්වයන්ට අදාලවීම සහ වෙනස්වන හොඳම භාවිතයන් සමග පෙලගැස්වීම තහවුරු කිරීම සඳහා ණය පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින්වර සමාලෝචනයකර යාවත්කාලීන කරනු ලබයි. බැංකුවේ අවදානම් බර තැබූ වත්කම්වලින් බහුතරයක් ණය අවදානමට හේතුවන බැවින් එය බැංකුවේ ප්‍රධාන අවදානම් නිරාවරණයන්ගෙන් එකක් ලෙස පවතී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විස්තීර්ණ රාමුවක් මගින් ණය අවදානම කළමනාකරණය කරනු ලබන අතර එයට ණය ප්‍රතිපත්ති, ණය මැනුවලයක්, අනුමත කිරීමේ බලධාරීන්, අභ්‍යන්තර අවදානම් ශ්‍රේණිගත කිරීමේ පද්ධති, සාමූහික කළමනාකරණ පිළිවෙත් හා අබණ්ඩ ණය අධීක්ෂණ ක්‍රියා පටිපාටි ඇතුලත්වේ. ආයතනය තුල පිහිටුවා ඇති තක්සේරු හා නීති ඒකක මගින් අනුබලයක් ලබන පාර්හෝගිකයා පිළිබඳ නිසි සොයාබැලීම් සිදුකරන ක්‍රියාවලියක් අනුගමනය කිරීම සිදුකරනු ලබයි. අවසන් අනුමැතිය ලබාදීමට පෙර, ණය ආපසු ගෙවීමේ හැකියාව, ප්‍රතිපත්ති සඳහා අනුකූලතාවය හා ණය යෝජනා අවදානම් සඳහා හොඳින් ඇගයීම් සිදුකිරීම සිදුකර ඇති බව තහවුරු කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශය විසින් ශක්තිමත් ස්වාධීන පූර්ව සමාලෝචනයක් සිදුකරනු ලබයි. සියලුම අනුමත කොන්දේසි අවශ්‍ය ලියකියවිලි හා අවදානම් අවම කිරීමේ ක්‍රම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත්දැයි මෙම තක්සේරු කිරීමෙන් අනතුරුව පූර්ව ණය මුදාහැරීමේ ඒකකය ණය මුදල් මුදා හැරීමට පෙර අතිරේක වලංගුකරණ ක්‍රියාවලියක් මගින් සිදුකරයි. එක් එක් ණය නිශ්පාදන කාණ්ඩය සඳහා අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආකෘති සංවර්ධනය කර ඇති අතර, එමගින් එක් එක් ණය නිශ්පාදනවල සුවිශේෂී අවදානම් ලක්ෂණ පිළිබිඹු කරයි. මෙම ශ්‍රේණිගත කිරීම් නව ණය පහසුකම් ලබාදීමට හෝ පවතින සීමාවන් වැඩි දියුණු කිරීමට පෙර සිදුකරනු ලබන අතර, එමගින් පැහැර හැරීමේ සම්භාවිතාවය සහ විය හැකි ණය අලාභ තක්සේරු කිරීමට හැකිවෙයි.


ආංශික නිරාවරණයන්, නිශ්පාදන සංයුතිය අභ්‍යන්තර අවදානම් ශ්‍රේණිගත කිරීම් නිර්වචනයකර ඇති දැරිය හැකි සීමාවන් සහිත ප්‍රධාන අවදානම් දර්ශක සහ අනෙකුත් අදාල අනුපාත ආවරණය කරමින් නිතිපතා කලඹ මට්ටමේ විශ්ලේෂණයක් සිදුකරනු ලැබේ. මෙම විශ්ලේෂණයන්හි ප්‍රතිඵල නිර්දේශිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග සමග අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට කලින් කලට වාර්තා කරනු ලැබේ. මෙයට අමතරව අවදානම් කළමනාකරණ අංශය ණය ආපසු ගෙවීමේ හැකියාව නිවැරදිව තක්සේරු කිරීම සහ හානිකරණ ප්‍රතිපාදනවල යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් හානිකරණය යටතේ සිටින ගනුදෙනු කරුවන්ගේ මුදල් ප්‍රවාහය සමාලෝචනය කරයි. වැඩිවන අවදානම් අවස්ථා සහ ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් සඳහා ණය අවදානම් කළමනාකරණ රාමුව සහ ඒ ආශ්‍රිත ක්‍රියාවලින් අබණ්ඩව සමාලෝචනය කර වැඩි දියුණු කරනු ලැබේ.

මීට අමතරව බැංකුව ව්‍යුහගත ණය සමාලෝචන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන අතර ඒ යටතේ ණය කළඹෙන් ආසන්න වශයෙන් 30%ක් වාර්ෂිකව ස්වාධීනව තක්සේරු කරනු ලබයි. මෙම යාන්ත්‍රණය ණය ගුණාත්මකභාවය පිළිබඳ දැඩි අපක්ෂපාතී ඇගයීමක් අවදානම් භාර ගැනීමේ ප්‍රමිතීන්ට අනුකූලවීම සහ ණය ගැනුම්කරු හා කළඹ මට්ටම් යන දිත්වයෙහිම මතුවන දුර්වලතා කල්තියා හඳුනා ගැනීම සිදුකරයි. ණය ලබාදීමේ කළඹෙහි දිගුකාලීන ස්ථාවරත්වයට සහය වෙමින් සහ බැංකුවේ ණය පාලන රාමුව ශක්තිමත් කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවලට යොමුකරවීම, අවදානම් පාලනය ශක්තිමත් කිරීම හා ණය ක්‍රියාවලිය සකස් කිරීමට මෙම සමාලෝචනයන්ගේ සොයාගැනීම් ඉවහල් වෙයි.


නිශ්පාදන නිශ්චිත නිරාවරණයන් පිළිබඳව සලකා බැලූ විට බැංකුවේ ණය කළඹ බොහෝ දුරට පුද්ගල ණය ලබාදීම සඳහා කේන්ද්‍රගතවී ඇත. මුළු ණය කළඹින් 4.8%ක් උකස් ණය සඳහා සහ සේවක අර්ථ සාධක අරමුදල් ණය සඳහා යොදාගෙන ඇත. ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා බැංකුව විවිධ අංශ හා කර්මාන්ත අංශය හරහා විවිධාංගිකරණය නොකඩවා සිදුකරමින් යන අතරම ඇපමත ණය දීමේ ක්‍රමය ක්‍රමයෙන් ඉහල නංවයි. නිශ්පාදන සංයුතිය අනුව පුද්ගලික ණය කළඹ විශාලතම අත්තිකාරම් කොටස නියෝජනය කරන අතර ණය කළඹෙන් 55% ක් උකස් ඇප මත හා සේවක අර්ථසාධක

අරමුදල් ණය මත පදනම් වේ. ආංශික විවිධාංගිකරණය ශක්තිමත් කිරීම සහ ඇපකර අංශය තවදුරටත් පුළුල් කිරීම සඳහා දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

නිශ්පාදන අනුව ආයෝජන කළඹේ සංයුතිය



මෙම වසරතුල බැංකුව ප්‍රකෘතිමත් වීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ අක්‍රිය ණය කළඹ සමීපව අධීක්ෂණය ඉහල නැංවීම කෙරෙහි අවධානය යොමුකර ඇත. යථා තත්ත්වයට පත්කරලීම වේගවත් කිරීම සහ වත්කම් ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා ඉලක්කගත පසු විපරම් ක්‍රියාමාර්ග වැඩි දියුණුකල අධීක්ෂණ යාන්ත්‍රණය සහ ණය ගැනුම්කරුවන් සමග වඩාත් ඵලදායි සම්බන්ධතාවයක් ක්‍රියාත්මක කරන ලදී




වෙළෙඳපල අවදානම


වෙළෙඳපල අවදානම යනු වෙළෙඳපල මිල අනුපාතවල උච්චාවචනයන් හේතුවෙන් බැංකුවේ වත්කම් සහ බැරකම් මගින් ජනනයවන වටිනාකමට හෝ ආදායමට ඇතිවිය හැකි අහිතකර බලපෑමයි. බැංකුවේ ප්‍රධාන වෙළඳපළ අවදානම පැන නගින්නේ වෙළඳපොළ තුළ ඇති පොලී අනුපාත අවදානමෙන් වන අතර එය නියාමන අභ්‍යන්තර අවදානම් පරාමිතීන් සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා සමීපව නිරීක්ෂණය කරනු ලැබේ.

බැංකුවේ වෙළඳපළ අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේදී වත්කම් හා බැරකම් කමිටුව ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. කල්පිරීම් අව ගැලපුම් නිරීක්ෂණ කිරීම, අත්තිකාරම් සහ තැන්පතුවල සංයුතිය තක්සේරු කිරීම සහ බැංකුවේ සමස්ථ වෙළෙඳපළ අවදානම් නිරාවරණ අනුමත අවදානම් රුචිය ඇතුළත පවතින බව සහතික කිරීම සඳහා වත්කම් හා බැරකම් කමිටුව වගකිවයුතු වෙයි. නිතිපතා අධීක්ෂණ අවස්ථා විශ්ලේෂණය උපාය මාර්ගික ශේෂ පත්‍ර කළමනාකරණය හරහා වත්කම් හා බැරකම් කමිටුව බැංකුවේ ඉපයීම්වල ස්ථාවරත්වය පවත්වා ගැනීමට සහ කළඹේ දිගුකාලීන වටිනාකම් ආරක්ෂා කිරීමට උපකාරීවෙයි.

ද්‍රවශීලතා අවදානම

බැංකුවේ මූල්‍ය බැඳීම් නිසිකලට ඉටු කිරීමට නොහැකිවීම නිසා ඉපයීම් වලට හෝ ප්‍රාග්ධනයට වියහැකි බලපෑම ද්‍රවශීලතා අවදානම ලෙස හැඳින්වේ. අනපේක්ෂිත ද්‍රවශීලතා පීඩන හෝ වෙළඳපළ බාධාවන් හමුවේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා ඵලදායි ද්‍රවශීලතා කමනාකරණය අත්‍යවශ්‍ය වේ. අනුමතකර ඇති අවදානම් රුචිය සමඟ සමගාමී බව තහවුරු කිරීමට කල්පිරීම් පැතිකඩ, අරමුදල් සංයුතිය, බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය ක්‍රියාකාරී ලෙස අධීක්ෂණය කිරීම සහ ද්‍රවශීල අවදානම අධීක්ෂණය කිරීමට වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වගකිව යුතුවෙයි. ඒ සමගම අවදානම් කළමණාකරණ අංශය (RMD) ද්‍රවශීලතා හා පොලී අනුපාත අවදානම අධීක්ෂණය කරයි. නැගී එන අවදානම් හඳුනාගනිමින් හා කාලෝචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම ද නිර්දේශ කරයි. සොයාගැනීම් හා විශ්ලේෂණ නිතිපතා විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, (EIRMC) වත්කම් හා බැරකම් කළමණාකරණ කමිටුව (ALCO) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත වාර්තා කරනු ලබයි. එමගින් දැනුවත් තීරණ ගැනීමට සහ බැංකුවේ සමස්ථ ද්‍රවශීලතා පාලන රාමුව ශක්තිමත් කිරීමට හැකියාව ලැබේ.





බැංකුවේ තැන්පතු පදනම ප්‍රධාන වශයෙන් කෙටි කාලීන හා මධ්‍ය කාලීන වගකීම් වලින් සමන්විතවන අතර එහි ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත වන නිවාස මූල්‍ය ස්වභාවයෙන්ම දිගුකාලීන ස්වරූපයක් ගනී. මෙම ව්‍යුහාත්මක අසමතුලිතතාවයට බැංකුවේ ස්ථාවර අනුපාත ණය ලබාදීම තවදුරටත් බලපා


ඇති අතර එහි වගකීම් බහුතරයක නැවත මිල නියම කිරීමකට යටත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ඍණ කල්පිරීම් අවගැලපුම ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා බැංකුව උපායමාර්ගික පියවර කීපයක් ක්‍රියාත්මක කර ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ හරහා කෙටිකාලීන ණය විසඳුම් හඳුන්වාදීම, පොලී අනුපාත සංවේදීතාවය අඩු කිරීම සඳහා විචල්‍ය අනුපාත ණය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ බැංකුවේ අරමුදල් පදනමේ ස්ථාවරත්වය හා විවිධත්වය ශක්තිමත් කිරීම සඳහා කුඩා ඉතුරුම් ගිණුම් පුළුල් කිරීමට මුල පිරීම් ඇතුළත් වේ. සාමූහිකව මෙම ක්‍රියාමාර්ග කල්පිරීම් අවගැළපුම් අවදානම් අඩු කිරීමට හා වඩාත් සමතුලිත, වත්කම් බැරකම් ව්‍යුහයකට අනුබලයක් ලබාදෙයි.

තහවුරු පරීක්ෂා

අවදානම් රුචිය සම්බන්ධව බැංකුවේ වර්තමාන හා වියහැකි අවදානම් පැතිකඩෙහි සංවේදීතාවය තක්සේරු කිරීම හා බැංකු ව්‍යාපාරයට බලපාන විභව අවදානම් සාමාන්‍ය තහවුරු පරීක්ෂාව (stress test) මගින් ඇගයීමට ලක්කරයි. බැංකුවේ තහවුරු පරීක්ෂණ රාමුව සාර්ව ආර්ථික සහ ව්‍යාපාර ආකෘති පරීක්ෂණ ඇතුළු ශිල්පීය ක්‍රමවල එකතුවක් භාවිතා කරයි.

තහවුරු පරීක්ෂාව බැංකුවේ සියලුම අංශයන් හරහා අවදානම් දැනුවත්භාවය වැඩි කිරීමට දායකවන අතර ක්‍රියාකාරී කළමනාකරණයක් මගින් ව්‍යාපාර අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමට ක්‍රියාකරයි. වෙළෙඳපළ අවදානම පිළිගත හැකි පරාසයක පවතින බව තහවුරු කිරීම සඳහා බැංකුව අභ්‍යන්තර තහවුරු පරීක්ෂණ පරාසයක් ක්‍රියාත්මක කරයි. ද්‍රවශීලතා විචලනයන්, මුදල් ප්‍රවාහ පුරෝකථනයන්, ද්‍රවශීලතා අනුපාත සහ කල්පිරීම් පරතර විශ්ලේෂණය මගින් මනිනු ලබයි. තහවුරු පරීක්ෂා ප්‍රතිපත්ති රාමුව ණය ද්‍රවශීලතා පොලී අනුපාත සහ කල් පිරීම් පරතර වැනි සියලු ප්‍රමාණාත්මක අවදානම් විවිධ තහවුරු මට්ටම් යටතේ ආවරණය කරයි. සුළු, මධ්‍යම, ප්‍රධාන අර්බුද ලාභදායිත්වය ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්බව කෙරෙහි ඇතිවන බලපෑම කාර්තුමය පදනමක් මත ඇගයීමට ලක්කර ඉහළ කළමනාකාරිත්වයට විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (EIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත වාර්තා කරනු ලබයි. තහවුරු පරීක්ෂාව මගින් පිළිගතහැකි තහවුරු පරීක්ෂා අවස්ථාවන්හිදී බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ අධීක්ෂකවරුන්ට හා නියාමකයින්ට පුළුල් දැක්මක් ලබාදෙයි.

තහවුරු පරීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵලය ගැඹුරින් නිරීක්ෂණය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි. බැංකු විසින් ගනු ලබන වෙනත් අවදානම් කළමනාකරණ ප්‍රවේශයන් සඳහා අතිරේකයක් ලෙස මෙය භාවිතා කරයි.



ද්‍රවශීලතා ගැටළු සමඟ කටයුතු කිරීම සඳහා බැංකුව හදිසි අරමුදල් සැලැස්මක් ක්‍රියාත්මක කරන අතර මහ බැංකුව නියම කර ඇති මට්ටම් වලට වඩා ද්‍රවශීල ආවරණ අනුපාතය (LCR) පවත්වා ගැනීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ වගකීමකි.

පූර්ව ආරක්ෂාවක් ලෙස වසරතුළදී වත්කම් හා බැරකම් නිෂ්පාදන හඳුන්වාදීමට බැංකුව පියවර කීපයක් ගෙන ඇත. වර්ෂය තුළ නොගැලපීම් අවමකර ගැනීමට පාරිභෝගික අවශ්‍යතා සහ වෙළෙඳපළ තත්ත්වයන් පවත්වා ගැනීම මෙහි අරමුණ වෙයි.

මීට අමතරව බැංකුව සඳහා මූලික බැංකුකරණ විසඳුමක් ලබාගැනීම වෙනුවෙන් ගත් උත්සාහයක් සාර්ථක වූ අතර එමගින් වැඩි දියුණු කරන මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ පාරිභෝගික විශ්වාසය දත්ත මත පදනම්වූ තීරණ ගැනීම වැනි විවිධ ප්‍රතිලාභ බැංකුව වෙත ලබා දෙයි.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් පාඩු ඇතිවීමේ අවදානමයි. මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම ආයතනය පුරා විනය පවත්වා ගැනීමක් වන අතර බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව තුළ අඩංගු මෙවලම් උපයෝගි කරගනිමින් එම කටයුතු ආරම්භකර ඇත. මෙම අවදානම් කළමනාකරණ රාමුව මගින් ද්‍රව්‍යාත්මක මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, මැනීම කළමනාකරණය, අධීක්ෂණය සහ වාර්තාකරණයට සහාය දක්වයි.

පරිපූර්ණ අවදානම් කළමනාකරන රාමුවක් මගින් මෙහෙයුම් අවදානම් ඵලදායි ලෙස හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. "පළමු ආරක්ෂක මට්ටම" ලෙස දැක්වෙන ශාඛා සහ අංශ මගින් මූලාරම්භයේදී අවදානම් හඳුනාගැනීමේ වගකීම දරයි. දෙවන ආරක්ෂක මට්ටම වන අවදානම් කළමනාකාරණ අංශයේ මෙහෙයුම් අවදානම් රාමුව ක්‍රියාත්මක කිරීම සහ අවදානම් රුචිය තුළ අර්ථ දක්වා ඇති පරාමිතීන්ට එරෙහිව අවදානම් ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු වෙයි. විගණන හා අනුකූලතා ඒකක මගින් මෙහෙයුම් අවදානම් කලමනාකරණ ක්‍රියාවලීන් හි ප්‍රමාණවත් බව සහ සවලතාවය පිළිබඳ ව සහතික වෙයි.

අවදානම් කළමනාකරන අංශය විසින් (RMD) සියලුම ප්‍රධාන ව්‍යාපාරික ඒකකයන්ට අවදානම් පාලන ස්වයං ඇගයීම් (RCSA) සිදුකරන අතර මෙමගින් පළමු ආරක්ෂක මට්ටමේ දී සිදුවන මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම සිදුකරයි. මෙහෙයුම් අවදානමට නිරාවරණය වීම ඇගයීම සඳහා සිද්ධි වාර්තාකරණය, ප්‍රධාන අවදානම් දර්ශක, අභ්‍යන්තරව අලාභ සිදුවීමේ දත්ත වැනි මෙවලම් ආයතනය ඇතුලත භාවිතා කරයි. බැංකුවේ අවදානම් රුචියට අනුකූලවන අයුරින් මෙහෙයුම් අවදානම් කලමනාකරණය, පාලනය හා අවම කිරීම බැංකුවේ අරමුණ වෙයි. මෙහෙයුම් වල සංවේදී අංශ සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රවේශයේ ඇති දැඩි ඉහළ යෑමක් සහිත මට්ටම බැංකුව තහවුරු කර ඇත.

මානව සම්පත් කළමනාකරණය

බැංකුවේ ලාභදායිත්වය සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා මූලිකවම දායකත්වය ලබා දෙන්නේ එහි සේවකයින් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවකයින් මූල්‍යමය වත්කමක් ලෙස නොදැක්වුවද ඔවුන් ආයතනයේ වටිනාම සහ හිලව්කළ නොහැකි වත්කමක් ලෙස පවතී.

අපගේ සේවකයින් අපගේ උපායමාර්ගික දැක්ම ස්පෘශ්‍ය ප්‍රතිඵලයක් ලෙස අනුවර්තනය කිරීම මගින් අපගේ ගනුදෙනුකරුවන්ට සහ පාර්ශවකරුවන්ට වටිනාකමක් නිර්මාණය කරයි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අපි සේවකයින්ට විශිෂ්ටත්වයට පත්වීමට හැකිවන පරිදි ආකර්ශනීය හා ප්‍රබෝධමත් සේවා පරිසරයක් ඇති කිරීමට කැපවී සිටිමු. පුහුණුව, සංවර්ධනය, සේවක සහභාගිත්ව මූලාරම්භයන් සඳහා අබණ්ඩව ආයෝජනය කිරීම, අපගේ ශ්‍රම බලකාය දැනුමින් සන්නද්ධ වීමට සහ ඵලදායී ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ හැකියාවන්ගෙන් පිරිපුන් බව තහවුරු කරයි.

බැංකුවේ තිරසාර වර්ධනය පවත්වාගෙන යාම සඳහා ඉහළ දක්ෂතා ඇති පුද්ගලයින් ආකර්ෂණයකර ගැනීම, පෝෂණය කිරීම සහ රඳවාතබා ගැනීම කෙරෙහි අපි නිරන්තරයෙන්ම අවධානය යොමු කරමු.

කාර්ය මණ්ඩල සංඛ්‍යාව

මෙම වසර තුළ මුළු සේවක සංඛ්‍යාව 334 ක් වූ අතර, ඔවුන් තුළනාත්මකව කුඩා ප්‍රමාණයක් වුවත්, ඔවුන් වඩා ඉහළ ප්‍රමාණයකින් බැංකුවේ කාර්යසාධනයට දායක වී ඇත. වසර තුළ, කාර්ය මණ්ඩල සාමාජිකයින් 23 දෙනෙකු බැංකුවෙන් ඉවත් වූ අතර එයින් නිලධාරීන් 11 ක් බැංකුවෙන් විශ්‍රාම ගන්නා ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින් 12 දෙනෙකු විශ්‍රාම යෑම සහ වෙනත් හේතූන් මත බැංකුවෙන් ඉවත් විය. වසර තුළ බැංකුව සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයින් 3 ක් අපි බඳවා ගත්තෙමු. බැංකුවේ බඳවාගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීම සිදුකර ඇත.

කාර්ය මණ්ඩල වෙනස

කළමනාකරණ මට්ටම	වෙනස		
	විශ්‍රාම ගිය	ඉල්ලා අස්වූ / වෙනත්	බාහිරින් බඳවාගත්
ආයතනික කළමනාකරණය	1		1
ජේෂ්ඨ කළමනාකරණය	1		1
විධායක	4	6	1
විධායක නොවන	5	2	1
කොන්ත්‍රාත් පදනම මත / TBA		4	1
එකතුව	11	12	3

කාර්ය මණ්ඩල සංඛ්‍යාව ස්ථර අනුව

කළමනාකරණ මට්ටම	2025.12.31 දිනට සේවක සංඛ්‍යාව
ආයතනික කළමනාකරණය	11
ජේෂ්ඨ කළමනාකරණය	4
විධායක	93
විධායක නොවන	203
කොන්ත්‍රාත් පදනම මත / TBA	23
එකතුව	334

ස්ත්‍රී පුරුෂභාවය

සමානව රැකියා අවස්ථා සපයන්නෙකු ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කාන්තා හා පුරුෂ පාර්ශවයන් සඳහා සමාන රැකියා අවස්ථා ලබා දී ඇත. කාන්තා : 53%

පිරිමි : 47%

මෙය විවිධත්වය, සමානාත්මතාවය සහ සමාන රැකියා අවස්ථා සඳහා අපගේ අබණ්ඩ කැපවීම පිලිබිඹු කරයි.

සේවක වයස් විස්තරය

ඉතා පළපුරුදු හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයක් තබා ගැනීමට බැංකුවට හැකියාව ලැබී තිබිනි. කාර්ය මණ්ඩලයෙන් 50% ක ප්‍රමාණයක් අවුරුදු 40 ඉක්මවූ අය වෙති.

වයස් වර්ගය	2025.12.31 දිනට සේවකයින් ගණන
50 හෝ ඊට ඉහළ	61
40 49	117
30 39	111
29 හෝ ඊට පහළ	45
එකතුව	334

කුසලතා කළමනාකරණය

අපගේ සියලුම ගනුදෙනුකරුවන්හට උසස් ගුණාත්මක සේවාවක් ලබා දීමට හැකි වන නිසා කුසලතා සංචිතය කළමනාකරණය සඳහා අපගේ ඉහලම ප්‍රමුඛත්වය හිමි වෙයි. සම්පූර්ණ හැකියාවක් අවබෝධ කරගැනීමට බැංකුවට හැකියාව ඇතිකරමින් අනාගත නායකයින් බවට පත්වීම සඳහා සේවකයින්ගේ හැකියාවන් සංවර්ධනය කිරීමට අපගේ කණ්ඩායම තුළ ආයෝජනය කරමින් විශිෂ්ට සම්පත් අත්පත් කරගෙන බැංකුව තුළ රඳවා ගන්නා බව අපි තහවුරු කරමු.

කුසලතා ආකර්ෂණය හා අත්පත් කරගැනීම

ව්‍යාපාර අවශ්‍යතාවයන් සඳහා මනාව ගැලපෙන අපේක්ෂකයා තෝරාගැනීම සඳහා සැලසුම්කර ඇති බැංකුවේ බඳවාගැනීමේ පටිපාටිය මඟින් නව කුසලතා අත්පත් කර ගැනීම සිදුකරයි. අවශ්‍ය දක්ෂතාව, දැනුම, හැකියාවන් සහ අපගේ සංස්කෘතියට ගැලපෙන හා එය පෝෂණය කරන චර්යාවන් සහිත දක්ෂයින්ට ප්‍රමුඛතාව ලබා දේ. ඇබෑර්තු ඇතිවන සෑම අවස්ථාවකදීම, අභ්‍යන්තර දක්ෂයින්ට සමීප සලකාබැලීම ලබාදෙන අතර, අභ්‍යන්තර දක්ෂයින් ලබාගත නොහැකිනම් අවශ්‍ය මට්ටම්වලදී විශේෂිත දක්ෂයින් ලබා ගනී.

පුහුණුව හා සංවර්ධනය

සේවකයෙකුගේ දැනුම, හැකියාවන්, දක්ෂතා, ආකල්ප සහ කාර්යසාධනය වැඩි කරන ආකාරයෙන් පුහුණුව හා සංවර්ධනය ප්‍රධාන මෙවලමක් වන අතර, එය අප බැංකුවේ වර්ධනය අත්කර ගනු ලබයි. අපගේ සේවකයින්ට ඔවුන්ගේ දක්ෂතා සහ දැනුම වැඩි කර ගැනීමට ඔවුන්ගේ පුද්ගල සන්නාමය ශක්තිමත් කරමින් පුහුණුව හා සංවර්ධන අවස්ථා පිරිනමනු ලැබේ. තම රාජකාරි ඉටු කිරීමට ඔවුන්ට හැකියාව ඇති කරමින් විවිධ කාර්යයන් හී සෑම මට්ටමකදීම සේවකයින් පුහුණු කර සංවර්ධනය කිරීමට බැංකුව උත්සාහ ගන්නා අතර අනාගත වගකීම් සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දේ.

වෙළඳපොළට බලපා තිබූ අයහපත් අස්ථාවරභාවය හේතුවෙන් 2025 වර්ෂයේ දී පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සහභාගිත්වය අභියෝගාත්මක විය. නියමිතව තිබූ පුහුණු වැඩ සටහන් වලින් වැඩි කොටසක් අවලංගු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩ සටහන් පැවැත්වීමට අපට හැකිවී තිබිනි. අපගේ සේවකයින් අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 06 කට හා බාහිර පුහුණු වැඩසටහන් 79 කට සහභාගිවී ඇති බව දක්නට තිබිනි.

2025 වසර තුළ, ලබාදෙන ලද විවිධ පුහුණු අවස්ථාවන් හී සේවක සහභාගිත්වය පහත වගුවෙන් සාරාංශ කෙරේ.

ප්‍රධාන ක්ෂේත්‍ර	සහභාගිවූවන් ගණන
දැනුම හා දක්ෂතා සංවර්ධන පුහුණුව	171
ආකල්ප සංවර්ධන පුහුණුව අභිප්‍රේරණ පුහුණුව	149
සම්මන්ත්‍රණ, වැඩමුළු, සාමාජිකත්ව ගාස්තු, ප්‍රශ්න තරඟාවලි	9

සේවකයින්ගේ සේවය

සේවා වර්ගය (අවුරුදු)	2025.12.31 දිනට සේවකයින් ගණන
04	74
59	42
10-14	124
15-19	42
ඉහළ 20	52
එකතුව	334

සේවකයින්ගෙන් 78%ක් බැංකුව තුළ වසර 5කට වැඩි කාලයක් සේවය කර ඇති අතර, බැංකුවේ සංවර්ධනයට ඔවුන්ගේ සේවය දායක කරයි. කාර්ය මණ්ඩලය වෙත මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම පමණක් නොව, මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබාදීමෙන් ඔවුන්ගේ රැකියා තෘප්තිය වැඩිකර ඇත.

අප අද සිටින ස්ථානය කරා ගමන්මඟ එතරම් පහසු නොවිය. නමුත්, බැංකුව එය අත්කරගෙන සිටින සෑම දෙයක්ම එහි සේවකයින්ගේ වෙහෙස නොබලා කැපවීමේ උත්සාහයන් තුළින් අත්කරගෙන ඇත.

අනාගත දැක්ම

ඉදිරි වසර තුළ මානව සම්පත් හොඳම භාවිතයන් අඛණ්ඩව වැඩි දියුණු කිරීම මඟින් බැංකුව සිය මානව ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට කැපවී සිටියි. හැකියා පරතරය හඳුනාගැනීම සහ ඉගැන්වීම් මූලාරම්භයන් ආරම්භ කිරීම උපායමාර්ගික අරමුණු සමඟ පෙළ ගැස්වීම සඳහා පුළුල් පුහුණු හා සංවර්ධන අවශ්‍යතා විශ්ලේෂණයක් දැනට සිදුකරමින් පවතී. සොයාගැනීම් මත පදනම්ව බැංකුව තාක්ෂණික නිපුනතා සහ අත්‍යවශ්‍ය මෘදු කුසලතා යන දිත්වයම සඳහා නිර්මාණයකර ඇති ව්‍යුහගත පුහුණු රාමුවක් ක්‍රියාත්මක කරනු ඇත. එමඟින් හොඳින් දැනුවත්වූ සහ අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් ඇතිකරනු ඇත.

ආයතනික තිරසාරභාවයේ ප්‍රධාන අත්තිවාරමක් ලෙස අනුප්‍රාප්තික සැලසුම්කරණය කෙරෙහි බැංකුව සිය අවධානය යොමුකර ඇත. ඉහළ විභව සේවකයින් සහ තීරණාත්මක භූමිකාවන් දරන්නන් හඳුනාගැනීම හා සංවර්ධනය කිරීම තුළින් නායකත්ව හැකියාව ගොඩනැඟීම හා ප්‍රධාන තනතුරුවල අඛණ්ඩ බව සහතික කිරීම සඳහා ඉලක්කගත සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කරනු ඇත.

අපගේ මෙම මූලාරම්භයන් මඟින් ඉහළ කාර්යසාධන සංස්කෘතියක් වර්ධනය කිරීම සේවක සහභාගිත්වය ශක්තිමත් කිරීම සහ සියලුම පාර්ශවකරුවන් සඳහා දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම සඳහා සහයවන සේවා ස්ථාන පරිසරයක් ඇති කිරීම සඳහා සිදුකරමින් පවතින කැපවීම විදහා දක්වයි.

නිෂ්පාදන සන්නාමකරණය

හැඳින්වීම

වර්ධනය සඳහා සැලසුම් කර ඇති පහසු ප්‍රවේශයක් සහිත විශ්වාසනීය මූල්‍ය විසඳුම් මඟින් ව්‍යාපාර, පවුල් හා පුද්ගලයන් බලගැන්වීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කැපවී සිටියි. අපගේ ගනුදෙනුකරුවන්ගේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම වැඩි වන අවශ්‍යතා සපුරා ලීමට හා ඉතුරුම් ප්‍රවර්ධනය සහ ආයෝජන සුරක්ෂිත කිරීමේ සිට පුද්ගලික ඉලක්ක වෙත ළඟාවීම හා ව්‍යාපාර පුළුල් කිරීම දක්වා අපගේ වැඩි වූ නිෂ්පාදන පෙළ ඉතාමත් ප්‍රවේශම් සහගතව සැලසුම් කර ඇත.

විශ්වාසය, පහසුව, පාරිභෝගික කේන්ද්‍රීය නව්‍යකරණය සඳහා දැඩි අවධානයක් යොමු කරමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විස්තීර්ණ ඉතුරුම් ගිණුම් කළඹක්, ණය පහසුකම්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍ය විසඳුම් සහ ආයෝජන විකල්පයන් ඉදිරිපත් කරයි. සෑම නිෂ්පාදනයකම වටිනාකම්, නම්‍යතාවය සහ මූල්‍ය විශ්වාසය ලබා දෙන පරිදි සැලසුම් කර ඇති අතර, එමඟින් අපගේ ගනුදෙනුකරුවන්ට අනාගතය සැලසුම් කිරීම සඳහා සහ ඉතා පහසුවෙන් ඔවුන්ගේ අපේක්ෂා වෙත ළඟාවීමට හැකිවනු ඇත.

ශක්තිමත් හා වඩාත් සුරක්ෂිත මූල්‍ය අනාගතයක් ගොඩනැඟීම සඳහා ඔබගේ විශ්වාසනීය සහකරුවෙකු ලෙස සරල, කරදර රහිත ක්‍රියාවලීන් සමඟ තරඟකාරී ප්‍රතිලාභ එක් කරන අතිනවීන විසඳුම් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අඛණ්ඩව සපයනු ඇත.

1. ඉතුරුම් නිෂ්පාදන

1.1 නිත්‍ය ඉතුරුම් - සේවි ස්මාර්ට්

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිත්‍ය ඉතුරුම් ගිණුම සැලසුම් කර ඇත්තේ ඔබගේ මුදල් ක්‍රමයෙන් වර්ධනය වීමට සහ ඔබට අවශ්‍ය නම්‍යශීලීත්වය ළඟා කරදීම සඳහා වේ. ඔබේ ඉතුරුම්වල ස්ථාවර වර්ධනයක් සහතික කරමින් දිනපතා ගණනය කර මාසිකව බැර කරනු ලබන ආකර්ෂණීය වාර්ෂික 2.25%ක පොළියක් උපයා ගන්න.

ප්‍රතිලාභීන් නම් කිරීම, ස්ථාවර නියෝග පහසුකම් සහ බද්ධ ගිණුම් විවෘත කිරීම සඳහා විකල්පයන් වැනි පහසුකම් ලබාදී ඔබට ආරක්ෂාව සහ පාලනය යන දෙකම ලබා දෙයි.

වලංගු ජාතික හැඳුනුම්පතක් හෝ විදේශ ගමන් බලපත්‍රයක් සහිත වයස අවුරුදු 18ට වැඩි සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ට ලබාගත හැකි මෙය ස්ථාවර මූල්‍ය අනාගතයක් ගොඩනැඟීම සඳහා පරිපූර්ණ ගිණුමකි.

1.2 අපූර්වා (කාන්තා ඉතුරුම්) විශ්වාසයෙන් ඉතිරි කරන්න, ශක්තියෙන් වර්ධනය වන්න

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 'අපූර්වා' කාන්තා ඉතුරුම් ගිණුම සමඟ මූල්‍ය නිදහස වෙත පියනඟන්න. ඔබව බලගැන්වීම සඳහා ඔබ වෙනුවෙන්ම සැලසුම් කළ ගිණුමකි. වාර්ෂිකව 5%ක පොළියක් සමඟ ඕනෑම අවස්ථාවක දඩ මුදලකින් තොරව මුදල් ආපසු ගැනීමේ නිදහස භුක්තිවිඳින්න.

මනාප ණය අනුපාත, ස්ථාවර නියෝග පහසුකම් සහ රු. 1000ක අවම තැම්පතුවක් වැනි අමතර ප්‍රතිලාභ සමඟින් අපූර්වා ඔබට, ඔබගේ මූල්‍ය කටයුතු වර්ධනය කර ගැනීමට නම්‍යශීලීත්වය හා සහාය ලබා දෙයි.

වයස අවුරුදු 18 හා ඊට වැඩි ශ්‍රී ලාංකික කාන්තාවන් සඳහා ලබාගත හැකි මෙය ඉතිරි කිරීමේ ගිණුමකට වැඩියමක් වන අතර, එය ඔබගේ දියුණුවේ සහකරු වෙයි.

1.3 මැක්ස් සේවර් - වැඩියෙන් ඉතිරි කරන්න, වැඩියෙන් උපයන්න, දිගුකලක් ජීවත් වෙන්න

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු මැක්ස් සේවර් ඉතුරුම් ගිණුම සමඟ ඔබගේ මූල්‍ය වර්ධනය පාලනය කරන්න. එහිදී ඉහළ ඉතුරුම් යනු ඉහළ ප්‍රතිලාභ වේ. ඔබගේ දෛනික ශේෂය මත ගණනය කර මාසිකව බැර කරන තරඟකාරී පරාසගත පොළී අනුපාත භුක්තිවිඳින්න.

රු. 1000.00 ක මුදලකින් ආරම්භ කර රු. 5000.00 ක් දක්වා පවත්වා ගෙන ගොස් පොළිය උපයා ගන්න. ඒ සමඟම දඩ මුදල් නොමැතිව අසීමිත මුදල් ආපසු ගැනීම්, ප්‍රතිලාභියා නම් කිරීම සහ ඔබගේ ඉතුරුම් වර්ධනය වන විට පූර්ණ නම්‍යශීලීතාවය ලබා ගන්න.

වයස අවුරුදු 18 හෝ ඊට වැඩි ශ්‍රී ලාංකිකයන් සඳහා සැලසුම් කර ඇත. සීමාවන් නොමැතිව ඉතිරි කිරීමට ඇති හොඳම ක්‍රමය මෙයයි.

1.4 'මුතු සිනා' සුළුවෙන් පටන් ගෙන හෙට දිනයේ විශාල සිහින ගොඩනඟන්න.

ඔබේ දරුවාට පැහැබර අනාගතයක් උදාකරදීම සඳහා ඉතා සතුටින් ඉතිරි කිරීම ආරම්භ කළ හැකි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු මුතු සිනා ළමා ඉතුරුම් ගිණුම 5%ක් වැනි සිත් ගන්නා සුළු පොළී අනුපාතයක් සමඟ රු. 500.00ක මූලික තැම්පතුවකින් ආරම්භ කළ හැකි වේ. එය ඉතා ඉක්මණින් බුද්ධිමත් මූල්‍ය පුරුදු ඇති කර ගැනීම සඳහා හොඳ ආරම්භයක් සපයයි.

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග වැනි ප්‍රධාන සංධිස්ථානවලදී අධ්‍යාපන ජයග්‍රහණ සඳහා විශේෂ ත්‍යාග සමඟින් ඉතිරි කිරීම් මත පදනම් වූ ආකර්ෂණීය ත්‍යාග ලබාදීම.

දෙමාපියන් හෝ භාරකරුවෙකු විසින් විවෘත කළ හැකි මෙම ගිණුම ඔබේ දරුවා සමඟ වැඩෙන අතර, වයස අවුරුදු 18 වන විට බාධාවකින් තොරව සාමාන්‍ය ඉතිරි කිරීම් ගිණුමක් බවට පරිවර්තනය වෙයි.

2. ණය සහ අත්තිකාරම්

2.1 උකස් ණය - අගය උපරිම කිරීම, බොහෝ දේ ලබා ගන්න

පුද්ගල හා ව්‍යාපාරික අවශ්‍යතා සඳහා විශ්වාසනීය මූල්‍ය විසඳුම් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු උකස් ණය සමඟ ඔබගේ දේපළවලින් උපරිම වල නෙළා ගන්න. ඉක්මන් අනුමැතියෙන් සහ කරදරයකින් තොර ක්‍රියාවලියක් මඟින් සම්පූර්ණ ණය මුදල ඉක්මණින් එකවර ලබා ගත හැකි වෙයි.

වසර 15ක් දක්වා නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රම සහ ඔබගේ කලත්‍රයා සමඟ ඒකාබද්ධව අයැදුම් කිරීමේ හැකියාව සමඟින්, මෙම ණය මුදල ඔබගේ මූල්‍ය හැකියාව සහ දේපළ වටිනාකමට ගැළපෙන පරිදි සකස් කර ඇත.

දේශීය හා විදේශීයව වෙසෙන ශ්‍රී ලාංකිකයන් සඳහා වැටුප් ලබන හා ස්වයං රැකියාලාභීන් සඳහා ලබාගත හැකි මෙම ණය මුදල් මූල්‍ය නිදහස සඳහා ඔබගේ විශ්වසනීය මාවතයි.

2.2 පහන් පියස - අද දින ගොඩනඟා හෙට දිනයේ ජීවත් වෙන්න

ඔබගේ දැක්ම යථාර්තයක් බවට පත් කර ගැනීම සඳහා සැලසුම් කර ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පහන් පියස නිවාස ණය මඟින් ඔබගේ සිහින නිවස විශ්වාසයෙන් ගොඩනඟන්න. වසර 25ක කාලයක් දක්වා නම්‍යශීලී ආපසු ගෙවීමේ හැකියාවන් හා දැරිය හැකි පොළී අනුපාත සමඟින් පහසු ප්‍රවේශයකින් නිවසක හිමිකාරිත්වය ලබා ගන්න.

වේගවත් කරදර රහිත සැකසීම් අභ්‍යන්තරව තක්සේරු කිරීම්, නීතිමය සහාය, ඉදිකිරීම් උපදෙස් සහ ප්‍රමාණ පත්‍ර සැකසීම් සමඟින්, සෑම විටම සහයෝගය ලබා දෙමින්, ඔබගේ ආදායම මත පදනම්ව තනි තනිව හෝ පවුලේ අය සමඟ එකතුව අයදුම් කළ හැකි වේ.

දේශීයව හා විදේශීයව වෙසෙන ශ්‍රී ලාංකිකයන් සඳහා විවෘතයි. එය ඔබගේ අනාගතය වෙනුවෙන් ආයෝජනය කිරීමට ඇති හොඳම ක්‍රමයයි.

2.3 සේවක අර්ථසාධක අරමුදල් ණය - ඔබගේ ඉතුරුම් ශ්‍රේණිගත කරන්න, ඔබගේ අනාගතය විශ්වාසයෙන් ගොඩනඟන්න

ඔබගේ නිවාස ඉලක්ක පහසුවෙන් ළඟා කර ගැනීමට උපකාරී වන පරිදි නිර්මාණය කර ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු සේවක අර්ථසාධක අරමුදල් ණය සමඟ ඔබගේ ඉතුරුම්වල බලය මුදාහරින්න. ඔබගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන් 75% ක් දක්වා ඔබට ඉක්මන් අනුමැතිය සහ වසර 15ක් දක්වා ආපසු ගෙවීමේ ක්‍රම සමඟ ඉක්මන් කරදර රහිත මූල්‍යකරණයකට ප්‍රවේශ විය හැකි වෙයි.

ඉදිකිරීම්, මිලදී ගැනීම්, අලුත්වැඩියා කිරීම් හෝ නිවාස සම්බන්ධ ණය පියවීම වැනි කටයුතු සඳහා සුදුසු වෙයි. මෙම පහසුකම ඔබගේ නිවාස සිහිනයේ සෑම පියවරකටම සහාය දෙයි.

ස්ථාවර ආදායමක් සහිත සේවක අර්ථසාදක අරමුදලේ සාමාජිකයන් සඳහා ලබාගත හැකි මෙම ණය මුදල් ඔබ මහත් පරිශ්‍රමයෙන් උපයා ගත් ඉතුරුම් ඔබට නිවනක් සේ දැනෙන ස්ථානයක් බවට පත් කිරීමට ඇති ක්‍රමයකි.

2.4 පුද්ගල ණය - හොඳින් සැලසුම් කර, පහසු ණය ගැනීමෙන් යහපත් ජීවිතයක්

සැලසුම් කළ ඉලක්ක සහ අනපේක්ෂිත අවශ්‍යතා සඳහා රජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පුද්ගල ණය සමඟ ඔබගේ විශ්වාසවන්ත සහකරු බවට පත් කර ගන්න. ආකර්ෂණීය පොළී අනුපාත, ක්ෂණික අනුමැතිය සහ වසර 12ක් දක්වා නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රම සමඟින් ඔබගේ මූල්‍ය කටයුතු පහසුවෙන් කළමනාකරණය කිරීම සඳහා ඔබට හැකි වේ.

ඔබගේ ණය ආපසු ගෙවීමේ හැකියාවට සහ ආදායමට සරිලන පරිදි ණය මුදල ඒකාබද්ධව ඉල්ලුම් කිරීමේ හැකියාවක් පවතින අතර, මෙම පහසුකම් ඔබගේ ජීවන රටාවට සරිලන පරිදි සැලසුම් කර ඇත.

රජයේ සහ පුද්ගලික අංශයේ වැටුප් ලබන ව්‍යක්තිකයන් සඳහා සකස් කර ඇති අතර, මෙය ඔබගේ සැලසුම් යථාර්තයක් බවට පත් කරගත හැකි සරල මඟක් වේ.

3. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය

3.1 ව්‍යාපාර සංවර්ධන ණය - ශක්තිමත්ව වැඩීම, දක්ෂ ලෙස හැකියාවන් පුළුල් කර ගැනීම, විශාල ලෙස සාර්ථක වීම

සෑම තරාතිරමකම ව්‍යවසායකයන්ට සහාය වීම සඳහා සැලසුම් කර ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ව්‍යාපාර සංවර්ධන ණය සමඟ ඔබේ ව්‍යාපාර දියුණුවට මඟ පාදා ගන්න. ඔබ ඔබගේ මෙහෙයුම් පුළුල් කිරීමට, වැඩිදියුණු කිරීමට හෝ ශක්තිමත් කිරීමට අපේක්ෂා කළ ද මෙම පහසුකම ඔබට විශ්වාසයෙන් යුතුව ඉදිරියට යෑමට අවශ්‍ය මූල්‍යමය සහාය සපයයි.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම සහ ආයතනික ව්‍යවසායන් සඳහා සකස් කර ඇති එය, නවීන වෙළෙඳ පළ අවශ්‍යතා සමඟ ගැළපෙන නම්‍යශීලී සහායක් ලබා දෙන අතර, ඔබගේ ව්‍යාපාරයේ සැබෑ විභවතාවය විවෘත කිරීමට උපකාරී වෙයි.

ස්ථාපිත කර ඇති ව්‍යාපාර සහ සුදුසු ව්‍යාප්ත කිරීම් සඳහා ලබාගත හැකි මෙය ඔබේ ව්‍යාපාරය ඊළඟ මට්ටමට ගෙන යෑමට හොඳ විසඳුමකි.

3.2 කප්රුක ආයෝජන ණය - පුළුල් ලෙස ආයෝජනය කරන්න, සාර්ථකත්වය ඇති කර ගන්න, වර්ධනය නෙළාගන්න

ඉහළ ඵලදායීතාවයකින් යුත් පොල් වගාවකට හා ඒකාබද්ධ කෘෂි පද්ධතියක් සඳහා නිර්මාණය කර ඇති විශේෂිත ණයක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය සමඟ ඔබගේ පොල් වගාවේ විභවතාවය වැඩිදියුණු කර ගන්න. රුපියල් මිලියන 10ක් දක්වා මූල්‍යකරණයක්. වාර්ෂිකව සියයට 8%ක පොළී අනුපාතයක් සමඟ

වසර 5ක් දක්වා නම්‍යශීලී ආපසු ගෙවීමක් සමඟින් මෙම යෝජනා ක්‍රමය ඔබගේ ගොවිපළ කාර්යක්ෂමව වගා කිරීමට නඩත්තු කිරීමට සහ නවීකරණය කිරීමට උපකාරී වෙයි.

නව වගාවන්, නැවත වගාවන්, අතුරු බෝග වගාවන්, පාංශු හා තෙතමනය සංරක්ෂණය, වාරිමාර්ග පද්ධති, තවාන්, ගොවිපළ යන්ත්‍රෝපකරණ සහ පශු සම්පත් ව්‍යාප්ති සඳහා සුදුසු වන මෙම ණය යෝජනා ක්‍රමය ඔබගේ පොල් ආශ්‍රිත ව්‍යවසාය ඊළඟ අදියරට ගෙන යෑම සඳහා පුළුල් සහයෝගය ලබා දෙයි.

3.3 පුනර්ජීවන ණය - වර්ධනයට දායකත්වය දෙන්න, මෙහෙයුම් වැඩිදියුණු කරන්න, ඔබගේ ව්‍යවසාය ජව සම්පන්න කරන්න

ශ්‍රී ලංකාව පුරා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වර්ධනය වේගවත් කිරීමට රජයේ අනුග්‍රහය සහිතව ආරම්භ කර ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පුනර්ජීවන ණය සමඟ ඔබගේ ව්‍යාපාරය සවිබල ගන්වන්න. ඔබගේ ව්‍යාප්ති පිරිවැයෙන් 90% ක් ආවරණය වන පරිදි වසර 10ක් දක්වා නම්‍යශීලී ආපසු ගෙවීමක් සහිත, තරඟකාරී වාර්ෂික සියයට 5% ක පොළී අනුපාතයකට රුපියල් මිලියන 25ක් දක්වා ලබාගත හැකිවේ.

නිෂ්පාදන, ඉදිකිරීම්, අපනයන, සංචාරක, ඇඟලුම්, කෘෂිකර්මාන්තය සහ කාන්තා ව්‍යවසායන් සඳහා නිර්මාණය කර ඇති මෙය, ඔබගේ ව්‍යාපාරයේ නවෝත්පාදනයන් සහ විශ්වාසයෙන් ගොඩනඟා ගැනීමට, වත්කම් මිලදී ගැනීම්, තාක්ෂණ වැඩිදියුණු කිරීම්, පුළුල් කිරීම්, සූර්ය බලශක්ති ස්ථාපනයන් සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සහාය ලබා දෙයි.

3.4 ධීවර දිරිය - ඉදිරියට යාත්‍රා කරන්න, ශක්තිමත්ව වැඩෙන්න, හොඳින් වල නෙළාගන්න

සමුද්‍ර හා මිරිදිය ධීවර ජලජීවී වගා, විසිතුරු මත්ස්‍ය සහ ඒ ආශිත කර්මාන්ත සඳහා ව්‍යවසායකයන් වෙනුවෙන් සකස් කර ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ධීවර දිරිය ණය සමඟ වර්ධනය කරා ළඟාවන්න. වසර 7ක් දක්වා ආපසු ගෙවීමේ කාලසීමාවක් සහිතව රු. 250,000 සිට රුපියල් මිලියන 50ක් දක්වා ණය ලබා ගන්න. දැනටමත් ආරම්භ කර ඇති හා නව ආරම්භයක් ගැනීමට සැරසෙන ව්‍යාපාර සඳහා සහාය ලබා දෙයි.

ඔබගේ ව්‍යාපාරයේ සෑම අංශයක්ම ආවරණය වන බව තහවුරු කරමින් බෝට්ටු, ධීවර ආම්පන්න, සැකසුම් උපකරණ, පොකුණු ඉදිකිරීම, කාරක ප්‍රාග්ධනය, තාක්ෂණ වැඩිදියුණු කිරීම්, අපනයන හා ධීවර පවුල් සඳහා නිවාස වෙනුවෙන් ද අරමුදල් භාවිත කළ හැකි වේ.

ධීවර අංශයට අදාළ ආයතනයක ලියාපදිංචි වී ඇති මෙහෙයුම් කටයුතු සනාථ කර ඇති පුද්ගලයන්ට, හවුල් ව්‍යාපාර සහ සමාගම්වලට ලබාගත හැකි මෙම ණය මුදල ධීවර අංශය පුළුල් කිරීමට නවීකරණය කිරීමට සහ සමෘද්ධිමත් කිරීමට බලය ලබා දෙයි.

4. ආයෝජන

4.1 ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථිර තැන්පත් - ප්‍රවේශමෙන් ආයෝජනය කරන්න, විශ්වාසයෙන් උපයා ගන්න, සතුටින් ජීවත් වන්න

ආරක්ෂාව, මනසේ ඒකාග්‍රතාවය සහ උපරිම ප්‍රතිලාභ සඳහා සැලසුම් කර ඇති ආයෝජනයක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පත් සමඟ ඔබගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කර ගන්න. මාස 01 සිට මාස 60 දක්වා ආකර්ෂණීය පොළී අනුපාත ලබා ගන්න. එමෙන්ම මාසිකව හෝ වාර්ෂිකව පොළී මුදල් ලබා ගන්න.

අවම වශයෙන් රු. 10000.00ක තැන්පතුවක් ප්‍රතිලාභියෙකු නම් කිරීමේ හැකියාව සහ ණය හෝ ඇප සඳහා ආරක්ෂාවක් ලෙස ඔබගේ තැන්පතුව භාවිතා කිරීමේ හැකියාව සමඟ ඔබගේ ඉතුරුම් වර්ධනය කර ගැනීමට බුද්ධිමත් හා විශ්වාසදායක ක්‍රමයකි.

වයස අවුරුදු 60 සහ ඊට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ආරම්භ කළ හැකි මෙම තැන්පතුව මඟින් ඔබගේ මුදලේ සුරක්ෂිත බව තහවුරු කරයි.

4.2 සාමාන්‍ය ස්ථිර තැන්පතු - ආරක්ෂිතව ආයෝජනය කරන්න, ස්ථාවරව උපයන්න, විශ්වාසයෙන් සැලසුම් කරන්න

ආකර්ෂණීය පොළී අනුපාත සහ විශ්වාසනීය ප්‍රතිලාභ ලබා දෙන නම්‍යශීලී ආයෝජනයක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ස්ථාවර තැන්පතු සමඟ ඔබගේ මුදල් සුරක්ෂිතතාව වර්ධනය කර ගන්න. මාසික හෝ වාර්ෂික පොළී ගෙවීම් සහිත මාස 01 සිට මාස 60 දක්වා කාලසීමාවක් තෝරාගත හැකි වේ. එමඟින් ඔබගේ මූල්‍ය කටයුතු ඔබට රුචි අයුරින් සැලසුම් කර ගැනීමට ඔබ වෙත නිදහස ලබා දෙයි.

අවම වශයෙන් රු. 1000.00 ක තැන්පතුවකින් ආරම්භ කළ හැකි අතර, ප්‍රතිලාභියෙකු නම් කිරීමේ හැකියාව සමඟින් ණය හෝ ඇප සඳහා ඔබගේ තැන්පතුව භාවිත කිරීමට හැකියාවක් ඇත. මෙය ඔබගේ මූල්‍ය අනාගතය ගොඩනැඟීමට ආරක්ෂිත හා හොඳම ක්‍රමයකි.

වයස අවුරුදු 18 සහ ඊට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විවෘතව ඇති මෙය ස්ථාවර, විශ්වාසදායක වර්ධනයක් සඳහා හොඳම තේරීමකි.

ජාතික සංවර්ධනය සඳහා රාජ්‍ය
උකස් හා ආයෝජන බැංකුවේ
දායකත්වය පුළුල් කිරීම
අරමුණුකරගත්, එහි අනාගත
වර්ධන උපාය මාර්ගයේ
ප්‍රධාන අඩිතාලම ලෙස
වෙළෙඳපල ප්‍රසාරණය සහ
විවිධාංගීකරණය පවතිනු ඇත.



අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධනවලට යටත්ව සහ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව ඇතුළුව බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව අධ්‍යක්ෂවරු ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ නිවාස කටයුතු, කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධන මූල්‍ය සහ තැන්පතු භාවිතය ප්‍රවර්ධනය කිරීමයි. වර්ෂය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැත. බැංකුව, රටේ නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නැත. සංශෝධිත 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධාන යටතේ, සභාපතිවරයා ඇතුළු විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු හත් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, සංශෝධිත පරිදි 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුකූලව අමාත්‍යවරයා විසින් ඔවුන් පත් කරනු ලබයි. විධායක අධ්‍යක්ෂවරු කිසිවෙකු බැංකුවේ නොමැත. එසේ පත් කරන ලද අධ්‍යක්ෂවරු තිදෙනෙකු පහත සඳහන් අමාත්‍යාංශවල නියෝජිතයින් වේ; (අ) කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය; (ආ) නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය; (ඇ) පශු සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය. එක් අධ්‍යක්ෂවරයෙකු භාණ්ඩාගාර නියෝජිතයා ලෙස පත්කර ඇත.

ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී ගණපූරණය සඳහා අධ්‍යක්ෂවරු නවදෙනෙකු අතුරින් සාමාජිකයින් තිදෙනෙකු ප්‍රමාණවත් වේ. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මසකට එක් වතාවක් හෝ සභාපතිවරයාට අවශ්‍ය යැයි හැඟීයන විට නිතර නිතර වුවත් පැවැත්විය හැකිය. 2025 වසර තුළදී රැස්වීම් 16 පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම.

#	අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී විය යුතු රැස්වීම් ගණන	සහභාගී වූ රැස්වීම් ගණන
1	එම්. පී. කුරගම මහතා	15	15
2	එච්.සී.බී.එල්.සිල්වා මහතා	02	07
3	එස්.කේ.ඒ.ගලප්පත්ති මහතා	02	02
4	මහාචාර්ය ඩී.ඒ.එම්. පෙරේරා මහතා	01	01
5	බී.ආර්. මඩිහහේවා මහතා	00	01
6	ආචාර්ය ආර්. ඒ. ටී.කේ. රණසිංහ මහතා	01	01
7	එම්.ටී.ඒ.ජේ.එෆ්.ගෝමිස් මහතා	13	14
8	ඒ.සී. ගමගේ මහතා	13	14
9	ඒ. පී. රණසිංහ මහතා	14	14
10	ඩී.ආර්.එල්.වික්‍රමසිංහ මහතා	12	13
11	ආචාර්ය බී.එස්. එස්. පෙරේරා මහතා	4	8
12	ඒ .පී. කුරුඹලාපිටිය මහතා	7	8
13	ජේ.එන්. වීරකෝන් මහතා	4	4
14	කේ. එම්. එම්. ජබීර් මහතා	4	4
15	කේ. එම්. ජේ. ආර්. අබේසිංහ මහතා	4	4
16	එච්. එම්. ඒ. සෙනෙවිරත්න මහතා	1	1

කොන්ත්‍රාත් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය මඟින් විනිවිදභාවය සහ අතේ දුරින් වූ මිලකරණය මත පදනම්ව බැංකුව සහ ඊට අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු සිදු වන බව සහතික කිරීම අරමුණු කරයි.

මෙම ප්‍රතිපත්ති මඟින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ප්‍රමාණාත්මකභාවය තීරණය කරනු ලබන පදනම සහ බැංකුව විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමඟ කටයුතු කරන ආකාරය පෙන්වා දේ. බැංකුව විසින් බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කළ නියෝගවලට සමගාමීවන සම්බන්ධිත අදාළ ගනුදෙනු ප්‍රතිපත්තිය අනුගමනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනුදෙනු කරන ලද හෝ ගනුදෙනු කිරීමට යෝජනා කර ඇති යම්කිසි ව්‍යාපාර ගනුදෙනුවක් පිළිබඳව සෘජුව හෝ වක්‍රව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ ඔහුගේ කලත්‍රයා හෝ යැපෙන දරුවකු හෝ දරුවන් උනන්දුවක් දක්වා තිබේ නම්, එම ගනුදෙනුව සඳහා දක්වා තිබූ උනන්දුවේ ස්වභාවය පිළිබඳ එවැනි ගනුදෙනු සාකච්ඡා කරන රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එළිදරවු කළ යුතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන් බැඳියාවක් දක්වන කරුණු සම්බන්ධයෙන් ප්‍රකාශය කිරීමෙන් වැළකී සිටින බව සහතික කරලීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඔවුන්ගේ අධ්‍යක්ෂ ධුර සහ සම්බන්ධතා අනාවරණය කළ යුතුය. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන්, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුව සමඟ යම් ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙකු සෘජුව හෝ වක්‍රව බැඳියාවක් නොමැති බව වාර්තා කරමි.

මෙහෙයුම් සමාලෝචනය සහ අනාගත සංවර්ධන

2025 මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය සහ අනාගත සංවර්ධනය පිළිබඳ සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාවේ පිළිවෙලින් අංක 5 සිට 18 දක්වා පිටුවල දක්වා ඇති සභාපතිගේ වාර්තාව, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. ගේ වාර්තාව සහ මූල්‍ය සමාලෝචනය තුළ අන්තර්ගත වේ. එම වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසකි.

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී :ප්‍ර.වි.නි.*

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) යනු බැංකුව තුළ ඉහළම ශ්‍රේණියේ පුද්ගලයා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුව පත් කරනු ලැබේ. ඔහුගේ මූලික වගකීම් අතරට බැංකුවේ කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතු ඇතුළත් වේ. බැංකුවේ තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රමෝපායික අරමුණු, ආයතනික සාරධර්ම සහ සමස්ත අවදානම් ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවලට අනුකූලව බැංකුවේ ව්‍යාපාරයේ එදිනෙදා කළමනාකරණ කටයුතු ඔහු විසින් සිදු කරයි.

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

දැක්ම, මෙහෙවර සහ වටිනාකම් මඟින් බැංකුව ගමන් කරන දිශාව සහ සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන දෑ පිළිබඳ සියලු දෙනාගේ අවධානය යොමු කරයි. තවද එමඟින් බැංකුවේ මූලික සාරධර්ම සහ සේවකයින්ගේ හැසිරීම අපේක්ෂා කරන ආකාරය පැහැදිලි කරයි. බැංකුව එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා ඉහළ මට්ටමක සදාචාර ප්‍රමිතීන් අනුව සිය ව්‍යාපාරික කටයුතු පවත්වනු ලබයි. බැංකුවේ දැක්ම, මෙහෙවර සහ ආචාර ධර්ම පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 03හි දක්වා ඇත.

ආයතනික පාලනය

ඵලදායී ආයතනික පාලන ව්‍යුහයක් සහ ක්‍රියාවලියක් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. ඵලදායී පාලනය මඟින් තිරසාර වගකීම් සහගත වර්ධනය සඳහා මඟ පෙන්වන බැවි අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. ආයතනික පාලන ප්‍රතිපත්ති මඟින් බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා කාර්යයන් ඵලදායී ලෙස මෙහෙයවීම සහ පාලනය කිරීම සිදු කරනු ලබයි. ආයතනික පාලන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 27 සිට 65 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුවේ කටයුතු පාලනය කිරීම සහතික කිරීම සඳහා බැංකු පනතේ විධානයන්ට අනුකූලව අනු කමිටු හතරක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මඟින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරයි. බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ හෙළිදරව් කිරීම සඳහා සකස් කරන ලද ත්‍රෛමාසික වාර්තා, බැංකුවේ නෛතික සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම, බැංකුවේ බාහිර විගණන කාර්යයන්හි වාර්ෂික වැඩ වැඩසටහන සහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ මූල්‍ය වාර්තාකරණය, තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ පාලනය ආදිය කමිටුවේ විෂය පථය යටතට ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර, එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. කමිටුවේ සභාපතිවරයා ගණකාධිකරණය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සේවය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, කුසලතා සහ පළපුරුද්ද ඇති සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සඳහා පත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය), සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ ප්‍රසම්පාදන) සහ ප්‍රධාන කළමනාකාර (ශාඛා මෙහෙයුම්) ආරාධිතයන් ලෙස රැස්වීම්වලට සහභාගී වූ අතර, රජයේ විගණන අධිකාරී නිරීක්ෂකයෙකු ලෙස සියලුම රැස්වීම්වලට සහභාගී විය.

2025 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් පහක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 66 සිට 67 දක්වා පිටුවල ඉදිරිපත් කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පරිශ්‍රමික කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) බැංකුව වෙනුවෙන් මානව සම්පත් ප්‍රතිපත්ති,

ක්‍රමෝපායන් සහ සැලසුම් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමේදී මඟ පෙන්වීම් හා උපදෙස් ලබා දේ, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පාරිශ්‍රමික ප්‍රතිපත්ති, වැඩසටහන්, වැටුප් ව්‍යුහයන් සහ නියමයන් හා කොන්දේසි සමාලෝචනය කරයි, එමෙන්ම සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටලු සම්බන්ධයෙන් අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සමඟ උපයෝගී කාර්යභාරයක් පවත්වා ගෙන යයි, එමෙන්ම මේවා කමිටුව වෙත පැවරී ඇති මූලික වගකීම් වේ.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විතවන අතර, එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන විට හැර සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී කමිටුවේ සියලුම රැස්වීම් සඳහා සහභාගී වේ.

කමිටුව අවම වශයෙන් වසරකට දෙවරක් රැස්විය යුතු අතර, 2025 වර්ෂයේදී කමිටුව පස් වරක් රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක ... හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) මඟින් සියලු අවදානම් තක්සේරු කරනු ලබයි; එනම් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ඔස්සේ ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ග තක්සේරු කරනු ලබන අතර, බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා සමාලෝචන කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් විශේෂිත අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සමාලෝචනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ ව්‍යාපාරික මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්තිවලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා ස්වාධීන අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත. එමෙන්ම බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරන ලද විචක්ෂණ මට්ටම් ඉක්මවා යන මට්ටම්වලදී විශේෂිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ ව්‍යාපාරික මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්තිවලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා ස්වාධීන අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත. එමෙන්ම බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරන ලද විචක්ෂණ මට්ටම් ඉක්මවා යන මට්ටම්වලදී විශේෂිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වේ; අයෙකු විකල්ප සාමාජිකයෙකු වන අතර, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ පුළුල් අවදානම් කාණ්ඩ භාරව කටයුතු කරනු ලබන අවදානම් කළමනාකරණ ප්‍රධානියා මේ අතර වේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) ලේකම් ලෙස කටයුතු කරයි.ඉක්මවා යන මට්ටම්වලදී විශේෂිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

2025 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු 72 සිට 75 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටුව (BNGC)

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම/ පත්කිරීමේ ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් යන තනතුරු සඳහා පත්කිරීම් හෝ උසස්කිරීම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සැකසීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටුව (BNGC) වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩල නමයෝජනා කමිටුව එහි ක්‍රියාකාරකම් සහ තීරණ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර, අයෙකු විකල්ප සාමාජිකයෙකි. කමිටුවේ සභාපතිවරයාගේ මඟපෙන්වීම මත ආරාධිතයන් ලෙස සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ ප්‍රසම්පාදන) රැස්වීම්වලට සහභාගි විය. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ (BNC) ලේකම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා හා පාලන කමිටුව අවම වශයෙන් වසරකට වරක් හමුවීමට අවශ්‍ය වන අතර, අවශ්‍යතා මත පදනම්ව, තවත් රැස්වීම් පැවැත්විය හැකිය. 2025 වර්ෂයේදී කමිටු රැස්වීම් හයක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 68හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු (BITC)

2025 වසර අවසානයේ ආරම්භ කළ අතර සමාලෝචිත වසර තුල රැස්වීම් පවත්වා නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. කමිටු සභාපතිගේ උපදෙස් මත ආරාධිතයන් ලෙස සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි, සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ සහ CISO රැස්වීම් වලට සහභාගි වෙති. කමිටුවේ ලේකම්වරයා ලෙස සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) ක්‍රියාකරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු (BCC)

2025 වසර අවසානයේ ආරම්භ කළ අතර සමාලෝචිත වසර තුල රැස්වීම් පවත්වා නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සභාපතිගේ උපදෙස් මත ආරාධිතයන් ලෙස සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි, සහකාර සාමාන්‍යාධිකාරී ණය, සහකාර සාමාන්‍යාධිකාරී අයකරගැනීම් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ ප්‍රධානී රැස්වීම් වලට සහභාගි වෙති. කමිටුවේ ලේකම්වරයා ලෙස සහකාර සාමාන්‍යාධිකාරී (ණය) ක්‍රියාකරයි.

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR)

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR) යනු බැංකුවක පවතින ප්‍රාග්ධනය මැනීමකි. එය බැංකුවේ බර තැබූ අවදානම් ණය නිරාවරණවල ප්‍රතිශතයක් ලෙස දක්වනු ලබයි. බැංකුව සෑම විටම අවම ප්‍රාග්ධන ප්‍රමාණවත් අවශ්‍යතා පවත්වා ගෙන යයි.

බැංකුවේ වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) විසින් ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය නිතිපතා අධීක්ෂණය කරනු ලැබේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාර ගනී. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගනු ලබන නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 91හි දක්වා ඇත.

අභ්‍යන්තර පාලනය

ගිණුම්කරණය සහ විගණනය මගින් අර්ථ දක්වා ඇති පරිදි, අභ්‍යන්තර පාලනය යනු මෙහෙයුම් ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව, විශ්වාසනීය මූල්‍ය වාර්තාකරණය සහ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුවේ අරමුණු සහතික කිරීමේ ක්‍රියාවලියකි.

එදිනෙදා ව්‍යාපාර කළමනාකරණයේදී ආයතනික කළමනාකාරිත්වයට මගපෙන්වීමක් දක්වන ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් බැංකුව තුළ ක්‍රියාත්මක වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කර ඇත.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 92හි දක්වා ඇත.

ලාභ සහ විසර්ජන

2025 වර්ෂය සඳහා බැංකුවේ මුළු ආදායම රු. මිලියන 7,694 කි. බැංකුවට අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

විස්තර	රු. මිලියන
සංචිත	5,816
ප්‍රාග්ධන වියදම්	38
නිශ්චල දේපළවල වෙළඳ පොළ/ සාධාරණ වටිනාකම	-
දායක ප්‍රාග්ධනය	889
සැලකිය යුතු කොටස් හිමිකම සහ තොරතුරු බෙදාගැනීම	-
රජයට දායක මුදල් ව්‍යවස්ථාපිත ගෙවීම්	454
බදු අය කිරීම	454
ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවන සිදුවීම්	අදාල නොවේ
පසු ශේෂ පත්‍ර සිදුවීම්	අදාල නොවේ
අඛණ්ඩ පැවැත්ම	අදාල නොවේ

වාර්තා කරන දිනට පසු සිදුවීම්

වාර්තා කරන දිනට පසු වාර්තා කිරීමට අවශ්‍ය සිදුවීම් නොමැත.

අදාළ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල වීම

බැංකුව සෑම අවස්ථාකදීම 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට සංශෝධන සහ අනෙකුත් අදාළ සියලුම නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල බවට තහවුරු කර ඇත

සියලුම පාර්ශවකරුවන්ට සාධාරණ සැලකීම

බැංකුව සෑම පාර්ශ්වකරුවන් කණ්ඩායමකටම එක හා සමානව වැදගත්කමක් ලබා දෙයි. සාධාරණ මිලකරණය; සේවාවන්හි ගුණාත්මකභාවය; මෙන්ම අවංකභාවය සහ සම්පූර්ණත්වය තුළින් බැංකුව සිය සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට කැපවී සිටී.

ගනුදෙනුකරුවන් සහ ණය ගැතියන්

බැංකුවේ ප්‍රධාන අරමුණක් වන්නේ දැරිය හැකි මිලකට ජනතාව වෙනුවෙන් නිවාස ණය ලබාදීමයි. මේ සම්බන්ධයෙන් නිරන්තර සමීක්ෂණ සිදු කිරීමට බැංකුව විශේෂ උත්සාහයක් ගෙන ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, රැකියා වියුක්තිය තුරන් කිරීමට රජයට සහය දක්වන කර්මාන්තකරුවන්ට උපකාර කිරීම සඳහා බැංකුව විසින් ණය යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දී ඇත.

තැන්පත්කරුවන් සහ සැපයුම්කරුවන්

තැන්පත්කරුවන් බැංකුවේ ප්‍රධාන අරමුදල් සපයන්නන් වේ. තැන්පතු අනුපාත ප්‍රකාශයට පත් කර ඇති අතර තරඟකාරී වේ. ප්‍රාග්ධනය සහ පොලී නියමිත දිනට ගෙවනු ලැබේ. බැංකුව භාණ්ඩ හා සේවා සැපයීම සඳහා මිල ගණන් කැඳවන අතර, කඩිනම් ගෙවීම් සහතික කරයි.

විගණක වාර්තාව

විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විගණකවරයා වේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයාගේ උපදෙස් අනුව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ගිණුම් විගණනය සිදු කරන ලදී.

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 98 සිට 102 දක්වා පිටුවල දක්වා ඇත.

ස්තුතිය

අධ්‍යක්ෂවරු බැංකුවේ අඟනා ගනුදෙනුකරුවන්ගේ සහයෝගය හා බැංකුව කෙරෙහි ඔවුන් තබා ඇති විශ්වාසය පිළිබඳව අවංක ස්තුතිය පුදකර සිටින අතර මෙම අනෝන්‍ය සහයෝගාත්මක සම්බන්ධතාවය ඉදිරියටත් පවත්වාගෙන යෑමට අපේක්ෂා කරති. බැංකුවේ ප්‍රගමනය සඳහා සේවකයින් ලබාදුන් දායකත්වය පිළිබඳව අධ්‍යක්ෂවරු ඔවුන්ගේ කෘතඥතාවය පිරිනමන අතර ශ්‍රී ලංකාවේ නියාමන හා රාජ්‍ය බලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය පිළිබඳවත් ස්තුතිය පළ කරති.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ඩිලානි අලහකෝන්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

වගකීම

2024 අංක 05 දරන බැංකු පනත් නියෝගයේ 09 වන පරිච්ඡේදයේ (2)(ආ) වගන්තියට අනුකූලව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව තුළ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සහ එහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. බැංකුකරණ ව්‍යාපාර පාලිත පදනමක් යටතේ අවදානම් සහ ප්‍රතිලාභ සමතුලිත වීම අවශ්‍ය බව එවැනි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සලකා බැලීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන ඇත. බැංකුවේ අවදානම් දැරීමේ හැකියාව අනුව සැඳුම් ලත් සීමා සහ දර්ශක මඟින් පෙන්නුම් කරනු ලබන නොගැළපීම් ඉස්මතු කරලීමට එවැනි අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් සකස් කොට ඇත. මෙහිදී පාලකවල ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සැලකිල්ලට ගනිමින් වත්කම් නිසි ලෙස ආරක්ෂා කිරීම, නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ විශ්වසනීයත්වය සැපයීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, මූල්‍ය තොරතුරු සහ වාර්තාවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ට එරෙහිව හෝ ආවේනික සීමාවන් හේතුවෙන් අක්‍රමිකතා සහ වංචා ඉවත් කිරීම සඳහා මෙම පද්ධතිය මඟින් පූර්ණ සහතිකයක් ලබා නොදේ.

බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අබණ්ඩ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇත. ව්‍යාපාරික පරිසරයේ හෝ නියාමන අවශ්‍යතා සහ වෙනත් මාර්ගෝපදේශ වෙනස් වන විට සහ වෙනස් කරන විට අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම මෙම ක්‍රියාවලිය සඳහා ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශයට අනුකූලව මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා අධීක්ෂණය කරනු ලබයි. එම මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා මූලධර්මවලට අනුකූලව අභ්‍යන්තර පාලන පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිය යහපත් සහ ප්‍රමාණවත් මට්ටමින් පවතින බවත්, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවලට අනුකූල බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

බැංකුව විසින් මුහුණ දෙනු ලබන අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම ඔස්සේ අවදානම් සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය වේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායිත්වය යොදා ගැනීම සහ සමාලෝචනය කිරීමේදී භාවිත කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලැසුම සහ කාර්යසාධනය වරින් වර සමාලෝචනය කිරීමේ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත. එහි ප්‍රධාන ක්‍රියාවලි සඳහා පහත දෑ ඇතුළත් වේ.

- බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත්භාවය සහ පරිපූර්ණත්වය සහතික කරලීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ අනු කමිටු පිහිටුවා ඇත. ආයතනික අරමුණු, උපාය මාර්ග සහ වාර්ෂික අයවැය සාක්ෂාත් කර ගැනීම මෙන්ම බැංකුව විසින් මුහුණ දෙන අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීමට එහි අධිකාරිය ආයතනික කළමනාකාරිත්වය, ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය සහ බැංකුවේ කළමනාකරුවන් යන මට්ටම් අතර පවරා ඇත.

- ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමන්විත වේ. බැංකුවේ අවදානම් ස්වරූප සමාලෝචනය කිරීම, බැංකුව විසින් මුහුණ දෙන ප්‍රධාන අවදානම හඳුනා ගැනීම සහ බැංකුවේ අවදානම් ස්වරූපය සහ අවදානම් දැරීමේ හැකියාව මත පදනම්ව ප්‍රතිපත්ති සකස් කිරීම කමිටුවේ වගකීම වේ.

- බැංකුවේ අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමඟ එහි මූල්‍ය, පරිපාලන සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ගැළපෙන්නේද යන්න සහතික කිරීම සඳහා අවදානම් මත පදනම් වූ විගණන ප්‍රවේශය අනුව බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය පරීක්ෂණ සිදු කරයි. ක්‍රියාකාරී ඒකක සහ බැංකුවේ නිෂ්පාදන හා සම්බන්ධ අවදානම් මට්ටම අනුව නිරන්තරයෙන් සියලුම ක්‍රියාකාරී ඒකක සහ ශාඛා සඳහා විගණන සිදු කෙරේ. බැංකුවේ අක්‍රමිකතා, සාවද්‍ය ප්‍රකාශන, වංචා, පරිපාලනය සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ විගණන නිරීක්ෂණවලට අදාළව අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ විෂයමූලික සහ ස්වාධීන තක්සේරුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත නිරන්තර වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක වගකීම දරයි
- සාමාන්‍යයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ සමස්ත කාර්යක්ෂමතාව

සමාලෝචනය කරන අතර, අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳ නිශ්චිත නිරීක්ෂණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරන්තරයෙන් වාර්තා කරයි. මේ සම්බන්ධයෙන්, කමිටුව විසින් භාවිත කරන යාන්ත්‍රණය සඳහා විගණකාධිපති වාර්තාව, අභ්‍යන්තර විගණන වාර්තා, නියාමන වාර්තා, වාර්ෂික/මාසික මූල්‍ය ප්‍රකාශන සහ ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් වේ.

- 2012 දී බැංකුව විසින් LKAS සහ SLFRS ඇතුළත් නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් සම්මත කරන ලදී. එවැනි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමත් සමඟ, හඳුනාගැනීම, ඇගයීම, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම පිළිබඳ නව අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීමට බැංකුව විසින් ක්‍රියාවලි අබණ්ඩව අධීක්ෂණය කිරීම සහ ප්‍රගතිශීලී ලෙස වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි.

- 2018 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් SLFRS 9 "මූල්‍ය සාධනපත්‍ර" බැංකුව විසින් අනුගමනය කරනුලබයි. SLFRS 9 හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා, විවිධාකාර ආර්ථික පුරෝකථන භාවිත කරමින් බැංකුව විසින් අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘතියක් සකස් කරන ලදී. වර්ෂය තුළදී වරලත් ගණකාධිකාරිවරුන්ගේ ජාත්‍යන්තර සමාගමෙන් හානිකරණ ප්‍රතිපත්තියේ ආදර්ශ වලංගුභාවය ලබාගත් අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. SLFRS 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ ඇගයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූල වීමට බැංකුව සුදුසු පියවර ගෙන ඇත.

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වාර්තාකරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි මඟින් සහතික කරන්නේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.

- එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම් සම්බන්ධයෙන් බැංකුවේ මූලික ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණය සහ අධීක්ෂණය සහතික කිරීම සඳහා කළමනාකරණ මට්ටමේ කමිටු අදාළ බලතල අනුව ක්‍රියාත්මකව පවතී.

- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සැලසුම් සහ කාර්යසාධනය පිළිබඳ විධිමත් වාර්ෂික සමාලෝචනයක් සිදු කර ඇත. අභ්‍යන්තර පාලනවල කාර්යසාධනය සමාලෝචනය කිරීමට පහසුකම් සලසන බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ලියකියවිලි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

- තොරතුරු පද්ධති පාලනය ශක්තිමත් කරලීමට වරලත් ගණකාධිකාරිවරුන්ගේ ජාත්‍යන්තර සමාගම විසින් සකස් කරන ලද තොරතුරු පද්ධති ආරක්ෂණ පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී පියවර ගෙන ඇත.

- කර්මාන්තයේ හොඳම භාවිතයන් හඳුනා ගැනීමට සහ පාරිභෝගික සේවාව වැඩිදියුණු කිරීමට ව්‍යාපාර ක්ෂේත්‍රයේ තාක්ෂණික සහ තොරතුරු පද්ධති පරිසරයේ සිදුවන වෙනස්කම් ඉතා වැදගත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. මෙකී කාරණයට විසඳුමක් ලෙස නව මූලික බැංකු පද්ධතියක් සඳහා ආයෝජනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී මූලපිරීමක් ගෙන ඇත. සංවිධානයේ සංවර්ධන අරමුණු සඳහා ඉහළ ප්‍රතිඵලයන් අත් කර ගැනීමට ව්‍යාපාර මෙහෙයුම්වල ඵලදායීතාව ඉහළ නැංවීම සහ පාරිභෝගික අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම මෙහි අරමුණ විය.

- පසුගිය වසරේ සහ වර්ෂය තුළ අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව බාහිර විගණකවරයා සහ මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද අදහස් ද සලකා බැලූ අතර, අවශ්‍ය අවස්ථාවලදී ඒවා විසඳීමට නිසි පියවර ගන්නා ලදී.

සහතික කිරීම

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුවේ මූල්‍ය වාර්තාකරන ක්‍රමය මූල්‍ය වාර්තාකරනයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා පිළියෙල කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුව සිදුකර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව,



එච්. එම්. ඒ. සෙනෙවිරත්න
සභාපති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ස්වාධීන අධ්‍යක්ෂ



ඩී. ආර්. එල්. වික්‍රමසිංහ
සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ



එම්. පී. කුරගම
සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/F/SMIB/IC/2025/16

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2026 මාර්තු 11

සභාපති
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිවරයාගේ ස්වාධීන තහවුරු වාර්තාව

හැඳින්වීම

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට ඇතුලත් කළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි (බැංකුව) අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය ("ප්‍රකාශණය") සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය පිළිබඳ තහවුරු කිරීමක් මෙම වාර්තාව මගින් සපයනු ලබයි.

කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති 2024 අංක 5 දරණ බැංකු පනත් නියෝගයේ 9(2)(ආ) වගන්තිය අනුකූලව නිකුත්කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂ මණ්ඩල සඳහා මාර්ගෝපදේශය" ට අනුව මෙම ප්‍රකාශණය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමණාකරණය වගකීමට බැඳි සිටී.

මාගේ වගකීම සහ SLSAE 3050 (ප්‍රතිශෝධිත) සමග අනුකූලතාවය

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීමේදි අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු සඳහා සහතික කිරීමේ වාර්තාව වන, සහතික කිරීමේ කාර්යය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය -SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුකූලව මම මගේ කාර්යය සිදුකළෙමි.

සියලුම වැදගත් අංශයන් හිදී කළමනාකරණය මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ප්‍රකාශය පිළියෙල කර ඇති බවට සීමිත සහතිකයක් ලබාගැනීමේ ක්‍රියාපටිපාටි මම විසින් සැලසුම් කර ඉටුකිරීම මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ.

මෙම කාර්යයේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සඳහා මම වගකීමට බැඳි නොමැති අතර, මෙම කාර්යය සම්බන්ධයෙන් මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදුකර නොමැත.

ක්‍රියාවට නංවන ලද කාර්යයන් පිළිබඳ සාරාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵළදායිත්වය සමාලෝචනය කිරීමේදි අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා මාගේ කාර්යය මම ඉටු කළෙමි.

නියැදියකින් ප්‍රශ්න කිරීම් මගින් ලබාගත් තොරතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලියට සහයවන නියැදි පදනමක් මත, ඉටුකරන කරන ලද ක්‍රියාපටිපාටි මූලික වශයෙන් බැංකුවෙහි කාර්යය මණ්ඩලය සහ ලේඛණවල පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා සීමා විය.

SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව මෙම ප්‍රකාශනය මගින් සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න හෝ බැංකුවෙහි අවදානම සහ පාලන ක්‍රියාපටිපාටිවල ඵලදායිතාව පිළිබඳ මතයක් සකස් කරන්නේද යන්න සලකා බැලීමක් අවශ්‍ය නොවනු ඇත. SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව වාර්ෂික වාර්තාව තුළ හෙලිදරව් කරන ලද කිසියම් සැලකිය යුතු ගැටළු පිළිබඳ වැදගත් අභ්‍යන්තර පාලන අංගයන් සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කරන ලද ක්‍රියාවලි සැබැවින්ම ගැටළුවලට පිළියම් කරන්නේද යන්න සලකා බැලීමක් මාහට අවශ්‍ය නොවනු ඇත.

තෝරාගත් ක්‍රියාපටිපාටි බැංකුවේ ස්වභාවය, ප්‍රකාශනය පිළියෙල කර ඇති සිදුවීම හෝ ගනුදෙනුව පිළිබඳ මාගේ අවබෝධය සැලකිල්ලට ගත් මගේ විනිශ්චය මත රඳා පවතී.

මගේ නිගමනය සඳහා පදනමක් ලබා ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් කරුණු මා ලබාගෙන ඇති බව මම විශ්වාස කරමි.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියාපටිපාටි අනුව, බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සැකැස්ම සහ එහි ඵලදායිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාවට නගනු ලබන අගය කිරීමේ ක්‍රියාවලිය, අපගේ අවබෝධයට අනුව සහ වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් ප්‍රකාශනයන්ගේ අනුකූලතාවයේ පැහැදිලි බවක් හෝ විශ්වාස කටයුතුභාවයෙහි සැකයක් ඇති බවට කිසිඳු සාක්ෂියක් හමුවී නොමැත.

චිල්. එස්. අයි. ජයරත්න
විගණකාධිපති

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

කළමනාකරණය විසින් භාරගන්නා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා වගකියමින්, මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මූල්‍ය වාර්තාකරණයට අදාළ නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වී ඇති බව සහතික කිරීම සඳහා අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශනය තුළ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කරන බව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත්කරන මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී.

මූල්‍ය ප්‍රකාශන

1988 අංක 30 දරණ බැංකු පනත, 1971 අංක 38 දරන මූල්‍ය පනත සමග කියවියයුතු 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්හි දක්වා ඇති විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියෝග ප්‍රකාරව අවබෝධකර ගැනීම, අධීක්ෂණය සහ ආයතනය ඉදිරියට මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සාක්ෂරතාවයක් ඇති බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු සහ ව්‍යාපාරය පාලනය සහ පරිපාලනය කිරීම සිදුකරයි.

මෙම වාර්ෂික වාර්තාවේ පිළියෙල කර ඉදිරිපත් කර ඇති 2025 මූල්‍ය වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ පොත්වලට අනුකූලවන අතර, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතාවන්ට අනුකූලවන අතර අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව එක් එක් මූල්‍ය වසර අවසානයේදී බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

මෙම වාර්ෂික වාර්තුව තුළ ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී. මෙම මූල්‍ය ප්‍රකාශනවල පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂවරු පහත දෑ තහවුරු කර සිටිති.

1. පවත්නා මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුව අනුරූප ආකාරයකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන, යොදාගෙන, සහ භාවිතා කර ඇති අතර වැදගත් අපගමනයන් ඇත්නම් අනාවරණය සහ පැහැදිලිකර ඇත;

2. අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රමිති අදාල පරිදි අනුගමනය කර ඇත;

3. විනිශ්චයන් හා ඇස්තමේන්තු සිදුකර ඇති බව සහ ඒවා විචක්ෂණ හා සාධාරණබව.

මූලික කාර්යසාධන දර්ශක ඇතුළුව කාර්තුමය විගණනය කළ මූල්‍ය ප්‍රකාශන එක් එක් කාලසීමාව අවසානයේදී මාස දෙකක් ඇතුළත භාෂා තුනෙන් පුවත්පත්වල බැංකුව ප්‍රකාශයට පත් කර ඇති අතර ඒවා බැංකුවේ වෙබ් අඩවියේද ප්‍රකාශයට පත් කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකළ සමාලෝචනය හා නිර්දේශය අනුගමනය කරමින් අතුරු මූල්‍ය ප්‍රකාශන මුදාහැරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා අනුමත කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 66 සිට 67 දක්වා පිටුවල ඉදිරිපත් කොට ඇත. මූල්‍ය ප්‍රකාශන බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියමිත ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

අඛණ්ඩතා පැවැත්ම

නුදුරු අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකිරීම සඳහා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS හා SLFRS) අනුකූලව සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරණය කිරීමට ප්‍රමාණවත් සම්පත් බැංකුවට ඇති බව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අභ්‍යන්තර පාලනය හා අවදානම් කළමනාකරණය

බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම, වංචා හා වැරදි කළමනාකරණය පිටු දැකීම සහ ශක්තිමත් පාලන වටපිටාවක් පවත්වාගෙන යෑම සඳහා සැලකිය යුතු අවදානයක් යොමු කිරීම හා අභ්‍යන්තර විගණනය හා අවදානම් කළමනාකරණය ඇතුළත් ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් හා එහි ඵලදායීත්වය අධීක්ෂණය කිරීම සඳහා ඵලදායී පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර බැංකුවේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත් වංචා හා වෙනත් අක්‍රමිකතා අනාවරණය කර ගැනීම සඳහාත්, සැලකිය යුතු ක්‍රියාමාර්ග හා දැඩි අවදධානය යොමු කිරීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වෙයි.

අභ්‍යන්තර පාලනයේ අරමුණ වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකර ඇති ඉලක්ක සපුරාගත හැකි ඵලදායී ආයතනයක් බිහිකර ගැනීම වන අතර එබැවින් මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ ව්‍යාපාර කටයුතු සුදුසු හා ඵලදායී ලෙස සිදුකරගෙන යනු ලබන බව සහ නීති හා රෙගුලාසි සඳහා අනුකූලව කටයුතු කරන බව සැලකිය යුතු දුරකට අර්ථවත් වෙයි.

විගණන කමිටුවේ මග පෙන්වීම් යටතේ අභ්‍යන්තර විගණන අංශය අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීත්වය අධීක්ෂණය කරන අතර අවශ්‍ය විටදී අවශ්‍ය සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හරහා සහ සාමාන්‍ය පරිදි පවත්වන රැස්වීම්වලදී සෘජුව මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරනු ලබන බව අධ්‍යක්ෂවරු තහවුරු කරති.

බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරන වාර්තාව මෙම වාර්ෂික වර්තාවේ පිටු අංක 92 සිට 93 දක්වා පිටුවල ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට බැංකුව විසින් ගෙවියයුතු බදු සහ බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් හා ඒ වෙනුවෙන් ගෙවියයුතු සියලුම දායකත්වයන් හා බදු සහ බැංකුව විසින් රජයට සහ අනෙකුත් නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවීමට බැඳී සිටින හා ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කර සිටිති.

විගණන වාර්තාව

විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයාවන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අවසන් මතයක් ප්‍රකාශකරයි.

අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන ඇතුලු බැංකුවේ සියලුම වාර්තා විගණකාධිපතිවරයා වෙත ලබා දී ඇති අතර ඔවුන්හට සුදුසුයයි හැඟීයන පරීක්ෂාකිරීම් සිදුකිරීමට අවස්ථාව ලබා දෙමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම දේ පරීක්ෂාකර විගණකාධිපතිවරයා අවසන් මතයක් ප්‍රකාශකර ඇත.


මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකවරයාගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 98 සිට 102 දක්වා පිටුවල දැක්වේ.

වැදගත් ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන් බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ හිටපු අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහ බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහතික කළ යුතුය ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට බැංකුව විසින් සියළුම නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බව හෝ අදාල පරිදි සපයා ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමකට පත්වෙති. මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ වගකීම් ඉටුකර ඇති බව අධ්‍යක්ෂවරුන් දරණ මතය වේ.



අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඩිලානි අලහකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. BAN/F/SMIB/FS/2025/15

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2026 පෙබරවාරි 26

සභාපති,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුමකරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනත සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත මාගේ වාර්තාව යථාකාලයේදී සභාගත කරනු ලැබේ.

මේ සමග ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන්වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සත්‍ය හා සාධාරණ නිරූපණයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මම මාගේ විගණනය පැවැත්වූයෙමි. මෙම ප්‍රමිති යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තරකර ඇත. මම ලබාගත් විගණන සාක්ෂිය මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට මම විශ්වාස කරමි.

1.3. බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ අඩංගු වෙනත් තොරතුරු

අනෙකුත් තොරතුරු සඳහා බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුලත් තොරතුරු අන්තර්ගත නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල හා මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන අතර එම තොරතුරු මා වෙත ලැබෙනු ඇත්තේ මෙම විගණන වාර්තාවේ දිනට පසුව වේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුවෙයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොවන අතර මම එහිදී සහතික කරනලද නිගමනයන් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය සම්බන්ධයෙන් ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු පවතිනවිට ඒවා කියවමින් මූල්‍ය ප්‍රකාශන සමග එම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මකව නොගැලපේද? හෝ විගණනයේදී මා ලබාගත් තොරතුරු සාවද්‍ය ලෙස ප්‍රකාශවී තිබේද යන්න සලකා බැලීම වෙයි.

මම බැංකුවේ 2025 වාර්ෂික වාර්තාව කියවන විට එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, ඒවා නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කිරීමට මට අවශ්‍ය වේ. තවදුරටත් ප්‍රමාණාත්මක නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ මාගේ වාර්තාවේ තිබේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ ප්‍රතිපාදන අනුව පාර්ලිමේන්තුවට යථා කාලයේ දී සභාගත කරනු ලබන ඉදිරිපත් කරන මාගේ වාර්තාවට ඇතුලත්වනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවීම පිණිස අවශ්‍ය යයි කලමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයක් හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අනුව සත්‍ය හා සාධාරණ නිරූපණයක් ලැබෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කලමනාකරණය වගකිවයුතු වෙයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කලමනාකරණය එක් පසකින් බැංකුව ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවත්වීමට හෝ තත්ථ්‍ය විකල්පයක් නොමැතිනම් එසේ සිදුකිරීම නැතහොත් ගිණුම්කරණයේ දී ප්‍රවර්ථන ව්‍යාපාර සංකල්පයට සම්බන්ධ කරුණු සුදුසු පරිදි හෙළි කිරීම ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්වාගෙන යෑමේ බැංකුවේ හැකියාව තක්සේරු කිරීම සඳහා කලමනාකරණය වගකිව යුතු වෙයි.

පාලනය සඳහා වගකිවයුතු පිරිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු වෙයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව බැංකුව එහි අන්තර්වාර හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවීම පිණිස බැංකුවේ සියලුම ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වාර්තා කිරීම සඳහා යෝග්‍ය පොත්පත් පවත්වාගෙනයෑම අවශ්‍යවෙයි.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

මගේ පරමාර්ථය වන්නේ සමස්ථයක් ලෙස වංචා හෝ දෝෂ හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශන වැදගත් වැරදි ප්‍රකාශයන්ගෙන් නිදහස්ද යන්න පිළිබඳ සාධාරණ සහතිකය ලබාගැනීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ සහතිකය ඉහළ මට්ටමේ සහතිකයක් වුවද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනයකින් වැදගත් වැරදි ප්‍රකාශයක් එහි පැවතියද සෑම අවස්ථාවකදීම එය සොයා ගන්නා බවට වගවීමක් නොමැත. වැරදි ප්‍රකාශ වංචාව හෝ දෝෂය තුළින් ඇතිවිය හැකි අතර තනි තනිව හෝ එකතුව මෙම මූල්‍ය ප්‍රකාශනවල පදනම මත ගනු ලබන ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට ඉන් සාධාරණව අපේක්ෂා කරන්නේනම් වැදගත් ලෙස සලකනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර, විගණනය පුරා වෘත්තීය සංශයවාදය පවත්වා ගනිමි. එමෙන්ම මම :

- වංචාව හෝ දෝෂ හෝ සැලැස්ම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශනවල වැදගත් වැරදි ප්‍රකාශන පිළිබඳ අවදානම් හඳුනාගෙන තක්සේරු කරන අතර, එවැනි අවදානම්වලට ප්‍රතිචාරාත්මක විගණන ක්‍රියාපටිපාටි ඉටුකරමින් මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසුවන විගණන සාක්ෂිය ලබා ගනිමු. වංචාවෙන් ඇතිවන වැදගත් වැරදි ප්‍රකාශනයක් සොයා නොගැනීමේ අවදානම වංචාව කුමන්ත්‍රණය, ව්‍යාජ ලේඛන සෑදීම, සිතාමතා ඉවත්කිරීම්, ව්‍යාජ නියෝජන, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම හා සම්බන්ධවන බැවින් දෝෂයකින් ඇතිවන දෙයකට වඩා විශාලය.

- බැංකුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා හැර අවස්ථාවන්ට සුදුසුවන විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමු.

- කළමනාකරණය විසින් භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ ඔවුන් විසින් සිදුකරන ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ අනාවරණවල සාධාරණත්වය අගය කරමි.

- ගිණුම්කරණය පිළිබඳ අබණ්ඩතා පදනම සම්බන්ධ කළමනාකරණයේ භාවිතයේ යෝග්‍යතාව සහ ලබාගත් විගණන සාක්ෂිය මත පදනම් වී, ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යාම පිළිබඳ බැංකුවේ හැකියාව සම්බන්ධව වැදගත් සැකයක් ඇතිකළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් සම්බන්ධයෙන් වැදගත් අවිනිශ්චිතතාවක් පවතීද යන්න නිශ්චය කරමි. වැදගත් අවිනිශ්චිතතාවක් පවතින බවට මම නිශ්චය කරන්නේනම් මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ අනාවරණයන්ට මගේ විගණක වාර්තාව පිළිබඳ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, එවැනි අනාවරණ ප්‍රමාණවත් නොවන්නේනම් මගේ මතය වෙනස් කිරීමට අවශ්‍ය වේ. මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂිය මත මාගේ නිගමන පදනම් වේ. කෙසේවෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස බැංකුව ඉදිරියට යාම නතර කිරීමට හේතු විය හැකිය.

- සමස්ත ඉදිරිපත් කිරීම, අනාවරණ ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කිරීම අත්කර ගන්නා ආකාරයකින් පාදක වූ ගනුදෙනු හා සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීමට ලක් කළෙමි.

අනෙකුත් කරුණු අතර මගේ විගණනය තුළ මම හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ යම් වැදගත් අඩුපාඩු ඇතුළුව වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් වගකියන පුද්ගලයින් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනත තුළ පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය:

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම මම ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂණයෙන් පෙන්නුම්වන තාක් දුරට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතා පරිදි සුදුසු ගිණුම්කරණ වාර්තා බැංකුව විසින් තබා ගෙන ඇත.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශ පූර්වාසන්න වසර සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශවල පෙර වසරේ මා විසින් සිදුකළ සියලුම නිර්දේශ ඇතුළත් වේ.

2.2 1988 අංක 30 දරණ බැංකු පනතේ 39 වන වගන්තියේ (2024 අංක 24 දරණ බැංකු පනත මගින් සංශෝධිත) පහත සඳහන් අවශ්‍යතා සඳහා අවශ්‍ය විශේෂ ප්‍රතිපාදන අඩංගුවේ.

2.2.1 මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශනයේ සිදුකර ඇති හෙලිදරව් කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති 2024 අංක 5 දරණ චක්‍රලේඛයේ අවශ්‍යතා වලට අනුකූලවේ.

2.3 ඉටුකල ක්‍රියාමාර්ග හා ලබාගත් තොරතුරු මත පදනම්ව ප්‍රමාණාත්මක කරුණු සඳහා පමණක් සීමා වෙමින් මාගේ අවධානය සඳහා කිසිවක් හමුවී නොමැත.

2.3.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඩී) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියෙන් බැහැරව බැංකුව විසින් ගිවිසගත් කිසියම් කොන්ත්‍රාත්තුවක් සඳහා බැංකුවේ පාලන තන්ත්‍රයේ සිටින කිසියම් සාමාජිකයකු කිසියම් සෘජු හෝ වක්‍ර උනන්දුවක් දක්වා තිබීම ප්‍රකාශ කිරීම.

2.3.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(එෆ්) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව බැංකුවේ පාලන තන්ත්‍රය විසින් නිකුත්කර ඇති සාමාන්‍ය හා විශේෂ විධිවිධාන කිසියම් අදාල ලිඛිත නීතියක් සමග බැංකුව අනුකූල නොකරගත් බව ප්‍රකාශ කිරීම.

2.3.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(පී) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව කාර්යයන් සහ රාජකාරීන් එහි බලතල අනුව බැංකුව සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.3.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(එච්) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව අදාල නීති සමග අනුකූලව හා කාල සීමාවන් තුල පිරිමැසුම්දායක ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස බැංකුවේ සම්පත් ප්‍රසම්පාදනය හා භාවිතා කිරීම සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

එල්. එස්. අයි. ජයරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	සටහන්	2025 රු.	2024 රු.
වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	13	136,854,046	124,664,750
බැංකු තැම්පතු	14	925,582,077	152,682,844
මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට	15	789,027,014	2,943,277,961
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට			
ණය සහ අත්තිකාරම්	16.1	44,806,182,075	41,730,024,581
ණය සහ අනෙකුක් උපකරණ	17	9,202,754,302	8,979,104,008
මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	18	5,379,078	5,379,078
දේපළ පිරියත සහ උපකරණ	19	329,133,780	404,644,985
භාවිතයට අයිතිය ඇති වත්කම්	33.1	129,759,524	99,174,660
පමාකළ බදු වත්කම්	20	438,399,341	633,635,649
වෙනත් වත්කම්	21	596,939,555	595,607,504
මුළු වත්කම්		**57,360,010,792**	**55,668,196,019**
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	22	-	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්			
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	23	48,856,751,018	48,160,520,558
ණය සුරැකුම්පත් හිමිකරුවන්ට ගෙවිය යුතු		-	-
අනෙකුත් ණයකරුවන්ට ගෙවිය යුතු	23	273,638,910	140,800,069
සේවක ප්‍රතිලාභ වගකීම	24	663,321,765	677,787,456
ආදායම් බදු වගකීම	25	193,604,550	-
වෙනත් වගකීම්	25	1,557,162,803	1,268,890,469
මුළු වගකීම්		**51,544,479,047**	**50,247,998,551**
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	26	889,812,899	889,812,899
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	27	306,650,839	306,650,839
රඳවාගත් ඉපැයීම්	28	3,541,259,005	3,145,924,725
අනෙකුත් සංචිත	29	1,077,809,004	1,077,809,004
මුළු ස්කන්ධය		**5,815,531,746**	**5,420,197,467**
මුළු ස්කන්ධය හා වගකීම්		**57,360,010,793**	**55,668,196,018**

සහතික කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශ මගින් 2025 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තත්ත්වය සහ ඉන් අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දේ.

.....

කේ. එල්. එන්. ඒ. පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ආයතනික සැලසුම් හා ශාඛා මෙහෙයුම්

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

.....	.....	.....
මහිල් කුරගම මහතා	ඩී ආර් එල් වික්‍රමසිංහ මහතා	අයි. ටී. අසුරමාන්න මහතා
සභාපති	අධ්‍යක්ෂ	සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි.
23.02.2026		

ආදායම් ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	සටහන්	2025 රු.	2024 රු.
පොලී ආදායම	4	7,120,861,865	7,590,650,416
පොලී වියදම	4	(3,887,744,333)	(5,392,222,204)
ශුද්ධ පොලී ආදායම	4	**3,233,117,532**	**2,198,428,212**
ගාස්තු සහ කොමිස් ආදායම	5	379,854,246	172,631,902
ගාස්තු සහ කොමිස් වියදම		-	-
ශුද්ධ, ගාස්තු සහ කොමිස් ආදායම	5	**379,854,246**	**172,631,902**
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය)	6	145,788,904	377,996,544
ශුද්ධ, අනෙකුත් මෙහෙයුම් ආදායම	7	48,390,326	31,145,845
මුළු මෙහෙයුම් ආදායම		**3,807,151,007**	**2,780,202,503**
හානිකරණ ගාස්තු	8	(557,006,149)	(540,890,034)
ශුද්ධ මෙහෙයුම් ආදායම		**3,250,144,858**	**2,239,312,470**
සේවක වියදම්	9	(1,424,261,245)	(1,229,142,717)
ක්ෂයකිරීමේ හා ක්‍රමක්ෂය වියදම්	10, 33.2	(197,085,992)	(126,686,733)
අනෙකුත් වියදම්	10	(451,487,828)	(447,408,400)
ඒ. ඇ. බදු, ජා. ගො. බදු හා ණය ආ. ගෙ. බදුවලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		**1,177,309,792**	**436,074,620**
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු	34	(386,663,181)	(244,987,282)
සමාජ ආරක්ෂණ බද්ද		(53,703,220)	(33,289,319)
බදු පෙර ලාභය / (අලාභය)		**736,943,391**	**157,798,019**
ආදායම් බදු වියදම්	11	(374,922,038)	(125,756,722)
වසර සඳහා ලාභය / (අලාභය)		**362,021,354**	**32,041,296**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	2025 රු.	2024 රු.
වර්ෂය සඳහා ලාභය / (අලාභය)	362,021,354	32,041,296
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලබන අයිතම		
මූල්‍ය වත්කම් නැවත තක්සේරු කිරීම මත ලාභය හෝ අලාභය	-	-
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු නොලබන අයිතම		
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම නැවත තක්සේරු කිරීම්	46,396,069	(45,714,913)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය හෝ අලාභය මත විලම්බිත බදු බලපෑම	(13,918,821)	13,714,474
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	**394,498,602**	**40,857**

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	පවරන ලද ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිතය	ප්‍රාග්ධන සංචිතය	පොදු සංචිතය	හිමිකම් හානිපූර්ණ අරමුදල	රඳවාගත් ඉපයීම්	එකතුව
2023.12.31 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	3,179,896,294	5,454,169,035
පෙර කාලසීමාවේ ගැලපීම්						(34,012,426)	(34,012,426)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						32,041,296	32,041,296
වෙනත් විස්තීර්ණ ආදායම්						(32,000,439)	(32,000,439)
වර්ෂය තුළ මාරු කිරීම්						-	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-	-
31.12.2024 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	3,145,924,725	5,420,197,466
පෙර කාලසීමාවේ ගැලපීම්						835,677	835,677
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						362,021,354	362,021,354
වෙනත් විස්තීර්ණ ආදායම්						32,477,248	32,477,248
වර්ෂය තුළ මාරු කිරීම්		-				-	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-	-
31.12.2025 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	3,541,259,004	5,815,531,745

මූදල් ප්‍රවාහ ප්‍රකාශනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	01/01/2025 සිට 31/12/2025 දක්වා රු.	01/01/2024 සිට 31/12/2024 දක්වා රු.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
ලද පොලිය	6,546,337,943	4,934,027,163
ගෙවූ පොලිය	(4,260,609,014)	(6,732,425,069)
ශුද්ධ කොමිස් ලැබීම්	379,854,246	172,631,902
සේවකයින්ට ගෙවීම්	(1,120,466,598)	(1,119,439,181)
මූල්‍ය සේවා මත එ. අ. බදු, ණ. ආ. ගෙ. බදු හා ජා. ගො බදු	(454,139,424)	(166,242,018)
අනෙකුත් මෙහෙයුම් කටයුතුවලින් ලැබීම්	12,451,660	2,368,345
අනෙකුත් මෙහෙයුම් කටයුතු මත ගෙවීම්	(378,346,400)	(467,871,894)
මෙහෙයුම් වත්කම් හා වගකීම් වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	725,082,414	(3,376,950,752)
මෙහෙයුම් වත්කම් (වැඩිවීම)/අඩුවීම		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් ණය හා අත්තිකාරම්	(3,096,642,217)	(605,999,021)
අනෙකුත් වත්කම්	(115,609,864)	27,650,831
	(3,212,252,081)	(578,348,190)
මෙහෙයුම් වගකීම් (වැඩිවීම)/අඩුවීම		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	1,069,095,141	(2,655,990,025)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු	132,838,840	(38,186,700)
අනෙකුත් වගකීම්	66,273,612	379,834,326
	1,268,207,593	(2,314,342,400)
ආදායම් බද්දට පෙර මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(1,218,962,075)	(6,269,641,342)
ගෙවූ පාරිතෝෂිත	(70,395,778)	(73,719,634)
ගෙවූ ආදායම් බදු	-	(15,564,251)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(1,289,357,853)	(6,358,925,227)
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
ලද ලාභාංශ	25,020,277	23,070,500
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල	10,918,389	5,707,000
දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම	(37,881,840)	(234,813,235)
මූල්‍ය ආයෝජන විකිණීමෙන් සහ කල්පිරීමෙන් ලද මුදල්	1,303,490,323	6,569,757,649
ආයෝජන කටයුතුවලින් ලැබූ ශුද්ධ ආදායම (භාවිත කළ)	1,301,547,149	6,363,721,915
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය		
යටත් ණය ආපසු ගෙවීම	-	-
ඒකාබද්ධ අරමුදල වෙත ගෙවීම්	-	-
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල	-	-
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	12,189,296	4,796,688
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	124,664,750	119,868,062
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	136,854,046	124,664,749
මුදල් සහ මුදල් හා සමාන දෑ සැසැඳීම		
මුදල් සහ කෙටිකාලීන අරමුදල්	136,854,046	124,664,750
බැංකුවලින් ණයට ගැනීම් (අයිරා ගිණුම)	-	-
කාලසීමාව අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	136,854,046	124,664,750

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1. සාමාන්‍ය තොරතුරු

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1931 අංක16 දරන ආඥාපනත මගින් 1931 දෙසැම්බර් 06 වැනි දින ලංකා රාජ්‍ය උකස් බැංකුව ලෙස ආරම්භ කරන ලදී. ලංකා රාජ්‍ය උකස් බැංකුව හා වර්ෂ 1943 දී පිහිට වූ කෘෂිකාර්මික හා කර්මාන්ත ණය සංස්ථාව ඒකාබද්ධ කරමින් වර්ෂ 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ස්ථාපිත කරන ලදී. බැංකුව 1979 ජනවාරි 1 දින එහි මෙහෙයුම් ආරම්භ කළේය. මෙම බැංකුව බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස නම්කල අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1998 අප්‍රේල් 27 දින බලපත්‍රය නිකුත් කරන ලදී.

1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රධාන වශයෙන් නිවාස ණය ලබාදීමේ කටයුතුවල නියැලී සිටි අතර, වර්ධනය වන තරඟකාරීත්වයට මුහුණදීම පිණිස මෑතක සිට සිය කටයුතු විවිධාංගීකරණය කරමින් රථවාහන ණය හා පුද්ගල ණය වැනි අනෙකුත් ණය පහසුකම් ලබාදීමේ කටයුතුවල ද නිරත වෙමින් සිටී.

1.3. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය

1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත, 1988 බැංකු පනත සහ එහි සංශෝධනවල විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

1.4. බලය ලබාදීමේ දිනය

2025 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මෙම විගණනය කළ මූල්‍ය ප්‍රකාශන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් අනුමැතිය අනුව නිකුත් කිරීමට බලය ලබා දී ඇත.

2025 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 332ක් විය. (2024 දෙසැම්බර් 31 දිනට එම සංඛ්‍යාව 353 ක් විය.)

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් ගිණුම්කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී විශේෂයෙන් සඳහන්කර නොමැතිව්ට සියලුම කාල පරිච්ඡේද සඳහා අනුග මනය කර ඇත.

2.1 පිළියෙල කිරීමේ පදනම

2.1.1 අනුකූලතා ප්‍රකාශය

1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන වලට අනුව අවශ්‍ය තොරතුරුවලට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව (SLFRS සහ LKAS) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙලකර ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන මුදල් ප්‍රවාහයේ ඇති තොරතුරු හැර ගිණුම්කරණයේ උපචිත පදනම යටතේ පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී අනුගමනය කළ ආකෘතිය හා එහි සඳහන් එළිදරව් කිරීම් ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය පල කිරීම හා පිළියෙල කිරීම පිළිබඳ නියම කරන ලද විශේෂිත ආකෘතියට අනුව සිදුකර ඇත.

2.1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුව එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද්‍රවශීලතාවයේ අනුපිළිවෙළට පුළුල්ව ඉදිරිපත් කරයි. හඳුනාගත් වටිනාකම් නිරවුල් කිරීම වෙනුවෙන් නෛතිකව බැඳී ඇති විටක සහ ශුද්ධ අගය පදනමින් නිරවුල් කිරීමට අරමුණක් ඇති විටක දී හෝ වත්කම් උපලබ්ධි කිරීමත් සමඟ වගකීම් නිරවුල් කිරීමත් එක්වර සිදු කරන අවස්ථාවේ දී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කර ඇත. බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මඟින් විශේෂිතව හෙළිදරව් කිරීම යටතේ සහ කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් අර්ථකථනය කිරීමට අනුව අවශ්‍ය හෝ ඉඩ දී ඇති විටක දී හැර මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කිරීමක් සිදු කර නොමැත.

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරයි. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කරන්නේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 විසින් අවසර දී ඇත්නම් පමණි.

2.1.3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී, කළමනාකාරිත්වය මඟින් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නා ප්‍රමාණ තීරණය කිරීමේදී විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතා කර ඇත. අවිනිශ්චිතතාවය මත පදනම් වූ ප්‍රධාන සැලකියයුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන පහත සාකච්ඡාකර ඇති අතර, එවැනි වත්කම් හා වගකීම්වල ධාරණ අගයන් අදාළ සටහන්වල දක්වා ඇත.

2.1.3.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

SLFRS 9 අනුව බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය වත්කම් විවිධ වර්ගවලට වර්ගීකරණය කිරීමට හා ගණනය කිරීමට අවකාශයක් සපයන අතර පහත සඳහන් නිර්ණායකයන් මත ඒවා ක්‍රමක්ෂය පිරිවැයට, අනෙකුත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට හා ලාභ සහ අලාභ මඟින් සාධාරණ අගයට ලෙස දැක්විය හැකි වේ; මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පිහිටුවා ඇති, ආයතනයේ ව්‍යාපාරික ආකෘතිය

2.1.3.2 මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකර ඇති මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳපළ තුළින් ලබාගත නොහැකිවිට ගණිතමය ආකෘතිවල අඩංගු තක්සේරු ශිල්පීය ක්‍රම උපයෝගීකර ගනිමින් ඒවා තීරණය කරනු ලබයි. මෙම ආකෘති සඳහා යෙදවුම් හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත මඟින් ලබා ගනී.

2.1.3.3 මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ

SLFRS 9 සහ LKAS 39 යටතේ සියලුම වර්ගවල මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ ගණනය කිරීමේදී විශේෂයෙන්ම හානිකරණ අලාභ තීරණය කරන විට අනාගත මුදල් ප්‍රවාහයන් සහ ඇප සුරැකුම්වල වටිනාකම් ඇස්තමේන්තු කිරීමේ හා කාල ගණනය කිරීමේ විනිශ්චයන් අවශ්‍යවේ. ඒ අනුව ආදායම් ප්‍රකාශයේ හානිකරණ අලාභ දැක්විය යුතුද? යන්න තක්සේරු කිරීම සඳහා සෑම වාර්තා කරන දිනකටම බැංකුව වෙන් වෙන් වශයෙන් වැදගත්වන ණය සහ අත්තිකාරම් සමාලෝචනය කරයි. විශේෂයෙන්ම හානිකරන අලාභ තීරණය කරන විට ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ දී හා අනාගත මුදල් ප්‍රවාහයන්ගේ කාල ගණනය කිරීමට කළමනාකරණයේ විනිශ්චයන් අවශ්‍යවේ. මෙම ඇස්තමේන්තු, කරුණු කීපයක් මත පදනම්වූ උපකල්පනයන් වන අතර එමනිසා සැබෑ ප්‍රතිඵල වෙනස්විය හැකි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වෙන්කර ඇති හානිකරණ දීමනාවේ අනාගත වෙනස්කම් ඇතිවිය හැකිය. වෙන් වෙන් වශයෙන් ඇති හානිකරණ ප්‍රතිපාදන හානිකරණය සඳහා වෙන් වෙන වශයෙන් ඇගයීම් කරන ලද මූල්‍ය වත්කම් සඳහා අදාළවන අතර ලැබීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය කළමනාකරණයේ හොඳම ඇස්තමේන්තු මත පදනම්වේ. මෙම මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමේදී ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය හා ඇප සුරැකුම් ලෙස තබා ඇති වතකමේ ශුද්ධ උපලබ්ධි වටිනාකම පිළිබඳ කළමනාකරණය විනිශ්චයන් සිදු කරයි. සියලුම හානිකරණයට වත්කම් එහි ගුණාත්මකභාවය මත තක්සේරු කරන අතර මුදල් ප්‍රවාහයන්ගේ ගණනය කිරීමේ උපායමාර්ග සහ ඇස්තමේන්තු අයකර ගතහැකි ලෙස සලකනු ලබයි. වෙන් වෙන් වශයෙන් සලකනු නොලබන එකම වර්ගයේ ණය හා අත්තිකාරම් සඳහා වෙන් වෙන් වශයෙන් හානිකරණයවීම් දක්නට නොලැබුණු සහ වෙන් වෙන් වශයෙන් වැදගත්වන වත්කම් කාණ්ඩ සඳහා සාමූහික හානිකරණ ප්‍රතිපාදන සිදුකර ඇත.

SLFRS 9 ට අනුව අපේක්ෂිත ණය හානි ගණනය කිරීම යනු විචල්‍ය යෙදවුම් තෝරාගැනීම සහ ඒවායේ අන්තර් රඳා පැවැත්ම සම්බන්ධයෙන් උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ මාදිලිවල නිමැවුම් (outputs) වේ. ගිණුම්කරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු ලෙස සලකනු ලබන අපේක්ෂිත ණය හානි ආකෘතිවල මූලික අංගවලට

- ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී තිබේද යන්න ගුණාත්මක තක්සේරු කිරීම සඳහා වන නිර්ණායක සහ එසේනම් ජීව කාලය තුළ අපේක්ෂිත ණය හානි පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා දීමනා

- ඒවායේ අපේක්ෂිත ණය හානි සාමූහික පදනමක් මත තක්සේරු කරනවිට මූල්‍ය වත්කම් බෙදා වෙන් කිරීම

- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් තේරීම ඇතුළුව අපේක්ෂිත ණය හානි ආකෘති සංවර්ධනය කිරීම

- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හා උද්ධමනය වැනි සාර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය නිර්ණය කිරීම

- පොලී අනුපාත විනිමය අනුපාත සහ විරැකියාව හා පැහැර හැරීමේ සම්භාවිතාව (PDS)

- පැහැර හැරීමේ නිරාවරණය (EAD) හා පැහැර හැරීමේ අලාභ වීම (LGD)

- අපේක්ෂිත ණය හානි (ECL) ආකෘතිවලට ආර්ථික යෙදවුම් ලබාගැනීම සඳහා ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික අවස්ථා තෝරාගැනීම සහ ඒවායේ විය හැකි බර තැබීම ඇතුළත් වේ.

2.1.4. ආසන්නම රුපියලට දැක්වීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 මගින් ඉඩ ලබා දී ඇති පරිදි වෙනත් අයුරකින් දක්වා ඇති ස්ථාන හැර මූල්‍ය ප්‍රකාශන වල ඇති වටිනාකම් ආසන්නම රුපියලට දක්වා ඇත.

2.1.5. තක්සේරු කිරීමේ පදනම

සාධාරණ අගයට මිනිනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් අයිතමයන් හැර ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.
i. වෙනත් විස්තීර්ණ ආදායම් තුලින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්

ii. ලාභ හෝ අලාභ මගින් හඳුනාගන්නා මූල්‍ය වත්කම් හා වගකීම්

iii. ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට නියමකර ඇති මූල්‍ය වත්කම් හා වගකීම්

iv. සේවකයින්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමවල සැලසුම් කරන ලද වත්කම්වල සාධාරණ අගයට වඩා අඩුවෙන් වර්තමාන වටිනාකම අනුව හඳුනාගෙන ඇත.

2.1.6. ප්‍රවර්ථන ව්‍යාපාරය

ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් කටයුතු කරගෙන යෑමේ හැකියාව පිලිබඳ බැංකුවේ කලමනාකරනය තක්සේරුවක් සිදුකර ඇති අතර ඉදිරි කාලය තෙක් ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යෑම සඳහා අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමකට පත්වෙයි. ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් කටයුතු කරගන යෑමේ බැංකුවේ හැකියාව පිලිබඳ සාධාරණ සැකයක් ඇතිවිය හැකි කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් පිළිබඳව කලමනාකරනය දැනුවත් වී නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන පිලියලකර ඇත්තේ ප්‍රවර්ථන ව්‍යාපාර පදනම මත වෙයි. මෙම තක්සේරු කිරීම් සිදුකිරීමේදී කළමනාකරණය බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්වලට කොවිඩ්19 වසංගතයෙන් විය හැකි පසු බැසීම සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ප්‍රවර්ථන ව්‍යාපාර පදනම සුදුසු බවට කළමනාකරණය සෑහීමකට පත් වෙයි.

2.1.7. ප්‍රමාණාත්මක බව හා එක්කිරීම්

සමාන අයිතමයන්ගේ සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වශයෙන් ඉදිරිපත්කර ඇත. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 මගින් අවසර දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවේ නම් සමාන ස්වභාවයේ නොවන අයිතම හා ක්‍රියාකාරකම් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

2.1.8. සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි කිරීම සඳහා සහ අන්තර් කාලාන්තර සංසන්දනාත්මක බව වැඩි කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල පෙර කාලසීමාව සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කර ඇත. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුගතවීම සඳහා සංසන්දනාත්මක තොරතුරු වඩා ගුණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා නැවත වගීකරණය කරයි.

2.2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය උපකරණ සඳහා ආදායම් සහ වියදම් හඳුනාගැනීම

2.2.1. පොලී ආදායම සහ වියදම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට ඉඩ ඇති බව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකි බව දක්වා ආදායම් හඳුනාගෙනඇත. "ආදායම් හා වියදම්" පිළිබඳ විස්තර සටහන් අංක 3 හා 4 හි දක්වා ඇත.

සඵල පොලී අනුපාත ක්‍රමය

ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කර ඇති සියලුම මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට (LVPL) වර්ගකර ඇති මූල්‍ය උපකරණ සඵල පොලී අනුපාතය (EIR) උපයෝගී කරගනිමින් පොලී ආදායම වාර්තා කරනු ලබයි. SLFRS 9 යටතේ වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට තක්සේරු කර ඇති පොලී ලබාගත හැකි මූල්‍ය වත්කම්වල පොලී ආදායම මෙන්ම විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති පොලී ලබාගත හැකි මූල්‍ය වත්කම් හෝ LKAS 39 යටතේ කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් ද EIR ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් වාර්තා කර ඇත. EIR යනු මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හරහා ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හෝ සුදුසුවූ විට කෙටි කාලසීමාවක් මූල්‍ය වත්කම්වල ශුද්ධ ඉදිරියට ගෙන එන මුදලට නියමිත පරිදි වට්ටම් කරන අනුපාතයයි.

EIR (සහ එම නිසා වත්කමේ ක්‍රමක්ෂය පිරිවැය) ගණනය කරනු ලබන්නේ EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත්කර ගැනීම් ගාස්තු සහ පිරිවැය පිළිබඳ කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. ණය මුදලක අපේක්ෂිත ජීව කාලයට වඩා ස්ථාවර ප්‍රතිලාභ අනුපාතයක හොඳම ඇස්තමේන්තුව නියෝජනය කරන ප්‍රතිලාභ අනුපාතයක් භාවිතා කරමින් බැංකුව පොලී ආදායම හඳුනාගනී. එබැවින් විවිධ කාල සීමාවන් වල අයකළ හැකි පොලී අනුපාතවල බලපෑම සහ නිෂ්පාදනයේ ජීවන චක්‍රයේ අනෙකුත් ලක්ෂණ (පෙර ගෙවීම්, දඩ පොලී සහ ගාස්තු ඇතුළුව) එය හඳුනාගනී.

ණය අවදානම හැර වෙනත් හේතූන් මත මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහයන් පිළිබඳ අපේක්ෂාවන් සංශෝධනය කරන්නේ නම් පොලී ආදායමේ වැඩිවීමක් හෝ අඩුවීමක් සමග මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමේ ඉදිරියට ගෙනයන ශේෂයට ගැලපීම ධන හෝ ඍණ ගැලපීම ලෙස වෙන්කර ඇත. ගැලපීම ආදායම් ප්‍රකාශයේ පොලී සහ ඒ හා සමාන ආදායමක් මගින් පසුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.2.2. ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමට බැංකුවේ හිමිකාරිත්වය තහවුරු කරන අවස්ථාවේදී ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි. සටහන් අංක 7.

2.2.3. ශුද්ධ වෙළඳ ආදායම

වෙළඳ ක්‍රියාකාරකම්වලින් හටගන්නා ලද ප්‍රතිඵලවලට ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ හා ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය තුළින් උපලබ්ධි ලාභ හෝ අලාභ ඇතුළත්ය.

2.2.4. වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලබයි. සටහන් අංක 7.

2.2.5. අනෙකුත් වියදම්

සියළුම අනෙකුත් වියදම් ඒවා දරනු ලැබූ කාලයට අදාළව සහ ඒවායේ සම්බන්ධතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබයි. ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමේ දී හා කාර්යක්ෂම තත්ත්වයකින් ප්‍රාග ්ධන වත්කම් පවත්වාගෙන යෑම සඳහා දරණු ලබන සියලුම වියදම් වර්ෂය සඳහා වන බැංකුවේ ලාභය සෙවීමේ දී, ආදායමට අයකර ඇත. වෙනත් වියදම් පිළිබඳ විස්තර සටහන් අංක 10 හි දක්වා ඇත.

2.2.6. SLFRS 15 ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත් වලින් ලැබෙන ආදායම

SLFRS 15 ආදායම හඳුනාගන්නේ ද? කොපමණ ප්‍රමාණයක් සහ කුමන අවස්ථාවේදී ද යන්න තීරණය කිරීම සඳහා විස්තීරණ රාමුවක් ස්ථාපිත කරයි. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට අනාගතය, ප්‍රමාණය කාලය සහ ආදායමේ අවිනිශ්චිතභාවය සහ ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් පැන නගින මුදල් ප්‍රවාහයන් අවබෝධ කර ගැනීමට හැකි කිරීම අරමුණු කරයි. ආයතනය විසින් ආදායම හඳුනාගන්නේ කවදාද සහ කුමන මුදල් ප්‍රමාණය ද යන්න තීරණය කිරීමට පියවර පහක ආකෘතියක් යොදාගනු ඇත. ආදර්ශය නිශ්චිතව දක්වා ඇත්තේ, ආයතනයට හිමිකම් ලැබීමට අපේක්ෂා කරන මුදලට භාණ්ඩ හා සේවා ආයතනික පාලනයක් පාරිභෝගිකයකු වෙත පැවරීමේ දී හෝ ආයතනයක් ලෙස ආදායම හඳුනාගන්නා බවයි. යම් නිර්නායක සපුරා තිබේ ද යන්න මත පදනම්ව, ආදායම් හඳුනාගනී.

2.3. බදු වියදම්

මූල්‍ය සේවා මත වැටි බද්ද ඇතුළුව බැංකුව ආදායම් බදු හා වෙනත් බදු ගෙවීම සඳහා යටත්වේ. මූල්‍ය ප්‍රකාශනවලට අදාළව (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. SLFRS පිළිගෙන ඒ මත කළ යුතු ගලපීම් පිළිබඳ නිකුත් කර ඇති බදු මාර්ගෝපදේශයට අනුව ඇති අනෙකුත් බදු සහ වර්තමාන බදු හා කල් පසු වූ බදු සඳහා කරනු ලබන මුළු බදු ප්‍රතිපාදන (වෙන් කිරීම්) පිළිබඳ සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. බදු අය කිරීම සඳහා වන බදු අය කළ හැකි ලාභය ගණනය කිරීමේ දී බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන අවස්ථාවේ දී බදු නීතිය යොදා ගැනීම පිළිබඳ අර්ථ නිරූපණය කිරීමට අදාළව අවිනිශ්චිතතාවක් පවතී.

බැංකුව ජංගම වත්කම් හා වගකීම් මත විලම්භිත සහ අනෙකුත් බදු අය කිරීම, බදු ගෙවිය යුතු ද යන්න ඇස්තමේන්තු මත පදනම්ව හඳුනා ගෙන ඇත. මෙහි දී අවශ්‍ය බදු ප්‍රතිඵලය මූලික අවස්ථාවේ දී හඳුනාගත් බදු වටිනාකමට වඩා වෙනස් විය. එකී වෙනස්කම් තීරණ ගනු ලැබූ කාලයට අදාළව ආදායමට හා විලම්භිත බදු වටිනාකමට බලපෑමක් ඇති කරන ලදී.

2.3.1. IFRIC 23ආදායම් බදු ගැලපීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවය

LKAS 12 ආදායම් බදු යෙදවීමට බලපාන ආදායම් බදු ගැලපීමට සම්බන්ධව අවිනිශ්චිතතාවයන් ගණනය කිරීමට අර්ථ දැක්වීම පාදකකර ගනී. එය LKAS 12 විෂය පථයට පිටින් ඇති බදු හා ගාස්තු සඳහා අදාල නොවේ. නිශ්චිත බදු ගැලපීම සඳහා අදාල වන දඩ හා පොලිය සම්බන්ධ අවශ්‍යතාවයන් විශේෂයෙන්ම අඩංගු නොවේ. අර්ථදැක්වීම විශේෂයෙන්ම පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරයි.

- ආයතනය අවිනිශ්චිත බදු ගැලපීම් වෙන් වශයෙන් සලකා බලා තිබේද
- බදු අධිකාරීන් විසින් බදු ගැලපීම පරීක්ෂා කිරීම පිළිබඳව ආයතනය විසින් කරන උපකල්පන
- ආයතනයක් බදු අයකළ හැකි ලාභය (බදු පාඩුව) බදු පදනම් භාවිතා නොකළ බදු අලාභ, භාවිතා නොකල බදු බැර ශේෂ සහ බදු අනුපාත තීරණය කරන ආකාරය
- ආයතනයක් කරුණු සහ අවස්ථාවන්හි වෙනස්කම් සලකා බලන ආකාරය. බැංකුව විසින් එක් එක් අවිනිශ්චිත බදු ගැලපීම් වෙන් වෙන් වශයෙන් හෝ වෙනත් අවිනිශ්චිත බදු ගැලපීම් එකක් හෝ කීපයක් සමග සලකා බැලිය යුතුද යන්න තීරණය කරන

අතර අවිනිශ්චිතතාවයේ විසඳුම යෝග්‍ය ලෙස පුරෝකථනය කරන ප්‍රවේශය භාවිතා කරයි.

බදු ගැලපම්වල අවිනිශ්චිතතාවයන් හඳුනා ගැනීමේදී බැංකුව වැදගත් විනිශ්චයන් යොදාගනියි. බැංකුව සංකීර්ණ වටපිටාවක ක්‍රියාත්මකවන බැවින් මූල්‍ය ප්‍රකාශන වල බැංකුවේ අර්ථ දැක්වීමෙන් වන බලපෑම එමගින් තක්සේරු කරයි. අර්ථකතනය කිරීම් යොදාගැනීමෙන් පසුව එමගින් අවිනිශ්චිත බදු තත්ත්වයක් තිබේදැයි බැංකුව සලකා බලා ඇත. විවිධ තීන්දු මත බැංකුවේ බදු ගොනු කිරීමේ එම බදු ගැලපීම් සඳහා බදු බලධාරීන් විසින් අභියෝග කළ හැකිවේ. බදු බලධාරීන් විසින් පිළිගනු ලබන ප්‍රකාශන බදු ගැලපීම සඳහා විය හැකි එහි බදු අනුකූලතාවය මත පදනම්ව බැංකු තීරණය කරයි. අර්ථදැක්වීම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑමක් ඇති නොකරයි. මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර ඇති සියලුම කාලසීමාවන් සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති බැංකුව විසින් අනුකූලව යොදාගෙන ඇත.

2.3.2. රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති ආදායම් බදු නීතිය සඳහා සංශෝධන

2017 අංක 24 දරණ ආදායම් බදු නීතියට යෝජිත සංශෝධන ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති 2020 අප්‍රේල් 08 දින දරණ නිවේදනයට අනුව ආයතනික ආදායම් බදු අනුපාතය 2022 ඔක්තෝබර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි 28% සිට 24% දක්වා සංශෝධනයකර තිබිණි.

ප්‍රවර්ථන ආදායම් බදු පිළිබඳ විස්තර සටහනක් අංක 11 හි එලිදරව් කර ඇත.

2.3.3. විලම්භිත බදු වත්කම්

අනාගතයේ දී බදු අය කළ හැකි ලාභයන්ට හිලව් කිරීම් වශයෙන් යොදා ගත හැකි අලාභයන්ගේ ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකි බදු අලාභයේ ප්‍රමාණයට විලම්භිත බදු වත්කම් හඳුනාගනී. මෙම විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීමේ දී අනාගත බදු සැලසුම්කරන ක්‍රමෝපායන් සමඟ අනාගත බදු අය කළ හැකි ලාභයේ කාලය සහ මට්ටම මත පදනම්ව විනිශ්චයන්ට එළැඹීම සිදු කිරීම අවශ්‍ය වේ.

විලම්බිත බදු පිළිබඳ විස්තර සටහන් අංක 20 එලිදරව් කර ඇත.

2.3.4 මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු (VAT)

2002 අංක 14 දරණ එකතුකල අගය මත බදු පනතේ 25 අ පරිච්ඡේදය සහ එම පනතට පසුව කරන ලද සංශෝධනයන්ට අනුව එකතුකළ අගය මත බදු (VAT) ගණනය කරනු ලබයි. ආර්ථික පහතවැටීම හා සේවක පාරිශ්‍රමික සඳහා ගැලපීම් සිදුකර ඇති මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු හා එකතුකළ අගය මත බදුවලට පෙර මෙහෙයුම් ලාභයෙන් 15% ක් මූල්‍ය සේවා මත වැට් බද්ද සඳහා ගෙවිය යුතු වේ.

එකතුකළ අගය මත බදු වියදම් පිළිබඳව විස්තර සටහන් අංක 34 හි දක්වා ඇත.

2.3.5. මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL)

2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ බදු පනතට අනුව 2022 ඔක්තෝබර් 01 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි මූල්‍ය සේවා සඳහා වැට් බද්ද වෙනුවෙන් භාවිතයට ගන්නා අගය එකතු කිරීමේ ප්‍රමාණයෙන් 2.5% ක් ලෙස බැංකුව විසින් මූල්‍ය සේවා සඳහා සමාජ ආරක්ෂණ බද්ද ගණනය කර ගෙවා ඇත.

2.3.6. මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බද්ද (DRL)

2008 අංක 35 දරණ මුදල් පනතට අනුව 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සෑම මූල්‍ය ආයතනයකින්ම ණය ආපසු ගෙවීමේ බදු (DRL) අයකරනු ලබයි. මූල්‍ය සේවා සඳහා අදාලවන වටිනාකම් එකතු කිරීමෙන් 7% ක ප්‍රමාණයක් DRL ලෙස ගණනය කරයි. 2020 ඔක්තෝම්බර් 12 දින දරණ 2020 අංක 02 දරණ මුදල් (සංශෝධන) පනත අනුව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමේ බද්ද (DRL) අවලංගු කර තිබිණි.

2.3.7. ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ ප්‍රතිපාදන හා ඉන්පසු සිදුකළ සංශෝධනයන්ට අනුව බැංකුවේ වගකීම් පිරිවැටුමෙන් (liable turnover) 0.5% ක ප්‍රමාණයක් ගෙවියයුතු වන අතර ගෙවියයුතු ආදායම් බද්දෙන් මෙම ප්‍රමාණය අඩු කළ හැකි වේ. 2020 ඔක්තෝම්බර් 12 දින දරණ 2020 අංක 04 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත මගින් 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අවලංගු කර ඇත.

2.3.8. වගා රක්ෂණ බද්ද (CIL)

2013 අංක 12 දරණ මුදල් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව 2013 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ බද්ධ (CIL) හඳුන්වා දී තිබූ අතර බදු පසු ලාභයෙන් 1% ක ප්‍රමාණයක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වෙයි.

2.4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වත්කම් හා වගකීම් හඳුනාගැනීම

2.4.1. සේවක ප්‍රතිලාභ වගකීම් පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂික ලැබීම සඳහා බැංකුවේ සියලුම සේවකයෝ සුදුසුකම් ලබති. අවුරුදු5 ට වඩා වැඩි සේවා කාලයක් සපුරා ඇති අයට සේවය සිදුකර ඇති සෑම වර්ෂයක් වෙනුවෙන්ම සේවය අවසන් කළ හෝ ඉල්ලා අස් වූ මූල්‍ය වර්ෂයේ අවසන් මාසයට අදාළ වන පරිදි දළ වැටුපෙන් හරි අඩක් 1983 අංක 12 පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ පාරිතෝෂිත ලබාගැනීමට, විශ්‍රාම යෑමෙන් හැර ඉල්ලා අස් වූ හෝ සේවය අවසන්කල සේවකයින් සුදුසු වෙයි. නිශ්චිත දායකත්වය සැලැස්ම වන පොරොන්දු වූ පාරිතෝෂිත විශ්‍රාම ප්‍රතිලාභ වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරු ක්‍රමය උපයෝගී කරමින් බැංකුව ගණනය කරයි.

සාමාන්‍ය සහ කලින් විශ්‍රාම

වසර තුනක සේවා කාලයක් සපුරා ඇති ඔහු/ඇය වයස අවුරුදු 55 දී සාමාන්‍ය විශ්‍රාම යෑමට සුදුසුකම් ලබයි. සියලුම අය වයස අවුරුදු 60 දක්වා විශ්‍රාම ගැනීමේ වයස දීර්ඝ කිරීමට සුදුසකම් ලබයි.

පොලී පිරිවැය

ප්‍රතිලාභ පියවීමට වසරකට ආසන්න බැවින් සැලසුම් වගකීම්වල වර්තමාන කාලසීමාව තුල පොලිය හේතුවෙන් පොලී පිරිවැයෙහි වැඩිවීමක් අපේක්ෂා කරයි.

අරමුදල් සැලසුම්

පාරිතෝෂික වගකීම් බාරහින් අරමුදල් කරණය නොවේ.

ආයුගණක තක්සේරු

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය පාරිතෝෂික ආයුගණක තක්සේරුව ප්‍රයෝජනයට ගෙන නිශ්චය කර ඇත. ආයුගණක තක්සේරු සඳහා වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, සේවකයින්ගේ පවත්නා සේවා කාලය සහ සේවක මරණ අනුපාතය යනාදිය පිළිබඳ උපකල්පනයන් පදනම් වේ. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසා එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ. මේ සඳහා යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2025	2024
පොළී අනුපාතය	10.00%	11.00%
වාර්ෂික වැටුප් වැඩිවීම් අනුපාතය	6.00% - 7.00%	6.50% - 8.00%
විශ්‍රාම ගන්නා වයස	අවුරුදු 55-60	අවුරුදු 55-60

සේවක ප්‍රතිලාභ බැඳීම්වලට අදාළ පාරිතෝෂිත වෙන් කිරීම් පිළිබඳව සටහන් අංක 24 හි දැක්වේ.

2.4.2. සේවක ප්‍රතිලාභ වගකීම් වෛද්‍ය ප්‍රතිලාභ

වෛද්‍ය ප්‍රතිලාභයන්ගේ ආයුගණක තක්සේරුව පිළිබඳ විස්තර සටහන් අංක 21 හි එළිදරව්කර ඇත. ස්ථිර සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විශ්‍රාමිකයින් වෛද්‍ය ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන අතර ඔවුන් යෝජනා ක්‍රමය සඳහා දායකව් සාමාජික මුදල් ගෙවා තිබිය යුතුවේ. විශ්‍රාම ගිය සාමාජිකයින්ගේ පවුලේ සාමාජිකයින් විශේෂ අවස්ථාවක් යටතේ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. (විශ්‍රාම ගිය සාමාජිකයන්ගෙන් කිසියම් අයෙකු හෝ ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයෙකු සුදුසුකම් ලබයි)

වෛද්‍ය ප්‍රතිලාභ ආවරණය කිරීම සඳහා ඇති නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සඳහා වන පිරිවැය අරමුදල් ආයුගණක තක්සේරු මත පදනම්ව තීරණය කර ඇත. ආයුගනක තක්සේරු කිරීම වට්ටම් අනුපාතය වෛද්‍ය උද්ධමනය සහ මරණ අනුපාතය පිළිබඳව උපකල්පනයන් පදනම් වී ඇත. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසාම එම උපකල්පනයන් සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2025	2024
වට්ටම් අනුපාතය	10.5%	11%
වෛද්‍ය වියදම් ඉහළයාම	12%	12%
සහභාගීත්ව දත්ත (ක්‍රියාකාරී) දිනට සංගණන තොරතුරු	31.12.2025	31.12.2024

ආයු ගනක ලාභ /පාඩු හඳුනාගැනීම් - ආයු ගනක පාඩු ලාභ වෙනත් විස්තරන ආදායම් තුළ හඳුනාගනු ලබයි.

වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ - සැලසුම කලින් අරමුදල් කරණය වී නොතිබූ නිසා වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ ශූන්‍ය අගයක් ගනියි.

පොලී පිරිවැය - වර්තමාන සේවා පිරිවැය සහ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන අගයේ කාල වටිනාකම පොලී පිරිවැය වේ.

අරමුදල් සැපයීමේ පියවර - වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බාහිරින් අරමුදල් නොසැපයේ.

2.4.3. නිශ්චිත දායකත්ව සැලසුම

තවද බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක් ක්‍රියාත්මක කරයි. සේවකයින් බැංකුවට සේවය ලබා දෙන ලද සේවා කාලයට අනුපාතිකව නිශ්චිත දායකත්ව සැලසුමකට අනුව ගෙවිය යුතු දායකත්වය හඳුනා ගනු ලබන අතර එය 'පිරිස් පාලන වියදම්' යටතේ වාර්තා ගත කරනු ලබයි. නොගෙවන ලද දායකත්වයන්

වගකීමක් ලෙසටම වාර්තා කරනු ලබයි. බැංකුව පහත දැක්වෙන යෝජනා ක්‍රමයන්ට දායක වී ඇත.

2.4.3.1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ කාර්යය මණ්ඩලය පිළිවෙළින් මාසික දළ වැටුපෙන් (අතිකාල ගෙවීම් හැර) 15% සහ 10% බැගින් අර්ථසාධක අරමුදලට දායක වෙයි. බැංකුවේ අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලකි.

2.4.3.2 සේවක භාරකාර අරමුදල

බැංකුව සේවකයින්ගේ දළ මාසික (අතිකාල හැර) වැටුපෙන් 3%ක් අරමුදලට දායක වන අතර එම අරමුදල සේවක භාරකාර අරමුදල් මණ්ඩලය මඟින් කළමනාකරණය කරනු ලබයි. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයින් පාරිතෝෂිත අරමුදල් ලැබීමට හිමිකම් කියයි.

2.4.4. කල්බදු

පලමුවරට 2019 ජනවාරි 01 දිනෙන් පසුව හෝ එදින සිට බලපැවැත්වෙන පරිදි SLFRS-16 කල්බදු මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි බැංකුව විසින් යොදාගෙන ඇත. 2019 ජනවාරි 01 දින සිට බැංකුව SLFRS-16 අතීතයට බලපාන ලෙස යොදාගෙන තිබුනත් ප්‍රමිතියේ ඇති විශේෂිත සංක්‍රාන්තික ප්‍රතිපාදන යටතේ අවසර දී ඇතත් 2018 වාර්තා කරන කාල පරිච්ඡේදය සඳහා සංසන්දනයන් නැවත ප්‍රකාශකර නොමැත. 2018 මූල්‍ය වර්ෂය දක්වා දේපළ පිරියත උපකරණවල කල්බදු මූල්‍ය කල්බදු හෝ මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කර තිබිනි.

SLFRS-16 කල්බදු අනුව 2019 ජනවාරි 01 දින සිට කල්බදු වත්කම් බැංකුව විසින් භාවිතා කිරීමට ඇති දිනයට කල්බදු භාවිතයට ඇති වත්කම් සහ අනුරූප වගකීමක් ලෙස හඳුනාගනී.

කල්බද්දකින් පැනනගින වත්කම් සහ වගකීම් වර්තන වටිනාකම් පදනමක් මත මුලිකවම අගය කෙරේ. කල්බදු වගකීම්වල පහත සඳහන් කල්බදු ගෙවීම්වලට අදාල ශුද්ධ වර්තන අගය ඇතුලත්වේ.

- කල්බදු දිරිදීමනා ලැබීම් අඩුකළ ස්ථිර ගෙවීම් (අවශ්‍යම ස්ථිර ගෙවීම් ඇතුළුව)
- දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විවිධ කල්බදු ගෙවීම මූලිකව ආරම්භක දිනයට දර්ශකය හෝ අනුපාතය භාවිතා කරමින් මනිනු ලබයි
- සුන්බුන් වටිනාකමේ ඇප යටතේ සමූහය විසින් ගෙවීමට ඇති අපේක්ෂිත ප්‍රමාණ
- සමූහය එම මතය ක්‍රියාත්මක කිරීමට සාධාරණව නිශ්චිතනම්, මිලදි ගැනීමේ මතයක් පිළිබඳ ප්‍රායෝගික මිල, සහ
- කල්බදු නියමයන්ගෙන් සමූහය එම විකල්පය ක්‍රියාවට නංවන බව පිළිබිඹු කරයිනම් කල්බදු අවසන් කිරීම සඳහා දඩමුදල් ගෙවීම

කල්බදු ගෙවීම් කල්බද්ද තුළ පොළී අනුපාත භාවිතා කරමින් වට්ටම් කෙරේ. එම අනුපාතය සමූහය තුළ කල්බදු සඳහා පොදුවේ අවස්ථාව වන පහසුවෙන් තීරණය කළ නොහැකිනම්. කල්බදුකරුගේ වර්ධිත ණය ගැනිමේ අනුපාතය භාවිතා කෙරේ.

කල්බදු ගෙවීම් මුල් මුදල සහ මූල්‍ය පිරිවැය අතර වෙන් කෙරේ. එක් එක් කාලසීමාව සඳහා වගකිමේ ඉතිරි ශේෂය මත අඛණ්ඩ ආවර්ථික අනුපාතයක් නිෂ්පාදන කරමින් පොළී මූල්‍ය පිරිවැය කල්බදු කාලය තුළ ලාභය හෝ අලාභයට අයකෙරේ.

2.4.4.1 කල්බදු හඳුනාගැනීම

කාලසීමාවක් සඳහා හඳුනාගත් වත්කමක් පාලනය කිරීමේ අයිතිය ගිවිසුමකින් පැවරෙන්නේ නම් එම ගිවිසුම කල්බද්දකි. එම නිසා ගිවිසුමක මූලාරම්භයේදීම බැංකුව ගිවිසුම හෝ Contains පහත කරුණු ගැන සලකා බලා තක්සේරු කිරීම සිදු කරයි. හඳුනාගත් වත්කමක් පැවතීම, හඳුනාගත් වත්කමේ පාලනය කිරීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කමේ භාවිතයෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ සැලකියයුතු ලෙස ලබාගැනීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කම භාවිතාව අධීක්ෂණය කිරීමට ඇති අයිතිය (කෙටි කාලීන ගිවිසුම්, මාස 12 ට අඩු සහ අඩු වටිනාකම් ඇති ගිවිසුම් හැර) SLFRS 16 කල්බදු යටතේ යන්ත්‍රෝපකරණ Contain a lease සඳහා සහ ශාඛා මෙහෙයවීම සඳහා බැංකුව ඇතුළත්වී ඇති සියලුම කුලී ගිවිසුම් ඒ අනුව බැංකුව හඳුනාගනී.

භාවිතයට අයිතිය ඇති වත්කම් පහත සඳහන් දෑ ඇතුළත්ව පිරිවැයට මනිනු ලැබේ:

- කල්බදු වගකිමේ මූලික මැනීමේ ප්‍රමාණය
- ලද යම් කල්බදු දිරිදීමනා අඩුකළ ආරම්භක දිනයට හෝ පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම්
- යම් මූලික සෘජු පිරිවැය, සහ
- ප්‍රතිසංස්කරණ පිරිවැය.

භාවිතයට අයිතිය ඇති වත්කම් වත්කමේ ඵලදායි ජීවකාලයේ කෙටි කාලය සහ සරල මාර්ගික ක්‍රමයක් මත කල්බදු කාලය පුරා පොදුවේ ක්ෂය කෙරේ.

කෙටි කාලීන කල්බදු ආශ්‍රිත ගෙවීම් සහ අඩු වටිනාකම් වත්කම්වල සියලුම කල්බදු ලාභය හෝ අලාභය තුළ

වියදමක් ලෙස සරල මාර්ගික පදනමක් මත හඳුනා ගනී. කෙටි කාලීන කල්බදු යනු මාස 12 හෝ ඊට අඩු කාලයක් සහිත කල්බදුය. මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 33 යටතේ මුදල් හා කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තරයක් ලබා දී ඇත.

2.4.5. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ කෙටිකාලීන අරමුදල්වලට අතැති මුදල් බැංකුවල ඇති ශේෂයන්, බැංකු සමඟ ස්ථාපනයන්, ඉල්ලුම් කළ හැකි මුදල් සහ කෙටිකාලීන දැනුම්දීමක් මත ලබා ගත හැකි මුදල් ද ඇතුළත් වෙයි. මුදල් සහ කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් අංක 13 හි දක්වා ඇත.

2.4.6. දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත උපකරණ පිළිබඳ විස්තරයක් සටන් අංක 16 හි ලබා දී ඇත. දේපළ පිරියත හා උපකරණ පිරිවැය හෝ වටිනාකමින් සමුච්චිත ක්ෂයකිරීම සහ සමුච්චිත හානිකරණය අඩු කළ එදිනෙදා නඩත්තු වියදම ඉවත්කළ පසු වටිනාකමට දක්වා ඇත. අපේක්ෂිත ඵලදායී ජීව කාලයෙහි වෙනස්වීම් සුදුසු පරිදි ක්ෂය කිරීම් කාලය හෝ ක්ෂය ක්‍රමය වෙනස් කිරීම මඟින් ගණනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ද හඳුනා ගනු ලබයි.

2.4.6.1. දේපල පිරියත උපකරණ සහ අස්පෘශ වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය

සෑම වාර්තාකරන දිනටම දේපළ පිරියත උපකරණවල ඉතිරි වටිනාකම ප්‍රයෝජනවත් ජීව කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය බැංකුව සමාලෝචනය කරයි. කලමනාකරණයේ විනිශ්චයන් මෙම වටිනාකම්, අනුපාත හා ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී ප්‍රයෝජනයට ගන්නා අතර එහෙයින් ඒවා අවිනිශ්චිතතාවයන්ට යටත්වෙයි. සෑම වත්කම් කාණ්ඩයක් සඳහාම භාවිත කළ ක්ෂය කිරීමේ ක්‍රම හා අනුපාත පිළිබඳ විස්තර සටහන් අංක 2.4.6.4. හි දැක්වේ.

2.4.6.2. හඳුනාගැනීමේ පදනම

වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ලැබෙන සහ වත්කමක පිරිවැය පහසුවෙන් අගය කළ හැකි අවස්ථාවේදී දේපළ පිරියත හා උපකරණ හඳුනා ගනී. එදිනෙදා සේවා කිරීමේ පිරිවැය රහිතව දේපළ පිරියත හා උපකරණ පිරිවැයට සඳහන් කරයි.

2.4.6.3. අගය කිරීමේ පදනම

දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, පහත සඳහන් විශේෂිත පදනම සඳහා එය ලබා දේ.

2.4.6.4. ක්ෂයකිරීම

දේපළ පිරියත හා උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ඒවායේ සුන්බුන් වටිනාකමට ලියා හැරීමට සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්ෂයකිරීම ගණනය කරන අතර, වත්කමක් ක්ෂය කිරීම එය භාවිතයට ගන්නා අවස්ථාවේදී ආරම්භ කරයි.

ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පහත පරිදි වේ:

වත්කම් වර්ගය	ක්ෂයකිරීමේ අනුපාතය
මෝටර් රථ	25.00% වාර්ෂිකව
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	12.50% වාර්ෂිකව
කාර්යාල උපකරණ	12.50% වාර්ෂිකව
පරිගණක	25.00% වාර්ෂිකව
වෙනත්	12.50% වාර්ෂිකව

කාර්යාල ගොඩනැගිලි පුළුල් කිරීම සඳහා වෙනස් කිරීම හෝ නවීකරණය වෙනුවෙන් දරන පිරිවැය වසර 4 ක් හෝ මූල් කල්බදු කාලය යන දෙකෙන් අඩුකාලයට ක්‍රමක්ෂය කර ඇත.

2.4.6.5. පසුව දරනු ලබන පිරිවැය

දේපළ පිරියත හා උපකරණ යන අයිතමයක කොටසක් ඇළුත් කිරීම සඳහා දරනු ලබන පිරිවැය, එම කොටස එකතු කිරීමත් සමඟ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බැංකුවට ගලා එන්නේනම් සහ එහි පිරිවැය පහසුවෙන් අගය කිරීමට ද හැකිනම්. එම අයිතමයේ ධාරණ වටිනාකමකට හඳුනා ගනු ලබයි.

2.4.6.6. යළි ස්ථාපනය කිරීමේ පිරිවැය

දේපළ පිරියත සහ උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් පවත්වාගෙන යෑම සඳහා වන අළුත්වැඩියාවන් සහ නඩත්තුව සහ දරන වියදම එම අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලබයි.

2.4.6.7. කාරක ප්‍රාග්ධනය

ගොඩනැගිලි ඉදි කිරීම්, විශාල යන්ත්‍ර හා පිරියත සහ පද්ධති සංවර්ධනය, ප්‍රාග්ධනීකරණය අපේක්ෂාව සඳහා සෘජුව දරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ඇත. මෙවැනි වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.4.6.8. ඉවත් කිරීම

දේපළ පිරියත හා උපකරණ විකිණීම හෝ එම වත්කම් භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බලාපොරොත්තු නොවන විට දී ඉවත්කරයි. එවැනි වත්කම් ඉවත්කිරීමක් මත හට ගන්නා ලාභය හෝ

අලාභය (වත්කමෙහි ධාරණ වටිනාකම සහ ශුද්ධ විකුණුම් ආදායම අතර වෙනස ගණනය කළ) වත්කම ඉවත්කරන වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් මෙහෙයුම් ආදායම් ලෙසට හඳුනාගනු ලැබේ. සටහන් අංක 19 හි විස්තර එළිදරව් කර ඇත.

2.4.7. අස්පෘෂ්‍ය වත්කම්

බැංකුවේ අනිකුත් අස්පෘෂ්‍ය වත්කම්වල පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුලත් වෙයි. පිරිවැය විශ්වාසදායී ලෙස තක්සේරු කලහැකි විටදී සහ එයට සම්බන්ධිත ඇතිවිය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා එන අවස්ථාවේදී අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගනී.

වෙන් වෙන් වශයෙන් අත්පත් කර ගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම් මූලික හඳුනා ගැනීම මත පිරිවැයට අගය කරනු ලබයි. මූලික හඳුනා
ගැනීමෙන් අනතුරුව, අස්පෘෂ්‍ය වත්කම්වල සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණය අලාභයන් අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලබයි.

අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායී ජීව කාලය නිශ්චිත හෝ අවිනිශ්චිතව අගය කිරීමක් සිදු කරනු ලබයි. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් ඵලදායී ජීව කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි. නිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය අඩු වශයෙන් සෑම වර්ෂයක් අවසානයේ දීම සමාලෝචනයට ලක් කරනු ලබයි. අපේක්ෂිත ඵලදායී ජීව කාලය තුළ හෝ වත්කම් සමඟ ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන් භාවිතයේ අපේක්ෂිත රාටාවන් හී වෙනස්වීම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කරමින් ගණනය කරනු ලැබේ. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම එම අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය සමඟ යන වියදම වර්ගීකරණය යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

පහත පරිදි ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය පුරා ඉතිරි වටිනාකමට අස්පෘෂ්‍ය වත්කම්වල පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල පන්තිය	ඵලදායී ජීව කාලය	ක්‍රමක්ෂය ක්‍රමය
පරිගණක මෘදුකාංගය	අවුරුදු 4	සරල මාර්ග ක්‍රමය

2.4.8. මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

බැංකුව සෑම වාර්තාකරන දිනයකදීම වත්කමෙහි හානිකරණය පිළිබඳව කිසියම් සලකුණක් තිබේද යන්න පිළිබඳව ඇගයීමට ලක් කරනු ලබයි. කිසියම් සලකුණක් පවතී නම් හෝ වත්කමක වාර්ෂික හානිකරණය පිළිබඳ පරීක්ෂා කිරීමක් අවශ්‍ය වේනම්, බැංකුව වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලබයි. කිසියම් වත්කමක ලැබිය හැකි වටිනාකම වනුයේ වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකය හි සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පාවිච්චි වන වටිනාකම අඩු කළ පසු අගය වේ. එහි දී වත්කමෙහි ධාරණ අගය හෝ එහි ලැබිය හැකි වටිනාකම ඉක්මවන්නේ නම්, එම වත්කම හානිකරණය වී ඇති බවට සලකනු ලබන අතර එය අය කරගත හැකි වටිනාකමට ලියා හරිනු ලබයි.

භාවිතය තුළ වටිනාකම් තක්සේරු කිරීමේ දී, මුදලෙහි කාලීන වටිනාකම පිළිබඳ පවත්නා වෙළෙඳපොළ තක්සේරුව සහ වත්කමට නිශ්චිත අවදානම් පිළිබිඹු කරන පෙර බදු වට්ටමක් භාවිතා කරමින්, අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකම වට්ටම් කෙරේ. විකිණීම සඳහා දරනු ලබන වියදම් අඩු කළ සාධාරණ අගය තීරණය කිරීමේ දී, සුදුසු තක්සේරු ක්‍රමයක් යොදා ගනු ලබයි. එම ගණනය කිරීම, තක්සේරු කිරීම් පරිපාලිත සමාගම්වල ලැයිස්තුගත කොටස් මිල හෝ වෙනත් පවත්නා සාධාරණ අගය දර්ශකයන් මඟින් මනාව පැහැදිලි වේ.

2.4.9. මූල්‍ය සුරැකුම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී, බැංකුව මූල්‍ය ඇපවීම් ලබා දේ. මූල්‍ය ඇපවීම් අදාළ වාරිකයන් ලැබෙන විට, සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල (වෙනත් වගකීම් යටතේ) මූලිකවම හඳුනා ගනී. එම මූලික අවස්ථාවේ හඳුනා ගැනීමෙන් අනතුරුව, එක් එක් ඇපය යටතේ බැංකුවේ වගකීම, ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ මුලින් හඳුනාගත් ප්‍රමාණය සහ ඇපයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් මූල්‍ය බැඳීම නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වඩා නිවැරදි ඇස්තමේන්තු වටිනාකම යන දෙකෙන් ඉහළ අගයට මනිනු ලබයි.

මූල්‍ය ඇපවීම් සම්බන්ධයෙන් ඇති වගකීම්වල කිසියම් වැඩිවීමක් 'ණය අලාභ වියදම' යටතේ ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලබයි. වාරික ලැබීම් 'ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම' ලෙසට සරල මාර්ග ක්‍රමයට එම ඇපවීම අදාළ වන කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබයි.

2.4.10. වෙන්කිරීම්

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ ගිවිසුම්ගත) ඇති විටක සහ බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභයක් ඇතුළත් සම්පත් පිටවයාමක් අවශ්‍ය වන විට සහ වගකීමෙහි ප්‍රමාණය විශ්වාසදායී ලෙසට ඇස්තමේන්තු කිරීමක් ද කළ හැකි විට වෙන්කිරීම් හඳුනා ගනියි. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදම ආදායම් ප්‍රකාශනයෙහි කිසියම් ප්‍රතිපූරණයකින් ශුද්ධව ඉදිරිපත් කර ඇත.

2.4.11. මූල්‍ය උපකරණ මූලික හඳුනා ගැනීම

2.4.11.1. හඳුනා ගැනීමේ දිනය

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ අත්හරිමින් මූල්‍ය වත්කම් සහ වගකීම් වෙළෙඳ දිනයට හඳුනා ගන්නා අතර, මෙම දිනය වන්නේ බැංකුව උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල කොටස්කරුවෙක් බවට පත්වන දිනයයි. මෙයට ඇතුළත් වන්නේ වෙළෙඳාමේ විධිමත් මාර්ගවන, වෙළෙඳ ස්ථානය තුළ රෙගුලාසියක් හෝ ගිවිසුමක් මගින් පොදුවේ ස්ථාපිත කාලරාමුවක් තුළ වත්කම බෙදා හැරීම අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම සහ විකිණීමයි. අරමුදල් ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් හඳුනා ගනී. අරමුදල් බැංකුව වෙත මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ බැංකුව හඳුනා ගනී.

2.4.11.2. මූල්‍ය උපකරණයන්ගේ මූලික තක්සේරු කිරීම

මූලික හඳුනා ගැනීමේ දී මූල්‍ය උපකරණයන් වර්ගීකරණය එහි ගිවිසුම්ගත කාලය සහ එම උපකරණය කළමනාකරණය සඳහා ව්‍යාපාර රටාව මත පදනම් වේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වාර්තා කරන, එයට ගනුදෙනු පිරිවැය එකතු කරන හෝ අඩුකරන අවස්ථාව හැර ඒවායේ සාධාරණ අගයට මූලික වශයෙන් අගය කරනු ලබයි. වෙළෙඳ ලැබීම් ගනුදෙනු මිලට අගය කරනු ලබයි. මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය උපකරණ මත සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස්වන අවස්ථාවක. පහත විස්තර කරන පරිදි බැංකුව දින 1 ලාභය හෝ අලාභය ගණනය කරයි.

2.4.11.3. දින 1 ලාභය හෝ අලාභය

උපකරණයේ ගනුදෙනු මිල ආරම්භයේදී සාධාරණය අගයට වෙනස්වන්නේනම්. සහ සාධාරණ අගය වෙළෙඳපොල ගනුදෙනුවල නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් භාවිතා කරන තක්සේරු කරණ ශිල්පයක් මත පදනම් වන අවස්ථාවක, බැංකුව ශුද්ධ වෙළෙඳ ආදායම තුළ ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස හඳුනා ගනී. සාධාරණ අගය සමහර යෙදවුම් නිරීක්ෂනය කළ නොහැකි ආදර්ශ මත පදනම් වන අවස්ථාවන්හිදී, ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස සොයා ගන්නා අතර යෙදවුම් නිරීක්ෂනය කළ හැකි බවට පත්වන හෝ උපකරණය ඉවත්කරන අවස්ථාවේදී ලාභය හෝ අලාභය තුළ පමණක් හඳුනා ගනී.

2.4.11.4. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් තත්සේරු කිරීමේ ප්‍රභේදයන්

2018 ජනවාරි 01 දින සිට වත්කමේ ආයුගණක කෝන්දේසි හා වත්කම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාරික ආකෘතිය මත පදනම්ව සමස්ථ මූල්‍ය වත්කම් බැංකුව වර්ගීකරනය කරයි. තක්සේරු කිරීම්:

- ක්‍රමක්ෂය පිරිවැයට
- වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරන අගය FVOCI
- ලාභ සහ අලාභ මගින් සාධාරන අගය FVPL

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් තක්සේරු කිරීමේ ප්‍රභේදයන්

2018 ජනවාරි 01 දිනට පෙර බැංකුව එහි මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරයි. (ක්‍රමක්ෂය පිරිවැයට) FVPL, විකිණීම සඳහා ඇති හෝ කල්පිරීම දක්වා, රඳවාගෙන ඇති (ක්‍රමක්ෂය පිරිවැයට) ණය බැඳීම් හා මූල්‍ය ඇප හැර මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරයි.

2.4.12. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

2.4.12.1. බැංකුවලින් ලැබියයුතු, ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන

2018 ජනවාරි 01 දින සිට බැංකුවලින් ලැබිය යුතු, ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම් අනෙකුත් මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් පමණක් බැංකුව අගය කරයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට මූල්‍ය වත්කම් දරා ගැනීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගනී.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි හිඟව පවත්නා ප්‍රධාන මුදල මත මුල් මුදල සහ පොළියේ පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා විශේෂ දිනවල ඇති වේ.

මෙම කොන්දේසි පිළිබඳ විස්තර පහත දැක්වේ.

2.4.12.2. ව්‍යාපාර ආදර්ශ තක්සේරුව

බැංකුව එහි ව්‍යාපාර අරමුණු අත්කර ගැනීමට මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය වඩා හොඳින් පිළිබිඹු කරන මට්ටමකදී එහි ව්‍යාපාර ආදර්ශය තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාර ආදර්ශය උපකරණයකින් උපකරණය යන පදනම මත තක්සේරු නොකරයි. එකතුකළකළඹ තුළ ඉහළ මට්ටමකදී කරනු නොලැබුවත්, පහත නිරීක්ෂණය කළ හැකි සාධක මත එය පදනම් වේ:

- ව්‍යාපාර ආදර්ශයේ සහ එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්වල කාර්යසාධනය අගය කරන සහ ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට වාර්තා කරන ආකාරය

- ව්‍යාපාර ආදර්ශයේ සහ කාර්යසාධනයට බලපාන අවදානම් (එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්) විශේෂයෙන් එවැනි අවදානම් කළමනාකරණය කරන ආකාරය

- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට ගෙවනු ලබන ආකාරය (නිදසුනක් ලෙස, ගෙවීම් කළමනාකරණය කළ වත්කම්වල සාධාරණ අගය හෝ එකතුකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත පදනම් වේ)

- විකුණුම්වල අපේක්ෂිත වාර ගණන, වටිනාකම සහ කාලය බැංකුවේ තක්සේරුවේ වැදගත් අංගයකි.

ව්‍යාපාර ආදර්ශ තක්සේරුව නරක සිදුවීම් හෝ පීඩන සිදුවීම් සැලකිල්ලට ගන්නේ නැතිව සාධාරණව අපේක්ෂිත ක්‍රියාදාම මත පදනම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ බැංකුවේ මුල් අපේක්ෂාවන්ගෙන් වෙනස් වන ආකාරයකින් මුදා හරින්නේනම්, එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන ඉතිරි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය බැංකුව වෙනස් නොකරයි. නමුත්. ඉදිරියට ගෙනියන අලුතින් උත්පාදිත හෝ අලුතින් මිලදිගත් මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී එවැනි තොරතුරු අතුළත් කරයි.

2.4.12.3. SPPI පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවැනි පියවරක් ලෙස, SPPI පරීක්ෂණය සපුරා ඇතිද යන්න හඳුනා ගැනීම සඳහා මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ බැංකුව තක්සේරු කරයි. මෙම පරීක්ෂණයේ අරමුණ සඳහා ප්‍රධාන මුදල යන්න මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම්වල සාධාරණ අගය ලෙස නිර්වචනය කරන අතර මුල් මුදල මූල්‍ය වත්කමේ (නිදසුනක් ලෙස, ආපසු ගෙවීම් හෝ වාරිකය/ වට්ටම ක්‍රමක්ෂය කිරීම ඇත්නම්) සපුරා වෙනස් විය හැකිය.

ණයදීමේ වැඩපිළිවෙලක් තුළ පොළියේ වඩාත් වැදගත් අංග වන්නේ මුදල සහ ණය අවදානමේ කාල වටිනාකම සඳහා නියමානුකූල ප්‍රතිඵලවයි SPPI තක්සේරු කිරීම සිදු කිරීම සඳහා, බැංකුව විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම නම් කරනු ලබන ව්‍යවහාර මුදල සහ පොළී අනුපාතය නියම කරන කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලයි.

මෙයට වෙනස්ව, මුල් ණය දීමේ වැඩපිළිවෙලකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තුළ අවදානම් හෝ වෙනස්වීම් සඳහා නිරාවරණය අඩුකර ගැනීමකට වඩා හඳුන්වාදෙන ගිවිසුම්ගත නියමයන් හිඟව පවත්නා ප්‍රමාණය මත මුල් මුදල හා පොළිය ගෙවීම් සඳහා පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඇති නොකරයි. එවැනි අවස්ථාවලදී, මූල්‍ය වත්කම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වේ.

2.4.12.4. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ණය උපකරණ

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන අවස්ථාවේදී අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ SLFRS 9 යටතේ නව වර්ගීකරණය බැංකුව යොදා ගනී:

- උපකරණය ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගැනීම, හා එහි පමාර්ථය සාමූහික ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ සහ අලෙවිකරන මූල්‍ය වත්කම් යන දෙවර්ගය විසින් අත්කර ගැනීම.

- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් හි SPPI පරීක්ෂණය සපුරාලීම

මෙම උපකරණ විශාල වශයෙන් LKAS 39 යටතේ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන ලෙස පෙර වර්ගීකරණය කර ඇති වත්කම්වලින් සමන්විත වේ.

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සාධාරණ අගය තුළ වෙනස්වීම් නිසා ඇතිවන ලාභ හෝ අලාභ සහිත සාධාරණ අගයට පසුව මනිනු ලැබේ. සමාන සුරැකුම්වල බැංකුව එක් ආයෝජනයකට වැඩිපුර දරන අවස්ථාවේදී, ඒවා පෙර පිවිසි පෙර පිටවුම් මත LKAS බැහැර කළ යුතුයයි සලකනු ලැබේ. ඉවත් කිරීම මත, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභ අනෙකුත් විස්තරාත්මක ආදායමෙන් ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ. 2022 වසරෙන් අවසන් වූ වසර සඳහා වෙනත් විස්තරාත්මක ආදායම් තුළින් සාධාරණ අගයට තක්සේරු කල ණය උපකරණ බැංකුව රඳවාගෙන නොමැත.

2.4.12.5. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ (FVOCI)

මූලික හඳුනා ගැනීම මත, බැංකුව අවස්ථානුකූලව LKAS 32 යටතේ ස්කන්ධය පිළිබඳ නිර්වචනය සපුරාලන අවස්ථාවේදී එහි ස්කන්ධ ආයෝජන කිහිපයක් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ ලෙස වෙනස්කළ නොහැකි ලෙස වර්ගීකරණය කිරීම තෝරා ගෙන ඇත. මූල්‍ය උපකරණ අලෙවිය සඳහා තබා නොමැති අවස්ථාවකදී, එවැනි වර්ගීකරණය උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

මෙම ස්කන්ධ උපකරණ මත ලාභ හෝ අලාභ ලාභයට නැවත ප්‍රතිචක්‍රිය නොකරයි. උපකරණයේ පිරිවැයේ

කොටසක් අයකර ගැනීමක් ලෙස එවැනි ලද මුදල්වලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවේදී, එවැනි ලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරන අවස්ථාව හැර ගෙවීමේ අයිතිය සථාපිත කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභය හෝ අලාභය තුළ ලාභාංශ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ හානිකරණ තක්සේරුවකට යටත් නොවේ. 2002 වසරෙන් අවසන් වූ වසර සඳහා පිච් රේටින් සමාගමේ සහ ණය තොරතුරු කාර්යාංශයේ ලයිස්තුගත ස්කන්ධ උපකරණ බැංකුව රඳවාගෙන ඇත. සටහන් අංක 18.

2.4.12.6. නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල්

මූලික අගය කිරීමෙන් පසු, නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල් පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ. ක්‍රමක්ෂය පිරිවැය නිකුත්කළ අරමුදල් පිළිබඳ යම් මට්ටම් හෝ වාරික සහ ඵලදායී පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ගණනය කෙරේ. වගකීමක් සහ ස්කන්ධ සංරචකයක් අඩංගු සංකීර්ණ මූල්‍ය උපකරණයක් නිකුත් කරන දිනයට වෙන් කෙරේ.

2.4.12.7. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් හා වගකීම්

මෙම වර්ගය තුළ මූල්‍ය වත්කම සහ මූල්‍ය වගකීම යනු අලෙවිය සඳහා තබා ඇති සහ මූලික හඳුනා ගැනීම මත කළමනාකරණය විසින් නම්කර ඇති හෝ SLFRS යටතේ සාධාරණ අගයේදී මැනීමට අනිවාර්යෙන්ම අවශ්‍ය වන ඒවා වේ. කළමනාකරණය පහත සඳහන් නිර්ණායකයක් සපුරාලන අවස්ථාවේ මූලික හඳුනා ගැනීම මත ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට උපකරණයක් නම් කරයි. එම නම් කිරීම උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

- මෙම නම් කිරීම වත්කම් හෝ වගකීම් අගය කිරීමෙන් වෙනත් ආකාරයකින් ඇතිවියහැකි හෝ විවිධ පදනමක් මත ඒ මත ලාභ හෝ අලාභ හඳුනා ගැනීමේ අනුරූප නොවන දෙය තුරන් කරයි නැතිනම් සැලකියයුතු ලෙස අඩු කරයි.

හෝ

- වගකීම් (සහ LKAS 39 යටතේ 2018 ජනවාරි1 දක්වා වත්කම්) මූල්‍ය වගකීම් සමූහයක (හෝ LKAS 39 යටතේ මූල්‍ය වත්කම් හෝ දෙකම) කොටසක් වන අතර, ලේඛණගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන ක්‍රමෝපායට අනුකූලව කළමනාකරණය කරන අතර ඒවායේ කාර්යසාධනය අගයනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කරයි. සාධාරණ අගයේ වෙනස්වීම් බැංකුවට අයත් ණය අවදානම් තුළ වෙනස්වීම් නිසා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ වගකීම්වල සාධාරණ අගය තුළ වෙනස්වීම් හැරදැමීම සමඟ ලාභය සහ අලාභය තුළ වාර්තා කෙරේ. සාධාරණ අගය තුළ එවැනි වෙනස්වීම් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ණය සංචිතය තුළ වාර්තා කරන අතර, ලාභය සහ අලාභයට ප්‍රතිචක්‍රීය නොකරයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ උපකරණ මත උපයන හෝ දරන පොළිය ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් යම් මට්ටම/වාරිකය සහ උපකරණයේ අත්‍යවශ්‍ය කොටසක් වන සුදුසුකම් ලබන ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් පිළිවෙලින් පොළී ආදායම හෝ පොළී වියදම තුළ උපචිත කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මැනිම නීතියෙන් අනිවාර්ය වත්කම් මත උපයන පොළිය ඔිවිසුම්ගත පොළී අනුපාතය භාවිතා කරමින් වාර්තා කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මනිනලද ස්කන්ධ උපකරණවලින් ලාභාංශ ආදායම ගෙවීමේ අයිතිය ස්ථාවර කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභ සහ අලාභ තුළ වාර්තා කෙරේ. 2025 දෙසැම්බර් 31 දිනට බැංකුව ඒකක භාර රඳවාගෙන ඇති අතර ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට (FVPL) තක්සේරු කරයි.

2.4.12.8. මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ව්‍යාපාර මාර්ගයක් අත්කරගන්නා, බැහැර කරන හෝ අවසන් කරන විශේෂ වාතාවරණයකදී හැර බැංකුව ඒවායේ මූලික හඳුනා ගැනීමෙන් පසු එහි මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකරයි. බැංකුව 2024 සහ 2025 දී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

2.4.12.9. මූල්‍ය වත්කම් හා වගකීම් ඉවත් කිරීම

2.4.12.9.1. නියමයන් හා කොන්දේසිවල සැලකියයුතු වෙනස්වීම් අනුව ඉවත් කිරීම

බැංකුව ගනුදෙනුකරුවන්ට ණය වැනි මූල්‍ය වත්කමක් ඉවත් කරන්නේ, හානිකරණ අලාභය දැනට වාර්තා කර නොමැති ප්‍රමාණය දක්වා ඉවත් කිරීමක් ලෙස හඳුනාගන්නා වෙනස සමඟ එය අලුත් ණයක් බවට පත්වන පරිදි සැලකියයුතු ප්‍රමාණයට එහි නියමයන් හා කොන්දේසි නැවත සාකච්ඡා කර ඇති අවස්ථාවේදීය. අලුතින් හඳුනාගත් ණයමුදල් අපේක්ෂිත ණය අලාභ මැනීමේ අරමුණ සඳහා 1 අදියර ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එම ණය POCI වන බවට සලකන්නේනම් පමණි.

අනෙකුත් කරුණු අතර, ගනුදෙනුකරුවන්ට ණයක් හඳුනා ගන්නේද යන්න තක්සේරු කිරීමේදී, බැංකුව පහත සඳහන් සාධක සලකා බලයි:

- ණය මුදලේ ව්‍යවහාර මුදලේ වෙනස
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වාදීම
- ඇපයක වෙනස්වීම
- වෙනස්වීම මගින් SPPI නිර්ණායක තවදුරටත් සපුරනු නොලබන උපකරණයක් විය

වෙනස්වීම පසුකාලීනව වෙනස් වන මුදල් ප්‍රවාහවලට හේතු නොවේනම්. වෙනස්වීම ඉවත් කිරීමට හේතු නොවේ. මුල් ඵලදායී පොළී අනුපාතයට වට්ටම් කළ මුදල් ප්‍රවාහ තුළ වෙනස මත පදනම් වී, හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට වෙනස් වීමේ ලාභයක් හෝ අලාභයක් වාර්තා කරයි.

2.4.12.9.2. සැලකියයුතු නවීකරණයකිරීම හැර ඉවත්කිරීම

මූල්‍ය වත්කම්

කල් ඉකුත් වූ වත්කම්වලින් මුදල් ගලා ඒම ලබාගැනීමට හිමිකමක් ඇතිවිට මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක් හෝ අදාලවන පරිදි) ඉවත් කිරීමක් සිදුකරයි. ඉවත්කිරීම සඳහා මාරු කිරීම් ලක්ෂණ හා මූල්‍ය වත්කම මාරුකර තිබේනම් යන අවස්ථා දෙකෙහිදීමදිත් බැංකුව මූල්‍ය වත්කම ඉවත් කරයි. බැංකුව මූල්‍ය වත්කම මාරුකර ඇත්නම් පමණක්, නැතහොත්

- මූල්‍ය වත්කමකින් මුදල් ගලාඒම ලබාගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව මාරුකර ඇතිවිටක දී හෝ
- මුදල් ගලාඒම අයිතිය අත්හිටුවා ඇතිවිට එහෙත් pass-through ගිවිසුමක් යටතේ නොවන පක්ෂයකට ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ලබාගත් මුදල් ප්‍රවාහය සම්පූර්ණයෙන් ගෙවීමේ අයිතිය පිළිගෙන ඇත.

Pass-through ක්‍රියාමාර්ග යනු ගනුදෙනු වෙයි. එමගින් වත්කමකින් (ආරම්භක වත්කම) මුදල් ගලා ඒම ලබාගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව අත්හිටුවයි. එහෙත් මෙම මුදල් ප්‍රවාහයන් එකක් හෝ ආයතන වැඩි ගණනකට ගෙවීමට හැකි ගිවිසුම්ගත අයිතිය පහත සඳහන් තත්ත්වයන්ට යෝග්‍යවේ නම් පිලිගනු ලබයි.

- ණයට දුන් මුදලට වෙළෙඳපල අනුපාතයට ඇති උපචිත පොලිය එකතුකර සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට අයිතියක් ඇත. කෙටිකාලීන අත්තිකාරම් හැර මූලික වත්කමින් සමාන වටිනාකමක් ලබාගෙන නොමැති ආනුෂාංගික ලැබීම්කරුවන්හට වටිනාකම් ගෙවීමට බැංකුව බැඳීමක් නොමැත.
- ආනුෂාංගික ලැබීම්කරුවන්හට ඇති සුරැකුම් හැර මූලික වත්කම ඇපයට තැබීමට හෝ විකිණීමට බැංකුවට නොහැක.
- බැංකුව විසින් එකතුකරනු ලබන මුදල් ප්‍රවාහයන් ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ආනුෂාංගික ලැබීම්කරුවන් වෙත බැංකුව ප්‍රේෂණය කරයි.

මීට අමතරව රැස්කිරීමේ දිනය හා ආනුෂාංගික ලැබීම්කරුවන්ට ප්‍රේෂණය කිරීමට අවශ්‍ය දිනය අතර කාලය තුල දී ඉපයූ පොලිය ඇතුලුව මුදල් හෝ මුදල් සමාන දෑ වල ආයෝජනය කිරීම හැර එවැනි මුදල් ප්‍රවාහයන් ආයෝජනය කිරීමට බැංකුවට අයිතියක් නොමැත.

ඉවත්කිරීම සඳහා පැවරීම සුදුසු වත්කම් එක පසෙකින්

- බැංකුව වත්කමේ සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස මාරුකර ඇතිවිට හෝ
- බැංකුව සැලකියයුතු ලෙස වත්කමේ සියලු අවදානම් හා ලැබීම් මාරුකිරීමක් හෝ රඳවාගැනීමක් සිදුකර නොමැති නමුත් වත්කමේ පාලනය මරුකර ඇත.

පැවරුම් ලාභියාට අසම්බන්ධිත පාර්ශවයකට වත්කම මුළුමනින්ම විකුනා දැමීමට ප්‍රායෝගික හැකියාවක් තිබියයුතු අතර එම හැකියාව පැවරීම අමතර සීමාවලට යටත්කිරීමකින් තොරව බහුපාර්ෂිකව ප්‍රයෝජනයට ගැනීමට හැකිනම් හෝ හැකිවේනම් පමණක් බැංකුව පාලනය පැවරීම සලකා බලයි.

සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස රඳවා තබා ගැනීමක් හෝ පැවරීමක් බැංකුව සිදු නොකරනවිට හා වත්කමේ පාලනයේ නවතා දැමීම සිදුකර බැංකුවේ සිදුකරගෙන යන මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම හඳුනාගන්නා අතර එවැනි අවස්ථාවක බැංකුව ආශ්‍රිත වත්කම් ද හඳුනාගනී. බැංකුව රඳවාගෙන ඇති බැඳීම් හා අයිතීන් නිරූපනයවන පදනම මත පවරන ලද වත්කම හා ආශ්‍රිත වගකීම් තක්සේරු කරනු ලබයි.

පවරනලද වටිනාකමේ ඇපයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කමේ මූලික ඉදිරියට ගෙන ආ වටිනාකමේ අඩු අගයට තක්සේරු කරන අතර බැංකුව ගෙවියයුතු උපරිම වටිනාකම සලකා බැලීම සිදුකරයි.

ප්‍රතිමිලදී ගැනීම් සඳහා බැංකුවට ගෙවීමට අවශ්‍යවන අගයට අඛණ්ඩ මැදිහත්වීම තක්සේරු කරන අතර පවරන ලද වත්කම මත අඛණ්ඩ මැදිහත්වීම ලිඛිත හෝ මිලදී ගැනීම් විකල්පයක ස්වරූපය ගනී. සාධාරණ අගයට තක්සේරු කර ඇති වත්කමක අයිතිය විකිණීමේ දී අස්ථිත්වයේ අඛන්ඩ මැදිහත්වීම පවරන ලද වත්කමේ සාධාරණ අගයේ අඩුවටිනාකමට සීමාවෙයි.

මූල්‍ය වගකීම්

වත්කමක් යටතේ ඇති බැඳීම් නිදහස් කරනු ලැබීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත්වීම සිදුවූ අවස්ථාවක මූල්‍ය වගකීමක් ඉවත්කිරීම සිදුකරයි. එකම ණය

ගනුදෙනුකරුවෙකු සැලකියයුතු වෙනසක් සහිත කොන්දේසිවලට යටත්ව පවත්නා මූල්‍ය වගකීමක් අලුත් කිරීම හෝ දැනට පවත්නා වගකීම්වල කොන්දේසි සැලකිය යුතු ලෙසින් අලුත් කිරීමේ දී එවැනි නුවමාරුවක් හෝ අලුත් කිරීමක් ප්‍රාරම්භක වගකීම් ඉවත්කිරීමක් ලෙසට හා නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසද ගැලපීම් කර ඇත. එසේම ප්‍රාරම්භක මූල්‍ය වගකීම්වල ඉදිරියට ගෙන එන ලද වටිනාකම සහ මූලාරම්භක මූල්‍ය වගකීම් යන ගෙවන ලද වටිනාකම අතර වෙනස ලාභය හෝ අලාභය තුල හඳුනාගැනේ.

2.4.12.10. මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව, ගනුදෙනුකරුවන්ට සියලුම ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වියහැකි හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කෙරේ. පහත සඳහන් තක්සේරු ශිල්ප ණයවල සාධාරණ අගය ගණනය කිරීමට භාවිතා කළ අතර ඒවා පහත පරිදි වේ. මූල්‍ය වත්කම් හානිකරණයේ විස්තර සටහන් අංක 16 හා 17 හි දක්වා ඇත.

2.4.12.10.1. වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණ ක්‍රමය

1 වෙන් වෙන් වශයෙන් හානිකරණ ක්‍රමය ණය සඳහා සිදුකරන අතර, එහිදී මුදල් ආපසු ණය ඉවත්කරන අතර රු.මි.5ට වැඩි සියලුම ණය ඇතුළත් කරයි. නැතිනම් ප්‍රාග්ධන පදනමෙන් 0.1%ක් තනි තනිව සැලකියයුතු ලෙස සලකනු ලබයි. තනි තනි හානිකරණ පරීක්ෂණය සඳහා පහසුකම් හානිකරණයේ අරමුණුගත සාක්ෂි ලබාගැනීම මත පදනම් වී තෝරා ගනු ලැබේ.

11 වෙන් වෙන් වශයෙන් වැදගත් සහ වෙන් වෙන් වශයෙන් හානිකරණය වූ තක්සේරු කිරීම්

මූලාරම්භයේ සිට සැලකිය යුතු පිරිහීමකට ලක්වී ඇති නිර්ණායක මත පදනම් වූ වෙන් වෙන් වශයෙන් සැලකිය යුතු නමුත් හානිකරණය නොවූ ණය සාමූහිකව අධියර 1 යටතේ හෝ අධියර 11 යටතේ හානිකරණය සඳහා තක්සේරු කරනු ලබයි. එයින් වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණය යටතේ වර්ගකර ඇති ණය පහසුකම් සඳහා සැලකිය යුතු ණය පිරිහීම් සැලකීමේ දී පහත සඳහන් නිර්ණායක සලකා බලනු ලබයි.

ණය ලබාගන්නා හෝ ණය ලබාදෙන්නාගේ සැලකිය යුතු මූල්‍ය අපහසුතා ඇතිවූ විට ණය ගැනුම්කරු බංකොලොත් වී හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට යොමු වී ඇති බවක් දක්නට ලැබෙයි. මූල්‍ය වත්කම් සඳහා ක්‍රියාකාරී වෙළඳපළක් නොමැතිවූ විට මූල්‍ය දුෂ්කරතාවයන් ඇති කරයි. ගැනුම්කරු වංචා සහගත ලෙස ලියකියවිලි ඉදිරිපත් කර ඇති අතර ඉතිරි ශේෂය අයකර ගැනීම සැක සහිත බව ප්‍රකට වෙයි. එහෙයින් එම ණය ගැනුම්කරුගේ වෙනත් මූල්‍ය උපකරණ සඳහා ද ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇතිකරයි.

2.4.12.10.2 සාමූහික හානිකරණ ක්‍රමය

වියහැකි ණය අලාභ සඳහා සාමූහික හානිකරණ වෙන් කිරීම් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව සිදු කෙරේ. බැංකුව අපේක්ෂිත ණය අලාභ මූලධර්මයට අනුව සාමූහික හානිකරණ වෙන්කිරීම බැංකුව සිදුකර ඇත. එහිදී වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණය වැදගත් නොවේ.

2.4.12.10.2.1අපේක්ෂිත ණය අලාභ මූලධර්මය පිළිබඳ දළ විශ්ලේෂණය

ඉදිරිය දකින අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් සහිතව LKAS 39 හි දරන ලද අලාභ ප්‍රවේශය වෙනුවට SLFRS 9 යොදා ගැනීම මූලිකවම බැංකුවේ ණය අලාභ හානිකරණ ක්‍රමය මූලිකවම වෙනස් කර ඇත. 2018 ජනවාරි 1 සිට, "මූල්‍ය උපකරණ, ලෙස මෙම සෑම කොටසකම සඳහන් කරන ණය බැඳීම් සහ මූල්‍යමය ඇප ගිවිසුම් සමඟ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොදරන සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් අත්තිකාරම බැංකුව වාර්තා කරමින් සිටී. ස්කන්ධ උපකරණ SLFRS 9 යටතේ හානිකරණයට යටත් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු ජීවකාල අපේක්ෂිත ණය අලාභයේ කොටස වන අතර එය වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුළත වියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් ඇතිවන අපේක්ෂිත ණය අලාභය නියෝජනය කරයි. ජීවකාල අපේක්ෂිත ණය අලාභ සහ මාස 12 අපේක්ෂිත ණය අලාභ යන දෙකම මූල්‍ය උපකරණවල පාදක කළඹේ ස්වභාවය මත රැඳෙමින් තනි තනි පදනමක් හෝ සාමූහික පදනමක් මත ගණනය කෙරේ. මූල්‍ය වත්කම් කාණ්ඩකරණය සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය සාමූහික පදනමක් මත අගය කර ඇත.
මූල්‍ය උපකරණයක ඉතිරි ජීව කාලය තුළ සිදුවන පැහැර හැරීමේ අවදානම තුළ වෙනස සැලකිල්ලට ගනිමින් මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය උපකරණයේ ණය අවදානම සැලකියයුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ එක් එක් වාර්තාකරන කාලසීමාව අවසානයේදී තක්සේරුවක් සිදු කිරීමට බැංකුව ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත. ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුව එහි ණය පහත විස්තර කරන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 සහ POCI තුළට කාණ්ඩ කරයි:

අදියර 1 ණය පළමුව හඳුනාගන්නා අවස්ථාවේදී, බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ

මත පදනම් වී අත්තිකාරමක් හඳුනා ගනී. අදියර 1 ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 2 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

අදියර 2 ණයමුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි. අදියර 2 ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉතිරි කොටස 134 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වාර්ෂික වාර්තාව 2019 ණයට ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 3 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

අදියර 3 ණය හානිකරණය වී ඇති බවට සලකන ණය (අංක 13 හි සඳහන් පරිදි). බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි.

POCI මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය (POCI) වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. POCI වත්කම් මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරන අතර ණය ගලපන ලද ඵලදායී පොළි අනුපාතයක් මත පදනම් වී පොළි ආදායම පසුකාලීනව හඳුනා ගනී. අපේක්ෂිත ණය අලාභ හඳුනාගැනීම හෝ නිකුත් කිරීම සිදුකරනු ලබන්නේ අපේක්ෂිත ණය අලාභ වල පසුකාලීන වෙනසක් ඇති ප්‍රමාණයට පමණි.

හිඟව ඇති මුළු ප්‍රමාණය හෝ එයින් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් බැංකුවට නොමැති මූල්‍ය වත්කම් සඳහා, මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය අඩු කරනු ලබයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනා නොගැනීමක් ලෙස සලකනු ලබයි.

2.4.12.10.2.3 අපේක්ෂිත ණය අලාභ (ECLs) ගණනය කිරීම

ඵලදායී පොළි අනුපාතයට ආසන්නවීමට වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟය මැනීම සඳහා සම්භාවිතාව බරතබනලද ක්‍රියාදාම හතරක් මත පදනම් වී බැංකුව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟයක් යනු ගිවිසුමකට අනුකූලව ආයතනයකට ගෙවියයුතු මුදල් ප්‍රවාහ සහ ආයතනය ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසයි. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ශිල්ප පහත කෙටියෙන් දක්වන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ.

PD පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ පැහැර හැරීම සිදුවියහැකි බව පිළිබඳ ඇස්තමේන්තුවකි. මූල්‍ය පහසුකම මෙයට පෙර හඳුනා ගෙන නොමැතිනම් සහ තවමත් කළඹ තුළනම්, පැහැර හැරීමක් තක්සේරු කළ කාලසීමාව තුළ එක්තරා අවස්ථාවකදී පමණක් සිදුවියහැක.

EAD පැහැර හැරීමේදී නිරාවරණය යනු බැඳුණු පහසුකම සහ මඟහැරුණු ගෙවීම්වල උපචිත පොළිය මත පහළවැටීම් අපේක්ෂිත ගිවිසුම මගින් හෝ වෙනත් ආකාරයකින් උපලේඛනගත මුල් මුදල සහ පොළිය නැවත ගෙවීම ඇතුළුව වාර්තාකරන දිනයෙන් පසු නිරාවරණ තුළ අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අනාගත පැහැරහැරීමේ දිනයක නිරාවරණය පිළිබඳ තක්සේරුවකි.

LGD අලාභ ලබන පැහැර හැරීම යනු දෙනලද යම් කාලයකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවක ඇතිවන අලාභය පිළිබඳ තක්සේරුවකි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හිඟ සහ යම් ඇප මුදාහැරීම ඇතුළුව ණයකරු ලබාගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, බැංකුව විසින් මූලික සිදුවීම, හොඳම සිදුවීම සහ නරකම සිදුවීම ලෙස ක්‍රියාදාම තුනක් සලකා බලයි. මේවා එකින් එක එකිනෙකට වෙනස් PDs, EADs සහ LGDs හා බැඳේ. අදාළ වන අවස්ථාවේදී, ණය අයකර ගැනීමේ හැකියාව සහ ඇපවල වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලබාගතහැකි ප්‍රමාණය ඇතුළුව පැහැර හැරි ණය අයකර ගැනීමට අපේක්ෂා කරන ආකාරය සම්බන්ධයෙන් විවිධ ක්‍රියාදාම පිළිබඳ තක්සේරුවක් ද ඇතුළත් කරයි.

හානිකරණ අලාභ සහ මුදාහැරීම් මූල්‍ය වත්කමේ දළ ධරණ අගයේ ගැලපීමක් ලෙස ගණනය කරන වෙනස්කිරීමේ අලාභ හෝ ලාභ සඳහා ගණනය කර වෙන වෙනම අනාවරණය කෙරේ.

2.4.12.10.2.4අපේක්ෂිත ණය හානි (ECL) ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සංක්ෂිප්තව පහත දැක්වේ.

අදියර 1 මාස12අපේක්ෂිතණයහානි(12mECL) ජීව කාලයක පුරා ඇති අපේක්ෂිත ණය හානි (LTECLs) වල කොටසක් ලෙස ගණනය කරන අතර එමගින්

අපේක්ෂිත ණය හානි (ECLs) නියෝජනය වෙයි. මෙම ගණනය කිරීම වාර්තා කරන දිනයෙන් පසු මාස 12 ක් ඇතුලත මූල්‍ය උපකරණයක් මත වියහැකි පැහැර හැරීම් අවස්ථාවක් නිසා ඇතිවන ප්‍රතිඵලයකි. වාර්තාකරන දිනයෙන් පසු මාස 12 ක කාලයක දී සිදුවන පැහැර හැරීමක් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (LKAS) යටතේ මාස 12 ණය හානි දීමනාව බැංකුව ගණනය කරයි. ප්‍රාරම්භක සවිල පොලී අනුපාතයට (EIR) ආසන්නව වට්ටම්වන අපේක්ෂිත පාඩු සිදුවන පැහැර හැරීමක් (LGD) ගුණකර අපේක්ෂිත මාස 12 හෝ වියහැකි පැහැරහැරීම් පුරෝකථනය කරන ලද නිරාවරණයක දී (EAD) සඳහා යොදා ගනී. ඉහත විස්තර කළ පරිදි මෙම ගණනය කිරීම් සෑම අවස්ථා හතරක් සඳහාම සිදුකරයි.

අදියර 2 ආරම්භයේ පටන් ණය මුදලක ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් පෙන්වා තිබේනම් ජීව කාලය පුරා ඇති අපේක්ෂිත ණය හානි (LTECLs) සඳහා බැංකුව දීමනාවක් වාර්තා කරයි. විවිධ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම ඇතුලත්ව ක්‍රියාකාරිත්වය ඉහත විස්තර කරන ලද දේ හා සමාන වෙයි. නමුත් PDs හා LGDs උපකරණයක ජීව කාලය පුරා ඇස්තමේන්තු කරනු ලබයි. සවිල පොලී අනුපාතයට ආසන්න අගයක් මත අපේක්ෂිත, මුදල් හිඟවීම් වට්ටම් කරයි.

අදියර 3 ණය හානිකරණයවී ඇතැයි සලකන ණය සඳහා බැංකු ජීව කාලය පුරා අපේක්ෂිත ණය හානි අලාභ බැංකුව හඳුනා ගනී. 100% ලෙස PDතබා ඇති අදියර 2 වත්කම් සඳහා ද ක්‍රමවේදය සමාන වෙයි.

POCI මූලික හඳුනාගැනීමේ දී ණය හානිකරණයවී ඇති මූල්‍ය වත්කම් POCI වත්කම්වේ. ණය ගලපන ලද සවිල පොලී අනුපාතය මගින් වට්ටම් කරන ලද වියහැකි බව මත බර තැබූ අවස්ථා හතර පදනම්ව ආරම්භක හඳුනාගැනීමේ සිට ජීව කාලය පුරා ඇති ECLs සඳහා අවසාන වෙනස්වීම් පමණක් බැංකුව හඳුනාගනී.

2.4.12.11. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ සාධාරණ අගයේ පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මෙම මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු නොකරයි. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේනම් ඇතිවිය හැකි දීමනාවට සමාන මුදලක් ආදායම් ප්‍රකාශනයට අනුරූප අයකිරීමක් සමඟ සමුච්චිත හානිකරණ ප්‍රමාණයක් ලෙස අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සමුච්චිත අලාභ වත්කම හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභයට ප්‍රතිවක්‍රිය කෙරේ.

2.4.12.12. මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් (POCI)

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් සඳහා, අලාභ දීමනාව තුළ මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනා ගනී.

2.4.12.13. ඉදිරිය දකින තොරතුරු

අපේක්ෂිත ණය අලාභ ආදර්ශය තුළ, පහත කරුණු වැනි ආර්ථික යෙදවුම් ලෙස ඉදිරිය දකින තොරතුරු පිළිබඳ පුළුල් පරාසයක් මත බැංකුව විශ්වාසය තබයි:

- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොලී අනුපාත
- විනිමය අනුපාතය
- විරැකියා අනුපාත

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සහ ආදර්ශ මූල්‍ය ප්‍රකාශනවල දිනයට වෙළෙඳපොලේ සියලුම ගතිලක්ෂණ සෑමවිටම ග්‍රහනය කර නොගනී. මෙය පිළිබිඹු කිරීම සඳහා, එවැනි වෙනස්වීම් සැලකියයුතු ලෙස වැදගත් වන අවස්ථාවේ ගුණාත්මක ගැලපීම් හෝ ආවරණ තාවකාලික ගැලපීම් ලෙස අවස්ථානුකූලව සිදු කෙරේ. එමනිසා, බැංකුව පහත සඳහන් ගුණාත්මක සාධක සැලකිල්ලට ගනී.

- සාමාන්‍ය LTV
- රජයේ ප්‍රතිපත්ති
- ක්ෂේත්‍රයේ ව්‍යාපාරයේ තත්ත්වය
- නියාමන බලපෑම

2.4.12.14.ඇප තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් මත ණය අවදානම් අවම කිරීම සඳහා, හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප භාවිතා කිරීමට උත්සාහ දරයි. ඇප මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇප, නිශ්චල දේපල, ලැබීම්, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය වර්ධනයන් වැනි විවිධ ආකාරයේ ස්වරූපයක් ගනී. SLFRS 9 යටතේ බැංකුව එහි ණයදීමේ වැඩපිළිවෙල තුළින් පවරාගන්නා ඇප සඳහා බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියයි.

2.4.12.15. නැවත අත්කරගත් ඇප

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුළ පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ නැවත අත්කරගත් වත්කමක් එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වඩා හොඳින් භාවිතා කළ හැකිය යන්න හෝ විකිණිය යුතුය යන්න තීරණය කිරීමයි. එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත්යයි තීරණය කළ වත්කම් ඒවා නැවත අත්කරගත් වටිනාකම හෝ මුල් සුරැකුම් වත්කමේ ධාරණ අගය යන දෙකින් අඩු අගයට ඒවාට අදාළ වත්කම් වර්ගීකරණයට මාරු කෙරේ. විකිණීම වඩාත් හොඳ විකල්පයක් වන බවට තීරණය කරනු ලබන වත්කම් ඒවායේ සාධාරණ අගයට (මූල්‍ය වත්කම්නම්) සහ බැංකුවේ ප්‍රතිපත්තියට සමගාමීව නැවත අත්කර ගත් දිනයට මූල්‍ය නොවන වත්කම් සඳහා විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගයට අලෙවිය සඳහා තබා ඇති වත්කම්වලට මාරු කරනු ලබයි.

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර රටාවට අනුව, බැංකුව එහි පාරිභෝගික කළඹ තුළ දේපළ හෝ අනෙකුත් වත්කම් භෞතිකව නැවත අත්කර නොගන්නා නමුත් පොදුවේ වෙන්දේසියකදී හිඟ ණය නිරවුල් කිරීමට අරමුදල් අයකර ගැනීමට බාහිර නියෝජිතයින් සේවයේ යොදවනු ලබයි. යම් අතිරික්ත අරමුදල් ගනුදෙනුකරුවන්ට/ වගකිවයුත්තන්ට ආපසු ගෙවනු ලැබේ. මෙම ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් ලෙස, නෛතිකව නැවත අත්කරගැනීමේ ක්‍රියාවලීන් යටතේ නේවාසික දේපළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා නොකෙරේ.

2.4.12.16. ලියාහැරීම්

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුළ පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුව අයකරගැනීමේ කාර්යය නවතා ඇති අවස්ථාවේදී පමණක් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම මූල්‍ය වත්කම් ලියා හරිනු ලබයි. ලියාහරිනු ලබන මුදල සමුච්චිත අලාභ දීමනාවට වඩා ඉහළ නම්, දළ ධාරණ අගයට අනුව යොදා ගනු ලබන දීමනාවට එකතු කිරීමක් ලෙස වෙනස පළමුව සලකනු ලැබේ. යම් පසුකාලීන අයකර ගැනීම් ණය අලාභ වියදමට බැර කෙරේ.

2.4.13. වාර්තාකරන කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරන කාලසීමාවෙන් පසු සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර, සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සිදු කෙරේ. කොවිඩ් 19 වසංගතයේ තුන්වන රැල්ල හේතුවෙන් පුද්ගලයින් සහ ව්‍යාපාර මුහුණදුන් අභියෝගයන්ට මුහුණදීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 අංක 5 දරණ චක්‍රලේඛය 2021 මැයි මාසයේ දී නිකුත් කරන ලදී. 2021 අංක 08 දරණ චක්‍රලේඛය මගින් 2021 සැප්තැම්බර් මාසයේ දී එය තවදුරටත් දීර්ඝ කරන ලදී. ඒ අනුව දැනටමත් බැංකුව 2021 මැයි මාසයේ දී සහන ලබා දී ඇති අතර දැනට බැංකුව විසින් දීර්ඝ සහන ක්‍රියාමාර්ග සඳහා සුදුසු ණය ගැනුම්කරුවන් විසින් යොමු කරන ලද ඉල්ලීම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක නිරතවී සිටියි.

මූල්‍ය සේවා මත වැට් බදු වෙනස්වීම
2022 ජනවාරි 7 වෙනි දින නිකුත් කරන ලද රජයේ පනත් කෙටුම් පතේ ප්‍රතිපාදන අනුව මූල්‍ය සේවා මත වැට් බදු වැඩි කිරීමට යෝජනා කර ඇත.

නව අක්‍රීය ණය අනුපාත නියෝගය
2022 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය පහසුකම් සඳහා වර්ගීකරණය හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව නියෝග මාලාවක් නිකුත් කර ඇත. අක්‍රිය ණය වර්ගීකරණය සඳහා අවිනිශ්චිත පොලී ඉවත් කිරීම SLFRS 9 අදියරේ වර්ගීකරණ යොදා ගැනීම, හරස් පැහැර හැරීමේ නීති, අදියර 01 ණය සඳහා ලබා දිය යුතු ණය ප්‍රතිපාදන අනුපාතය සහ විවිධ අදිරය යටතේ මූල්‍ය වත්කම් සංචලනය කිරීමේ නව නීති ආදිය වේ. කෙසේ වෙතත් 2022 ජනවාරි මස 01 දිනෙන් පසුව අක්‍රිය ණය ලෙස සලකන ණය සඳහා නව නියෝගය බලපැවැත්වෙන අතර පෙර නිකුත්කර තිබූ නියෝගය යටතේ වර්ගීකරණය කර ඇති පැරණි ණය ගෙවා නිමකරන තුරු එලෙසම පවතී.

2.4.14. රජය හා රජයට අදාළ ආයතන සමඟ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

LKAS 24 හි 32 පරිච්ඡේදය යටතේ අනාවරණයෙන් නිදහස්වීම බැංකුව තෝරාගෙන නැත

2.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම්

2.5.1. පොලී ආදායම

පොළී ආදායම් විස්තර සටහනක් අංක 3 හි දක්වා ඇත.

2.5.2. පොළිය සහ සමාන ආදායම

බැංකුව ණය හානිකරණ වත්කම් හැර මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයට වලදායි පොළී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කරමින් පොළී ආදායම ගණනය කරනු ලබයි. මූල්‍ය වත්කමක් ණය හානිකරණ බවට පත්වන සහ එමනිසාම අදියර 3 ලෙස සලකන අවස්ථාවක, මූල්‍ය වත්කමේ ශුද්ධ ක්‍රමක්ෂය පිරිවැයට වලදායි පොළී අනුපාත (EIR) ක්‍රමය යොදා ගනිමින් බැංකුව පොළී ආදායම ගණනය කරනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී අනිවාර්යයෙන් මැනීමට අවශ්‍ය සියලුම වෙළඳ

වත්කම් සහ මූල්‍ය වත්කම් මත පොළී ආදායම පිළිවෙලින් ශුද්ධ වෙළෙඳ ආදායම සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ / (අලාභ) තුළ ගිවිසුම්ගත පොළිය භාවිතයෙන් හඳුනා ගනී.

2.5.3. ගාස්තු සහ කොමිස් ආදායම

කොමිස් ආදායම හා වියදම පිළිබඳ විස්තර සටහන් අංක 5 හි දක්වා ඇත.

2.6. 2020 දෙසැම්බර් 31. දින සිට තවමත් බලාත්මක නොවූ නිකුත්කල ප්‍රමිති

2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකව තිබූ පවතින පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සඳහාවූ සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මත සැලකිය යුතු බලපෑමක් ඇතිකර නොතිබිණි.

2.6.1. 2020.01.01. දින සිට බලපැවැත්වෙන පරිදි LKAS 1 සහ LKAS 8 සඳහා සංශෝධන

2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන දැනට ක්‍රියාත්මක වන පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතීන්ට සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර නොතිබිණි. නිර්වචනයේ කිසියම් පැතිකඩක් තහවුරු කිරීමට හා ප්‍රමිතිය හරහා ප්‍රමාණාත්මකභාවයේ නිර්වචනය පෙලගැස්වීමට LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ LKAS 8 ගිණුම්කරණ ප්‍රමිති ගිණුම්කරණ ඇස්තමේන්තු හා දෝෂ වෙනස්වීම් වල ප්‍රමාණාත්මක සංශෝධනයක් සිදුකරයි. තොරතුරු ප්‍රමාණාත්මකවන අතර මග හැරීම් හෝ සැගවීම් විශේෂිත වාර්තාකරණ ආයතනයක් පිළිබඳ මූල්‍ය තොරතුරු සපයන එම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සාමාන්‍ය අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් විසින් ගනු ලබන තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් එල්ල කිරීම නව අර්ථකථනය මගින් ප්‍රකාශවෙයි. ප්‍රමාණාත්මක වන අර්ථකථනට සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු බලපෑමක් එල්ල කරන බව අපේක්ෂා නොකරයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

03. දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආදායම විශ්වාසදායි ලෙස තක්සේරු කිරීමට හැකිවීම සහ ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒම සිදුවිය හැකි ප්‍රමාණයට දළ ආදායම හඳුනාගනී. ආදායම හඳුනාගැනීමට ප්‍රථම විශේෂිත හඳුනාගැනීම් නිර්ණායකයන් ද සැලකිල්ලට ගතයුතු වෙයි.

	2025 රු.	2024 රු.
පොලී ආදායම	7,120,861,865	7,590,650,416
ගාස්තු සහ කොමිස් ආදායම	379,854,246	172,631,902
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්වලින් ශුද්ධ සාධාරණ අගයේ ලාභ/ (අලාභ	145,788,904	377,996,544
වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම්	48,390,326	31,145,845
දළ ආදායම	**7,694,895,340**	**8,172,424,707**

04. ශුද්ධ පොලී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 2.2.1 හි දක්වා ඇත.

	2025 රු.	2024 රු.
පොලී ආදායම		
බැංකු තැන්පතු (ස්ථාවර + ඉතුරුම් + ගිණුම්)	25,380,956	207,957,256
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්		
ණය සහ අත්තිකාරම්	6,187,346,842	6,073,826,180
ණය සහන කාල ලබාදුන් ණයවල එක් දින බලපෑම	2,345,621	2,507,045
5වැනි කොවිඩ් රැල්ල සඳහා ණය සහන පොලී මත 7%ක විලම්බිත පොලී ආදායම	-	-
අඩුකළා 1,3,4,5 වැනි කොවිඩ් රැල්ලෙන් 7%ක බැංකුව අයකළ ණය සහන	(1,069,129)	(897,949)
ණය සහ වෙනත් උපකරණ	906,857,575	1,307,257,884
මුළු පොලී ආදායම	**7,120,861,865**	**7,590,650,416**
පොලී වියදම		
බැංකුවලට ගෙවිය යුතු	-	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්		
තැන්පතුකරුවන්ට ගෙවිය යුතු	3,869,105,610	5,374,590,961
අනෙකුත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	18,638,724	17,631,243
මුළු පොලී වියදම	**3,887,744,333**	**5,392,222,204**
ශුද්ධ පොලී ආදායම	**3,233,117,532**	**2,198,428,212**
අ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම් වලින් ලද ශුද්ධ ආදායම		
පොලී ආදායම	583,140,270	973,039,690
(අඩු කළා): පොලී වියදම	-	-
ශුද්ධ පොලී ආදායම	**583,140,270**	**973,039,690**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

05. ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

බැංකුව, කාල සීමාව තුළ සිදුකළ සේවාවන් සමූහයකින් ගාස්තු සහ කොමිස් ආදායම උපයා ගනී.

	2025 රු.	2024 රු.
ගාස්තු හා කොමිස් ආදායම	379,854,246	172,631,902
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**379,854,246**	**172,631,902**
ඇතුළත් වේ		
බැංකු සේවා ගාස්තු ණය හා අත්තිකාරම්	355,941,214	160,872,603
නෛතික හා තාක්ෂණ ගාස්තු ණය හා අත්තිකාරම්	17,757,273	5,315,042
වෙනත් අයකිරීම්	6,155,758	6,444,257
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**379,854,246**	**172,631,902**

06. ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණයන්ගේ ශුද්ධ සාධාරණ ලාභය / (අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පොලී ආදායම හැර, "ලාභ හෝ අලාභ තුළින් හඳුනාගත් මූල්‍ය උපකරණ" වෙත සියලුම ලාභ හා අලාභ සහ අදාළ ලාභාංශ ශුද්ධ වෙළඳ ආදායම සඳහා ඇතුළත් වේ.

	2025 රු.	2024 රු.
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා ලාභ	145,788,904	377,996,544
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා අලාභ	-	-
මුළු ගණන	**145,788,904**	**377,996,544**

07. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයේ ගෙවීම් ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු වූ විට, වෙනත් විස්තීර්ණ ආදායමක් තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වලින් උපයන ලාභාංශ හඳුනා ගැනේ.

	2025 රු.	2024 රු.
ලාභාංශ ආදායම	25,020,277	23,070,500
විවිධ ආදායම්	23,370,049	8,075,345
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	**48,390,326**	**31,145,845**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

08. ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු (ප්‍රතිවර්තන)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

"මූල්‍ය උපකරණ" සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 අනුව තක්සේරු කරනු ලබන, සියලු මූල්‍ය උපකරණ සඳහා වන හානිකරණ ප්‍රතිපාදනවල වෙනස්වීම් බැංකුව හඳුනාගෙන ඇත. SLFRS 9 යටතේ සියලු කාණ්ඩවල මූල්‍ය වත්කම් හානිකරණ මැනීම සඳහා විනිශ්චයක් අවශ්‍ය වේ; විශේෂයෙන් හානිකරණ අලාභ හඳුනාගැනීමේදී සහ ණය අවදානම්වල සැලකිය යුතු වර්ධනය තක්සේරු කිරීමේදී ප්‍රමාණය තීරණය කිරීම සහ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සහ ඇපසුරුකුම්වල කාල නිර්ණය කිරීම සඳහා අවශ්‍ය වේ. අදාළ කරගත් විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 16හි විස්තර කොට ඇත.

	2025 රු.	2024 රු.
ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් ණය හා අත්තිකාරම්		
අදියර 1	50,382,606	(25,466,851)
අදියර 2	(30,369,623)	24,889,011
අදියර 3	536,643,994	547,881,282
ක්‍රමක්ෂය පිරිවැයට ඇති අනෙකුත් මූල්‍ය වත්කම්		
අදියර 1	349,171	(6,413,408)
අදියර 2	-	-
අදියර 3	-	-
එකතුව	557,006,149	540,890,034

09. පුද්ගල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

01.නිශ්චිත දායකත්ව සැලසුම්

2023 මූල්‍ය වර්ෂය තුළ බැංකුව මඟින් පහත සඳහන් නිශ්චිත දායකත්ව සැලසුම ක්‍රියාත්මක කරයි. ලබාදුන් දායකත්වය "පුද්ගල වියදම්" යටතේ වියදමක් ලෙස වාර්තා කර ඇත. නොගෙවූ දායකත්වයන් වගකීමක් ලෙස වාර්තා කරයි.

(අ) සේවක අර්ථසාධක අරමුදල

2.4.1 හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය විළිදරව් කර ඇත.

(ආ) සේවක භාරකාර අරමුදල

2.4.1 හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය විළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

කාර්ය මණ්ඩල වියදම්	2025 රු.	2024 රු.
වැටුප් හා ප්‍රසාද දීමනා	1,076,413,049	863,549,970
නිශ්චිත දායකත්ව සැලසුම EPF සහ ETF	148,764,247	145,930,461
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම පාරිතෝෂික ප්‍රතිපාදන	60,486,876	61,445,114
ලබා නොගත් අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම්	38,072,372	38,815,577
අතිකාල සහ සේවකයා දැරූ වියදම් ප්‍රතිපූර්ණය	15,310,082	14,931,001
කාර්ය මණ්ඩල අධ්‍යයන සහ පුහුණු ගෙවීම්	5,312,577	2,248,850
වෛද්‍ය යෝජනා ගෙවීම්	63,861,992	60,086,208
වෛද්‍ය යෝජනා ක්‍රමය ප්‍රතිපාදන (IFRS)	41,839,281	46,672,840
සුභසාධන	8,430,176	5,787,930
රක්ෂණ	317,952	486,579
කාර්ය මණ්ඩල ණයවල පළමු දින වෙනස (IFRS)	(38,002,496)	(33,386,997)
හානිපූරණය	-	872,710
සේවා නියුක්ති ආදායම ඌ.වි.ගෙ බදු	3,455,138	21,702,473
එකතුව	1,424,261,245	**1,229,142,717**

අඩු කළා IFRS ප්‍රතිපාදන

කාර්ය මණ්ඩල ණය එක් දින වෙනස (IFRS)	38,002,496	33,386,997
වෛද්‍ය යෝජනා ක්‍රමය ප්‍රතිපාදන (IFRS)	(41,839,281)	(46,672,840)
සැබෑ එකතුව	**1,420,424,460**	**1,215,856,873**

09.1 දායකත්වය - විශ්‍රාමික කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය

	2025 රු.	2024 රු.
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	**41,839,281**	**46,672,840**

09.2 විශ්‍රාමික කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය බැංකුවේ සියලුම සේවකයින් සඳහා ස්ථාපිත කොට ඇත. 2023 දෙසැම්බර් 31 දින, වෘත්තීය ආයුගණක සමාගමක් වන Actuarial) Management Consultants (Pvt) Ltd හි, සාමාජිකයෙකු වන එම්. පූපාලනාතන් මහතා විසින් ආයුගණක තක්සේරුව සිදුකර ඇත. (සටහන් බලන්න)

දායකත්වය - පාරිතෝෂික	2025 රු.	2024 රු.
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	**60,486,876**	**61,445,114**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

10. වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම සහ දැරූ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හඳුනාගනී. ව්‍යාපාරය පවත්වා ගැනීමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම්, වර්ෂයේ ලාභය ගණනය කිරීම සඳහා ලාභ හා අලාභ ප්‍රකාශය වෙත අයකරනු ලැබේ. පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුව වර්තමාන බැඳීමක් (නෛතික හෝ ව්‍යුහාත්මක) ඇතිවිට වෙනත් වියදම්වලට අදාළ ප්‍රතිපාදන හඳුනාගනී. වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාම අවශ්‍ය වනු අතර, වගකීමේ වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තු පිළියෙල කළ හැකි වේ. දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ක්ෂයවීමේ හා ක්‍රමක්ෂය වියදම්, අනෙකුත් වියදම් වෙන් කොට ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

	2025 රු.	2024 රු.
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	3,910,600	4,017,257
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	9,608,078	11,660,898
වෘත්තිය හා නෛතික වියදම්	11,876,059	8,523,264
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්	189,775,117	185,346,169
ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වියදම්	11,792,593	40,986,467
රථ වාහන නඩත්තු හා ගමන් වියදම්	6,154,652	9,139,958
සාමාන්‍ය වියදම්	19,043,880	23,046,704
වෙනත් අලාභ, බොල් ණය හා ලියා හැරීම්	-	-
ශ්‍රී ලංකා මහ බැංකු තැන්පතු රක්ෂණය	49,055,043	50,198,203
වෙනත් වියදම්	150,271,805	114,489,481
එකතුව	**451,487,828**	**447,408,400**

දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම/ක්‍රමක්ෂය කිරීම

ක්ෂය කිරීම දේපළ, පිරියත සහ උපකරණ	113,393,044	49,185,811
ක්ෂය කල්බදු වත්කම්	83,692,948	77,500,923
	197,085,992	**126,686,733**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

11. බදු වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ප්‍රවර්තන බදු වියදම් බදු අනුපාතය 24% සහ 30%

වර්තන බදු වත්කම් හා වගකීම් සඳහා පසුගිය වසර මෙන්ම මෙම වසර වෙනුවෙන් දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් වෙත ගෙවූ හෝ අයකර ගැනීමට අපේක්ෂිත වටිනාකම් අඩංගු වේ. වටිනාකම් ගණනය කිරීම සඳහා භාවිත කළ බදු අනුපාත හා බදු නීති යනු වාර්තාකරණ දිනයට බලාත්මක කර තිබූ හෝ බලාත්මක කළ ඒවා වේ. ඒ අනුව 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන හා එහි සංශෝධන අනුව, සටහන 2.3 හි නිශ්චිතව දක්වා ඇති අනුපාතවලට බදු අරමුණු සඳහා වෙනස්කළ පරිදි, වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

විලම්බිත බදුකරණය බදු අනුපාතය 30%

වාර්තාකරණ දිනයට මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් බදු පදනම් සහ ඒවායේ රැගෙනයාමේ වටිනාකම අතර තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමවේද භාවිතයෙන් විලම්බිත බදු සපයනු ලැබේ. ප්‍රයෝජනයට ගතහැකි ප්‍රමාණයට එදිරිව බදු අයකළ හැකි ලාභ ප්‍රමාණයට, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්, භාවිත නොකළ ඉදිරියට ගෙන ආ බදු බැර ශේෂ සහ භාවිත නොකළ බදු අලාභ සියල්ල සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගනු ලබයි.

විලම්බිත බදු වත්කමේ කොටසක් හෝ සම්පූර්ණයෙන්ම භාවිතයට ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් තවදුරටත් නොපැවතීමේ ප්‍රමාණයට අඩුකර, විලම්බිත බදු වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම සෑම වර්තාකරණ දිනකදීම සමාලෝචනයට ලක් කරයි. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් සෑම වර්තාකරණ දිනකදීම නැවත තක්සේරු කරන අතර, ඉදිරියේදී තිබිය හැකි බදු අය කළ හැකි ලාභයක් මගින් විලම්බිත බදු වත්කම අයකර ගැනීමට ඉඩ ලබා දීමේ ප්‍රමාණයට හඳුනාගනු ලබයි.

වාර්තාකරණ දිනට පසුව පැනවූ හෝ දැනට පනවා ඇති බදු අනුපාත හා බදු නීති මත පදනම්ව, වත්කම් උපලබ්ධිවනවිට හෝ වගකීම් නිරාකරණය කරනවිට වර්ෂය තුළ දී උපයෝගී කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාත උපයෝගී කරගනිමින් විලම්බිත බදු වත්කම් හා වගකීම් ගණනය කරයි.

2022 වර්ෂයේදී බැංකුවේ සම්මත බදු අනුපාතය 24.0% සිට 30.0% දක්වා වැඩි වූ අතර, අලුතින් ක්‍රියාත්මක කරන ලද 2.5%ක සමාජ ආරක්ෂණ දායක බද්දක් බලාත්මක විය. 2022 ජනවාරි 1 වැනි දින සිට බලාත්මකවන පරිදි මූල්‍ය සේවා මත වැට බද්ද 15.0% සිට 18.0% දක්වා වර්ධනය විය.

	2025 රු.	2024 රු.
ප්‍රවර්තන බදු වියදම්		
ප්‍රවර්තන වර්ෂය	193,604,550	-
විලම්බිත බදු වියදම් (බැර)	181,317,487	125,756,722
එකතුව	**374,922,038**	**125,756,722**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

11.1 බදු වියදම් සැසඳීම

බදු පෙර ලාභය/ (අලාභ)	736,943,391	157,798,019
ඉකුත් කාලයේ ප්‍රවර්තන ආදායම් බදු ගැළපීම්		
එකතු කළ: බදු අරමුණු සඳහා අඩු කළ නොහැකි වියදම්/ආදායම් අඩුකිරීම්වල බදු බලපෑම	679,918,966	952,658,272
අඩු කළ): බදු අරමුණුවලට අඩු කළ හැකි වියදම්වල බදු බලපෑම	(806,278,781)	(804,527,551)
වත්කම් බැහැර කිරීම	10,918,389	5,707,700
ලාභාංශ	25,020,277	23,070,500
බදු සහන සඳහා සුදුසු ගෙවීම් බදු පාඩු	-	-
වර්ෂය සඳහා ගළපන ලද ලාභය	646,522,242	334,706,940
වර්ෂය සඳහා ලාභය මත පදනම් වූ බදු	193,604,550	-
14% ක ලාභාංශ ආදායම මත පදනම් වූ බදු	-	-
විලම්බිත බදුකරණයට/ බදුකරණයෙන් මාරු කිරීම්	181,317,487	125,756,722
පසුගිය වර්ෂයේ (අධි)/ ඌන වෙන්කිරීම්	-	-
කාලපරිච්ඡේදය සඳහා බදු වියදම්	374,922,038	125,756,722

11.2 ආදායම් ප්‍රකාශයේ හා වෙනත් විස්තීර්ණ ආදායම්වල ඇති විලම්බිත බදු (බැර)/ අයකිරීම්වල පහත සඳහන් වෙනස්කම් ඇතුළත්ය

විලම්බිත බදු		
දේපළ, පිරියත හා උපකරණ	(25,388,979)	(21,377,623)
සේවක ප්‍රතිලාභ බැඳීම්	198,996,530	203,336,237
හානිකරණ වෙන් කිරීම්	263,640,054	257,636,159
භාවිතය සඳහා අයිතිය ඇති වත්කම්	(1,546,801)	(1,813,934)
ණය සහන පළමු දින බලපෑම	2,698,537	3,402,223
භාවිතයට නොගත් බදු අලාභ	-	192,452,587
විලම්බිත බදු	438,399,342	633,635,650

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

12. අගය කිරීමේ පදනම් මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය බැංකුව ප්‍රවර්තන වර්ෂය (2025)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය යන මාතෘකා යටතේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය, SLFRS 9 හි " මූල්‍ය උපකරණ"වල අර්ථ දක්වා ඇති පරිදි කාණ්ඩ අනුව මූල්‍ය උපකරණවල ධාරණ වටිනාකම පහත සාරාංශගත කර ඇත.

රු. වලින්	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුළින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	136,854,046	-	-	136,854,046
බැංකු තැන්පතු	925,582,077	-	-	925,582,077
ණය සහ අත්තිකාරම්	48,299,620,423	-	-	48,299,620,423
ණය උපකරණ	694,698,510	-	-	694,698,510
ප්‍රතිමිලදී ගැනීම්	980,814,449	-	-	980,814,449
භාණ්ඩාගාර බිල්පත්	7,200,105,822	-	-	7,200,105,822
භාණ්ඩාගාර බැඳුම්කර	328,794,192	-	-	328,794,192
ඒකක භාර	-	789,027,014	-	789,027,014
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	**58,566,469,518**	**789,027,014**	**5,379,078**	**59,360,875,610**
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	-	-	-	-
මූල්‍ය වගකීම්				
තැම්පතුකරුවන්ට ගෙවිය යුතු	48,856,751,018	-	-	48,856,751,018
වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු	273,638,910	-	-	273,638,910
මුළු මූල්‍ය වගකීම්	**49,130,389,927**	**-**	**-**	**49,130,389,927**

AC - ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්

FVPL - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්/වගකීම්

FVOCI - වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

බැංකුව ඉකුත් වර්ෂය (2024)

රු. වලින්	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුළින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	124,664,750	-	-	124,664,750
බැංකු තැන්පතු	152,682,844	-	-	152,682,844
ණය සහ අත්තිකාරම්	44,666,805,952	-	-	44,666,805,952
ණය උපකරණ	694,208,564	-	-	694,208,564
ප්‍රතිමිලදී ගැනීම්	2,256,431,869	-	-	2,256,431,869
භාණ්ඩාගාර බිල්පත්	5,607,545,953	-	-	5,607,545,953
භාණ්ඩාගාර බැඳුම්කර	422,577,047	-	-	422,577,047
වාණිජ පත්‍රිකා	-	-	-	-
ඒකක භාර	-	2,943,277,961	-	2,943,277,961
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	**53,924,916,979**	**2,943,277,961**	**5,379,078**	**56,873,574,017**
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	-	-	-	-
මූල්‍ය වගකීම්				
තැම්පතුකරුවන්ට ගෙවිය යුතු	48,160,520,558	-	-	48,160,520,558
වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු	140,800,069	-	-	140,800,069
මුළු මූල්‍ය වගකීම්	**48,301,320,627**	**-**	**-**	**48,301,320,627**

13. මුදල් සහ මුදල් සමාන දෑ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මුදල් හා මුදල් සමාන දෑ සඳහා වටිනාකමෙහි නොසැලකිය යුතු වෙනස්වීමේ අවදානමට යටත්වන අතැති මුදල්, බැංකුවල ඇති ශේෂ, ඒක්ෂණ මුදල් සහ කෙටිකාල දැන්වීම් අඩංගු වේ. මුදල් හා මුදල් සමාන දෑ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණ අඩු කර ලබා ගනී. "මූල්‍ය උපකරණ" සඳහා වන SLFRS 9 අනුව බැංකුවල ඇති ශේෂ, ඒක්ෂණ මුදල් සහ කෙටිකාල දැන්වීම් හානිකරණයට යටත් වේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	2025 රු.	2024 රු.
අතැති මුදල්	84,963,933	94,473,374
බැංකුවල ඇති ශේෂ	51,890,113	30,191,375
එකතුව	136,854,046	124,664,750

14. බැංකුවල ඇති තැම්පතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සාධාරණ අගයේ වැඳගත් නොවන මට්ටමේ වෙනස්වීමේ අවදානමකට යටත්වන බැංකුවල ඇති තැම්පතු සඳහා, තැම්පත්කර ඇති කෙටිකාලීන තැම්පතු අඩංගුවන අතර, කෙටිකාලීන බැඳීම් කළමනාකරණය කිරීම සඳහා බැංකුව සහ සමූහය ඒවා යොදා ගනු ලබයි. සුදුසු පරිදි හානිකරණය අඩුකර ඒවා මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රකාශිත අගයට හෝ දළ වටිනාකමට වාර්තා කරනු ලබයි. විශේෂ බැංකුවක බාහිර ශ්‍රේණිගත කිරීම මත පදනම්ව SLFRS 9 හි මූල්‍ය උපකරණවලට අනුව සමූහය විසින් හානිකරණ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි.

14.1

	2025 රු.	2024 රු.
ස්ථාවර තැන්පතු		
ජාතික සංවර්ධන බැංකුව	445,141,644	-
සෙලාන් බැංකුව	126,936,644	-
සණස සංවර්ධන බැංකුව	-	-
ලංකා බැංකුව	-	-
ඒක්ෂණ තැම්පතු		
ලංකා බැංකුව	-	-
ඉතුරුම් ගිණුම් ආයෝජන		
සණස සංවර්ධන බැංකුව	101,307,576	1,252,059
ජාතික සංවර්ධන බැංකුව	1,436,261	1,360,802
සම්පත් බැංකුව	25,017	25,358
මුස්ලිම් වාණිජ තැම්පතු	251,096,845	150,056,610
දළ එකතුව	925,943,987	152,694,828

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

14.2

	2025 රු.	2024 රු.
අදියර 1		
2025.01.01 දිනට ආරම්භක ශේෂය	11,983	8,084,817
ආදායම් ප්‍රකාශනයට අයකිරීම්/ (ආපසු ලිවීම්)	349,926	(8,072,834)
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2025.12.31 දිනට අවසාන ශේෂය	361,910	11,983
අදියර 2		
2025.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම්/ (ආපසු ලිවීම්)	-	-
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2025.12.31 දිනට අවසාන ශේෂය	-	-
අදියර 3		
2025.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම්/ (ආපසු ලිවීම්)	-	-
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2025.12.31 දිනට අවසාන ශේෂය	-	-
ඇ. බැංකුවල ඇති ශුද්ධ තැම්පතු	925,582,077	152,682,844

15. ලාභ හෝ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්

	2025 රු.	2024 රු.
ඒකක භාර (NDB)	789,027,014	2,943,277,961
එකතුව	789,027,014	2,943,277,961

අ. විශ්ලේෂණය

	2025 රු.	2024 රු.
ඇප අනුව වර්ග කිරීම		
සුරැකුම් ලෙස තබා ඇති ඇප	-	-
බැඳීම් රහිත දේපළ	789,027,014	2,943,277,961
දළ එකතුව	789,027,014	2,943,277,961

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

16. ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් ණය හා අත්තිකාරම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ණය සහ අත්තිකාරම් සඳහා සක්‍රීය වෙළඳ පොළක සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇතුළත් වන අතර, වහාම හෝ නුදුරු කාලීනව විකිණීම සඳහා අදහස් කරන දෑ ඇතුළත් නොවේ. ඇතැම් වත්කම් මූලික හඳුනාගැනීමේදී ලාභ අලාභ තුළින් සාධාරණ අගයට නම් කරන අතර අනෙකුත් වත්කම් මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වලට නම් කරයි. ණය පිරිහීම හේතුවෙන් හැර, එම අයිතමය එහි මූලික ආයෝජන සියල්ලම සැලකිය යුතු ලෙස ආපසු අයකරගත නොහැක.

16.1

	2025 රු.	2024 රු.
දළ ණය හා අත්තිකාරම්	48,308,615,547	44,678,146,696
අදියර 1	25,507,379,483	24,538,845,298
අදියර 2	4,821,871,715	5,401,181,793
අදියර 3	17,979,364,348	14,738,119,605
(අඩු කළ): සමුච්චිත හානිකරණය	3,493,438,349	2,936,781,371
අදියර 1	453,051,692	402,669,086
අදියර 2	425,748,489	456,118,112
අදියර 3	2,614,638,167	2,077,994,173
ශුද්ධ ණය හා අත්තිකාරම්	44,815,177,198	41,741,365,325
අඩු කළ ණය සහන කාල ලබාදුන් ණයවල එක් දින බලපෑම	8,995,124	11,340,744
ධාරණ අගයට ණය හා අත්තිකාරම්	44,806,182,075	41,730,024,581

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

16.2 විශ්ලේෂණය

	2025 රු.	2024 රු.
නිෂ්පාදන අනුව		
උකස්	10,017,147,847	9,969,290,283
සේ.අ.අ	18,586,862,912	13,938,716,138
රථවාහන	-	-
කාර්ය මණ්ඩල ණය	1,047,933,967	1,061,427,985
පුද්ගල ණය	16,124,835,953	17,669,137,783
වෙනත්	2,858,432,857	2,404,174,993
අඩුකළා		
පළමු දින වෙනස සඳහා දීමනාව කාර්ය මණ්ඩල ණය	(326,597,990)	(364,600,486)
දළ එකතුව	**48,308,615,547**	**44,678,146,696**
ඇප සුරැකුම් අනුව		
සුරැකුම් ලෙස රඳවාගත් ඇප	58,652,361,384	23,908,006,421
අනෙකුත් ණය වැඩි කිරීම	(10,343,745,837)	20,770,140,275
දළ එකතුව	**48,308,615,547**	**44,678,146,696**

16.3 වර්ෂය තුළ හානිකරණයේ සංචලනය

අරමුණුගත සාක්ෂි පවතින විට හානිකරණ අලාභයක් දැරීමට වන අවස්ථාවේදී, වත්කමේ ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් අතර වෙනස මත පදනම්ව අලාභයේ ප්‍රමාණය ගණනය කරන අතර, වත්කමේ ධාරණ අගය අඩුකර වෙන්කිරීම් ගිණුමකට අයකරමින්, අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගනී.

ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම, මූල්‍ය වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරනු ලබයි. ඇපකර මූල්‍ය වත්කම්වල තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහවල වර්තමාන අගය ගණනය කිරීමේදී විකිණීමට ඇති වටිනාකම්වල මූල්‍ය ප්‍රවාහයෙන් පෙර වර්ෂවල පිරිවැයෙන් අඩු කළ ප්‍රමාණය සැලකිල්ලට ගනු ලබයි.

අ. සාමූහික හානිකරණ තක්සේරුව

වෙන්වෙන් වශයෙන් තක්සේරුකළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණයවීමට අරමුණුගත සාක්ෂි නොපවතින බව බැංකුව තීරණය කරන්නේ නම්, වත්කමේ නිෂ්පාදන ලක්ෂණවල සමජාතීය බව මත පදනම්ව තක්සේරු කිරීම් සිදු කරනු ලබයි. ඊට අමතරව සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සාමූහිකව හානිකරණ සඳහා ඇගයීමට ලක් කෙරේ.

ආ. හානිකරණවල තනි තක්සේරුකරණය

ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ගෙන යන මූල්‍ය වත්කම් (බැංකුවලින් ලැබිය යුතු මුදල්, ණය සහ ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් මෙන්ම මූල්‍ය වත්කම්වලට ක්‍රමක්ෂය පිරිවැය ණය සහ වෙනත් උපකරණ වැනි) සඳහා බැංකුව පළමුවෙන් හානිකරණවල විෂයබද්ධ සාක්ෂි පවතින්නේද යන්න තනි වැදගත්කමක් ඇති මූල්‍ය වත්කම් සඳහා තනිව තක්සේරු කරන අතර, තනි වැදගත්කමක් නොමැති මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පිළිබඳ විෂයබද්ධ සාක්ෂි නොමැති බව බැංකුව තීරණය කරන්නේ නම්, වත්කම් ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක දක්වනු ලබන අතර හානිකරණ සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. හානිකරණ අලාභ හඳුනාගෙන ඇති හෝ

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

නිරන්තරයෙන් හඳුනාගැනෙන හානිකරණ සඳහා තනි තනිව තක්සේරු කරන ලද වත්කම්, සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ. හානිකරණ අලාභ සිදු වී ඇති බවට විෂයමූලික සාක්ෂි පවතී නම්, අලාභ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම්වල ධාරණ වටිනාකම් සහ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහ අතර වෙනස්කම අනුවය (තවමත් නොදැරෑ ඉදිරියේදී අපේක්ෂිත ණය අලාභ හැර). හානිකරණ ප්‍රතිපාදන ගිණුමෙන් වත්කම්වල ධාරණ වටිනාකම අඩු වන අතර, අලාභ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. හානිකරණ මැනීමේ අරමුණු සඳහා ඉදිරි මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට භාවිත කරන පොලී අනුපාත අනුව රැගෙන යන මුදල මත පොලී ආදායම අබණ්ඩව උපචිත වේ. පොලී ආදායම "පොලී සහ සමාන ආදායම"හි කොටසක් ලෙස වාර්තා කරනු ලබයි. තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ.

ණයක් සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ඇත්නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ වත්මන් සඵල පොලී අනුපාතය වේ. බැංකුව විසින් ණය සහ ලැබිය යුතු දේ වෙත වෙළඳ වත්කම් නැවත වර්ගීකරණය කර ඇත්නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම සඳහා වන වට්ටම් අනුපාතය වනුයේ නැවත වර්ගීකරණ දිනයේ දී තීරණය කරනු ලබන නව සඵල පොලී අනුපාතය වේ. ඇපකරගත මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය ගණනය කිරීම මඟින්, පෙරවරණ සම්භාවිතාවක් තිබුණත් නැතත්, ඇපකරය ලබා ගැනීම සහ විකිණීම සඳහා පිරිවැය අඩුකළ පෙර වරණවලින් මූල්‍ය ප්‍රවාහයන් පිළිබිඹු කරයි. අනාගත ප්‍රතිසාධනය පිළිබඳ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සහ සියලු ඇපකර සාක්ෂාත් කර ඇති විට හෝ බැංකුව වෙත මාරු කර ඇති විට, අදාළ දීමනාව සමඟ ණය කපා හරිනු ලැබේ. පසු වසරක දී, හානිකරණ හඳුනා ගැනීමෙන් පසු සිදු වූ සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තුගත හානිකරණ අලාභයේ ප්‍රමාණය වැඩි වී හෝ අඩු වී ඇත්නම්, දීමනා ගිණුම ගැළපීමෙන් කලින් හඳුනාගත් හානිකරණ අලාභ වැඩි හෝ අඩු කරනු ලැබේ. ලියා හැරීමක් පසුව අයකරගනු ලැබුවහොත්, ආපසු අයකර ගැනීම "ණය අලාභ වියදම" වෙත බැර කෙරේ.

ණය සහ අත්තිකාරම් ලියාහැරීම

SLFRS 9 යටතේ කපා හැරීම සඳහා වන බැංකු ගිණුම්කරණ ප්‍රතිපත්තිය SLKAS 39 යටතේ පැවති ආකාරයටම පවතී. යථා තත්ත්වයට පත් වීමේ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සාමාන්‍යයෙන් ණය (සහ අදාළ හානිකරණ දීමනා ගිණුම්) අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ලියා හරිනු ලබන අතර ගෙවිය යුතු මුදල් අයකර ගැනීමේ දී ගත හැකි සියලු පියවර අවසන් වී ඇත. ණය සුරක්ෂිත කර ඇති විට, මෙය සාමාන්‍යයෙන් සිදුවන්නේ සුරැකුම සාක්ෂාත් කර ගැනීමෙන් ලැබෙන යම් ආදායමක් ලැබීමෙන් පසුවය. ලියා හැරිය යුතු මුදල, සමුච්චිත අලාභ දීමනාවට වඩා වැඩි නම්, වෙනස මුලින්ම සලකනු ලබන්නේ දීමනාවට එකතු කිරීමක් ලෙසය, පසුව එය දළ ධාරණ අගයට යොදනු ලැබේ. ලියා හැරීමක් පසුව අයකර ගනු ලැබුවහොත්, ප්‍රතිසාධනය "වෙනත් මෙහෙයුම් ආදායමට" බැර කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	2025 රු.	2024 රු.
අදියර 1		
2025.01.01 දිනට ආරම්භක ශේෂය	402,669,086	462,950,878
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	50,382,606	(34,814,940)
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
2025.12.31 දිනට අවසාන ශේෂය	453,051,692	402,669,086
අදියර 2		
2025.01.01 දිනට ආරම්භක ශේෂය	456,118,112	264,086,290
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	(30,369,623)	167,142,810
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
2025.12.31 දිනට අවසාන ශේෂය	425,748,489	456,118,112
අදියර 3		
2025.01.01 දිනට ආරම්භක ශේෂය	2,077,994,173	1,106,186,214
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	536,643,994	423,926,677
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
2025.12.31 දිනට අවසාන ශේෂය	2,614,638,167	2,077,994,173
එකතුව	3,493,438,349	2,936,781,371

17. මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ණය සහ අනෙකුත් උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ක්‍රමක්ෂය වියදම් සහිත මූල්‍ය වත්කම් ණය සහ අනෙකුත් උපකරණ යනු, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීමක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර, ඒවා කල්පිරීම දක්වා රඳවා ගැනීමට බැංකුවට අභිප්‍රාය සහ හැකියාව ඇත. මූලික ඇගයීමෙන් පසු ක්‍රමක්ෂය පිරිවැය ණය සහ වෙනත් උපකරණවල මූල්‍ය වත්කම, පසුව හානිකරණවලින් අඩු කළ, සවිල පොලී අනුපාත භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. සවිල පොලී අනුපාතයේ වැදගත් කොටසක්වන ගාස්තු හා අත්පත් කර ගැනීමේ දී කිසියම් වට්ටමක් වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයේ "පොලී සහ සමාන ආදායම්" තුළ හානිකරණ ගාස්තු ඇතුළත් වේ. හානිකරණ ගාස්තු යටතේ එවැනි ආයෝජන හෝ හානිකරණයෙන් පැන නගින අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

	2025 රු.	2024 රු.
භාණ්ඩාගාර බිල්පත්	7,200,105,822	5,607,545,953
භාණ්ඩාගාර බැඳුම්කර	328,794,192	422,577,047
ණයකර	694,698,510	694,208,564
ප්‍රති විකුණුම්	980,814,449	2,256,431,869
වාණිජ පත්‍රිකා	-	-
දළ එකතුව	9,204,412,972	8,980,763,433

17.1 විශ්ලේෂණය

ඇප අනුව වර්ගීකරණය		
ඇප ලෙස හිලවිකළ	-	-
බැඳීම් නොමැති	9,204,412,972	8,980,763,433
දළ එකතුව	9,204,412,972	8,980,763,433

17.2 අදියර 3

2025.01.01 දිනට ආරම්භක ශේෂය	1,659,425	-
ආදායම් ප්‍රකාශය වෙත අයකිරීම/(ආපසු ලිවීම)	(755)	1,659,425
වර්ෂය තුළ කපා හැරීම	-	-
වෙනත් වෙනස්වීම්	-	-
2025.12.31 දිනට අවසන් ශේෂය	1,658,670	1,659,425
ඇ. ශුද්ධ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට	9,202,754,302	8,979,104,008

18. අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් විස්තීර්ණ අදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් යටතේ ස්කන්ධ හා ණය සුරුකුම් වර්ගීකරණය කරනු ලබයි. අනෙකුත් විස්තීර්ණ අදායම තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කරනු ලබන ස්කන්ධ ආයෝජන යනු උපායමාර්ගික ආයෝජන ලෙස රඳවාගත් දෑය. මෙම කාණ්ඩයේ ණය සුරුකුම්පත් අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා ගැනීමට අදහස් කරන දෑ වන අතර ද්‍රවශීලතාවේ අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳ පොළ තත්ත්වයන්වල වෙනස්කම් සඳහා ප්‍රතිචාර වශයෙන් අලෙවි කළ හැකිය.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

වෙනත් විස්තීරණ ආදායම තුළින් ස්කන්ධ සාධන පත්‍ර සාධාරණ වටිනාකම

බැංකුව විසින් "මූල්‍ය උපකරණ: ඉදිරිපත් කිරීම" මත SLKAS 32 යටතේ කොටස් අර්ථ දැක්වීම සපුරාලන විට සහ වෙළඳාම සඳහා රඳවා නොගන්නා විට වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම යටතේ ඇතැම් ස්කන්ධ ආයෝජන වර්ගීකරණය කළ යුතුය. එවැනි වර්ගීකරණ උපකරණ උපකරණ පදනම යටතේ සිදු කරනු ලබයි.

වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම්

	2025 රු.	2024 රු.
ලැයිස්තුගත නොකළ කොටස්		
ණය තොරතුරු කාර්යාංශය	4,754,078	4,754,078
ෆිච් ශ්‍රේණිගත කිරීම්	625,000	625,000
දළ එකතුව	5,379,078	5,379,078

අ. විශ්ලේෂණය

ඇප අනුව වර්ගකිරීම		
ඇප ලෙස හිලව්කළ	-	-
බැඳීම් නොමැති	5,379,078	5,379,078
දළ එකතුව	5,379,078	5,379,078

19. දේපළ, පිරියත සහ උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනා ගැනීමේ පදනම

වත්කම සමඟ තිබියහැකි අනාගත ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් සහ වත්කම් පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ලබයි. වත්කම් අත්පත්කර ගැනීම සඳහා සෘජුවම අදාළ කර ගත හැකි පිරිවැය ඇතුළත්ව දේපළ, පිරියත සහ උපකරණ මූලිකව පිරිවැයට ගණනය කරනු ලබයි.

තක්සේරුකරණ පදනම

වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසුවන දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මූලිකවම පිරිවැයට තක්සේරු කරනු ලබයි. වත්කම් අත්පත් කර ගැනීම සහ පසුකාලීන වියදම් සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයංසාදන ලද වත්කම් සඳහා ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය, වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක් සහ අයිතම විසුරුවා හැරීමට සහ ඉවත් කිරීමට සහ ඒවා පිහිටා ඇති සහ ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කර ඇති වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට යන පිරිවැය ඇතුළත් වේ.

පිරිවැය මාදිලිය

බැංකුව සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, කම්හල් සහ උපකරණ සඳහා පිරිවැය ආකෘතිය අදාළ කරන අතර ඒ මත සිදුවන වියදම්වලින් අඩු කළ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ සමඟ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයේ වාර්තා කරයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

19.1

ඇ. දේපළ, පිරියත සහ උපකරණ

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	වෙබ් අඩවි සංවර්ධනය	එකතුව
2025 (ප්‍රවර්ථන වසර පිරිවැය / සාධාරණ අගය 2025.01.01 දිනට ආරම්භක ශේෂය	64,192,754	193,243,906	256,022,389	272,447,506	-	785,906,556
එකතු කිරීම්	-	21,679,293	1,385,792	14,816,755	-	37,881,840
බැහැරකිරීම්	(6,445,000)	(1,744,199)	(11,841,492)	-	-	(20,030,691)
ගැළපීම්	-	-	-	-	-	-
2025.12.31 දිනට අවසාන ශේෂය	57,747,754	213,179,000	245,566,689	287,264,261	-	803,757,704
(අඩු කළ): සමුච්චිත ක්ෂය කිරීම	64,192,754	138,234,185	161,896,008	16,938,623	-	381,261,571
2025.01.01 දිනට ආරම්භක ශේෂය	-	13,287,468	31,990,978	68,114,598	-	113,393,044
වර්ෂය සඳහා අයකිරීම	(6,445,000)	(1,744,199)	(11,841,492)	-	-	(20,030,691)
බැහැරකිරීම්	-	-	-	-	-	-
ගැළපීම්						
2025.12.31 දිනට අවසාන ශේෂය	57,747,754	149,777,455	182,045,494	85,053,221	-	474,623,924
2025.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	63,401,546	63,521,195	202,211,040	-	329,133,780

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	වෙබ් අඩවි සංවර්ධනය	එකතුව
2024 (පෙර වසර) පිරිවැය / සාධාරණ අගය 2024.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	173,707,095	177,334,076	4,395,518	460,000	426,694,943
එකතු කිරීම්	-	21,730,043	85,702,354	267,591,988	-	375,024,385
බැහැරකිරීම් / ගැළපීම්	(6,605,500)	(2,193,231)	(7,014,041)	-	-	(15,812,773)
ගැළපීම්	-	-	-	460,000	(460,000)	-
2024.12.31 දිනට අවසාන ශේෂය	64,192,754	193,243,906	256,022,389	272,447,506	-	785,906,556
(අඩු කළා): සමුච්චිත ක්ෂය කිරීම 2024.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	128,581,991	144,037,784	4,395,518	74,986	347,888,533
වර්ෂය සඳහා අයකිරීම	-	-	-			-
බැහැරකිරීම්	-	11,845,426	24,872,265	12,468,119	-	49,185,810
ගැළපීම්	(6,605,500)	(2,193,231)	(7,014,041)	74,986	(74,986)	(15,812,773)
2024.12.31 දිනට අවසාන ශේෂය	64,192,754	138,234,185	161,896,008	16,938,623	-	381,261,571
2024.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	55,009,721	94,126,381	255,508,882.93	-	404,644,985

19.2 තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණ

තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණ පහත පරිදි වේ.

දෙසැම්බර් 31 දිනට	2025	2024
වාහන	57,747,754	64,192,754
ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ කාර්යාල උපකරණ	112,345,383	93,852,701
පරිගණක උපකරණ	119,473,105	120,030,133
පරිගණක මෘදුකාංග	4,395,518	4,395,518
එකතුව	293,961,760	282,471,106

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

19.3 තාවකාලික අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ

වාර්තාකරණ දිනය වන විට තාවකාලික අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ නොමැත.

19.4 සක්‍රිය භාවිතයෙන් ඉවත් කළ දේපළ, පිරියත සහ උපකරණ

SLFRS 5 ප්‍රකාරව විකිණීමට තබා ඇති විකුණුම් සහ අත්හිටවූ මෙහෙයුම් සඳහා තබා ඇති ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය නොකළ ක්‍රියාකාරී භාවිතයෙන් ඉවත් කළ දේපළ, පිරියත සහ උපකරණ නොතිබුණි.

20. විලම්බිත බදු වත්කම් / (වගකීම්)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

විලම්බිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 11හි එළිදරව් කර ඇත.

	2025 රු.	2024 රු.
2025.01.01 ආරම්භක ශේෂය	633,635,649	745,677,897
අදාළ වසර සඳහා අය කිරීම		
ලාභ/ (අලාභ)	(181,317,487)	(125,756,722)
ලාභ/ (අලාභ) බදු අනුපාතවල වෙනස්කම් මත බලපෑම	-	-
වෙනත් විස්තීර්ණ ආදායම් (30% භාවිත කළ)	(13,918,821)	13,714,474
2025.12.31 දිනට අවසාන ශේෂය	438,399,341	633,635,649

21. වෙනත් වත්කම්

	2025 රු.	2024 රු.
ලිපි ද්‍රව්‍ය තොගය	17,243,076	16,920,483
තැම්පතු හා කලින් ගෙවීම්	8,407,311	3,758,799
කලින් ගෙවූ සේවක ණය	326,597,990	364,600,486
VAT අයවිය යුතු	35,812,671	35,812,671
WHT අයවිය යුතු	180,199,200	164,429,777
SSCL අයවිය යුතු	-	-
ණය සහන පොලිය මත 7% ක ලැබිය යුතු පොලිය	4,242,801	5,311,931
අයවිය යුතු පොලිය ජ්‍යේෂ්ඨ පුරවැසි ස්ථිර තැම්පතු	2,613,012	-
වෙනත්	21,823,496	4,773,358
එකතුව	596,939,555	595,607,504

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

22. බැංකුවලට ගෙවියයුතු

	2025 රු.	2024 රු.
ණය ගැනීම් (අයිරා)	-	-
නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	-	-
එකතුව	-	-

23. ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

තැම්පත්කරුවන්ට ගෙවිය යුතු මුදල් සඳහා තැන්පතු හා කාල තැන්පතු අඩංගු වේ. මූලික හඳුනාගැනීමෙන් බැංකුවලට ගෙවියයුතු පසුව සවිඳ පොලී අනුපාත ක්‍රමය උපයෝගී කරගෙන තැන්පතු, ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරයි. තැන්පතු සඳහා ගෙවූ/ගෙවියයුතු පොලිය පොලී වියදම් යටතේ ආදායම් ප්‍රකාශනයේදී හඳුනාගනු ලබයි.

	2025 රු.	2024 රු.
තැම්පත්කරුවන්ට ගෙවිය යුතු	48,856,751,018	48,160,520,558
නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	-	-
වෙනත් ණයට ගැනීම්	273,638,910	140,800,069
එකතුව	49,130,389,927	48,301,320,627

23.1 තැම්පතුකරුවන්ට ගෙවියයුතු වටිනාකම් විශ්ලේෂණය

	2025 රු.	2024 රු.
නිෂ්පාදන අනුව		
ඉතුරුම් තැම්පතු	3,543,513,557	3,574,326,835
ස්ථාවර තැම්පතු	44,998,097,836	44,319,050,968
වෙනත් තැම්පතු (යෝජනා ක්‍රම)	315,139,625	267,142,754
එකතුව	48,856,751,018	48,160,520,558

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

23.2 වෙනත් ණයට ගැනීම් විශ්ලේෂණය

	2025 රු.	2024 රු.
ප්‍රතිමූල්‍ය ණය	135,563,719	36,788,951
කල්බදු වගකීම්	138,075,190	104,011,119
එකතුව	273,638,910	140,800,069

24. සේවක ප්‍රතිලාභ

ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කරමින් ආයුගණක උපදේශන සමගින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක්වන නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි (PVDBO) වර්තමාන අගය බැංකුව තක්සේරු කරයි.

වට්ටම් කිරීමේ අනුපාතය, අපේක්ෂිත වත්කම් මත ඉපැයීම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතය ආදිය පිළිබඳ උපකල්පනයන් මත මෙම අරමුදලේ ආයුගණක තක්සේරු කිරීම් පදනම්ව ඇත. මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වරූපය හේතුවෙන් එම ඇස්තමේන්තු කිරීම් සැලකියයුතු අවිනිශ්චිතතාවයන්ට ලක් වේ. Actuarial & Management Consultants (Pvt) Ltd විසින් සිදු කරන ලද 2025 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී තක්සේරු වාර්තාව මත පදනම්ව 2025 දෙසැම්බර් 31 දිනට සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබයි.

ආයුගණක විසින් භාවිත කරන ප්‍රධාන උපකල්පනවලට පහත දෑ ඇතුළත් වේ.

	2025	2024
පොලී අනුපාතය	10.00%	11.00%
වැටුප් වැඩිවීමේ අනුපාතය	6% - 7%	6.5% - 8%
විශ්‍රාම ගැනීමේ වයස	55-60 years	55-60 years

පාරිතෝෂික

	2025 රු.	2024 රු.
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම		
වර්ෂයේ ආරම්භක ශේෂය	356,944,160	291,878,533
ප්‍රවර්තන සේවා වියදම	24,041,126	23,500,905
පොලී වියදම	36,445,750	37,944,209
ප්‍රතිලාභ ගෙවීම්	(51,238,315)	(57,161,366)
ආයුගණක (ලාභ)/අලාභ	(30,317,256)	60,781,879
එකතුව	335,875,465	356,944,160

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන අගයේ සංවේදීතාවය විශ්ලේෂණය කිරීම

	2025	2024
වෙනස් වූ උපකල්පන (අනෙකුත් සියලුම උපකල්පන නොවෙනස්ව පවතින විට	PV-DBO (Rs.)	PV-DBO (Rs.)
වට්ටම් අනුපාතයේ සියයට එකක් (+1%) වැඩිවීම	313,741,019	275,457,498
වට්ටම් අනුපාතයේ සියයට එකක් (1%) අඩුවීම	361,016,801	310,420,576
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියට එකක (+1%) වැඩිවීම	362,033,500	312,316,801
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියට එකක (1%) අඩුවීම	312,506,639	273,530,916

2025.12.31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදනයේ කල්පිරීමේ සාරාංශය

වයස් කාණ්ඩය	සේවකයින් ගණන	මුළු මූලික වැටුප (රු.)	මුළු ජීවන වියදම් දීමනාව	ඉදිරි වැඩ කාලයේ සාමාන්‍යය	මුළු ප්‍රතිපාදන (PV-DBO (රු.)
XV: 20 to 24	20	897,040	128,257	1.5	590,195
XV: 25 to 29	25	1,505,440	1,282,572	3.4	3,305,943
XV: 30 to 34	76	5,542,190	4,873,774	8.8	35,230,050
XV: 35 to 39	33	3,426,365	2,116,244	10.2	22,113,792
XV: 40 to 44	61	6,428,415	3,911,845	14.0	59,410,998
XV: 45 to 49	54	7,495,110	3,398,816	16.6	71,522,480
XV: 50 to 54	37	5,329,020	2,372,758	20.3	71,689,656
XV: 55 to 59	24	3,357,185	1,539,086	25.4	72,012,354
එකතුව	330	33,980,765	19,623,352	10.8	335,875,468

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

වෛද්‍යාධාර

	2025 රු.	2024 රු.
වෛද්‍යාධාර සඳහා වෙන්කිරීම		
වර්ෂය ආරම්භයේදී ශේෂය	320,843,296	305,795,690
ප්‍රවර්තන සේවා පිරිවැය	7,600,179	6,919,400
පොලී පිරිවැය	34,239,102	39,753,440
ආයුගණක (ලාභ) / (අලාභ)	(16,078,813)	(15,066,966)
ගෙවූ ප්‍රතිලාභ	(19,157,463)	(16,558,269)
එකතුව	**327,446,301**	**320,843,296**
සේවක ප්‍රතිලාභ වගකීම් එකතුව	**663,321,765**	**677,787,456**

ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය

ප්‍රවර්ගය	+1% වට්ටම් අනුපාතය PV-DBO (රු.)	-1% වට්ටම් අනුපාතය PV-DBO (රු.)
සේවකයින් විශ්‍රාමික වෛද්‍ය ප්‍රතිලාභ (වෛද්‍ය අරමුදල)	263,945,556	326,737,575
එකතුව	**263,945,556**	**326,737,575**

25. වෙනත් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් වගකීම් සඳහා ගාස්තු හා වියදම්, බදු ගෙවිය යුතු නොපැවැරූ ගනුදෙනුකරුවන්ගේ ලැබීම්, නිවාඩු සඳහා මුදල් ගෙවීම් සහ වෙනත් වියදම් ගිණුම්වල සිදුකර ඇති වෙන්කිරීම් ඇතුළත් වේ. වාර්තාකරණ දිනට ගෙවියයුතු ලෙස අපේක්ෂා කරන වටිනාකම් තුළ මෙම වගකීම් වාර්තා කර ඇත.

	2025 රු.	2024 රු.
ගෙවියයුතු බදු	149,679,344	149,578,309
උපචිත වියදම්	222,568,456	160,275,343
වෙනත් වගකීම්	117,115,209	30,667,357
බූදල නැවතගෙවීමේ ණයහිමි	8,452,291	8,452,291
ආන්තික ගිණුම ETF මණ්ඩලය සඳහා SP ණය	1,051,511,498	910,984,285
ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීම් වැසූ ණය මුදල	7,836,005	8,932,884
එකතුව	**1,557,162,803**	**1,268,890,469**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

25.1 බදු ගෙවියයුතු

	2025 රු.	2024 රු.
උපයනවිට ගෙවීම් බදු	20,474,325	10,151,925
WHT ගෙවියයුතු	19,415,093	15,863,435
VAT ගෙවියයුතු	100,330,767	113,691,536
SSCL ගෙවියයුතු	9,459,159	9,871,413
ගෙවියයුතු බදු	**149,679,344**	**149,578,309**
ගෙවියයුතු ආදායම් බදු		
ආරම්භක ශේෂය	-	-
වර්ෂය සඳහා ප්‍රතිපාදන	193,604,550	-
අධි/(ඌන) ප්‍රතිපාදන	-	-
ගෙවූ ආදායම් බදු	-	-
අවසන් ශේෂය	**193,604,550**	-

26. ප්‍රකාශිත ප්‍රාග්ධනය / වෙන් කළ ප්‍රාග්ධනය

	2025 රු.	2024 රු.
බලයලත් ප්‍රාග්ධනය	2,000,000,000	2,000,000,000
දායක ප්‍රාග්ධනය	889,812,899	889,812,899

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ ප්‍රතිපාදන සහ එහි සංශෝධනයන්ට අනුව බලය ලත් ප්‍රාග්ධනය රු. බිලියන 2කි. කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අඥා පනතේ වගන්ති අංක 22 අනුව කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව වෙත 1976 ජනවාරි 1වැනි දිනට ලබා දුන් අත්තිකාරම්වල හිඟ මුදල් වලින් සහභාගීත්ව ප්‍රාග්ධනය සමන්විත වේ. එමෙන්ම කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව යටතේ වන සංචිත සහ 1979 ජනවාරි 01 දිනට ලංකා රාජ්‍ය උකස් බැංකුවට අයත් ණය සංචිතය ද බැංකුවේ ප්‍රාග්ධනයෙන් කොටසක් වෙයි. එය බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය කරන අතර, එවැනි සියලුම මුදල් රජය විසින් බැංකුවේ ප්‍රාග්ධනයට ලැබෙන දායකත්වය ලෙස සලකනු ලැබේ

1979 ජනවාරි 1 දිනට පසුව රජය විසින් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායකත්වයක් ලබා දී ඇති අතර, එම දායකත්වය සහ ඉහත ඡේදයෙන් සඳහන් කරන ලද ප්‍රාග්ධන යෙදවීම් ද ඇතුළු සමස්ථ ප්‍රාග්ධන යෙදවීම 2025 දෙසැම්බර් 31 දිනට රු. 889,812,899ක් විය.

තවද පනතෙහි අදාළ ප්‍රතිපාදනයන්ට අනුව, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, එහි ප්‍රාග්ධන වෙත අමතර දායකත්වයක් ලෙස එවැනි අරමුදලක් කලින් කලට යෙදවීම සිදු කරන අතර රජයෙන් හෝ වෙනත් ප්‍රභවයකින්, ශ්‍රී ලංකා ජනරජයෙන් හෝ ඉන් පිටතින් බැංකුව සුදුසුයි තීරණය කරන පරිදි සිදුකරනු ලබයි. රජය වෙතින් යෙදවූ එවැනි අරමුදල්, ඒකාබද්ධ අරමුදල මත අයකරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

27. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

	2025 රු.	2024 රු.
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	306,650,839	306,650,839
වර්ෂය තුළ මාරු කිරීම්	-	-
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	**306,650,839**	**306,650,839**

28. රඳවාගත් ඉපයීම්

	2025 රු.	2024 රු.
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	3,145,924,725	3,179,896,294
පෙර කාලසීමාවේ ගැළපීම්	835,677	(34,012,426)
අනෙකුත් විස්තරාත්මක ආදායමේ සංචිත මාරු කිරීම	-	-
වර්ෂය සඳහා ලාභය	362,021,354	32,041,296
වෙනත් සංචිත වලට මාරු කිරීම්	-	-
අනෙකුත් විස්තීරණ ආදායම්	32,477,248	(32,000,439)
ගෙවිය යුතු ලාභාංශ බදු	-	-
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	**3,541,259,005**	**3,145,924,725**

පෙර කාල සීමාවේ ගැළපීම්		
ආදායම් බදු ඌන වෙන්කිරීම්	-	15,564,251
2019 වර්ෂයේ දී ජාතිය ගොඩනැගීමේ බදු වියදම්	-	3,603,588
2019 වර්ෂයේ දී ණය ආපසු ගෙවීමේ බදු වියදම්	-	15,591,023
අතිරික්ත වගා රක්ෂණ බදු	-	(746,436)
වත්කම් හා බැරකම් නැවත ප්‍රකාශ කිරීම	835,677	-
එකතුව	**835,677**	**34,012,426**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

29. වෙනත් සංචිත

ඇ. බැංකුව ප්‍රවර්තන වසර (2025) රු.

සංචිතය	2025/01/01 දිනට ආරම්භක ශේෂය	සංචලන/ පැවරීම්	2025/12/31 දිනට අවසාන ශේෂය
පොදු සංචිතය	683,280,000	-	683,280,000
ප්‍රාග්ධන සංචිතය	393,498,004	-	393,498,004
හිමිකම් සුරක්ෂිත අරමුදල	1,031,000	-	1,031,000
එකතුව	1,077,809,004	-	1,077,809,004

29.1

ආ. බැංකුව පෙර වසර (2024) රු.

සංචිතය	2024/01/01 දිනට ආරම්භක ශේෂය	සංචලන/ පැවරීම්	2024/12/31 දිනට අවසාන ශේෂය
පොදු සංචිතය	683,280,000	-	683,280,000
ප්‍රාග්ධන සංචිතය	393,498,004	-	393,498,004
හිමිකම් සුරක්ෂිත අරමුදල	1,031,000	-	1,031,000
එකතුව	1,077,809,004	-	1,077,809,004

30. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 37 හි අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රතිපාදනයන්ගේ නිර්වචනය කර ඇති පරිදි, ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම් කළ නොහැකි හෝ විශ්වාසදායක ලෙස තක්සේරු කළ නොහැකි, අවිනිශ්චිත අනාගත සිදුවීමක් හෝ වර්තමාන බැඳීම්වලින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන, වියහැකි බැඳීම් අසම්භාව්‍ය බැරකම් නම් වේ.

30.1 ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා ඉටුකිරීම පිණිස බැංකුව විවිධ වෙනස්කළ නොහැකි බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්වලට ඇතුළත් වෙයි. මේ සඳහා මූල්‍ය ඇපකර හා ණය දීම සඳහා වෙනත් ආදාන නොකළ බැඳීම් ඇතුළත් වේ.

	2025 රු.	2024 රු.
නිකුත් කර ඇති ඇපකර	-	-
වෙනත් බැඳීම්	392,476,948	305,236,517
එකතුව	392,476,948	305,236,517

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී එහි ගනුදෙනුකරුවන් වෙනුවෙන් විවිධ වූ බැඳීම් ඇති කර ගන්නා අතරම, එය නෛතික රාමුව තුළ එවැනි අසම්භාව්‍ය වගකීම්ද ඇති කර ගනු ලබයි. මෙම ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු අලාභයක් බලාපොරොත්තු නොවනු ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

30.2 බැංකුවට ලැබුණු තක්සේරු කිරීම්

පහත සඳහන් තක්සේරු කිරීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බැංකුව වෙත ලැබී ඇත.

2020/2021 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු වෙනුවෙන් භාවිතා කල තොරතුරු ඉල්ලා ඇති අතර ඒවා නිරාකරණය කිරීම සඳහා සාකච්ඡා සිදු කරමින් පවතී. පහත සඳහන් බදු තක්සේරු තවමත් ගෙවීමට තිබෙන අතර ඒවා ද තවමත් අධිකරණයේ අභියාචනා තත්ත්වයේ පවතින බැවින් ඒවා ද නිරාකරණය කිරීමේ ක්‍රියාවලියට අයත් වේ.

කාලය/බදු වර්ගය	පැමිණිලි අංකය	තක්සේරු අගය	වර්තමාන තත්ත්වය
2018/2019 ආදායම් බදු	0201819002	(5,191,892.28)	අභියාචනා අධිකරණයේ පවතී.

කළමනාකරණ ඇගයීමට අනුව, ඉහත සඳහන් තක්සේරු කිරීම් හේතුවෙන් කිසිදු අමතර බදු වගකීමක් ඇති නොවේ.

31. සම්බන්ධිත පාර්ශව එළිදරවු කිරීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 හි "සම්බන්ධිත පාර්ශව එළිදරව් කිරීම්" යටතේ සම්බන්ධිත පාර්ශව ලෙස අර්ථ දක්වා ඇති සම්බන්ධිත පාර්ශව සමඟ එනම් ශ්‍රී ලංකා රජය, අනුබද්ධ සමාගම්, බැංකුවේ සේවකයින් සඳහාවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් සහ ප්‍රධාන කළමනාකරණයේ නිලධාරීන් (KMP) සමඟ වාණිජ අනුපාතයන්ට අතේ දුරින් පදනම මත සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සිදු කිරීමේදී බැංකුව ගනුදෙනු සිදු කරනු ලබයි. මෙකී ගනුදෙනු සඳහා සාමාන්‍ය ව්‍යාපාරවලදී වාණිජ අනුපාත යටතේ අතේ දුරින් සිදු කරනු ලබන ණයදීමේ ක්‍රියාකාරකම්, ස්ථාපන, ශේෂ පත්‍රයෙන් බැහැර ගනුදෙනු සහ වෙනත් බැංකු සහ මූල්‍ය සේවා සැපයීම ඇතුළත්වන අතර, ප්‍රධාන කළමනාකරණයේ නිලධාරීන් විසින් සිදු කරන ගනුදෙනු සහනදායී මිල ගණන් මත සියලු කාර්ය මණ්ඩල සඳහා ඒකාකාරව අදාළ වන යෝජනා ක්‍රම යටතේ ලබාගෙන ඇත. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

31.1 ශ්‍රී ලංකා රජය (මව්) සමාගම හා රජය මගින් පාලනය කරන ආයතන සමඟ ගනුදෙනු

දෙසැම්බර් 31 දිනට	2025 රු.	2024 රු.
රජයේ සුරැකුම් මත සිදුකළ ආයෝජන	7,528,900,013	6,030,123,000
රජය සහ රජය මගින් පාලනය වන ආයතන වෙත සිදු කළ ආයෝජන	1,266,776,797	694,208,564
නැවත විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	980,814,449	2,256,431,869
රජයෙන් ලැබිය යුතු වෙනත් ලැබීම්	2,613,012	-
එකතුව	**9,779,104,271**	**8,980,763,433**
ගෙවූ බදු		
ආදායම් බදු	-	-
එකතු කළ අගය මත බදු සහ SSCL	152,807,634	152,807,634
එකතුව	**152,807,634**	**152,807,634**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

32. ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමග ගනුදෙනු(KMPs)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 සම්බන්ධිත පාර්ශව හෙළිදරවු කිරීම්වලට අනුව, ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා බැංකුවේ සහ එහි අනුබද්ධිත සහ ආශ්‍රිත ආයතනවල ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය සම්බන්ධයෙන් බලය සහ වගකීම දරන පිරිස අයත් වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සංස්ථාපිත කළමනාකරණ සාමාජිකයින්, ප්‍රධාන සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් ආදිය බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස ලෙසට වර්ගීකරණය කර ඇත.

32.1 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් වෙත සිදුකරන වන්දි ගෙවීම්

	2025 රු.	2024 රු.
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	66,649,255	58,631,193
පශ්චාත් සේවක ප්‍රතිලාභ	24,667,894	17,239,585
එකතුව	91,317,149	75,870,779

32.2

(අ) ප්‍රධාන කළමනාකරණ පිරිස, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් (CFMs) සම්බන්ධ ගනුදෙනු, ගැළපීම් සහ සම්මුතින් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගෙන් පාලනය කරන හා සැලකියයුතු බලපෑමක් ඇති ආයතනය

ආදායම් ප්‍රකාශනය		
ඉපැයූ පොලී (ණය මඟින්)	1,011,331	1,114,524
ගෙවූ පොලී (තැම්පතු සඳහා)	506,508	77,786
33 (අ) හි දක්වා ඇති ගෙවීම්	91,317,149	75,870,779
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය		
වත්කම්		
ණය සහ අත්තිකාරම්	18,720,700	15,560,840
වගකීම්		
තැම්පතු	10,479,316	12,735,423

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

33. කල්බදු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනාගැනීමේ පදනම

කල්බදු ආරම්භක දිනයේ දී (එනම් කල්බදු ගිවිසුමේ සඳහන් කර ඇති දිනයේ දී) භාවිත වත්කම් හිමිකම බැංකුව විසින් හඳුනාගැනේ. ඒවා කල්බදු කාලය තුළ ගෙවීම් කළයුතු කල්බදු ගෙවීම් වල වර්තමාන අගය වේ.

තක්සේරු කිරීමේ පදනම

පිරිවැයෙන් යම්කිසි සමුච්චිත ක්ෂයවීමක් හා හානිකරණ අලාභයක් අඩුකර කල්බදු වගකීම්වල යම්කිසි නැවත තක්සේරු කිරීමක් සඳහා ගළපා භාවිත වත්කම් හිමිකම තක්සේරු කරනු ලබයි. භාවිත වත්කම් හිමිකමේ පිරිවැය සඳහා ලැබූ ඕනෑම දිරි දීමනාවලින් හඳුනාගත් කල්බදු වගකීම් සහ ආරම්භක දිනට හෝ ඊට පෙර සිදුකළ කල්බදු ගෙවීම අඩුකළ විට ලැබෙන අගය ඇතුළත් වේ.

ඵලදායී ආර්ථික ජීව කාලය සහ ක්‍රමක්ෂය

කල්බදු කාලය අවසානයේ දී කල්බදු සඳහා තබා ඇති වත්කම් හිමිකාරිත්වය ලබා ගැනීමට බැංකුවට සැලකිය යුතු ලෙස නිශ්චිත නොවේ නම්, හඳුනාගත් භාවිත වත්කම් හිමිකම, සරල මාර්ග ක්‍රමයට එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය හා කල්බදු කාලයෙන් වඩාත් කෙටි කාලය තුළ දී ක්ෂය කිරීම සිදුකරයි. භාවිත වත්කම් හිමිකම හානිකරණයට යටත්වේ.

33.1 ශේෂ පත්‍රයේ හඳුනාගත් වටිනාකම්

කල්බදුවලට අදාළ පහත වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වේ.

	2025 රු.	2024 රු.
භාවිත වත්කම් හිමිකම		
පිරිවැය		
ආරම්භක ශේෂය	482,599,812	462,443,417
එකතු කිරීම් ගොඩනැගිලි	114,277,812	20,156,395
අවසාන ශේෂය	596,877,624	482,599,812
සමුච්චිත ක්ෂයවීම		
ආරම්භ ශේෂය	383,425,152	305,924,229
වර්ෂය තුළ අයකිරීම්	83,692,948	77,500,923
අවසාන ශේෂය	467,118,099	383,425,152
ශුද්ධ පොත් අගය	129,759,524	99,174,660
කල්බදු වගකීම්		
ආරම්භ ශේෂය	104,011,119	156,957,101
එකතුකිරීම්	112,601,016	18,508,495
අයකළ පොලී	16,956,434	16,940,774
ගෙවීම්	(95,493,378)	(88,395,251)
අවසාන ශේෂය	138,075,190	104,011,119

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

33.2 ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගත් වටිනාකම්

කල්බදුවලට සම්බන්ධ පහත වටිනාකම් ආදායම් ප්‍රකාශනයේ දැක්වෙයි:

	2025 රු.	2024 රු.
භාවිතයට හිමිකම් ඇති වත්කම්වල ක්ෂයවීම් ගාස්තුව		
ගොඩනැගිලි	83,692,948	77,500,923
පොළී වියදම	16,956,434	16,940,774

33.3 පොළී අනුපාතවල අනපේක්ෂිත වෙනස්වීම් හේතුවෙන් ආදායම් ප්‍රකාශවල බලපෑම

	ලාභදායිත්වයට බලපෑම
1%+ අවස්ථාව 01	(152,117)
1% - අවස්ථාව 01	157,117

34. වැටි වියදම් සැසඳුම් කිරීම

	2025 රු.	2024 රු.
බදුවලට පෙර ලාභය /(අලාභය)	1,177,309,792	436,074,620
වර්තමාන කාලසීමාව සඳහා ගැළපීම්		
එකතු කළා: වැටි කාර්යය සඳහා අඩු කළ නොහැකි වියදම්/ආදායම් අඩු කිරීම	1,526,060,343	1,280,583,989
	(116,636,744)	(112,113,442)
වර්ෂය සඳහා ගළපන ලද ලාභය	2,586,733,391	1,604,545,167
වසරේ ලාභය මත පදනම්වූ වැටි	386,400,009	239,683,095
ඉකුත් වසරේ (අධි) /ඌන වෙන් කිරීම්	263,173	5,304,187
කාලසීමාව සඳහා බදු වියදම	386,663,181	244,987,282

ගෙවියයුතු වැටි සැසඳුම් කිරීම

	2025 රු.	2024 රු.
ගෙවියයුතු ආරම්භක වැටි	113,691,536	6,989,869
සිදුකළ ගෙවීම්	(400,023,951)	(138,285,615)
සිදු කළ ප්‍රතිපාදන	386,663,181	244,987,282
වර්ෂය තුළ ලාභ සහ අලාභ සඳහා බදු එකතු කිරීම්	-	-
වැටි බදු ලැබිය යුතු ගිණුමට මාරු කිරීම	-	-
අවසාන වැටි ලැබීම්	100,330,767	113,691,536

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

35. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දිනයෙන් පසුව සිදුවූ සිදුවීම් ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වාර්තාකරන දිනට පසුව සිදුවූ සිදුවීම් වන්නේ වාර්තා කරන දිනය හා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලයලත් දිනය අතර සිදුවූ සිදුවීම්වේ. මූල්‍ය ප්‍රකාශනවල එළිදරව් කිරීමට හෝ ගැළපීම් සිදුකිරීමට අවශ්‍ය වන ප්‍රමාණාත්මක සිදුවීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයෙන් පසුව සිදුවී නොමැත.

36. මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය

සාධාරණ අගය සහ සාධාරණ අගයේ ධුරාවලිය තීරණය කිරීම

බැංකුව තක්සේරු කිරීම මගින් මූල්‍ය උපකරණවල සාධාරණ අගය තිරණය කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා පහතින් දක්වා ඇති ධුරාවලිය භාවිතා කරයි.

ශිල්පීය ක්‍රමය

මට්ටම 1	එක සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළෙඳපොලක් තුළ ලැයිස්තු ගත නොකළ (සංශෝධනය නොකල) මිල
මට්ටම 2	නිරීක්ෂණය කළහැකි යෙදවුම් උපයෝගි කරගත් තක්සේරුකරන ශිල්ප ක්‍රම : ලැයිස්තුගත මිලෙහි හෝ ක්‍රියාකාරී වෙළෙඳපලෙහි ඇති සමාන වත්කම් හා වගකීම් සඳහා ලැයිස්තුගත මිල
මට්ටම 3	සැලකියයුතු ලෙස නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සමග ඇති තක්සේරුකරන ශිල්ප ක්‍රම උපයෝගීකර ගනිමින් තක්සේරු කල වත්කම් හා වගකීම්

2025 දෙසැම්බර් 31 දිනට	මට්ටම 1 රු.	මට්ටම 2 රු.	මට්ටම 3 රු.	එකතුව රු.
මූල්‍ය වත්කම්				
මූල්‍ය ආයෝජන FVPL				
ලයිස්තුගත ආයෝජන ඒකක භාර	789,027,014	-	-	789,027,014
මූල්‍ය ආයෝජන FVOCI				
ණය තොරතුරු කාර්යාංශය	-	-	4,754,078	4,754,078
ෆිච් ශ්‍රේණිගත කිරීම	-	-	625,000	625,000
මුළු මූල්‍ය වත්කම්	**789,027,014**	**-**	**5,379,078**	**794,406,092**
මූල්‍ය වගකීම්	-	-	-	-

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

37. සාධාරණ වටිනාකමට ඉදිරියට ගෙන ඒමක් නොකරන ලද මූල්‍ය වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය

මෙම මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය තීරණය කිරීමේ දී යොදා ගන්නා ලද ගණනය කිරීමේ ක්‍රම සහ පදනම් කරගත් උපකල්පනයන් පහතින් විස්තර කර ඇති අතර එම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැනටමත් සාධාරණ වටිනාකමට වාර්තා කර නොමැත.

සාධාරණ අගයට ආසන්න පොත් අගයේ වත්කම් සහ වගකීම්

කෙටිකාලීන කල්පිරීමක් ඇති මූල්‍ය වත්කම් හා වගකීම් බැංකු තැම්පතු, වෙනත් වත්කම් සහ වෙනත් වගකීම් වැනි ධාරණ අගයට ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙයි. මෙම උපකල්පන නිශ්චිත කල්පිරීමක් නොමැති ඉල්ලුම් තැම්පතු සහ ඉතුරුම් තැම්පතු සඳහා ද යොදාගෙන ඇත.

ස්ථාවර අනුපාතයේ මූල්‍ය උපකරණ

සමාන මූල්‍ය උපකරණ සඳහා දැනට පවතින වෙළඳපල අනුපාතය අනුව ප්‍රථමවරට හඳුනාගන්නාවිට වෙළඳපල පොලී අනුපාත සමග සැසඳීමෙන් ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙන ආ ස්ථාවර අනුපාතයේ මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය ඇස්තමේන්තු කරනු ලබයි. සමාන ණය අවදානමක් හා කල්පිරීමක් සහිත ණය සඳහා පවතින වෙළඳපොල පොලී අනුපාත උපයෝගීකර ගනිමින් වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහයන් මත ස්ථාවර පොලී අනුපාත සහිත තැම්පතුවල ඇස්තමේන්තුකල සාධාරණ අගය පදනම් වේ. ලැයිස්තුගත වෙළඳපල මිල මත පදනම්ව නිකුත්කරන ලද ලැයිස්තුගත ණය සඳහා සාධාරණ අගය තීරණය කරනු ලබයි.

විචල්‍ය අනුපාතයේ මූල්‍ය උපකරණ

වෙළඳපල සංවලන විදහා දක්වන විචල්‍ය අනුපාතය සාධාරණ මිනුම් කිරීමකි. එම නිසා විචල්‍ය අනුපාතයේ උපකරණවල සාධාරණ අගය ඉදිරියට ගෙන එන වටිනාකම නියෝජනය වෙයි.

	2025		2024	
	ඉදිරියට ගෙන එන වටිනාකම රු.	සාධාරණ අගය රු.	ඉදිරියට ගෙන එන වටිනාකම රු.	සාධාරණ අගය රු.
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	136,854,046	136,854,046	124,664,750	124,664,750
බැංකුවල ඇති තැම්පතු	925,582,077	925,582,077	152,682,844	152,682,844
ණය සහ ලැබියයුතු දෑ	44,806,182,075	46,057,966,832	41,730,024,581	42,909,082,684
ණය සහ අනෙකුත් උපකරණ	9,202,754,302	10,133,708,935	8,979,104,008	8,732,385,184
මූල්‍ය වත්කම් – FVPL	789,027,014	789,027,014	2,943,277,961	2,943,277,961
මූල්‍ය වත්කම්– FVOCI	5,379,078	5,379,078	5,379,078	5,379,078
වෙනත් වත්කම්	1,494,232,201	1,494,232,201	1,733,062,798	1,733,062,798
මුළු මූල්‍ය වත්කම්	**57,360,010,792**	**59,542,750,183**	**55,668,196,019**	**56,600,535,298**
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	-	-	-	-
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	48,856,751,018	48,856,751,018	48,160,520,558	48,160,520,558
වෙනත් ණය ගැනුම්	273,638,910	273,638,910	140,800,069	140,800,069
වෙනත් වගකීම්	2,220,484,569	2,220,484,569	1,946,677,924	1,946,677,924
මුළු මූල්‍ය වගකීම්	**51,350,874,496**	**51,350,874,496**	**50,247,998,551**	**50,247,998,551**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

37.1 සාධාරණ අගයේ ධූරාවලිය තීරණය කිරීම

මට්ටම 1

සමාන උපකරණ සඳහා සක්‍රිය වෙළෙඳපොලක වෙළඳපොල මිලගණන් (ගැලපීම් නොකල) උපුටා දක්වන යෙදවුම් පවතින විට ගනුදෙනු පිරිවැය සඳහා කිසිඳු අඩු කිරීමකින් තොරව සක්‍රිය මිල ගණන් හෝ නියෝජිත මිල ගණන් භාවිතා කරමින් බැංකුව උපකරණයක සාධාරණ වටිනාකම මනිනු ලබයි.

මට්ටම 2

සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කලහැකි 1 වන මට්ටම තුල ඇතුලත් කර ඇති මිල ගණන් හැර වෙනත් යෙදවුම්

මට්ටම 3

මෙම කාණ්ඩයට සියලුම උපකරණ ඇතුලත්වන අතර ඒ සඳහා තක්සේරු ශිල්පීය ක්‍රම වලට නිරීක්ෂණය කල හැකි දත්ත මත පදනම් නොවන යෙදවුම් ඇතුලත් වන අතර නිරීක්ෂණය කල හැකි යෙදවුම් උපකරණයේ තක්සේරුව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

	මට්ටම 01	මට්ටම 02	මට්ටම 03	එකතුව
2025				
මූල්‍ය වත්කම්				
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	10,133,708,935	-	-	10,133,708,935
ඒකක භාර	789,027,014	-	-	789,027,014
ණය හා අත්තිකාරම්	-	-	46,057,966,832	46,057,966,832
එකතුව	**10,922,735,949**	**-**	**46,057,966,832**	**56,980,702,781**
2024				
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	8,732,385,184	-	-	8,732,385,184
ඒකක භාර	2,943,277,961	-	-	2,943,277,961
ණය හා අත්තිකාරම්	-	-	42,909,082,684	42,909,082,684
එකතුව	**11,675,663,145**	**-**	**42,909,082,684**	**54,584,745,829**

38. අවදානම් කළමනාකරණය

බැංකුව එහි ආවේණික අවදානම්, කළමනාකරණය කිරීමට විධිමත් අවදානම් කළමනාකරණ පරිචයක් ඇතිකර තිබේ. එම ක්‍රියාවලියට බැංකුවේ අවදානම් නැඹුරුව හා අවදානම් රුචියට යටත්ව හඳුනාගැනීම, තක්සේරු කිරීම හා අධීක්ෂණය ඇතුලත්වේ. බැංකුව ප්‍රධාන වශයෙන් ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, වෙළෙඳපල අවදානම සහ මෙහෙයුම් අවදානමට නිරාවරණය වෙයි.

38.1 අවදානම් කළමනාකරණ ව්‍යුහය

බැංකුවෙහි අවදානම් කළමනාකරණය පිළිබඳ රාමුව ස්ථාපිත කිරීම සහ පාලනය සඳහා සම්පූර්ණ වගකීම බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ එම පාලන වගකීම ඉටු කිරීමේ දී, එය ප්‍රධාන වශයෙන් කමිටු දෙකක් එනම් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව තුළින් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

එහි අවදානම් කළමනාකරණ වගකීම පහත දැක්වෙන විධායක කළමනාකරණ කමිටු වෙත පවරා එම අවදානම් සහිත අංශයන් සහ එකී අවදානම සම්බන්ධීකරණ කාර්යය ඉටු කර ගනු ලබයි.

- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC)
- විධායක ණය කමිටුව (ECC)
- වත්කම් සහ වගකීම් කමිටුව (ALCO)

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව(BIRMC)

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය හා අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වශ කිව යුතුවෙයි. කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් සමන්විත වෙයි.

විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

බැංකුවේ අවදානම් නිරාවරණය සමාලෝචනය හා අධීක්ෂණය කිරීමට, අවදානම් නැඹුරු සීමාවන් ඇති කිරීමට සහ බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සංවර්ධනය සඳහා නිර්දේශ ලබාදීම සහ සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා බැංකුවේ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි සභාපතිත්වය උසුලන විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC) වශකිව යුතු වෙයි.

ණය කමිටුව (ECC)

ණය ප්‍රතිපත්තිය, ණය මැනුවලය සංවර්ධනය හා කලින් කලට සමාලෝචනය කිරීම, බැංකුවේ ණය අවදානම අධීක්ෂණය හා කළමනාකරණය කිරීම සඳහා බැංකුවේ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි සභාපතිත්වය දරණ ණය කමිටුව වශකිවයුතු වෙයි. කමිටුවට කළමනාකරණ මට්ටමේ පුද්ගලයින් 07 දෙනෙකු ඇතුළත් වේ.

වත්කම් / බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)

බැංකුවේ පොලී අනුපාත කළමනාකරණය හා අධීක්ෂණය කිරීම, බැංකුවේ වත්කම් හා වගකීම් අධීක්ෂණය හා කළමනාකරණය කිරීම සහ බැංකුවේ සමස්ත ද්‍රවශීලතාවය අධීක්ෂණය හා කළමනාකරණය කිරීමට බැංකුවේ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි සභාපතිත්වය දරණ වත්කම් හා බැරකම් කමිටුව වශකිවයුතු වෙයි.

38.2 අවදානම් කළමනාකරණය හා වාර්තාකරණය

ණය අවදානම

බැංකුවට ආර්ථික අලාභයක් ඇති කරමින් කිසියම් බැඳීමක් ඇති කර ගත් අයෙකු එම වගකීම ඉටු කිරීමට ඇති අකමැත්ත හෝ එම වගකීම ඉටුකිරීමට ඇති හැකියාව හානිකරණයට පත්වීමෙන් ණය අවදානම ඇති වේ. මෙය අවදානම පිළිබඳ මූලික වර්ගීකරණය වන අතර බැංකුවෙහි වත්කම්වලින් බහුතරයක් මෙම ණය සහ අත්තිකාරම්වලින් සමන්විත වන නිසා මෙය ඉතාමත් සැලකියයුතු අවදානමක් වෙයි.

මෙම ණය අවදානම් ප්‍රතිපත්තිය, එදිනෙදා ව්‍යාපාරික කටයුතුවල දී ඉතා වැදගත් කාර්යය භාරයක් ඉටු කරනු ලබයි. ගනුදෙනුකරුවන් තෝරා ගැනීම කේන්ද්‍ර කර ගත් මූලධර්මයන් නිශ්චිතව ඇති කිරීම, නිසි අවදානම, කල් ඇතිව හඳුනා ගැනීමේ වාර්තා වීමේ ක්‍රමවේදයන්, අවදානම් පාලනය කිරීමේ මට්ටම් ඇති කිරීම සහ බැංකුවේ අවදානම් රුචිය ආශ්‍රිතව කටයුතු මෙහෙයවීමට අදාළව බැංකු ප්‍රතිපත්ති සංවර්ධනය කර ඇත. මෙම ප්‍රතිපත්තිය අවම තරමින් වාර්ෂිකව ඇගයීමකට ලක් කරන අතර, ඒවා බැංකුවේ ව්‍යාපාරික ක්‍රමෝපායන් සමඟ ගැලපෙන බවට සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර සහතික කරනු ලබයි.

මූලිකව අවදානම් හඳුනා ගැනීම සඳහා අබණ්ඩ ප්‍රම්තීන් පවත්වා ගෙන යනු ලබන අතර ණය අගය කිරීමේ ක්‍රියාවලිය, ස්වාධීන අවදානම් නිර්දේශ කිරීම සඳහා බලය ලබා දීම ණය අනුමත කිරීම වැනි ක්‍රම මඟින් ණය පිළිබඳ අවදානම අවම කර ගනු ලබයි. ඇප සුරැකුම් වශයෙන් ලබා ගන්නා ඇප පරිපාලන මාර්ගෝපදේශයන්ට අනුව කලින් කලට වටිනාකම අගය කිරීමක් කරනු ලබයි. බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ණය පසු විපරම් කර අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, එමඟින් කල් ඇතිව ගැටළු සහිත ණය හඳුනා ගැනීම සහ ඇති විය හැකි අලාභයන්ගෙන් ආරක්ෂාවීම තහවුරු කරනු ලබයි.

38.2.1.අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීම (ECL)

SLFRS 9 යටතේ අපේක්ෂිත ණය අලාභ (ECL) ඇස්තමේන්තු කිරීම සඳහා ප්‍රයෝජනයට ගත් ප්‍රධාන උපකල්පන, ආකෘති හා ශිල්පීය ක්‍රම ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 2,4,12,10 සටහන්වල දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

අපේක්ෂිත ණය හානි (ECL) තක්සේරු කිරීම

අදියර 1: 12මාසික අපේක්ෂිත ණය අලාභ (ECL)

මූලික හඳුනා ගැනීමෙන් පසු ණය අවදානමේ සැලකියයුතු වැඩිවීමක් සිදු නොවූ සහ ආරම්භයේ සිටම ණය දුර්වල නොවූ නිරාවරණ සඳහා, ඉදිරි මාස 12 තුළ සිදුවන පැහැර හැරීමේ සිදුවීම්වල සම්භාවිතාව හා සම්බන්ධ පීව කාලය තුළ අපේක්ෂිත ණය අලාභ කොටස හඳුනාගෙන ඇත. සැලකියයුතු ලෙස ණය පිරිහී නොමැති ගනුදෙනුකරුවන්ගෙන් මාස 12ක අපේක්ෂිත ණය අලාභ බැංකුව විසින් තිරණය කරනු ලැබේ. (එනම් ගෙවිය යුතු දින 30ට අඩු)

අදියර 2: පීවකාල අපේක්ෂිත ණය අලාභ (ECL) – ණය හානිකරණය නොකළ

මූලික හඳුනා ගැනීමෙන් පසු ණය අවදානමේ සැලකියයුතු වැඩිවීමක් ඇති නමුත් එය ණය හානිකරණය නොවූ නිරාවරණ සඳහා පීව කාලය තුළ අපේක්ෂිත ණය අලාභ (එනම් මූල්‍ය වත්කම්වල ඉතිරි ආයු කාලය පිළිබිඹු කිරීම සඳහා) හඳුනා ගැනේ. බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව, ප්‍රමිතියේ අවශ්‍යතාවල 3 වන අදියර යටතේ වර්ගීකරණය කර ඇති ණය පහසුකම් හැරුණ විට සැලකියයුතු හානිකරණයක් මනිනු ලබන්නේ දින 30කට පෙර උපමර්ධනීය පූර්වානුමැතිය කිරීමෙනි. මහ බැංකුව විසින් නිකුත් කරන ලද මඟපෙන්වීමේ 2 අදියර යටතේ ඉහළ අදියරක සිට පහළ අදියරක් දක්වා ණය පහසුකම් යාවත්කළ ණය පහසුකම්/ නිරාවරණ හැර දෙවරක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද ණය පහසුකම් සලකාබලයි.

අදියර 3: පීවකාල අපේක්ෂිත ණය අලාභ (ECL) – ණය හානිකරණය කල

එම වත්කම්වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපාන සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදු වී ඇතිවිට, නිරාවරණ ණය හානිකරණය වී ඇති ලෙස තක්සේරු කෙරේ. ණය හානිකරණය බවට පත්ව ඇති නිරාවරණ සඳහා, පීව කාලය තුළ අපේක්ෂිත ණය අලාභයක් හඳුනා ගන්නා අතර, පොළී ආදායම ගණනය කරනු ලබන්නේ දළ ධාරණ අගයට වඩා වලදායී පොළී අනුපාතය උකහාගත් පිරිවැයට (ප්‍රතිපාදනයෙන් ශුද්ධ) යෙදවීමෙනි. ගනුදෙනුකරුවෙකුගේ ගිවිසුම්ගත ගෙවීම් දින 90 ට වඩා වැඩි කාලයක් පවතින ණය පහසුකම් බැංකුව විසින් තීරණය කරනු ලැබේ. ඒවා SLFRS 9 හි සඳහන් පරිදි සහ මහ බැංකු වර්ගීකරණය පරිදි අක්‍රීය ණය වර්ගීකරණ සමඟ උපමර්ධනීය පූර්වානුමැතියට යටත් වේ. දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගතකරණය කරන සියලුම ප්‍රතිව්‍යුහගත කළ ණය සහ ණය පහසුකම්/ නිරාවරණ නොවන සියලුම නැවත උපලේඛණගතකළ ණය ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා ඉහළ නංවා ඇති අතර සියලුම ණය පහසුකම්/ගනුදෙනුකරුවන් 3 අදියර යටතේ මහ බැංකුවේ උපදෙස් අනුව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කෙරේ.

වියහැකි පැහැර හැරීම් (PD) ඇස්තමේන්තු ක්‍රියාවලිය

ලබාදී ඇති කාල පරාසයක්තුල විය හැකි පැහැරහැරීමක ඇස්තමේන්තුවක් සිදුවිය හැකි පැහැරහැරීමක් ලෙස සලකයි. SLFRS 9 යටතේ වෙනත් ගනුදෙනුකරුවන්ට ඇති ණය හා අත්තිකාරම්වල විය හැකි පැහැරහැරීම් සඳහා ඇස්තමේන්තු (PD Estimation) දැනට දිවයිනේ බොහෝ බැංකු සඳහා පොදු කාරණයක් වන පාරිභෝගිකයින්ගේ දින පසුවූ ගෙවීම් (DPD) මත විශාල ලෙස පදනම් වෙයි. ඒ අනුව පහත සඳහන් පරිදි DPD මත පදනම්ව කාණ්ඩ 05ක් අතර නිරාවරණයවීම් වර්ගීකරනය කරයි.

- ශූන්‍ය දින පසුවූ ගෙවීම්
- 130 දක්වා දින පසුවූ ගෙවීම්
- 3160 දක්වා දින පසුවූ ගෙවීම්
- 6091 දක්වා දින පසුවූ ගෙවීම්
- දින 90ට වැඩි පසුවූ ගෙවීම්

පැහැරහැරීමේ දී නිරාවරණය (EAD)

පැහැර හැරීමකට ආසන්න වන අතර කලින් ගෙවීම සිදුවිය හැකි බවත් නිරාවරණය ඉහල නැංවීමට ගනුදෙනුකරුගේ ඇති හැකියාවත් යන දෙකම සැලකිල්ලට ගනිමින් හානිකරණ ගණනයට යටත්ව පැහැර හැරීමේ දී නිරාවරනය (EAD) මූල්‍ය උපකරනයේ ඉදිරියට ගෙන ආ දළ වටිනාකම නියෝජනය කරයි. නිරාවරණය වැඩිකර ගැනීම සඳහා පාරිභෝගිකයින්ට හැකියාවක් ඇත. ණය නැවත සලකා බැලීමේ පහසුකම් වල පැහැර හැරීම් නිරාවරනය (EAD) ගණනය කිරීම සඳහා පැහැරහරින අවස්ථාවේ ඇති පැහැර හැරීම් පහසුකම් වෛතිහාසික භාවිතයන්ගේ විස්තරවන ණය පරිවර්තනීය කරුණු (CCF) බැංකුව ප්‍රයෝජනයට ගනී. ණය නැවත සලකා නොබැලීමේ පහසුකම් දැනටමත් පාවිච්චිකල වටිනාකම සහ කිසියම් උපචිත පොලියක් පැහැර හැරීමේ දී නිරාවරණයක් (EAD) ලෙස සලකයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

පාඩු ලබාදෙන පැහැර හැරීම් (LGD)

වියහැකි පාඩු නිරාවරණය විමේ බලපෑමක් ලෙස පාඩු ලබාදෙන පැහැරහැරීම් (LGD) හැඳින්විය හැකි අතර එය නිරාවරණයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි. රදවාගෙන ඇති ඕනෑම ඇපයක වටිටම්විමක් හෝ අයකරගැනිමට අපේක්ෂාකරන වටිනාකමට සංසන්දනාත්මකව අපේක්ෂිත පැහැර හැරීමේ දී නිරාවරනය (EAD) LGD අනුපාත මගින් සැලකිල්ලට ගනී.

භූගෝලීය කලාපයේ බහු ආර්ථික තත්ත්වයන් යටතේ අපේක්ෂිත ණය අලාභ ආකෘති (ECL) තක්සේරු කිරීම (EFA)

මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීව කාලය පුරා ණය පාඩුවල වියහැකි බව බරතැබූ හා අපක්ෂපාත ඇස්තමේන්තු අපේක්ෂිත ණය හානි මගින් විදහා සැක්විය යුතු වෙයි. වත්කම් හානිකරණයේ අපේක්ෂිත ණය අලාභ මත (ECL) බොහෝ විට සිදුවිය හැකි බලපෑම් වැනි විචල්‍යයන් හා අවස්ථාවන් බැංකුව යොදාගන්නා නිසා හැකි සෑම සාර්ව ආර්ථික විචල්‍යයන් හා අවස්ථාවන් ප්‍රායෝගික නොවන බව සලකනු ලැබේ. සම්පූර්ණ බව හා නිවැරදි බව තහවුරු කිරීම සඳහා ආර්ථික හා මූල්‍ය විශ්ලේෂණය (EFA) වලංගු කිරීමේ දිනය සඳහා බැංකුව තෙවන පක්ෂයකින් ස්වාධීන තහවුරුවක් ලබා ගනී. සාර්ව ආර්ථික පරිසරයේ අවිනිශ්චිතතාවයන් 2021 අවසන් වන විට සාර්ව ආර්ථික විචල්‍ය කළමනාකරණයේ ඍණ ඉදිරි දැක්මක් ලෙස අඛණ්ඩව පැවතිනි.

38.2.2.අපේක්ෂිත ණය අලාභ සඳහා සමස්ත හානිකරණයේ විශ්ලේෂණය පහත පරිදි වෙයි

දෙසැම්බර් 31 දිනට	සටහන්	2025				2024			
		රු. 000 අදියර 1	රු. 000 අදියර 2	රු. 000 අදියර 3	රු. 000 එකතුව	රු. 000 අදියර 1	රු. 000 අදියර 2	රු. 000 අදියර 3	රු. 000 එකතුව
මුදල් සහ මුදල් සමාන දෑ		-	-	-	-	-	-	-	-
බැංකු තැන්පතු	14	361,910	-	-	361,910	11,983	-	-	11,983
ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම්									
ණය සහ අත්තිකාරම්	16	453,051,692	425,748,489	2,614,638,167	3,493,438,349	402,669,086	456,118,112	2,077,994,173	2,936,781,371
ණය සහ අනෙකුත් උපකරණ		-		1,658,670	1,658,670	-		1,659,425	1,659,425
අපේකෂිත ණය අලාභ සඳහා මුළු දිමනාව		453,413,602	425,748,489	2,616,296,837	3,495,458,929	402,681,069	456,118,112	2,079,653,599	2,938,452,780

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

ණය අලාභ වියදම්

ආදායම් ප්‍රකාශනයේ වර්ෂය සඳහා වාර්තාකර ඇති මූල්‍ය උපකරණවල අපේක්ෂිත ණය අලාභ (ECL) පහත වගුව මගින් දක්වයි.

2025 දෙසැම්බර් 31 දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
මුදල් හා සමාන දෑ	-	-	-	-
මහා බැංකුවේ ඇති මුදල් හා ශේෂය	-	-	-	-
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්	-	-	(755)	(755)
වෙනත් බැංකුවල ඇති තැන්පතු	349,926	-	-	349,926
ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	50,382,606	(30,369,623)	536,643,994	556,656,977
මුළු හානිකරණ අලාභය	**50,732,533**	**(30,369,623)**	**536,643,239**	**557,006,149**

2024 දෙසැම්බර් 31 දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
මුදල් හා සමාන දෑ	-	-	-	-
මහා බැංකුවේ ඇති මුදල් හා ශේෂය	-	-	-	-
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්		-	1,659,425	1,659,425
වෙනත් බැංකුවල ඇති තැන්පතු	(8,072,834)	-	-	(8,072,834)
ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	(25,466,851)	24,889,011	547,881,282	547,303,442
මුළු හානිකරණ අලාභය	**(33,539,685)**	**24,889,011**	**549,540,707**	**540,890,034**

අවකල් තත්වය	තත්වය	විස්තරය
අදියර 1	නිත්‍ය	ක්‍රියාකාරී
	දින 1 සිට 30 දක්වා	ක්‍රියාකාරී
අදියර 2	දින 30 සිට 60 දක්වා	කාර්ය සාධනය අඩු
	දින 61 සිට 90 දක්වා	කාර්ය සාධනය අඩු
අදියර 3	දින 90 ට වැඩි	අක්‍රීය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

දෙසැම්බර් 31 වන දිනට	2025			2024		
	අදියර 1	අදියර 2	අදියර 3	අදියර 1	අදියර 2	අදියර 3
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ණය සහ අත්තිකාරම්						
අදියර 0 සිට 2 දක්වා ණය ගෙවීම්	23,602,815,890	4,260,641,871	4,022,829,752	26,371,942,197	4,792,399,466	3,594,725,610
අදියර 03 NPA - විශේෂයෙන් සඳහන් කල	1,305,112,387	398,779,549	1,963,752,504	152,834,250	127,422,780	1,693,639,384
අදියර 04 NPA උපප්‍රමාණික	648,871,681	56,207,425	1,391,004,111	26,841,181	14,134,104	987,337,843
අදියර 05 NPA අවිනිශ්චිත	231,301,875	74,613,327	5,943,198,712	10,290,011	1,303,383	1,059,328,970
අදියර 05 NPA අලාභ	54,870,764	31,629,544	4,331,981,279	26,511,656	14,573,876	5,816,202,728
මුළු ණය සහ අත්තිකාරම්	25,842,972,597	4,821,871,715	17,652,766,359	26,588,419,296	4,949,833,609	13,151,234,535
අපේක්ෂිත ණය හානි දීමනා	(453,051,692)	(425,748,489)	(2,614,638,167)	(402,669,086)	(456,118,112)	(2,077,994,173)
ශුද්ධ ණය සහ අත්තිකාරම්	25,389,920,904	4,396,123,226	15,038,128,191	26,185,750,210	4,493,715,497	11,073,240,362
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ණය සහ අනෙකුත් උපකරණ						
ඒකක භාර සහ ලැයිස්තුගත නොකල කොටස්	794,406,092	-	-	2,948,657,039	-	-
රජයේ ණය සුරැකුම්පත් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර	7,528,900,013	-	-	6,030,123,000	-	-
ප්‍රතිමිලදී ගැනීම්	980,814,449	-	-	2,256,431,869	-	-
ණයකර	694,698,510			694,208,564		
වාණිජ පත්‍රිකා	-			-		
බැංකු තැම්පතු	925,943,987	-	-	152,694,828	-	-
මුළු ණය සහ අනෙකුත් උපරණ	10,924,763,051			12,082,115,299		
අපේක්ෂිත ණය හානි දීමනා	(361,155)		-	(1,671,409)		
ශුද්ධ ණය සහ වෙනත් උපකරණ	10,924,401,896	-	-	12,080,443,891		

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

38.2.3අවදානම් සංකේන්ද්‍රනය විශ්ලේෂණය

බැංකුවේ අවදානම් සඳහා සකේන්ද්‍රනය කර්මාන්ත අංශය මගින් කළමනාකරණය කරයි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කොටසක් සඳහා කර්මාන්තයේ සංකේන්ද්‍රණය පහත සඳහන් වගුව මගින් පෙන්වයි. "වෙනත්" ලෙස හඳුන්වා ඇති වත්කම් සඳහා කෘෂිකර්මික ණය ඇතුලත් වෙයි.

2025.12.31 දිනට	මූල්‍ය සේවා	රජයේ සුරැකුම්	නිවාස හා ඉදිකිරීම්	පාරිභෝගිකයින්	වෙනත්	එකතුව රු.
මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමාන දෑ	136,854,046					136,854,046
වෙනත් බැංකු තැම්පතු	925,943,987					925,943,987
පාරිභෝගිකයින්ට ණය හා ලැබියයුතු දෑ						
උකස්			10,017,147,847			10,017,147,847
සේවක අර්ථ සාධක			18,586,862,912			18,586,862,912
කාර්ය මණ්ඩල ණය			1,047,933,967			1,047,933,967
පුද්ගල ණය				16,124,835,953		16,124,835,953
වෙනත්					2,858,432,857	2,858,432,857
මූල්‍ය ආයෝජන – FVPL	789,027,014					789,027,014
මූල්‍ය ආයෝජන – AC	980,814,449	7,528,900,013				8,509,714,462
මූල්‍ය ආයෝජන – FVOCI	5,379,078					5,379,078
එකතුව	2,838,018,573	7,528,900,013	29,651,944,726	16,124,835,953	2,858,432,857	59,002,132,123

2024.12.31 දිනට	මූල්‍ය සේවා	රජයේ සුරැකුම්	නිවාස හා ඉදිකිරීම්	පාරිභෝගිකයින්	වෙනත්	එකතුව රු.
මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමාන දෑ	124,664,750					124,664,750
වෙනත් බැංකු තැම්පතු	152,694,828					152,694,828
පාරිභෝගිකයින්ට ණය හා ලැබියයුතු දෑ						-
උකස්			9,969,290,283			9,969,290,283
සේවක අර්ථ සාධක			13,938,716,138			13,938,716,138
කාර්ය මණ්ඩල ණය			1,061,427,985			1,061,427,985
පුද්ගල ණය				17,669,137,783		17,669,137,783
වෙනත්					2,404,174,993	2,404,174,993
මූල්‍ය ආයෝජන - FVPL	2,943,277,961					2,943,277,961
මූල්‍ය ආයෝජන - AC	2,256,431,869	6,030,123,000				8,286,554,869
මූල්‍ය ආයෝජන - FVOCI	5,379,078					5,379,078
එකතුව	5,482,448,485	6,030,123,000	24,969,434,406	17,669,137,783	2,404,174,993	56,555,318,667

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

38.3 ද්‍රවශීලතා අවදානම හා අරමුදල් කළමනාකරණය

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ යම් මූල්‍ය වත්කමක් ලබාදීම මගින් නිරවුල් කළ හැකි මූල්‍ය වගකීම් හා බැඳී පවත්නා වගකීම් ඉටු කිරීමේ දී බැංකුවට මුහුණදීමට සිදුවන දුෂ්කරතා ලෙස නිර්වචනය කළ හැක. සාමාන්‍ය සහ පීඩනයක් සහිත යන අවස්ථා දෙකෙහිදීම බැංකුවට සිය ගෙවීම් වගකීම් ඉටු කිරීමට හැකියාවක් නොමැතිවීම නිසා ද්‍රවශීලතා අවදානම ඇති වෙයි. මෙම අවදානම සීමාකර ගැනීම සඳහා, කළමනාකරණය, එහි මූලික තැන්පතු පදනමට අමතරව විවිධාංගිකරණයක් සහිත අරමුදල් සම්පාදන මාර්ග නිර්මාණය කර ඇති අතර, දෛනික පදනමක් මත අනාගත මුදල් ප්‍රවාහ හා ද්‍රවශීලතාව පිළිබඳ අවධානය යොමු කරමින් සහ නියාමනය කරමින් වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්තියක් පිළිගෙන ඇත. ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියක් සහ අවදානම පාලන සැලසුම් බැංකුව සංවර්ධනය කර ඇත. මෙයට අපේක්ෂිත මුදල් ප්‍රවාහ සහ අවශ්‍යතාවන් අමතර අරමුදල් ආරක්ෂා කිරීමට භාවිතා කළහැකි ඉහළ මට්ටමේ ඇප ලබාගතහැකිවීම පිළිබඳ තක්සේරුවක් ඇතුළත් කරයි.

ද්‍රවශීලතා අනුපාතය

ද්‍රවශීල වත්කම් ප්‍රධාන වශයෙන්ම මුදල්, බැංකුවල ඇති මුදල් සහ රජයේ සුරැකුම්වලින් සමන්විත වේ. බැංකුව අරමුදල් අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීමට පහතින් දැක්වෙන ද්‍රවශීලතා අනුපාතයන් අධීක්ෂණය කරයි.

ද්‍රවශීල වත්කම් අනුපාතය

	2025	2024
වර්ෂය අවසානයේ දී	106.00%	106.00%
උපරිම	220.00%	220.00%
අවම	100.00%	100.00%
සාමාන්‍ය	160.00%	160.00%

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

38.4 පවත්නා ගිවිසුම්ගත කල්පිරීම් මගින් මූල්‍ය වත්කම් හා වගකීම් පිළිබඳ විශ්ලේෂණය

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වත්කම් සහ වගකීම්වල වට්ටම් නොකරන ලද මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම්ගත කල්පිරීම් පිළිබඳ විශ්‍රහයක් පහත වගුව මගින් සාරාංශගත කර ඇත.

මූල්‍ය වත්කම් හා වගකීම්වල වට්ටම් නොකරන ලද මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම්ගත කල්පිරීම්

2025 දෙසැම්බර් 31 දිනට	දින 7 ට අඩු	දින 730	මාස 13	මාස 36	මාස 612	අවුරුදු 13 අතර	අවුරුදු 35	අවුරුදු 5 ට වැඩි	එකතුව
මුළු වත්කම්	1,275,085,885	6,452,015,504	1,224,403,230	5,615,055,669	2,029,958,397	6,971,506,989	16,656,718,244	42,621,772,417	82,846,516,335
මුදල් හා මුදල් සමාන දෑ	136,854,046								136,854,046
බැංකු තැන්පතු	353,503,789		138,143,836	126,936,644	306,997,808	-	-	-	925,582,077
මූල්‍ය වත්කම් FVPL සහ FVOCI	197,256,754	394,513,507	197,256,754					5,379,078	794,406,092
ණය හා අනෙකුත් උපකරණ	521,696,092	199,674,075	794,819,152	5,352,059,802	1,330,746,678	1,003,758,504	-	-	9,202,754,302
ණය හා අත්තිකාරම්	6,081,250	5,738,440,011	34,489,533	76,365,267	332,519,956	5,908,054,530	16,597,024,288	42,497,005,428	71,189,980,263
වෙනත් වත්කම්	59,693,956	119,387,911	59,693,956	59,693,956	59,693,956	59,693,956	59,693,956	119,387,911	596,939,555
									-
මුළු මූල්‍ය වගකීම්	926,512,614	2,368,048,515	6,836,560,540	19,935,550,877	17,885,257,638	2,547,094,505	1,912,405,723	7,409,981,573	54,971,472,547
මුළු ස්කන්ධය								5,445,702,706	5,445,702,706
බැංකුවලට ගෙවියයුතු	-								
තැන්පත්කරුවන්ට ගෙවියයුතු	959,713,968	2,465,117,907	6,477,798,070	18,143,374,323	14,299,041,369	3,678,336,583	764,234,673	-	46,787,616,893
වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	-	-	-	-	138,075,190	45,187,906	45,187,906	45,187,906	273,638,910
සේවක ප්‍රතිලාභ වගකීම්	-	-	13,266,435	13,266,435	26,532,871	92,865,047	92,865,047	424,525,930	663,321,765
වෙනත් වගතීම්	-	244,029,470	-	1,557,162,803	-	-	-		1,801,192,273
කල්පිරීම් පරතරය	348,573,271	4,083,966,989	(5,612,157,311)	(14,320,495,208)	(15,855,299,241)	4,424,412,484	14,744,312,521	35,211,790,844	
සමුච්චිත කල්පිරීම් පරතරය		4,432,540,261	(1,179,617,050)	(15,500,112,258)	(31,355,411,499)	(26,930,999,015)	(12,186,686,494)	23,025,104,350	

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

38.4.1 කල්පිරීම් විශ්ලේෂණය

ඉකුත් වසර හා සැසඳීමේදී බැංකුවේ වත්කම් හා වගකීම් වල කෙටි කාලීන හා දිගුකාලීන කල්පිරීම් සංවලනය පහත සඳහන් වගුවේ දක්වා ඇත.

වත්කම් හා වගකීම් (අ)	2025			2024		
	රු 000 මාස 12 ට අඩු	රු 000 මාස 12 ට වැඩි	රු 000 එකතුව	රු 000 මාස 12 ට අඩු	රු 000 මාස 12 ට වැඩි	රු 000 එකතුව
මුළු වත්කම්	20,076,393,558	37,283,617,233	57,360,010,791	15,029,081,272	40,639,114,747	55,668,196,019
මුදල් හා මුදල් සමාන දෑ	136,854,046	-	136,854,046	124,664,750	-	124,664,750
බැංකු තැන්පතු	925,582,077	-	925,582,077	152,682,844	-	152,682,844
මූල්‍ය වත්කම් FVPL & FVICI	789,027,014	-	789,027,014	2,943,277,961	-	2,943,277,961
මූල්‍ය වත්කම් AC	-	-	-	-	-	-
ණය හා අනෙකුත් උපකරණ	8,198,995,798	1,003,758,504	9,202,754,302	7,571,563,229	1,407,540,780	8,979,104,008
ණය හා අත්තිකාරම්	9,229,371,549	35,576,810,524	44,806,182,073	3,358,520,277	38,371,504,304	41,730,024,581
මූල්‍ය වත්කම් FVOCI	-	5,379,078	5,379,078	-	5,379,078	5,379,078
දේපල පිරියත උපකරණ	-	329,133,780	329,133,780	-	404,644,985	404,644,985
භාවිතයට අයිති වත්කම්	-	129,759,524	129,759,524	-	99,174,660	99,174,660
විලම්බිත බදු වත්කම්	438,399,341	-	438,399,341	633,635,649	-	633,635,649
වෙනත් වත්කම්	358,163,733	238,775,822	596,939,555	244,736,563	350,870,941	595,607,504
මුළු වගකීම්	34,955,161,595	22,404,849,196	57,360,010,791	34,368,602,098	21,299,593,922	55,668,196,020
මුළු ස්කන්ධය	-	5,815,531,746	5,815,531,746	-	5,420,197,467	5,420,197,467
බැංකුවලට ගෙවිය යුතු	-	-	-	-	-	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්						
තැන්පත්කරුවන්ට ගෙවියයුතු	33,013,253,312	15,843,497,706	48,856,751,018	33,030,329,104	15,130,191,456	48,160,520,560
වෙනත් ණය ගැනුම් කරුවන්ට ගෙවිය යුතු	138,075,190	135,563,719	273,638,910	15,159,531	125,640,539	140,800,070
සේවක ප්‍රතිලාභ වගකීම්	53,065,741	610,256,024	663,321,765	54,222,996	623,564,460	677,787,456
ආදායම් බදු වගකීම්	193,604,550	-	193,604,550	-	-	-
වෙනත් වගකීම්	1,557,162,801	-	1,557,162,801	1,268,890,467	-	1,268,890,467
කල්පිරීම් පරතරය	(14,878,768,037)	14,878,768,037		(19,339,520,826)	19,339,520,826	

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

38.5 ප්‍රාග්ධන කළමනාකරණය

38.5.1අවම නියාමන ප්‍රාග්ධනය

(ශ්‍රී ලංකා මහ බැංකුවේ 2016.07.02 දින දරණ ලිපිය අනුව) 2018.01.01 දිනට රු. බිලියන 5 ක අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයකට බැංකුව අනුකූලතාවය දක්වා ඇත. මෙය 2017 ඔක්තෝබර් 26 දිනැති 2017 අංක 5 දරණ විධිවිදානය පරිදි 2020.12.31 දින සිට බලපැවැත්වෙන පරිදි රු. බිලියන 7.5 කින් තවදුරටත් ඉහල නංවා තිබිනි. පසුව 2022 අංක 4 දරණ මහ බැංකු අධිපතිවරයා නිතුත් කල විධිවිධානය පරිදි මෙය 2024.12.31 දක්වා දීර්ඝ කර තිබිනි. ඒ අනුව අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලීමට බැංකුවට නොහැකි වූ බැවින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සම්පූර්ණ කොටස් හිමිකම අත්පත්කර ගන්නා ලෙස මුදල් ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දී ඇති අතර එමගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට මහජන බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස ක්‍රියාත්මකවීමට හැකිවනු ඇත.

38.5.2බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතය හා නියාමන ප්‍රාග්ධනය

2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සමස්ත ප්‍රාග්ධන අනුපාතය 12.5% ක් සහ ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂාව 8.5% ක්ද අන්තර්ගතව අවම අදියර I ප්‍රාග්ධනය සියලු අවස්ථාවලදී බලපත්‍රලාභී විශේෂිත සියලුම බැංකු සඳහා පවත්වා ගත යුතු වෙයි. බැංකුවේ නියාමන ප්‍රාග්ධනය ප්‍රමාණවත්භාවයේ අනුපාතය පිළිබඳ විස්තර පහත දැක්වේ.

i. ප්‍රාග්ධන පදනම

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය අයිතම	රු 000 31.12.2025	රු 000 31.12.2024
ගැලපීමෙන් පසු පොදු ස්කන්ධ ප්‍රාග්ධනය	5,174,921	4,786,562
සමස්ථ අදියර 1 ප්‍රාග්ධනය	4,771,384	4,786,562
2024.12.31 දිනට සැපයිය යුතු අවම නියාමන ප්‍රාග්ධනය	7,500,000	7,500,000
ප්‍රාග්ධන හිඟතාවය	2,325,079	2,713,438
සමස්ථ අදියර 1 ප්‍රාග්ධන හිඟතාවය	2,728,616	2,713,438

ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතය		
පොදු ස්කන්ධය අදියර 1 ප්‍රාග්ධන අනුපාතය	24.32%	19.28%
සමස්ථ ප්‍රාග්ධන අනුපාතය	22.42%	19.28%

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

ii. ශේෂ පත්‍ර නිරාවරණයෙදී ගැළපූ අවදානම්

	ශේෂ පත්‍රයේ සටහන් වූ මුල් වටිනාකම	බර තැබූ වත්කම් වටිනාකම	ශේෂ පත්‍රයේ සටහන් වූ මුල් වටිනාකම	බර තැබූ වත්කම් වටිනාකම
	2025		2024	
නිරාවරණ				
ශ්‍රී ලංකා මහ බැංකුව මත හිමිකම්	8,509,714	-	8,286,555	-
රාජ්‍ය අංශයේ ආයතන (PSEs) මත හිමිකම්	-	-	-	-
බැංකු නිරාවරණ මත හිමිකම්				
මාස 03ට අඩු දේශීය බැංකුවලින් ගෙවියයුතු (AAA to BBB)	541,879	138,768	179,966	35,993
මාස 03ට වැඩි දේශීය බැංකුවලින් ගෙවියයුතු (A+ to BBB)	433,934	86,787	1,252	626
A to BBB	-	-	-	-
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන මූල්‍ය ආයතනවල හිමිකම්,	-	-	-	-
අනෙකුත් මූල්‍ය ආයතන මත හිමිකම්	5,380	5,380	5,380	5,380
සිල්ලර හිමිකම්				
තනි පුද්ගල නිරාවරණ	13,501,261	10,125,946	14,762,705	11,072,029
නේවාසික දේපල මගින් ඇප තබන ලද හිමිකම්	8,151,245	2,852,936	7,765,733	2,718,007
නේවාසික දේපල මගින් ඇප තබන ලද හිමිකම්				
නියාමන ප්‍රාග්ධන අරමුණ සඳහා සුදුසුකම්	-	-	-	-
ක්‍රියාකාරී නොවූ වත්කම් (NPAs)				
විශේෂ විධිවිධාන 20%ට සමාන හෝ ඊට වැඩි	1,795,497	1,795,497	2,089,837	2,089,837
විශේෂ විධිවිධාන 20%ට අඩු	90,803	136,205	131,433	197,149
නේවාසික දේපල මගින් ඇප තබන ලද ක්‍රියාකාරී නොවූ වත්කම්				
විශේෂ විධිවිධාන 20%ට වැඩි	137,255	68,628	18,842	9,421
විශේෂ විධිවිධාන 20%ට අඩු	1,447,677	1,447,677	2,371,487	2,371,487
මුදල් අයිතම හා වෙනත් වත්කම්				
තමන්ට අයත් නෝට්ටු හා කාසි	84,964	-	94,473	-
දේපල, පිරියත හා උපකරණ	256,682	256,682	503,820	503,820
අනෙකුත් වත්කම්/නිරාවරණ	596,940	596,940	595,608	595,608
ණය අවදානම සඳහා අවදානම බරතබන ලද ප්‍රමාණය	**35,553,232**	**17,511,445**	**36,807,090**	**19,599,356**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

38.6 වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානම යනු මූල්‍ය උපකරණයන්ගේ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය උච්ඡාවචනය විම පිළිබඳ ඇති අවදානමයි. එය වෙළඳපොළ සාධකයන්ගේ වෙනස්වීම් එනම් පොළී අනුපාතය, විදේශ විණිමය අනුපාතය සහ හිමිකාරත්ව මිල මත රඳා පවතියි. වර්තමානයේ බැංකුව කිසිදු කොටස් වෙළඳපොල කටයුත්තක නොයෙදෙන අතර එහෙයින් බැංකුවේ ආයෝජන කටයුතු කොටස් වෙළඳපොළින් බාහිරව ක්‍රියාත්මක වේ.

38.6.1. වෙළෙඳපොළ අවදානම වෙළෙඳ නොවන

පොලී අනුපාත අවදානම

මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය හෝ අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපාන, සිදුවිය හැකි පොළී අනුපාතයන්ගේ වෙනස්වීම මගින් පොලී අනුපාත අවදානම පැනනගී. පිහිටුවාගත් සීමාවන් ඇතුලත යම් තත්වයන් පවත්වාගෙන යෑම සහතික කිරීමට හෙජින් ක්‍රමෝපායන් අනුගමනය කිරීම බැංකුව විසින් සිදුකරන අතර, දිනපතාම මෙම තත්ත්වයන් නිරීක්ෂණය කිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වෙයි.

බැංකුවේ අනුපාත සංවේදී වත්කම් හා වගකීම් වල පොලී අනුපාතයන්ගේ සැලකිය යුතු වෙනස්වීමට ප්‍රතිචාරයක් ලෙස 2020 වසරෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ ආදායම් ප්‍රකාශනයේ සංවේදීතාවය පහත සාරාංශ ගත කර ඇත.

දෙසැම්බර් 31 දිනට	2025 රු 000	2024 රු 000
අනුපාත සංවේදී වත්කම් RSA	17,907,428	12,128,736
අනුපාත සංවේදී වගකීම් RLA	33,013,253	33,051,162
RSA - RLA	(15,105,825)	(20,922,426)

පොලී අනුපාත කම්පනය නිසා ආදායම් ප්‍රකාශයට සිදු වූ බලපෑම

දෙසැම්බර් 31 දිනට	2025 රු 000	2024 රු 000
0.50%	(45,927)	(66,065)
1%	(91,854)	(131,708)
-0.50%	45,927	65,854
-1%	91,854	131,708

පෙර ගෙවීමේ අවදානම

කලින් ගෙවීමේ අවදානම යනු බැංකුවට එහි ගනුදෙනුකරුවන් සහ ප්‍රතිපාක්ෂිකයන් නැවත ගෙවීම හෝ නැවත ගෙවීම් කරන ලෙසට කලින් ඉල්ලීම හෝ බලාපොරොත්තු වූවාට වඩා පසුව ගෙවන ලෙසට ඉල්ලීම් කිරීමේදී මුදල් ගෙවීමට සිදුවීම පිළිබඳ අවදානම වේ. එනම්, ස්ථිර අනුපාතික උකස්කරයන් පොලී අනුපාතයන් පහත වැටුණු විට ගෙවීමට ඉදිරිපත්වීම දැක්විය හැකිය.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

38.7 මෙහෙයුම් අවදානම

පද්ධති බිඳ වැටීම්, මානව දෝෂ, වංචාවන් හෝ බාහිර සිද්ධීන් තුළින් හටගන්නා අලාභ පිළිබඳ අවදානම වේ. පාලන ක්‍රමයන් ඵලදායී ලෙස මෙහෙයවීමට නොහැකි වන අවස්ථාවේදී, මෙහෙයුම් අවදානම් කීර්තිනාමයට හානියක් ඇතිකළ හැකි අතර, එමඟින් නෛතික සහ නියාමන ගැටළු ඇතිකර මූල්‍ය අලාභයකට හේතු විය හැකිය. බැංකුවට සියළුම මෙහෙයුම් අවදානම ඉවත් කිරීමක් බලාපොරොත්තු විය නොහැකි වුවත් පාලන රාමුවක් තුළින් සහ අනාගත අවදානම් නියාමනය කිරීම හා ප්‍රතිචාර දක්වමින් මෙම අවදානම් පාලනය කිරීමට උත්සාහ ගනී. මෙම පාලන ක්‍රමයන්ට ඵලදායී ලෙස වගකීම් බෙදා හැරීම, පිවිසීම, බලය දීම සහ සැසඳීම් කිරීම පිළිබඳ ක්‍රමවේද ඇති කිරීම, කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කිරීම වැනි තක්සේරු ක්‍රියාවලි ඇතුළත් වෙයි.

39 ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවූ සිදුවීම්

මෙම මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකරන දිනට ගැලපීම් හෝ විලිදරව් කිරීම් සිදුකිරීමට අවශ්‍ය වැදගත් සිදුවීමක් ශේෂපත්‍ර දිනයෙන් පසු සිදුවී නොමැත.

40 ඇපයට තැබූ වත්කම්

වත්කම් බැරකම් සඳහා ඇප වශයෙන් කිසිදු වත්කමක් තබා නොමැත.

41 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව රජය විසින් පාලනය කරන ව්‍යවසායකි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කර ගෙන යෑමේ දී, රජය විසින් පාලනය කරන අනෙකුත් ආයතන සමග ද ගනුදෙනු සිදු කරන අතර ඒ පිළිබඳ හෙළිදරව් කිරීමක් සම්බන්ධිත පාර්ශ්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි ප්‍රමිති අංක 30 4 (ඈ) ඡේදයේ සඳහන් පරිදි සිදු කර ඇත.

42 ගිවිසුම් හා යෝජිත ගිවිසුම්වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව, එහි අධ්‍යක්ෂවරයෙකු, ඔහුගේ කාලත්‍රයා හෝ යැපෙන දරුවකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ හෝ සිදු කිරීමට යෝජිත කිසියම් ව්‍යාපාර කටයුත්තක සෘජුව හෝ වක්‍රව සම්බන්ධතාවයක් තිබේ නම්, සාකච්ඡා කරන ලද එම සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ කරුණු හෙළිදරව් කළ යුතු වේ. එම හෙළිදරව් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ දැක්විය යුතු අතර, එකී අධ්‍යක්ෂවරයා එම කටයුත්ත පිළිබඳ තීන්දු ගැනීමේ හෝ සාකච්ඡා පවත්වන රැස්වීම්වලට සහභාගී නොවිය යුතුය. එම තීරණ ගන්නා හෝ නිගමනයන්ට එළැඹෙන රැස්වීම්වලට සහභාගී වීමෙන් වැළකිය යුතු වේ. පනතට අනුව, බැංකුව විසින් බැංකුවේ කිසිදු අධ්‍යක්ෂවරයෙකුට සේවකයෙකුට හෝ එම අධ්‍යක්ෂවරයාගේ හෝ සේවකයාගේ හෝ සේවකයාගේ කාලත්‍රයාට හෝ යැපෙන දරුවෙකුට හෝ අධ්‍යක්ෂවරයාට හෝ සේවකයාට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමකට හෝ වෙළඳ ආයතනයකට ණය ලබාදීම සිදු නොකළ යුතු වේ. කෙසේ වුවද බැංකුව තම සේවකයින් හට පදිංචිය සඳහා නිවසක් ඉදි කිරීමට අවශ්‍ය ඉඩමක් මිලට ගැනීම සඳහා, පවතින නිවසක් අළුත්වැඩියා කිරීමට, නවීකරණය කිරීමට හෝ කිසියම් දිගු කිරීමක් සිදු කිරීමට මෙම නීතිය යටතේ දක්වා ඇති වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා ණය ලබාදීම සිදු කරයි. මෙම ඡේදයට අනුව සේවකයින් සඳහා ලබාදෙන ණයවල පවතින ගෙවියයුතු ශේෂය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 32 යටතේ විලිදරව්කර ඇත. බැංකුවේ අධ්‍යක්ෂවරුන් සෘජුව හෝ වක්‍රව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කිසිම කොන්ත්‍රාත්තුවක් සඳහා උනන්දුවක් දක්වා නොමැත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

43 වටිනාකම් එකතුකිරීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා	2025 රු.	2024 රු.
පොලී ආදායම	7,120,861,865	7,590,650,416
වෙනත් ආදායම්	574,033,475	581,774,291
මුළු ආදායම	7,694,895,340	8,172,424,707
පොලී වියදම	(3,887,744,333)	(5,392,222,204)
සේවා පිරිවැය	(891,854,229)	(725,685,001)
හානිකරණ වෙන්කිරීම්	(557,006,149)	(540,890,034)
වටිනාකම් එකතුකිරීමේ සමස්ත බෙදීයාම	2,358,290,629	1,513,627,469

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා	2025 රු.	2024 රු.
සේවකයින්ට		
වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ	1,424,261,245.38	1,229,142,717
රජයට		
ආයතනික බදු	374,922,037.69	125,756,722
ක්ෂයවීම්	197,085,992.20	126,686,733
රඳවාගත් ලාභ	362,021,353.67	32,041,296
එකතුව	2,358,290,629	1,513,627,469

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

44 භාවිතයේ මූලාශ්‍රය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා	2025 රු.	2024 රු.
ආදායම් ප්‍රභවය		
ණය හා අත්තිකාරම්	6,188,623,333	6,075,435,276
රජයේ සුරැකුම් හා වෙනත් ආයෝජන	932,238,532	1,515,215,140
ගාස්තු හා කොමිස් ආදායම	379,854,246	172,631,902
වෙනත් ආදායම්	194,179,230	409,142,389
එකතුව	7,694,895,340	8,172,424,707

ආදායම් යෙදවීම		
සේවකයින්ට		
කාර්ය මණ්ඩල වේතන සහ අනෙකුත් ගෙවීම්	1,424,261,245	1,229,142,717
සැපයුම්කරුවන්ට		
ගෙවූ පොලිය	3,887,744,333	5,392,222,204
වෙනත් වියදම්	1,645,946,370	1,393,261,768
රජය		
ආයතනික බදු	374,922,038	125,756,722
රඳවාගත් ලාභය	362,021,354	32,041,296
එකතුව	7,694,895,340	8,172,424,707

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා

2025/12/31 දිනට අනුපාත විශ්ලේෂණය	31/12/2025	31/12/2024
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය (ශ්‍රී.ල. රු. මිලියන බාසල් III		
පොදු ස්කන්ධය අදියර I	5,175	4,787
අදියර I ප්‍රාග්ධනය	4,771	4,787
මුළු ප්‍රාග්ධනය	4,771	4,787
නියාමන ප්‍රාග්ධන අනුපාතයන්		
පොදු ස්කන්ධය අදියර I ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය 7%)	24.32%	19.28%
අදියර I ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය 8.5%)	22.42%	19.28%
මුළු ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය 12.5%)	22.42%	19.28%
බාසල් III තෝලන අනුපාතය (අවම අවශ්‍යතාවය 3%)	7.28%	8.40%
නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාවය		
නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාවය	102.48%	104.79%
උසස් ගුණාත්මකභාවයේ ද්‍රවශීල වත්කම් මුළු තොගය රු. මිලියන	8,625	7,167
ශුද්ධ අරමුදල් අනුපාතය (අවම අවශ්‍යතාවය 100%)	108.00%	108.00%
වත්කම් ගුණාත්මකභාවය		
මුළු ණය අනුපාතයට හානිකරණය වූ ණය (අදියර III%)	37%	33%
අදියර III ණය අනුපාතයට හානිකරණය (අදියර III%)	14.54%	14.10%
ආදායම හා ලාභදායීත්වය		
පොලී ආන්තිකය	5.72%	3.83%
වත්කම් මත ප්‍රතිලාභ	1.30%	0.28%
ස්කන්ධය මත ප්‍රතිලාභ	6.44%	0.59%
ආදායම් අනුපාතයට පිරිවැය	69.08%	84.32%
ආයතනික තොරතුරු		
ණය ශ්‍රේණිගතකිරීම	BBB	BBB
ශාඛා සංඛ්‍යාව	25	25
සේවක සංඛ්‍යාව	334	353

සහතික කිරීම

පහත අත්සන් කරන, බැංකුව ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී වන අපි:

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද ආකෘතියට හා නිර්වචනයන්ට අනුකූලව ඉහත සඳහන් ප්‍රකාශන පිළියෙල කර ඇති බවට එක්ව සහතික කර සිටිමු.

.....

අයි. ටී. අසුරමාන්න මහතා

සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නී.

28.02.2025

.....

කේ.එල්.එන්.ඒ. පෙරේරා මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -ආයතනික සැලසුම් හා ශාඛා මෙහෙයුම්

28.02.2025

දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා (රු.මිලියන)	2025	2024	2023	2022	2021	2020	2019	2018	2017	2016
ආදායම් ප්‍රකාශය										
පොළී ආදායම	7,121	7,591	9,324	7,402	5,254	6,082	5,982	5,524	4,745	4,241
පොළී වියදම	3,888	5,392	8,733	5,463	2,951	3,960	3,952	3,577	3,102	2,425
ශුද්ධ පොළී ආදායම	3,233	2,199	591	1,939	2,302	2,122	2,030	1,947	1,643	1,815
වෙනත් මෙහෙයුම් ආදායම්	574	581	276	115	172	178	142	134	171	131
මුළු මෙහෙයුම් ආදායම්	3,807	2,780	867	2,054	2,474	2,300	2,172	2,081	1,814	1,947
පොළී නොවන වියදම්	3,070	2,622	2,032	2,143	2,069	1,728	1,672	1,602	1,435	1,241
බදු පෙර ශුද්ධ ලාභය	737	158	(1,165)	(89)	405	572	500	479	379	706
බදු ගෙවීම්	375	(126)	162	291	(152)	(216)	(81)	(235)	(200)	(270)
බදු පසු ශුද්ධ ලාභය	362	32	(1,003)	202	253	356	419	244	179	436
වත්කම්										
ආයෝජන සුරැකුම්	5	3	4	-	25	21	19	18	18	17
ණය සහ අත්තිකාරම්	44,806	41,730	38,603	39,267	38,103	36,857	35,893	34,225	32,987	28,164
වෙනත් වත්කම්	597	596	623	1,076	891	1,104	1,178	932	8,946	7,073
දේපල පිරියත හා උපකරණ	329	405	172	78	56	52	56	64	71	94
මුළු වත්කම්	57,360	55,668	59,067	56,965	53,323	52,802	47,311	42,597	42,022	35,347
අරමුදල් යෙදවීම්										
දායක වූ ප්‍රාග්ධනය	890	890	890	890	890	890	890	890	890	890
සංචිත	4,926	4,530	4,564	5,585	5,394	5,130	4,769	4,297	4,067	4,028
මුළු ස්කන්ධය	5,816	5,420	5,454	6,475	6,284	6,020	5,659	5,187	4,957	4,918
වගකීම්										
තැන්පතු	48,857	48,161	52,138	49,140	45,738	45,388	38,872	34,272	33,620	28,845
ණය කර	-	-	-	-	-	-	110	110	110	110
වෙනත් වගකීම්	1,557	2,087	1,474	1,350	1,301	1,394	2,670	3,028	3,336	1,474
මුළු වගකීම්	51,544	50,248	53,612	50,490	47,039	46,782	47,311	42,597	42,022	35,347
අනුපාතයන්										
වත්කම් සාමාන්‍ය මත ප්‍රතිලාභ NPBT% (ROA	0.06	-1.73	0.37	0.48	0.71	0.93	0.58	0.46	1.25	1.27
යෙදවුම් අරමුදල් සාමාන්‍ය මත ප්‍රතිලාභ (ROE)	0.59	-16.82	3.17	4.11	6.10	7.73	4.81	3.63	9.50	9.90
සේවක ගණන	353	354	387	365	369	378	385	392	392	392
එක් සේවකයෙකුට ශුද්ධ ලාභය (රු. මි)	0.09	(2.83)	0.52	0.69	0.96	1.11	0.63	0.46	1.11	1.05
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	306.65	306.65	306.65	296.56	283.91	270.92	261.67	246.64	231.36	203.05
තැන්පතු සඳහා අත්තිකාරම් (කාල)	0.87	0.74	0.80	0.83	0.81	0.92	1.00	0.98	0.98	0.95
ස්කන්ධ වත්කම් අනුපාතය (කාල)	0.10	0.09	0.11	0.12	0.11	0.12	0.12	0.12	0.14	0.12
රුපියල් දායකත්වයට මුළු වත්කම්	62.55	66.37	64.01	59.91	59.34	53.17	47.87	47.22	39.72	38.46
සවිල ගෙවිය යුතු ලාභාංශ අනුපාතය	-	-	-	-	59.34	-	25.00	25.00	25.00	25.00
ගෙවිය යුතු ලාභාංශ ආවරණය	-	-	-	-	-	-	-	1.91	2.52	2.44
ජාතියට අපගේ දායකත්වය										
ගෙවිය යුතු ලාභාංශ බදු	-	-	-	-	-	-	(40.36)	93.27	173.35	167.86
ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	-	-	-	-	-	-	-	10.00	10.00	10.00

සටහන්

ආයතනික තොරතුරු

බැංකුවේ නම
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

නෛතික ස්වභාවය
1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන
බැංකු නීතිය යටතේ ස්ථාපනය කරන ලද සංස්ථාපිත ආයතනයකි.

ලියාපදිංචි කාර්යාලය
නො. 269, ගාලු පාර,
කොළඹ 03, ශ්‍රී ලංකාව.

ප්‍රධාන කාර්යාලය
නො.269, ගාලු පාර, කොළඹ 03.
දුර: 0112573561, 01177227223
ෆැක්ස් :0112573346
E-Mail:gm@smib.lk
Web:www.smib.lk

ප්‍රධාන කාර්යාලය / කොල්ලුපිටිය
නො. 269, ගාලු පාර, කොළඹ 03.
0117722808, 0112575031
butb@smib.lk

මහනුවර
අංක 61 සහ 61 1/1, පලමු මහල,
රජවීදිය, මහනුවර.
08177227223, 0812222819
kandy.mgr@smib.lk

ගම්පහ
අංක 49, යක්කල පාර, ගම්පහ.
03377227223, 0332221317
gampaha.mgr@smib.lk

ගාල්ල
අංක 41/ඒ, ශ්‍රී දේවමිත්ත මාවත, ගාල්ල.
09177227223, 0912246788
galle.mgr@smib.lk

කුරුණෑගල
අංක 46/1, මිහිඳු මාවත, කුරුණෑගල.
03777227223, 0372231234
kurunegala.mgr@smib.lk

මතුගම
අංක 141, අගලවත්ත පාර, මතුගම.
03477227223, 0342243714
matugama.mgr@smib.lk

හලාවත
අංක 41 කුරුණෑගල පාර, හලාවත.
03277227223, 0322223996
chilaw.mgr@smib.lk

මාතර
අංක 58 1/1, එස්ප්ලනේඩ් පාර, මාතර.
04177227223, 0412222204
matara.mgr@smib.lk

බත්තරමුල්ල
අංක 56/1 56/1/1, කඩුවෙල පාර,
බත්තරමුල්ල.
01177235701, 0112882144
battaramulla.mgr@smib.lk

කිරිබත්ගොඩ
අංක 140, බී නුවර පාර, කිරිබත්ගොඩ.
01177235756, 0112908833
kiribathgoda.mgr@smib.lk

කෑගල්ල
අංක 190/3, නුවර පාර, කෑගල්ල.
03577227223, 0352222877
kegalle.mgr@smib.lk

හොරණ
අංක 155, රත්නපුර පාර, හොරණ.
03477227334, 0342265400
horana.mgr@smib.lk

අම්බලන්තොට
අංක 122, කෙලින් වීදිය, අම්බලන්තොට.
04777227223, 0472225516
ambalantota.mgr@smib.lk

මඩකලපුව
අංක 245, ත්‍රිකුනාමල පාර, මඩකලපුව.
06577227223, 0652228480
batticaloa.mgr@smib.lk

යාපනය
අංක 127, ස්ටැන්ලි පාර, යාපනය.
02177227223, 0212220263
jaffna.mgr@smib.lk

අම්පාර
අංක 864, ඩී.එස්.සේනානායක වීදිය,
අම්පාර
06377227223, 0632223888
ampara.mgr@smib.lk

රත්නපුර
අංක 101, කෙලින් වීදිය, රත්නපුර.
04577227223, 0452232473
rathnapura.mgr@smib.lk

කදුරුවෙල
අංක 892, ලී මෝල හංදිය, මඩකලපු පාර,
කඳුරුවෙල.
02777227223, 0272227427
kaduruwela.mgr@smib.lk

වව්නියා
අංක 137, නුවර පාර, වව්නියාව.
02477227223, 0242227590
vavuniya.mgr@smib.lk

හැටන්
අංක 62/1/2, දිඹුල පාර, හැටන්.
05177227223 0512224722
hatton.mgr@smib.lk

බදුල්ල
අංක 38, බැංකු පාර, බදුල්ල.
05577227223, 0552228666
badulla.mgr@smib.lk

මොනරාගල
අංක 218, කච්චේරි හංදිය, මොනරාගල.
05577227334, 0552055430
monaragala.mgr@smib.lk

අනුරාධපුර
අංක 521/7 නව බස්නැවතුම්පල, කෙලින් වීදිය, අනුරාධපුර.
02577227223, 0252237476
anuradapura.mgr@smib.lk

මාතලේ
අංක 343, ත්‍රිකුණාමල වීදිය, මාතලේ.
06677227223, 0662227878
matale.mgr@smib.lk

පානදුර
අංක 26, සුසන්ත මාවත, පානදුර.
03877227223, 0382243293
panadura.mgr@smib.lk

Design & Produced by: Paragon Ceylon



රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
නො. 269, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංකය :011-7722722
වෙබ් අඩවිය :www.smib.lk / විද්‍යුත් තැපෑල : info@smib.lk